

# සන්න සහිත සම්බන්ධ චින්තාව.

THE

# SAMBANDHA-CINTA

BY

Venerable Sthavira, Sri Sangha Rakshita,

TRANSLATED BY

VENERABLE GOTAMA MAHA SAMI.

සන්න සහිත

# සම්බන්ධ චින්තාව.

ගෝනදූවේ විහාරවාසී

**කළුතර සාරානන්දස්ථවිරයන් විසින්**

ශුද්ධකොට සන්නස් කරණලදි.

*Printed at The "Lakrivikirana Press:"*

**COLOMBO.**

**1891.**

# THE SAMBANDHA-CINTÁ

COMPOSED BY THE

**Venerable Sthavira, Sri Sangha Rakshita,**

TOGETHER WITH ITS SINHALESE PARAPHRASE BY THE

VENERABLE GOTAMA MAHA SAMI.

REVISED AND EDITED, AT THE REQUEST OF

**L. C. Wijesinha, Mudaliyar,**

BY

KALŪTARA SÁRÁNANDA SÁMI

OF GONADUVE VIHÁRA;

A PUPIL OF THE VENERABLE

**Hikkaduwe Sri-Sumangala,**

*High Priest of Sripàda and Principal of the Vidyòdaya Parivena (Oriental College).*

PUBLISHED BY

K. D. SIMON APPUHÁMI

OF GONADUVA.

A. B. 2434.

*Printed at The "Lakrivikirana Press."*

COLOMBO.

1891.

පූජ්‍යාචාර්ය ශ්‍රීසඞ්ඝරක්ඛිතාභිධාන මහාස්ථවිරප්‍රණීත

# සම්බන්ධ චින්තාව.

පූජ්‍යාචාර්ය අරණ්‍යවාසී ගොතම මහාසාමින් විසින්
කරණලද විස්තරාර්ථව්‍යාඛ්‍යාන සහිතයි.

---

නානාභාෂාශාස්ත්‍රාතිදක්ෂ
ලුවි කොර්ණේල් විජයසිංහ මුදලිතුමන් විසින්
ආරාධනා කරණ ලදින්
විද්‍යෝදයපරිවෙණාධිපති
පූජ්‍යාචාර්ය හික්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන
දකුණු බටහිරි පලාත් සහිත
ශ්‍රීපාදස්ථානයෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්වාමිපාදයන්වහන්සේගේ
ශිෂ්‍ය වූ
ගෝනදූවේ විහාරවාසි
කළුතර සාරානන්ද ස්ථවිරයන් විසින්
ශුද්ධකොට සකස් කරණලදී.

---

ගෝනදූවේ. කෝ. ඕ. සයිමොන් අප්පුහාමි විසින්
ලක්රිවිකිරණ යන්ත්‍රාලයෙහි අච්චුගස්වා
ප්‍රසිද්ධ කරණලදී.

ශ්‍රීබුද්ධ වර්ෂ 2434,

APROVED BY THE LEARNED

Pandit Batuvantudave Sri Deva Rakshita.

ආචාර්ය ශ්‍රීදෙවරක්‍ෂිතාභිධාන බටුවන්තුඩාවේ

රාජකීය පණ්ඩිතුමන් විසින්

පිළිගන්නාලදී.

# SAMBANDHA-CINTÁ.

OR

## A TREATISE ON SYNTAX.

THIS is a work on Páli Syntax, held in very high estimation by all Pàli Scholars in Ceylon; and is founded on the grammatical sùtras of Moggalláyana. Its high authority is proven from the fact that even Totagamuve, the greatest schôlar that lived in modern times, quotes from it in elucidation of his Pancikà Pradipa, a work containing annotations on the Moggalláyana grammar.

The author was a pupil of the renowned glossarist of the Pitaka commentaries, Sáriputra Maha Thera, who lived at Polonnaruwa in the time of Parakrama Bàhu the Great, and for whom that warlike monarch built the stately monastery so minutely descrbed in the Mahàvansa (see ch. 78. v.v. 34—43) The pupil, our author, also played as important a part in the religious and political history of his country as his great teacher seems to have done: for, it was to him who was then at the head of the Buddhist Priesthood that Vijaya Bàhu III. (A. C. 1236) gave in charge, for education and training, his two sons, the elder of whom succeeded his father in the kingdom under the name of Paràkrama Bahu II. who, on account of his profound learning and piety obtained the great name, Kalikàla Sàhicca Sabbaññu Pandita (see Mahás vansa chaps 81—82) There are good grounds for supposing that it is a cast of this King's statue, and not that of Parákrama Báhu the Great, as is generally supposed, that now graces the Hall of the Ceylon Museum.

The Sinhalese Paraphrase to this work was made by a learned Buddhist hermit named Vanavási Gotama, a pupil of the Venerable Ananda Vanaratana, the renowned author of many well known works and the preceptor of Dimbulágala Medhankara Mahá Thera and Vedeha Mahá Thera both of whom produced excellent standard works in Pali and Sinhalese literature, and shone as brilliant lights in the Buddhist Church of that period. It would therefore be simply presumptuons on our part to extol their merits: their works proclaim them to posterity.

This valuable work, however, from disuse and incapacity of copyists, has become very rare; and even when obtained after much troublesome search, is found to contain so many errors and omissions as to render its study a matter of great difficulty and trouble. Seeing this state of things the learned translator of the Mahávansa, L. C. Wijesinha Mudaliyar, pressed upon me to undertake the difficult and laborious work of collating texts and preparing an edition for the Press. This task I have undertaken and accomplished with the able assistance of my most learned tutor, the Venerable High Priest Hikkaduwe Sumangala Mahà Thera, principal of the Vidyodaya Parivena, and his eminent pupil M. Nanissara, to both of whom I hereby gladly render my sincere thanks. I am also happy to be able to say that the learned and celebrated Pandit, Batuvantudáve Sri Deva Rakshita, has been good enough to look over the proof sheets, and lend to this work the sanction of his great name.

I have added some foot-notes in explanation of difficult passages so as to render the work easy of study to those whose knowledge of Pali is not great.

The task of correcting and revising a work which has been out of general use for centuries, and purging it of errors and defects resulting from the ignorance of copyists, is not an easy one. I trust, therefore, that the reader will readily excuse any errors and oversights that may occur herein.

Colombo, 17th February 1891. K. SÁRÁNANDA.

**වි ඥා ප න ය.**

සන්න සහිත

# සම්බන්ධ චින්තාව.

—000—

"අනුත්තාදිවසෙන චින්තියතෙ පටිපාදියතෙ'නෙනෙති'චින්තා,- සම්බන්ධස්ස ක්‍රියාකාරක යොගස්ස චින්තා'සම්බන්ධචින්තා"-මේ කාරණ කොට ගෙණ අනුක්තාදින්ගේ වශයෙන් චින්තනය කරණු ලැබේනුයි හෙවත් ප්‍රතිපාදනයට වහල් වේනුයි 'චින්තා, නම්—ගමනපචනාදි ක්‍රියාවන් හා කර්මාදි ෂට්කාරකයන්ද සම්බන්ධවූ චින්තනය **'සම්බන්ධ චින්තා,** නම් වේ.

උක්තානුක්තවිභාග කාරකවිභාගාදිය විස්තර වශයෙන් ප්‍රකාශ කිරීම පරමකොට මොග්ගල්ලායන ව්‍යාකරණනයානුගතව ප්‍රතිපාදිත මේ ප්‍රකරණය මොග්ගල්ලායන ව්‍යාකරණ නැමැති මහාර්ණව ප්‍රතරණයට තරණියක් බඳු වේ.

ෂඩ්භාෂාපරමේශ්වර **තොටගමුවේ ශ්‍රීරාහුල මහා ස්වාමිපාදයන්** වහන්සේ විසින් කරණලද පඤ්චිකාප්‍රදීපයට පවා මෙම සම්බන්ධචින්තා පාඨනිදර්ශනකොට තිබෙන හෙයින් එයින්ම ග්‍රන්ථගෞරවය සිද්ධයි.

සිංහල රාජවංශයට මුදුන් මල් කඩක් වැනිවූ **මහාපරාක්‍රමබාහු** මහරජතුමන් ලඞ්කාරාජ්‍යශ්‍රීපදප්‍රාප්ත කාලයෙහි පොලොන්නරු නුවර වැඩ විසූ සාරාත්ථදීපනිවිනයටීකා, අඞ්ගුත්තරටීකා, විනයසඞ්ග්‍රහ, අභිධම්මාත්ථසඞ්ග්‍රහ ව්‍යාඛ්‍යා, පඤ්චිකාටීකා, ආදි ප්‍රශස්ත මහාග්‍රන්ථ කර්තෘවූ **ශාරිපුත්‍ර මහාස්වාමිපාදයන්**වහන්සේගේ ශිෂ්‍යවූ පිටකත්‍රයධර **සඞ්ඝරක්ඛිතමහාස්වාමිපාදයන්**වහන්සේ විසින් මේ සම්බන්ධචින්තානම් ප්‍රකරණය මූලභාෂාවෙන් කරණලදි—මේ ඇර මුන්වහන්සේ සුසද්දසිද්ධි, සුබොධාලඞ්කාර, වුත්තොදය, ඛුද්දසික්ඛාටීකා, ආදි මෙනත් නොයෙක් ග්‍රන්ථසම්පාදනය කිරීමෙන් බොහෝ ලොකශාසන සඞ්ග්‍රහ කළ උත්තමයෙකි.

විශුද්ධිමාර්ග සන්න කර්තෘවූ **කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු** මහරජතුමන් පවා කුඩාකාලයෙහි තමන් පියමහරජහු විසින් මේ **සඞ්ඝරක්ඛිතස්වාමිපාදයන්**වහන්සේ ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට පාවාදී තිබේ-ඒ බව මහාවංශයෙහි-

"අථ තෙසු පරක්කන්ති භුජසෙට්ඨං සුතං තද
මහාසාමිං පුරක්ඛත්වා **සඞ්ඝරක්ඛිත**විස්සුතං.
සමාගතස්ස සඞ්ඝස්ස නියාදෙත්වා තතො පුන
තස්සාපි මුනිනො දන්තා පත්තධාතුවරං තථා" යි

දක්වනලද ගාථාවලින් පෙණෙන හෙයින් එයින්ම මුන්වහන්සේගේ ප්‍රතිභාසාමර්ථ්‍යය කල්පනා කටයුතුයි.

මෙහි සන්නය **කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු** මහරජතුමන්ගේ පිය මහරජතුමන් විසින් කළ ශාසන ශුද්ධියෙහිදී මුඛ්‍යපද ප්‍රාප්තවූ දිඹුලාගල වනවාසී **මේධංකරමහාසාමීන්ගේ** ගා සමන්තකූටවර්ණනා, රසවාහිනී, සිදත්සඟරා, ආදී ප්‍රශස්ත ග්‍රන්ථ කරණයෙන් බොහෝ ලොකශසනානුග්‍රහකළ **වෛදෙහමහාසාමීන්** වහන්සේගේද ආචාර්‍ය්‍ය පදප්‍රාප්ත අභිධර්ම මූලටීකාකාර **ආනන්ද වන රතනාභිධාන** මහා සාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ බුදුබව පතන් නෙක්වූ වනවාසී **ගොතම** නම් ස්ථවිරස්වාමින් විසින් යථොක්ත මහ රජතුමන් කාලයෙහි කරණලදි–ඒ බව ව්‍යාඛ්‍යා පරිසමාප්තියෙහි—

"සො'යං දයාලුගුරු මෙ ජයතිහ පඤ්ඤො
**ආනන්දරඤ්ඤරතනාදි** මහායතිමෙ
නිස්සාය සිස්සජනතා අපියස්ස තෙජෝ
ගන්ථස්ස අත්ථමසුතස්සාපි ජොතයන්ති.

බුද්ධත්තං පත්ථයන්තෙන සබ්බසත්තහිතත්ථිනා
ආරඤ්ඤකෙන යතිනා ලිඛිතං **ගොතමෙනිදං**" යි.

දක්වනලද ගාථාවලින් පෙණෙයි–අද දක්වාත් ඉර සඳසේ බබලන මේ උත්තමයන්වහන්සේලාගේ නාම ගැණ අපි කුමට වර්ණනා කරමුද? **ගොතම** නම් සාමිපාදයන් විසින් ලියනලද මේ සන්නයෙහි ඒ ඒ තැන් පාණිනීයචාන්ද්‍රාදි මහා ව්‍යාකරණවලින්ද වෙනත් නානාවිධ සංස්කෘත තන්ත්‍රයෙන්ද උදාහරණ දක්වීමෙන් ව්‍යක්තකොට තිබේ.

මුන්වහන්සේගේ උගත්කමේ ප්‍රමාණය පූජ්‍ය පණ්ඩිතයන් ඉදිරියෙහි මේ සන්නයෙන්ම ප්‍රකාශවෙන හෙයින් ඒ සඳහා අපි කුමටවෙහෙසෙමුද? ලඞ්කාවේ බොහෝ ස්ථවිර පරම්පරාවල ලාඞ්කිකාචාර්‍ය්‍යවරයෙක්වූ **මොග්ගල්ලායන** මහාස්ථවිරයන් විසින් ප්‍රණීතවූ මොග්ගල්ලායන ව්‍යාකරණය ප්‍රගුණකරණ සිරිත පුරාණකාලයේ පැවති බව මේ හැමඅතින්ම පෙණෙයි–වර්ත්තමානකාලයෙහි බොහෝ කොට ප්‍රගුණ කරවනු ලබන බාලාවතාරාදියෙහි නොදක්වන

ජිනවචනානුගතවූ පදරූපාදී නොයෙක් විශෙෂ පුරාණාචාර්‍ය්‍යවරයන් විසින් කරණලද ප්‍රකරණාන්තරවල බොහෝසේ දකින්ට ලැබෙන හෙයින් ඒ විශෙෂ ප්‍රකාශ වන්නාවූ මෞද්ගල්ලායන ව්‍යාකරණය පරිශීලනය කිරීම අවශ්‍යයි.

මෙසේ විශිෂ්ටාර්ත්‍ථ ප්‍රතිපාදක මුගලන් වියරණ අනුවගිය සම්බන්‍ධ චින්තා ව්‍යාඛ්‍යානය සපයාගැණීමේ දුෂ්කරතාව හා දුකසේවත් සපයාගත් පිටපත් එකකට එකක් නොසමව ඇතැම් තැන ගාථා ශ්ලොක වාක්‍යාදිය නැතිවද සමහර කාණ්ඩ සහමුලින්ම නැතිවද විද්‍යාර්ථීන්ගේ ප්‍රයොජනයට බාධාව අතිශයින් ආකූලව පවතින බව දුටු මහාවංශය ඉංග්‍රිසියට නගාලූ නානාභාෂා ශාස්ත්‍රාතිදක්ෂ **ලුවිකොර්ණේල් විජයසිංහ මුදලිතුමන්** විසින් ආරාධිතවූ **කලුතර සාරානන්‍ද තෙරුන්නාන්සේ** වන මම ඥනශක්තිවූ පරිද්දෙන් මෙය මෙසේ සකස් කොළෙමි.

මේ සංශොධනයෙහිදී අපගේ ආචාර්‍ය්‍යොත්තම පණ්ඩිතශිරොමණිභූත **ශ්‍රීසුමඞ්ගලාභිධාන** විද්‍යොදය පිරිවෙණාධිපතින්වහන්සේගෙන් හා උන්වහන්සේගේ ශිෂ්‍යවූ උගත් **ඤාණිස්සරාභිධාන** භවද්‍යුෂ්මතුන්ගෙනුත් උපකාරලත් බැව් සතුටින් මතක්කරමි.

එසේම ලොක ප්‍රසිඬ පූජ්‍යපණ්ඩිතරත්නයක්වූ ආචාර්‍ය්‍ය **ශ්‍රීදෙවරක්ෂිතාභිධාන බටුවන්තුඩාවේ** රාජකීය පඬිතුමන් විසින් සිඬිපත්‍රයක් බැලීමෙන් සමාදරයෙන් පිළිගන්නාලද බවද සඳහන්කරමි.

මේ පොත මුද්‍රාඬ්කණයෙහිදී අතිවිස්තර නිදශීන වශයෙන් දක්වූ සමහර පාඨ සුඛාවබොධවන පරිද්දෙන් අධොලිපි වශයෙන් යෙදුවෙමු.

මෙහි යම් ප්‍රමාද භ්‍රමාදියක් ඇතද එය නැනවතුන් විසින් සමාධිය භජනය කිරීමෙන් ශුඬකටයුතුයි.

**K. Sârânanda.**

නිරුත්තිසාරාපගරාජපාරගුං
අසෙසකාලුස්ස විසෙසඝාතකං
පබොධනෙය්‍යම්බුජ ඝම්මගුං ජිනං
සධම්මසඞ්ඝං පණමාමි මුද්ධනා.

සඞ්ඝරක්ඛිත නාමෙන ථෙරෙන ථිරබුද්ධිනා
කතා සම්බන්ධචින්තා'යං කාරකත්ථප්පකාසිනී.

තදත්ථවණ්ණනාචා'යං විවිධත්ථප්පභාවිනී
ගොතමාබෙය්‍යන ථෙරෙන කතා බාලත්ථමිච්ඡතා.

තා දුවෙචෙව රචනා පොරාණිකකවිහිමා
පසත්ථා පරිචිණ්ණත්තමුපනීතා පභාවිතා.

අථාපි ලිපිකාරානං හත්ථප්පත්තා පුනාපරං-
අව්‍යත්තාවිදිතත්ථානමා'කුලත්තමුපාගතා.

දුරන්නයා දුරාභාරා දුබ්බොධමවගාහිනී
අත්ථාභිලාසිසිස්සානං අත්ථබාධකතං ගතා.

තම්බොධමපහන්තාරා **සාරානන්ද**සමඤ්ඤිනා
ගරූපදෙසමා'ගම්ම යථාසත්ත්‍ය'භිසඞ්ඛතා.

අඤ්ඤෙපි දොසා යෙකෙචි සංවිජ්ජන්ති පමාදජා
සොධයන්තු බුධා බුද්ධ්‍යා සිස්සබුද්ධිප්පවුද්ධියා.

*K. Sārānanda.*

### සන්නසසහිත

# සම්බන්ධචින්තාව.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

නිරුත්තිවිසරාපාරසාගරත්තොපගං ජිනං
නමස්සිත්වා කරිස්සාමි සාධු සම්බන්ධචින්තනං. 1

සුනිශිතවිමලවිපුලබුද්ධි ඇති කවිගමකවාග්මිවෛයාකරණවූ සකලශාස්ත්‍රයෙහි පාරප්‍රාප්ත පිටකත්‍රයධර සඞ්ඝරක්ෂිතමහාස්වාමිපාදයෝ අවිදිත ශබ්දශාස්ත්‍ර අව්‍යුත්පන්නජනානුග්‍රහබුද්ධියෙන් මෞද්ගල්‍යායන ව්‍යාකරණමහාර්ණවයට පසුරක්බඳුවූ "ශබ්දසිද්ධිප්‍රකරණය" කොට තදවයවවූ කාරකවිභාගප්‍රකාශකවූ එතත් ප්‍රකරණාරම්භයෙහි ස්තුති පූර්වකවූ ඉෂ්ටදේවතා නමස්කාරාභිධාන කරණප්‍රකාර සන්දර්ශනය පිණිස "නිරුත්තිවිසරාපාර" යනාදි ගාථාව උපන්‍යාස කළෝ.

ශාස්ත්‍රාරම්භයෙහි ඉෂ්ටදේවතා නමස්කාරය කිමර්ථවූයෙහිය යත්? තත්සන්දර්ශනයක් නැතිව කරණ මාත්‍රයකිනිදු කර්තෘන්ට ස්වාර්ථ සංසිද්ධිය වතුදු ශ්‍රොතෘන්ගේද තන්නමස්කාර කරණානුප්‍රභාවයෙන් ඔවුන් විසින් විඥාතව්‍ය ග්‍රන්ථයාගේ අවිඝ්නයෙන් පරිසමාප්තිය පිණිසයි.

අභිධානසන්දර්ශනය තච්ඥනාපෙක්ෂා පූර්වකාරීන්ගේ ග්‍රන්ථාවතාර පරිඥානය පූර්වඞ්ගමකොට ඇතිහෙයින් ස්වප්‍රකරණයෙහි ගෞරවොත්පාදනය පිණිස හා අභිධාන ව්‍යවහාර සුඛපිණිසයි.

කරණප්‍රකාර සන්දර්ශනය ශ්‍රොතෘන්ගේ ග්‍රන්ථප්‍රවෙශයෙහි උත්සාහ ජනනය පිණිසයි.

මෙහි "නිරුත්තිවිසරාපාරසාගරත්තොපගං ජිනං නමස්සිත්වා" යන මෙයින් ආරම්භානුරූපක ස්තුති පූර්වකවූ ඉෂ්ටදේවතා නමස්කාර සන්දර්ශිතයි.

අනන්තබුද්ධගුණයන් අතුරෙන් සර්වඥයන්ට නිරුක්ති ප්‍රතිඥ විඥාන ස්තුති වශයෙන් නමස්කාරය නිරුක්තිවිෂය කොට චිකීර්ෂිත ප්‍රකරණාරම්භයට අනුරූප ස්තුති වශයෙන් කියනලදී හෙද පූර්වාචාර්ය ක්‍රමයෙක් නුයි කියායි.

"අභිධෙය්‍යසමුදිතෙන ශාස්ත්‍රෙන වාච්‍යාර්ථඃ" යනුහෙයින් යම් අර්ථයෙක් යම් ශබ්දයක්හුවිසින් හැඟේද හේ ප්‍රකරණයෙන් වාච්‍යවූ ක්‍රියාකාරකසම්බන්ධානුගත උක්තවිභක්තිභෙද ස්වරූපය මෙහි අභිධෙය නම්වේ.

"සම්බන්ධචින්තනං" යන අන්වර්ථනාමයෙන් ගතවනලදී නුයි

“සම්බන්ධචින්තනං” යන මෙයින් අභිධෙයාභිධාන සම්බන්ධ ක්‍රියාවට හෝ “සම්බන්ධචින්තනං” යන්නට හෝ විශෙෂණවූ “සාධු” යන මෙයින් කරණප්‍රකාර සඤ්ඥිතයි.

“යතො හි සිද්ධසම්බන්ධං ශ්‍රොතුං ශ්‍රොතා ප්‍රවර්තතෙ
ශාස්ත්‍රාදෞ තෙන වක්තව්‍යස්සම්බන්ධස්සප්‍රයොජනම්” යී

යනුහෙයින් ප්‍රයොජන පූර්වකවූ සිද්ධසම්බන්ධය මෙහි කියයුතුවේද යත්? අභිධෙයම ශාස්ත්‍රප්‍රයොජන වනහෙයින්ද ප්‍රයොජනයෙහි සම්බන්ධය සුගම වනහෙයින්ද ඔහු වෙනම නොදක්වනලදහු.

එසේමැයි යමක්හු උදෙසා යමක්හුගේ ප්‍රවෘත්තිය වේද? ඒ ඔහුගේ ප්‍රයොජනනුයි මෙහි අභිධෙයාභිධානසම්බන්ධානුකූලඋක්තවිභක්තිභෙද ස්වරූපය උදෙසා මේ ප්‍රකරණයාගේ ප්‍රවෘත්තිය හෙතුකොටගෙණ අභිධෙයම සාක්ෂාත්ප්‍රයොජනයයි කියනලදී. සාධ්‍ය සාධනලක්ෂණාත්වා දිය පාරම්පර්‍ය්‍යයෙන් වේනුයි සාක්ෂාත්ප්‍රයොජන නොවනහෙයින් අනවර්ථනාමවූ “සම්බන්ධචින්තනං” යන මෙයින් ප්‍රකාශිතහෙයින් ප්‍රයොජනයද සාධ්‍ය සාධනලක්ෂණ සම්බන්ධය ප්‍රයොජනයෙහි ම අන්තර්ගතහෙයින් හෙද වෙනම නොදක්වනලදී.

එයින් කිහ.

“ශාස්ත්‍රං ප්‍රයොජනඤ්චෛව සම්බන්ධස්‍යාශ්‍රයාවුභෞ
තදන්තර්ගතං තස්මාදභින්නොනොක්තං ප්‍රයොජනාත්” යි.

මේ මෙහි සමුදායාර්ථයි පිණ්ඩාර්ථයි යනුද මේමැයි.

අවයවාර්ථ කියනු ලැබේ.

1 “ජිනං නමස්සිත්වා සම්බන්ධචින්තනං කරිස්සාම” යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි–ජිනං, (පවමාරයන් දිනූ) සර්වඥයා; නමස්සිත්වා, වැඳ; සම්බන්ධචින්තනං, සම්බන්ධචින්තානම් ප්‍රකරණය; කරිස්සාම, කරමු.

කෙසේ වූද යත්?

නිරුත්තිවිසර, (ඝටපටස්තම්භකුම්භාදි) නිරුක්ති සමූහ නමැති; අපාර, පරතෙරක් නැත්තාවූ; සාගර, සමුද්‍රයාගේ; අඤ්ඤොපගං, කෙළවරට පැමිණියාවූ; ජිනං, (ස්කන්ධක්ලෙශාභිසංස්කාර මෘත්‍යුදිව්‍යපුත්‍ර සඞ්ඛ්‍යාත පවමාරයන් දිනූහෙයින් ජිනනම්වූ) සර්වඥයා; සාධු, මනාකොට; (හෙවත් භයලොභාදි රහිතව ශ්‍රද්ධාබුද්ධි පුරස්සරව) නමස්සිත්වා, (කායවාඞ්මනඃ යන වාරත්‍රයෙන්) වැඳ; සාධු, මනාකොට; (නොහොත් න්‍යායාගම විරොධයක් නැති හෙයින්) මනාවූ; සම්බන්ධචින්තනං, සම්බන්ධචින්තා නම්වූ ප්‍රකරණය; කරිස්සාම, කරමු.

ක්‍රියාය කාරකානඤ්ච යොගො සම්බන්ධසම්මතො
තස්මාස්ස විධානා සම්බන්ධවිධානානුත්තාදිනිස්සිතා. 1
එත්ථාදිසද්දෙන වුත්තවිභත්ති භෙදා සඞ්ගය්හන්ති. 2

---

“ආත්මනි ගුරුෂු බහුවචනං” යනුහෙයින් ආත්ම ගෞරවාපෙක්ෂායෙන් බහුවචන ප්‍රයොග කරණලදී.

නිඝරිඝා උත්ති නිරුත්ති, නිරුත්තීනං විසරො නිරුත්තිවිසරො නත්ථිපාර මෙතස්සාති අපාරො, අපාරො ච සො සාගරො චෙති අපාරසාගරො, අපාරසාගරොව අපාරසාගරො, නිරුත්තිවිසරො ච සො අපාරසාගරොචාති නිරුත්තිවිසරාපාරසාගරො, නිරුත්තිවිසරාපාරසාගරස්ස අන්තො නිරුත්තිවිසරාපාරසාගරන්තො–තං–උපගතවාති නිරුත්තිවිසරාපාරසාගරන්තාපගො–තං–ඛන්ධකිලෙසාභිසංඛාර මච්චුදෙව පුත්තසඞ්ඛාතෙ මාරෙ ජිතවාති ජිනො–තං–ජිනං, අනුත්තාදිවසෙන විධීයතෙ පටිපාදීයතෙ අනෙනාති විධානං, සම්බන්ධස්ස ක්‍රියාකාරක යොගස්ස විධානං සම්බන්ධවිධානං.

“සම්බන්ධවිධානං” යි අභිධාන සඞ්ක්ෂිප්ත වුවද ප්‍රත්‍යය ලිඞ්ගානන්ධයක් මිසූ එක කරණාර්ථයෙහි නිෂ්පන්නහෙයින් අර්ථ සමනුයි “සම්බන්ධවිධානා” යයි කියනලදී.

එහෙයින්ම මත්තෙහි කියනු ලැබේ.

“තස්මාස්ස විධානා සම්බන්ධවිධානානුත්තාදි නිස්සිතා” යි.

වක්ෂ්‍යමාණ සකලාභිධෙය ප්‍රකාශකාවූ “සම්බන්ධවිධානං” යන්නෙහි අර්ථවිවරණය කිරීම් වශයෙන් ප්‍රකාශිතවූ අභිධෙය යාගේ විභාවනය කොට විභක්තානුක්‍රමයෙන් මත්තෙහි නිර්දෙශ කරණු පිණිස “ක්‍රියාය කාරකානඤ්ච” යනාදිය ප්‍රකාශ කරණලදී.

එහි සම්බන්ධය නම් යොගයක් බැවින් හෙද දෙදෙනෙක්හට වේනුයි පළමුකොට ඔවුන් දෙදෙනා දක්වන්නාහු–

“ක්‍රියාය කාරකානඤ්ච යොගො සම්බන්ධසම්මතො” යී කීහු.

1. ක්‍රියාය, (ගමනපචනාදී) ක්‍රියාවගේද; කාරකානඤ්ච, (කර්මාදි ෂට්) කාරකයන්ගේද; යොගො, යෙදීම; (හෙවත් සමවායට එළඹීම) සම්බන්ධසම්මතො, (යම්හෙයකින්) සම්බන්ධයයි දන්නාලද්ද; තස්මා, එහෙයින්; අස්ස, මේ ක්‍රියාකාරකසම්බන්ධයාගේ; අනුත්තාදිනිස්සිතා, අනුක්තාදිය ආශ්‍රය කළාවූ; (නොහොත්) අනුක්තාදිය නිසා පැවැත්තාවූ; විධානා, විධාන තොමෝ; (හෙවත් ප්‍රතිපාදනයට වගල්වීම) සම්බන්ධවිධානා, සම්බන්ධ විධානා නමු.

2. එත්ථ, මේ ගාථාවෙහි; ආදිසද්දෙන, (අවයවාර්ථ වාචිවූ) ආදි ශබ්දයෙන්; උත්තවිභත්තිභෙදා, උක්තය විභක්තිභෙදය; (යන මොනු) සඞ්ගය්හන්ති, සඞ්ග්‍රහ කරණු ලැබෙත්.

සම්බන්ධො පන ජාතිවසා සම්බන්ධසද්දෙනෙව තෙනෙත්ථ ක්‍රියාකාරක සම්බන්ධානුත්තවුත්තවිභත්තිභෙද ක්කමෙන වුච්චන්ති. 1

---

"මර්‍ය්‍යාදයාම්ප්‍රකාරෙච සමීපාවයවෙ තථා
චතුෂ්වර්ථෙෂු මෙධාවී හ්‍යාදිශබ්දන්තු ලක්ෂයෙත්" යි.

ආදිශබ්දය "පබ්බතාදීනි ඛෙත්තානි" යනාදි තන්හි මර්‍ය්‍යාදයෙහි වැටේ. "ඉති එවමාදීනිදිසිවිසුකායිතානි" යනාදි තන්හි ප්‍රකාරයෙහි වැටේ. "එවාදිසාරිපුබ්බොච" යන තන්හි සමීපයෙහි වැටේ. "සබ්බාදීනි සබ්බනාමානි" යනාදි තන්හි අවයවයෙහි වැටේ. මෙතන්හිදු අවයවයෙහි වැටෙයි දතයුතු.

විභක්තිභෙදනම් "කම්මෙ දුතියා, කත්තුකරණෙසු තතියා" යනාදි ඒ ඒ සූත්‍රයෙන් විහිත විතියාදි විභක්තීන්කෙරෙන් පිටත් ෂෂ්ඨීසප්තම්‍යාදියෙහිදු වන බවයි.

ෂට් කාරකයෙන් පිටත් ෂෂ්ඨීසම්බන්ධය මෙහි කවර ශබ්දය කින් සඞ්ග්‍රහ කරණු ලැබේද? යන අන්තර්ලීනචොද්‍යයට පරිහාර දක්වන් නාහු "සම්බන්ධො" යනාදී කිහු.

1. සම්බන්ධො පන, (ස්වාම්‍යාදී ලක්ෂණවූ ෂෂ්ඨිප්‍රකාශක) සම්බන්ධය වනාහි; ජාතිවසා, ජාතිවශයෙන්; (හෙවත් ක්‍රියාකාරකසම්බන්ධයටද ෂෂ්ඨී සම්බන්ධයටද සාමාන්‍යබව හෙතු කොටගෙණ) සම්බන්ධසද්දෙනෙව, (ක්‍රියාකාරක ප්‍රකාශකවූ) සම්බන්ධ ශබ්දයෙන්ම; (සඞ්ගය්හන්ති, සඞ්ග්‍රහ කරණුලැබේ;) තෙන, එහෙයින්; (හෙවත් ආදිශබ්දයෙන් උක්ත විභක්ති භෙදයද ජාතිය ආශ්‍රය කොටවූ සම්බන්ධශබ්දයෙන් ෂෂ්ඨී ප්‍රකාශක සම්බන්ධයද සඞ්ගෘහීත හෙයින්) එත්ථ, මේ සම්බන්ධචින්තායෙහි; ක්‍රියා (පාකාදි) ක්‍රියාය; කාරක, (ෂට්) කාරකයෝය; සම්බන්ධ, (ෂෂ්ඨී) සම්බන්ධය; අනුත්තඋත්ත, අනුක්තය උක්තය; විභත්තිභෙද, විභක්තිප්‍රභෙදය; (යන මොහු) කමෙන, පිළිවෙළින්; වුච්චන්ති, කියනු ලැබෙත්.

සියලු ශබ්දජාතිය ම ක්‍රියාප්‍රභාවිතහෙයින් පළමුකොට ක්‍රියාව උද්දිෂ්ටය ක්‍රියාව කාරකසාධ්‍ය හෙයින් තදනන්තර කොට කාරකයෝ උද්දිෂ්ටයහ සම්බන්ධය ක්‍රියා පූර්වකහෙයින් කාරකවිෂය නුයි ක්‍රියාද සම්බන්ධවිභක්තියගේ කාරකවිභක්තීන්හා සහචරත්වය වේනුයි ක්‍රියාවද කාරකයන්ට අනන්තරකොට සම්බන්ධයද උද්දිෂ්ටයහ අනුක්ත උක්තතාව ක්‍රියාකාරකසම්බන්ධයන්ගේනුයි තදනන්තරකොට අනුක්ත උක්ත දෙකද අනුක්තාදීන් ප්‍රකාශ කොට විභක්තීන් වන හෙයින් තදනන්තර කොට විභක්තිභෙදයද උද්දිෂ්ටයයි මෙසේ මේ උද්දෙශ ක්‍රමයෙන් නිඃක්ෂෙපයෙහි හෙතු දතයුතු.

උද්දෙශක්‍රමයෙහි ආදිකොට උද්දිෂ්ටක්‍රියාවගේ ස්වරූප දක්වන පිණිස "කත්තුකම්මසං" යනාදි කියනලදී.

කත්තුකම්මණමද්දබ්බං කාරකග්ගාම සාධියං
පදත්ථං ක්‍රියමිච්ඡන්ති තප්පදන්ත්වස්ස දීපකං. 1
එවං ජාතිපදාදයොපි වක්ඛමානජාත්‍යාදි වසෙන. 2

---

1. කත්තුකම්මණං, (දෙවදත්තය ඔදනය යනාදී) කර්තෘ කර්ම දෙදෙනා කෙරෙහි පිහිටියාවූ; අද්දබ්බං, ද්‍රව්‍ය නුවූ; කාරකග්ගාම, කාරක සමූහයා විසින්; සාධියං, සිඬ කටයුතුවූ; පදත්ථං, (ගමනපචනාදී) පදාර්ථය තෙම; ක්‍රියං, ක්‍රියා වූවා (හෙවත්) ක්‍රියා යයි; ඉච්ඡන්ති, (ක්‍රියා ලක්ෂණ දන්නාහු) කැමති වෙත්; අස්ස, මේ (ක්‍රියාර්ථය) සම්බන්ධව; දීපකන්තු, ප්‍රකාශකවූ පදය වනාහි; තප්පදං, (තදර්ථ හෙයින්) ඒ ක්‍රියා පද නම්වේ.

2. වක්ඛමානජාත්‍යාදිවසෙන, වක්ෂ්‍යමාණජාත්‍යාදීන්ගේ වශයෙන්; ජාතිපදාදයොපි, ජාතිපදාදිහුද; එවං, මෙසේ මැයි.

යම්සේ ක්‍රියාව ප්‍රකාශ කරන්නාවූ පදය ක්‍රියා පද නම්වේද? එසේම වක්ෂ්‍යමාණ ලක්ෂණ ඇති ජාතිය ප්‍රකාශ කරන්නාවූ පදය ජාති පද නම. ගුණය ප්‍රකාශ කරන්නාවූ පදය ගුණ පද නම–ද්‍රව්‍යය ප්‍රකාශ කරන් නාවූ පදය ද්‍රව්‍ය පද නම–නාමය ප්‍රකාශ කරන්නාවූ පදය නාම පද නමැයි යනු භාවයි.

මෙයින් පද ප්‍රකාශකවූ අර්ථයාගේ පඤ්චප්‍රකාරවූ අර්ථභෙදයෙන්ම තත්ප්‍රකාශයට අධිගම සිටි පදයාගේ පඤ්චප්‍රකාරත්වයද හැඟවූවා නම්වේ. මේ අර්ථය මේ ශබ්දයාගේය යන ව්‍යපදෙශයද අර්ථයාගේ පද වාච්‍යත්වයෙන් යොග්‍යත්වය ද යනමේ සම්බන්ධ බලයෙන් අර්ථප්‍රතීතිය වේනුයි කියායි.

මෙම කිග.

"ජාතික්‍රියාගුණද්‍රව්‍යං තථා නාමෙති පඤ්චධා
ශබ්දස්‍යාර්ථස්තතෙෂොපි පඤ්චධෛවාත්‍ර භිද්‍යතෙ" ඉති.

ශබ්දස්‍ය අර්ථඃ, ශබ්දයාගේ අර්ථය තෙම; ජාතික්‍රියාගුණද්‍රව්‍යං, ජාතිය ක්‍රියාය ගුණය ද්‍රව්‍යය; තථා, එසේම; නාමෙති, නාමයයි; පඤ්චධා, පඤ්ච ප්‍රකාරයෙකින්වේ; තත්, එහෙයින්; එෂොපි, මේ ශබ්දයද; අත්‍ර, මේ ශබ්දාර්ථ ප්‍රභෙදයෙහි; පඤ්චධෛව, පඤ්චප්‍රකාරයකින් ම; භිද්‍යතෙ, බිඳුනා ලැබේ.

යම්හෙයකින් අර්ථය තෙමේ ජාතිය ක්‍රියාය ගුණය ද්‍රව්‍යය නාමයයි පඤ්චප්‍රකාර විද එහෙයින් අර්ථය ප්‍රකාශ කොට සිටිනා ශබ්දයද ජාති ශබ්දය ක්‍රියාශබ්දය ගුණශබ්දය ද්‍රව්‍යශබ්දය නාමශබ්දයයි පඤ්චප්‍රකාර වෙයි යනුභාවයි.

දැන් යථොක්ත ගාථාවෙහි අනුක්තනි පිණිස "කත්තාච කම්මච" යනාදී කියනලදී–

කත්තාච කම්මඤ්ච කත්තුකම්මානි හෙසු තිඨන්ති සමවෙතිනි කත්තු කම්මඨො දෙවදත්තාදිකත්තුගතො පාදුප්පතනාවපතනාදි ලක්ඛණො ගමනාගමනාදි ඔදනාදිකම්මගතො මුදුතනාදිච ගය්හති-ගාමො යථා සම්භවං. 1

ක්‍රියානිමිත්තං යං කිඤ්චි කාරකං තමුදීරිතං
ක්‍රියාජාතිගුණද්දබ්බනාමතො තච පඤ්චධා. 2

---

1. කත්තාච, කර්තෘද; කම්මඤ්ච, කර්මයද; (යන මොහු) කත්තුකම්මානි, කර්තෘ කර්ම නම්වෙති; හෙසු, ඒ කර්තෘ කර්ම දෙදෙනා කෙරෙහි; තිඨ න්ති-තිඨන්ති යයි සේය, සමවෙතිනි, සමවායට යේනුයි (හෙවත්) පිහිටානුයි; කත්තුකම්මඨො, කර්තෘකර්මස්ථ නම් වේ; (තේ කිමෙක් ද යත්)? දෙව දත්තාදි කත්තුගතො, දෙවදත්තාදි කර්තෘකෙරෙහි පිහිටියාවූ; පාදුප්පත නාවපතනාදි ලක්ඛණො, පාදෝත්පතනාවපතනාදිය ලක්‍ෂණ කොට ඇති (හෙවත්) පාදයන්ගේ නැගිම හෙළීම සවභාව කොට ඇති; ගමනා ගමනාදි, ගමන ආගමනාදියද (හෙවත්) යාම් ඊම් ආදියද; ඔදනාදිකම්ම ගතො, ඕදනාදි කර්මයෙහි පිහිටියාවූ; මුදුතනාදිච, මෘදුත්වාදියද; (හෙ වත් විකෙලදනාඛ්‍යවූ ආර්ද්‍රභාවාදියද) ගය්හති, (කර්තෘස්ථ කර්මස්ථ ක්‍රියා යයි) ගන්නාලදහු.

ගාමො, (කර්තෘාදි) කාරක සමූහය තෙම; යථාසම්භවං, සම්භව වූ පරිද්දෙනී.

එකෙකි ක්‍රියාවක ම ෂට්කාරකය සම්පූර්ණව සම්භව නොවේනුයි යම් යම් ක්‍රියාවෙක් යම් යම් කාරකයෙකින් සිඛ වේද ඒ ඒ ක්‍රියාව ඒ ඒ කාර කයන්ගේ වශයෙන් කාරක සමූහ සාධ්‍ය නම් වනහෙයින් "ගාමො යථා සම්භවං"යනාදි කිහු-මෙතැන්හි ගාමශබ්දය "සත්ත සරා තයො ගාමා" යනාදියෙහි මෙන් සමූහපර්‍ය්‍යායයි—මෙහි "චක්ඛුනා රූපං පස්සති දෙව දත්තො" යන තන්හි කර්තෘස්ථවූ දර්ශනක්‍රියාවට දෙවදත්ත කර්තෘ කාරකය චක්‍ෂුස කරණකාරකය රූපය කර්මකාරකයි. "දෙවද ත්තො කඨෙහි ථාලියං ඔදනං පචති" යන තන්හි කර්මස්ථවූ පචන ක්‍රියා වට දෙවදත්ත කර්තෘකාරකය කාෂ්ඨයෝ කරණකාරකයහ ස්ථාලි ආධාරකාරකය ඔදනසඞ්ඛ්‍යාතවූ තඬුලය කර්මකාරකයි. සෙසුතන් හිදු ඒ ඒ ක්‍රියාවන්ට මෙම නියෙන් කාරක සම්භවය ලැබෙන ලැබෙන පරිද්දෙන් දතයුතු.

2. යං කිඤ්චි, යම්කිසි; (ජාත්‍යාදිඅර්ථජාතයෙක්) ක්‍රියානිමිත්තං, (ගමන පචනාදි) ක්‍රියා සංසිඞියට කාරණාද; තං, හෙතෙම; කාරකං, කාරක වූ යේ (හෙවත්) කාරක යයි; උදීරිතං, කියනලද; තච, ඒ කාරකයද; ක්‍රියා ජාතිගුණද්දබ්බනාමතො, ක්‍රියාය ජාතිය ගුණය ද්‍රව්‍යය නාමය යන භෙදයෙන්; පඤ්චධා, පස් පරිද්දෙකින් වේ.

තෙසු ක්‍රියා වුත්තලක්ඛණාව-1
සෙසෙසු පන—

සාමඤ්ඤං ජාති විපරාවත්ති දබ්බස්සිතො ගුණො
දබ්බං විසෙස්සං යං කිඤ්චි සඤ්ඤිනාමමිදං පන.
පතීතිභෙදං නිස්සාය දබ්බත්ථස්මා විවෙචිතං. 2

---

ක්‍රියා නිෂ්පත්තියට නිමිත්තවූ යම් කිසිවෙක් ඇද්ද ඒ කාරකනම් වෙයි හෙද ක්‍රියා ජාති ගුණ ද්‍රව්‍ය නාමයයි පචප්‍රකාර වෙයි යනු භාවයි.

1. තෙසු, ඒ (ජාත්‍යාදි පස්දෙනා) අතුරෙහි; ක්‍රියා, ක්‍රියා තොමෝ; වුත්ත ලක්ඛණා එව; ("කත්තුකම්මඝම්මදබ්බං" යනාදී) කියනලද ලක්‍ෂණ ඇත්තී මැයි.

මෙතැන්හි "එව" ශබ්දය අයොගව්‍යවච්ඡේදකය අන්‍යයොගව්‍යවච්ඡේදකය අත්‍යන්තායොගව්‍යවච්ඡේදකයයි ත්‍රිවිධ වූයේ විශෙෂණයා කෙරෙන් පර කොට කරණලද හෙයින් අයොගව්‍යවච්ඡේදක වූයේ දතයුතු. මෙහි විශෙෂණයා කෙරෙන් පර කොට කරණලද "එව" කාරය "චෛත්‍රො ධනුර්ධර එව" යන තන්හි සෙයින් අයොගව්‍යවච්ඡේදක වේ. විශෙෂ්‍යයා කෙරෙන් පර කොට කරණලද "එව" කාරය "පාර්ථ එව ධනුර්ධරඃ" යන් තන්හි සෙයින් අන්‍යයොගව්‍යවච්ඡේදක වෙයි. ක්‍රියාවෙන් පර කොට ප්‍රයොග කරණලද "එව" කාරය "නීලං සරොජමෙස්ත්‍යව" යන තන්හි සෙයින් අත්‍යන්තායොගව්‍යවච්ඡේදක වේ. වාක්‍ය යන් ව්‍යවච්ඡේදක ඵල වනබැවින් නිපාතයා ප්‍රයොග නොකළද විවක්‍ෂා වශයෙන් ඔහුගේ අර්ථය ප්‍රතීත වේමැයි.

එයින් කිහු ධර්මකීර්තිපාදයෝ,

"අයොගං යොගමපරෛරත්‍යන්තායොග එව ච
ව්‍යවච්ඡින්නත්ති ධර්මස්‍ය නිපාතො ව්‍යතිරෙචකඃ.
විශෙෂණවිශෙෂ්‍යාභ්‍යාම් ක්‍රියයා ච සහොදිතඃ
විවක්‍ෂාතො ප්‍රයොගෙපි තස්‍යාර්ථොයං ප්‍රතීයතෙ.
ව්‍යවච්ඡේදඵලං වාක්‍යං යතශ්චෛත්‍රො ධනුර්ධරඃ
පාර්ථො ධනුර්ධරො නීලං සරොජමිති වා යථා.
ප්‍රතියොගව්‍යවච්ඡේදස්‍යාප්‍යර්ථෙෂු ගම්‍යතෙ
තථා ප්‍රසිද්ධස්‍යාධර්ම්‍යාවිවක්‍ෂානුගමාත්මනඃ" යි.

2. සෙසෙසු පන, (ක්‍රියාව හැර) සෙසු ජාත්‍යාදීන් අතුරෙන් වනාහි; සාමඤ්ඤං, (සියලු ඛණ්ඩමුණ්ඩාදිවූ විශෙෂණය අනුව පවත්නාවූ ගොත්වාදි) සාමාන්‍යය; * ජාති, ජාති නම්වේ; විපරාවත්ති, (වර්ණාන්තරප්‍රාප්තියෙන්)

---

*(රක්තශ්වෙතාදිභෙදභින්නවූ පුෂ්පයන් කෙරෙහි අනුගතවූ පුෂ්පදමසුතු යන් මෙන් සියලු රක්තශ්වෙතාදීන් භෙදභින්නවූ ගවාශ්වාදි ව්‍යක්තීන් කෙරෙහි අනුගතවූ ජාත්‍යාදී) සාමාන්‍යය—ඇතම් පොත්.

තත්‍ථ විසෙසීයති ව්‍යවච්ඡිජ්ජති කුතොචි කිඤ්චි අනෙනාති විසෙසනං වුත්තලක්ඛණෙන විසෙසනෙන විසෙසීයති අඤ්ඤතො ව්‍යවච්ඡිජ්ජතීති විසෙස්සං. 1

පදානි යානි යානෙව සම්බන්ධං සමුපෙන්ති චෙ
සාමත්‍ථො ගම්‍යතෙ තත්‍ථ විසෙසනවිසෙස්සතා. 2

---

විනශ්වරස්වභාව වූ; දබ්බස්සිතො, (ඝටපටාදි) ද්‍රව්‍යය ආශ්‍රය කළාවූ; (නීලපීතාදි වර්ණය තෙමේ); ගුණො, ගුණ නම්වේ; විසෙස්සං, විශෙෂ්‍යවූ; (ගෙවත් ස්ථානාන්තරයෙන් වෙසෙසියයුතුවූ) යං කිඤ්චි, (ජාත්‍යාදි) යම් කිසි වස්තුවෙක්; දබ්බං, ද්‍රව්‍ය නම්වේ. සඤ්ඤී, සංඥවත්වූ පදාර්ථය තෙම (හෙවත් ප්‍රවෘත්ති නිවෘත්තිලක්ෂණවූ ව්‍යවහාර කරණුලබන්නාවූ දෙවදත්තාදි) සංඥව ඇත්තේ; නාමං, නාම නම්වෙයි; ඉදං පන, මේ නාමය වනාහි; පතීතිභෙදං නිස්සාය, ප්‍රතීතිවිශෙෂය නිසා (හෙවත්) ප්‍රතීතිවිශෙෂය තකා; දබ්බත්‍ථසමා, ද්‍රව්‍යපදාර්ථයා කෙරෙන්; විවෙචිතං, වෙන් කරණලදී.

දැන් යථොක්තවූ ද්‍රව්‍යසඞ්ඛ්‍යාත විශෙෂ්‍යලක්ෂණයෙන් ප්‍රාසඞ්ගිකවූ විශෙෂ්‍යයාගේද තද්විෂයවූ විශෙෂණයාගේද ස්වරූප දක්වන්නාහු-

1. තත්‍ථ, ඒ (යථොක්ත ද්‍රව්‍යස්වභාව විභාවන ප්‍රස්තාවෙහි විශෙෂණ නම් කිමෙක් ද යත්)? අනෙන, මේ (විශෙෂණ වාච්වූ නීලශබ්දයා) කරණකොටගෙණ; කිඤ්චි, (උත්පලාදි) කිසි ද්‍රව්‍ය වස්තුවෙක්; කුතොචි, කිසි (රක්තාදි ප්‍රකාරඇති) වස්තුවක්හු කෙරෙන්; විසෙසීයති–විසෙසීයති යයි සේය; ව්‍යවච්ඡිජ්ජති, පිරිසිඳිනා ලැබේනුයි (හෙවත්) වෙන් කරණු ලැබේනුයි;විසෙසනං ඉති,විශෙෂණ නම්වෙයි කියා–වුත්තලක්ඛණෙන, කියනලද ලක්ෂණඇති; විසෙසනෙන, (නීලාදි) විශෙෂණයා විසින්; විසෙසීයති–විසෙසීයති යයි සේය; අඤ්ඤතො, (නීලාදිප්‍රකාරයෙන්) අන්‍යවූ (රක්තාදි) ප්‍රකාරයක්හු කෙරෙන්; ව්‍යවච්ඡිජ්ජතීති, වෙන් කරණුලැබේනුයි; විසෙස්සං, විශෙෂ්‍ය නම්වේ.

"නීලුප්පලං" යන්නෙහි උත්පලාදි වස්තුව නීලාදිවිශෙෂණයා කරණකොටගෙණ රක්තාදිප්‍රකාරයකින් වෙන් කරණුලැබේනුයි. නීලාදිය විශෙෂණ මැයි මෙසේ උක්තවූ ලක්ෂණඇති මේ නීලාදිවිශෙෂණයා විසින් උත්පලාදි ද්‍රව්‍යය රක්තාදිප්‍රකාරයෙන් වෙසෙසනු ලැබේනුයි උත්පලාදිය විශෙෂ්‍ය නම්වෙයි. යථොක්ත නිර්වචනවයෙන් විශෙෂණශබ්දයා කරණයෙහි නිෂ්පන්නබවද විශෙෂ්‍යශබ්දයා කර්මයෙහි නිෂ්පන්නබවද ප්‍රකාශිතයි. ඒ යථොක්ත ලක්ෂණඇති විශෙෂණ විශෙෂ්‍ය දෙදෙන යම් පදයෙක්හි සම්භව වේද්ද ඒ දක්වත්.

2. යානි යානි එව පදානි, (ස්‍යාද්‍යන්තවූ හෝ ත්‍යාද්‍යන්තවූ හෝ) යම් යම් පදකෙනෙක් ම; සම්බන්ධං, (විශෙෂණ විශෙෂ්‍ය භාවයට යොග්‍යව අන්‍යොන්‍ය) සම්බන්ධයට; චෙ, ඉදින්; සමුපෙන්ති, පැමිණෙද්ද; තත්‍ථ,

පදත්ථො නිස්සයො යො සො ක්‍රියාදීහි යථාරහං
විසෙස්සතෙ'ථ වා තෙහි තෙ'ඤ්ඤනො නිස්සයෙහිපි. 1

තං යථා–යදා ගමනක්‍රියාය විසිට්ඨො පදත්ථො නිස්සයභූතො 'ගිධියතෙ ගො ගච්ඡතීති තදා ක්‍රියා විසෙසනං. 2

---

ඒ (සම්බන්ධොපගත) ශබ්දයන් කෙරෙහි; කාමතො, කාමචාර හෙයින් (හෙවත්) විවක්‍ෂාවූ පරිද්දෙන්; විසෙසනවිසෙස්සානං, විශෙෂණ විශෙෂ්‍යබැව්; ගම්‍යතෙ, දන්නා ලැබේ.

එසේමැයි "නීලුප්පලං" යනමෙහි නිලශබ්දයද උත්පල ශබ්දයද එදෙන උත්පලාඛ්‍යවූ ඒකජලජ වස්තුවෙක්හි පවත්නාහයි ඔවු නොවුන්හා සම්බන්ධයහ මෙහි ශ්වෙත රක්තාදි ගුණයට සාධාරණවූ උත්පලාදි ද්‍රව්‍යය ඒ ශ්වෙතාදින් කෙරෙන් වෙනස්කොට සිටිනා නිලගුණය උත්පලාදි ද්‍රව්‍යයට විශෙෂණවෙයි. භෘඞ්ගාඞ්ගාරාදි ද්‍රව්‍යයන්ට සාධාරණවූ නීලගුණය ඒ භෘඞ්ගාඞ්ගාරාදීන් කෙරෙන් වෙනස්කොට සිටිනුයි. උත්පලාදි ද්‍රව්‍යය්ද නිලගුණයට විශෙෂණවෙයි. මෙසේ විශෙෂණ විශෙෂ්‍යභාවය විවක්‍ෂාවශයෙන් වේ.

සම්බන්ධොපගත පදයන් ක්‍රියාපදාදි පචකයෙන් අව්‍යභිචාරිහෙයින් ප්‍රවෙර්වාඝාන පවවිධවූම පදාර්ථයෙහි විශෙෂණ විශෙෂ්‍යභාවය විවක්‍ෂාවශයෙන් වේ.

1. නිස්සයො, (ක්‍රියාදීන්ට) ආධාරවූ; යො පදත්ථො, (ගවාශ්වාදි) යම් පදාර්ථයෙක් ඇද්ද; සො, ඒ පදාර්ථය තෙම; ක්‍රියාදීහි, ක්‍රියාජාත්‍යාදීන් විසින් (නොහොත්) ක්‍රියාජාත්‍යාදීන් කරණකොටගෙණ; (වක්තෘන් විසින්) යථාරහං, සුදුසු සුදුසු පරිද්දෙන්; (විසෙස්සතෙ, වෙසෙසනු ලැබෙයි;) අථවා, නොහොත්; තෙ, ඒ ක්‍රියාජාත්‍යාදිහු; තෙහි, ඒ ක්‍රියාජාත්‍යාදීන් විසින්ද; අඤ්ඤනො නිස්සයෙහිපි, තමන්ට ආධාරවූ (ගවාශ්වාදි) පදාර්ථයන් විසින්ද; විසෙස්සන්තෙ, වෙසෙසනු ලැබෙත්.

විශෙෂණ විශෙෂ්‍යභාවය වනාහි වක්තෘවිවක්‍ෂාවශයෙන් කිසි කලෙක්හි ක්‍රියාජාත්‍යාදීන් විසින් තමන්ට ආධාරවූ ගවාශ්වාදි ද්‍රව්‍යය වෙසෙසනුලැබෙයි. කිසි කලෙක්හි ක්‍රියාජාත්‍යාදීන් විසින් ක්‍රියාජාත්‍යාදිහු වෙසෙසනුලැබෙති. කිසි කලෙක්හි නිස්සයෙන් (ද්‍රව්‍යයෙන්) ක්‍රියාජාත්‍යාදිහු වෙසෙසනු ලැබෙති යනු මෙහි භාවයි—මේ ගාථාවෙන් දක්වනලද ත්‍රිවිධ විශෙෂණ විශෙෂ්‍යභාවයට ක්‍රමයෙන් උදාහරණ දක්වත්.

2. තං යථා, ඒ මෙසේයි; (විවක්‍ෂා වශයෙන් විශෙෂණ විශෙෂ්‍යභාවය වනපරිදි මෙසේයි)

යදා, යම් කාලෙක්හි; [ගො ගච්ඡති, ගො ගච්ඡා යි කියා; ගමනක්‍රියාය විසිට්ඨො, ගමන ක්‍රියාවෙන් විශිෂ්ටවූ (හෙවත්) වෙසෙසන ලද්දවූ;

යදා ජාතියා ගොති තදා ජාති විසෙසනං–යදා ධවලොති ගුණෙන තදා ගුණො විසෙසනං–යදා විසාණීති විසාණද්දබ්බෙන තදා දබ්බං විසෙසනං–යදා දෙවදත්තොති නාමෙන තදා නාමං විසෙසනං–ක්‍රියාදිහීති ආදිසද්දෙන නාමසඞ්ඛ්‍යාතාය සඤ්ඤාය ච ගහිතත්තා–සබ්බත්ථ ගො පිණ්ඩො විසෙස්සභූතො දබ්බං–1.

---

නිස්සයභූතො, (ඒ ගමන ක්‍රියාවට) ආධාරවූ; පදත්ථො, (ගො) පදාර්ථය තෙමේ; අභිධීයතෙ, කියනු ලැබේද; තදා, එකල්හි; ක්‍රියා, (ගමන) ක්‍රියා තොමෝ; විසෙසනං, විශෙෂණ වන්නීය.

1. යදා, යම් කලෙක්හි; ගොති, ගොයි කියා; ජාතියා, ගො ජාතියෙන් (වෙසෙසන ලද්දවූ ජාතියට ආධාරවූ ගො පදාර්ථය කියනු ලැබේද); තදා, එකල්හි; ජාති, ගො ජාති තොමෝ; විසෙසනං, විශෙෂණ වන්නීයි. ("විසිට්ඨො නිස්සයභූතො" යනුත් හැමතන්හිම යොදනු)

යදා, යම් කලෙක්හි; ධවලොති, ගො ධවලො යි කියා; ගුණෙන, ධවල ගුණයෙන් (විශිෂ්ටවූ ධවල ගුණයට ආධාරවූ පදාර්ථය කියනු ලැබේද); තදා,එකල්හි; ගුණො, ධවලගුණය තෙමේ; විසෙසනං, විශෙෂණ වේ.

යදා, යම් කලෙක්හි; විසාණීති, ගො විසාණී යි කියා; විසාණද්දබ්බෙන, විෂාණද්‍රව්‍යයෙන් (විශිෂ්ටවූ විෂාණද්‍රව්‍යයට ආධාරවූ පදාර්ථය කියනු ලැබේද) තදා, එකල්හි; දබ්බං, විෂාණද්‍රව්‍යය; විසෙසනං, විශෙෂණ වේ.

යදා, යම් කලෙක්හි; දෙවදත්තොති, ගො දෙවදත්තො යි කියා; නාමෙන, නාමයෙන් (විශිෂ්ටවූ ඒනාමයට ආධාරවූ පදාර්ථය කියනුලැබේද); තදා, එකල්හි; නාමං, නාමය තෙම; විසෙසනං, විශෙෂණ වේ; (කුමක්හෙයින්දයත්?) ක්‍රියාදිහීති, ක්‍රියාදිහි යනමෙහි; ආදිසද්දෙන, ආදිශබ්දයෙන්; නාමසඞ්ඛ්‍යාතාය, නාමයයි කියනලද; සඤ්ඤාය ච, සංඥාවද; ගහිතත්තා, ගන්නාලදබව හෙයිනි.

මතාන්තරයක් දක්වන පිණිස හෝ නාමනාමී දෙදෙනාගේ අභෙද විවක්ෂායෙන්හෝ "සඤ්ඤීනාමං" යි ද්‍රව්‍යයම කීහෙයින් "ක්‍රියාදිහි" යන්නෙන්ද ඒ යට්ඨි ද්‍රව්‍යයම ගුණීනුයි නාමනම් සංඥාවය එහෙයින් ඒ නාමයට නිශ්‍රයවූ පදාර්ථය විශිෂ්ටයයි දක්වන්නාහු "ක්‍රියාදිහීහි" යනාදී කීහු.

සබ්බත්ථ, හැමතන්හි; විසෙස්සභූතො, විශෙෂ්‍යවූ; ගො පිණ්ඩො, * ගො දෙහය; දබ්බං, ද්‍රව්‍ය නම් වේ.

---

* "පිණ්ඩො ආජීවනෙ දෙහෙ පිණ්ඩනෙ ගොළකෙ මතො" යනුහෙයින් මේ පිණ්ඩ ශබ්දය දෙහයෙහි වැටෙයි දතයුතු—සමහර.

ක්‍රියාද්‍යත්ථානං ක්‍රියාද්‍යත්ථෙහි යථාරහං විසෙස්සභාවො තු–යද ග මන ජාතියා විසිඨා ගමනක්‍රියා'භිධීයතෙ දෙවදත්තස්ස ගමනන්ති තද ජාති විසෙසනං ක්‍රියා විසෙස්සං දබ්බං. 1

---

මෙහි "ගො ගන්තා" යී කීකල්හි මේ තෙම (ගන්තෘවූ ගො යනු) ස්ථිති ක්‍රියාදියෙකින් යුක්තවූයේ නොවෙයි කියා ගමනක්‍රියාව විසින් ගො පදාර්ථය වෙසෙසනුලැබේනුයි ගමනක්‍රියාව විශෙෂණය ගන්තෘවූ ගො පිඬය විශෙෂ්‍යයි. "ගො" යි කීකල මේ තෙම අශ්වයෙක් නොවෙයි පුරුෂයෙක් නොවෙයි ගො යයි දන්නා ලබනහෙයින් ගො ජාතිය විසින් ගො පදාර්ථය වෙසෙසනු ලැබේනුයි ජාතිය විශෙෂණය ගො පිඬය විශෙෂ්‍යයි.

"ගො ධවලො" යි කීකල මේ තෙම ධවලය කෘෂ්ණ වර්ණාදියක් ඇත්තේ නොවෙයි කියා දන්නාලබනහෙයින් ධවලගුණයෙන් ගො පදාර්ථය වේසේසනු ලැබේනුයි ධවලගුණය විශෙෂණය ගො පිඬය විශෙෂ්‍යයි.

"ගො විසාණී" යි කීකල මේ තෙම විෂාණ ඇත්තේය විෂාණ නැතියේ නොවෙයි කියා දන්නාලබන හෙයින් විෂාණ ද්‍රව්‍යයෙන් ගො පදාර්ථය වෙසෙසනු ලැබේනුයි විෂාණද්‍රව්‍යය විශෙෂණය විෂාණද්‍රව්‍යයට ආධාරවූ ගො පිඬය විශෙෂ්‍යයි.

"ගො දෙවදත්තො" යි කීකල මේ තෙම දෙවදත්තය යන නමක් ඇත්තේය අනික් නමක් ඇත්තේ නොවෙයි කියා දන්නා ලබන හෙයින් නාමයා විසින් ගො පදාර්ථය වෙසෙසනුලැබේනුයි දෙවදත්තනාමය විශෙෂණය ගො පිඬය විශෙෂ්‍යයි හැමතැන්හි විශෙෂ්‍ය වන්නේ ද්‍රව්‍යය යනු මෙහි භාවයි. මෙසේ ක්‍රියාදීන් විශිෂ්ටවූ තන්නිශ්‍රයවූ ද්‍රව්‍යයාගේ විශෙෂ්‍යත්වයද ක්‍රියාදීන්ගේ විශෙෂණත්වයද දක්වා නැවත :—

1. ක්‍රියාද්‍යත්ථානං, ක්‍රියාදි අර්ථයන්ගේ (හෙවත් ක්‍රියා ජාති ගුණ ද්‍රව්‍ය නාම සඞ්ඛ්‍යාත පචාර්ථයන්ගේ); ක්‍රියාද්‍යත්ථෙහි, එම ක්‍රියා ජාත්‍යාදි පචාර්ථයන් විසින්ම; යථාරහං, සුදුසු සුදුසු පරිද්දෙන්; විසෙස්සභාවො තු, විශෙෂ්‍යභාවය වනාහි; (මත්තෙහි 'දඨබ්බො' යනුහා සම්බන්ධයි)

යද, යම් කාලෙක්හි; දෙවදත්තස්ස ගමනන්ති, දෙවදත්තස්ස ගමනං–කියා; ගමනජාතියා විසිඨා, (ශීඝ්‍රමන්ථර කුටිලාදි සර්ව ගමනයට සාධාරණවූ) ගමනජාතිය විසින් වෙන්කරණ ලද්දවූ; ගමනක්‍රියා, ගමනක්‍රියා තොමෝ; අභිධීයතෙ, කියනුලැබේද; තද, එකල්හි; ජාති, (ගමන) ජාති තොමෝ; විසෙසනං, විශෙෂණ වන්නිය; ක්‍රියා, (ගමන) ක්‍රියා තොම; විසෙස්සං, විශෙෂ්‍යවූ; දබ්බං, ද්‍රව්‍ය වේ.

යදා තු ජාතීයා විසිට්ඨො ගුණො'භිධීයතෙ පටස්ස ධවලො ගුණොති තදා ජාති විසෙසනං ගුණො විසෙස්සං දබ්බන්ති ආදිනා දට්ඨබ්බා–1 කාමචාරතො විසෙසනවිසෙස්සතාය ක්‍රියාද්‍යත්ථානං යථාරහං නිස්සයෙහි විසෙස්සතාය දබ්බභාවෙ පන. 2

ගාවස්ස ගමනං ගාවස්ස ජාති ගාවස්ස ධවලො ගුණො ගාවස්ස සිඞ්ගං ගාවස්ස නාමමිච්චාදිකං–3.

---

1. යදා තු, යම් කලෙක්හි; පටස්ස ධවලො ගුණොති, පටස්ස ධවලො ගුණො–කියා; ජාතියා විසිට්ඨො, ධවල ජාතියෙන් විශිෂ්ටවූ; ගුණො, ධවල ගුණය තෙමේ; අභිධීයතෙ, කියනු ලැබේද; තදා, එකල්හි; ජාති, ධවලජාති තොමෝ; විසෙසනං, විශෙෂණ වන්නීය; ගුණො, ධවලගුණය තෙමේ; විසෙස්සං, විශෙෂ්‍යවූ; දබ්බං ඉති, ද්‍රව්‍ය වෙයි යන; ආදිනා, මේ ආදි ක්‍රමයෙන්; දට්ඨබ්බා, දතයුත්තේය.

“ගමනං ධවලො ගුණො” යි මෙපමණ නිර්දේශයකින්ම ජාතියෙන් විශිෂ්ටවූ ක්‍රියාගුණයන් ගම්‍යමානවතුදු ඔවුන්ගේ නිරාශ්‍රය ප්‍රවෘත්තියක් නැතිහෙයින් “දෙවදත්තස්ස ගමනං පටස්ස ධවලො ගුණො” යී නිශ්‍රය සහිතකොට දක්වනලදී මෙහිදු දෙවදත්තයාගේ ගමන ස්ථාන නිෂද්‍ය ශයනය නොවෙයි ගමනමයයි දත්නාලබනහෙයින් ක්‍රියාව ගමන ජාතිය විසින් ශයනාදි ප්‍රකාරාන්තරයෙන් වෙසෙසියයුතුනුයි ගමන ජාතිය විශෙෂණ වෙයි ගමනක්‍රියාව විශෙෂ්‍යවූවා ද්‍රව්‍ය වේ.

පටයාගේ ධවලගුණයයි කිකාල නීලපීතාදි ගුණයෙක් නොවෙයි ධවල ගුණයයි දන්නා ලබනහෙයින් ගුණය ධවල ජාතිය විසින් කෘෂ්ණාදි ප්‍රකාරාන්තරයෙන් වෙසෙසියයුතුනුයි ධවලජාතිය විශෙෂණ වෙයි ධවල ගුණය විශෙෂ්‍යවූයේ ද්‍රව්‍ය වේ.

දැන් ගාථාවෙහි තුන්වැනිව දක්වනලද නිශ්‍රයෙන් ක්‍රියාදීන්ගේ විශෙෂණ විශෙෂ්‍යත්වය දක්වත්.

2. විසෙසන විසෙස්සතාය, විශෙෂණ විශෙෂ්‍යත්වයාගේ; කාමචාරතො, කැමැතිපරිද්දෙන් පැවැත්ම හෙතුකොටගෙණ; ක්‍රියාද්‍යත්ථානං, ක්‍රියා ජාත්‍යාදි අර්ථයන්ගේ; යථාරහං, සුදුසු සුදුසු පරිද්දෙන්; නිස්සයෙහි, ක්‍රියාදීන්ට ආධාරවූ (ගවාශ්වාදි) පදාර්ථයන් විසින්; විසෙස්සතාය, වෙසෙසියයුතුබව හෙතුකොටගෙණ; දබ්බභාවෙ පන, ද්‍රව්‍ය භාවයෙහි (උදහරණ) වනාහි; (“ආදිකං” යනුහා සම්බන්ධයි).

3. ගාවස්ස, ගො පදාර්ථයාගේ; ගමනං, ගමනක්‍රියාවද; ගාවස්ස, ගො පදාර්ථයාගේ; ජාති, ජාතියද; ගාවස්ස, ගො පදාර්ථයාගේ; ධවලො ගුණො, ධවලවූ ගුණයද; ගාවස්ස, ගො පදාර්ථයාගේ; සිඞ්ගං, ශෘඞ්ගයද; ගාවස්ස, ගො පදාර්ථයාගේ; නාමං ඉති, නාමයද යන; ආදිකං, මේ ආදියයි–

සබ්බත්ථ විසෙසනං යථාරහං සකත්ථො–1

“ගාවස්ස ගමනං” යී කීකල ගො පදත්ථයාගේ ගමනය අනිකක්හුගේ ගමනක් නොවෙයි දන්නාලබන හෙයින් ගො පදත්ථයා විසින් නිශ්‍රයානන්තරයෙන් ගමන වෙසෙසනලදනුයි ගමනක්‍රියාවට නිශ්‍රයවූ ගො පදත්ථය විශෙෂණය ඔහු විසින් වෙසෙසනු ලැබේනුයි ගමනය විශෙෂ්‍ය වූයේ ද්‍රව්‍ය වේ.

“ගාවස්ස ජාති” යි කීකල ගො පදත්ථයානේම ජාතිය අනිකක්හුගේ ජාතියෙක් නොවෙයි දන්නාලබනහෙයින් ජාතිය වෙසෙසානුයි ගො පදත්ථය තෙමේ විශෙෂණය ජාති තොමෝ ඔහු විසින් වෙසෙසනුලැබේනුයි විශෙෂ්‍ය වූවා ද්‍රව්‍ය වේ.

“ගාවස්ස ධවලො ගුණො” යී කීකල ධවලගුණය ගො පදත්ථයාගේමය අනිකක්හුගේ නොවෙයි කියා දන්නාලබනහෙයින් ගො පදත්ථය තෙමේ ධවලගුණය වෙසෙසානුයි විශෙෂණය ධවලගුණය තෙම ඔහු විසින් වෙසෙසනු ලැබේනුයි විශෙෂ්‍ය වූයේ ද්‍රව්‍ය වේ.

“ගාවස්ස සිඞ්ගං” යි කීකල ශෘඞ්ග ද්‍රව්‍යය තෙමේ ගො පදත්ථයාගේමය අනිකක්හුගේ නොවෙයි කියා දන්නාලබන හෙයින් ගො පදත්ථය තෙම ද්‍රව්‍යය වෙසෙසානුයි විශෙෂණය ඔහුවිසින් වෙසෙසනුලැබේනුයි ශෘඞ්ගය විශෙෂ්‍ය වූයේ ද්‍රව්‍ය වේ.

“ගාවස්ස නාමං” යී කීකල දෙවදත්තාදි නාමය ගො පදත්ථයාගේමය අනිකක් හුගේ නොවෙයි කියා දන්නාලබන හෙයින් ගො පදත්ථය තෙම නාමය වෙසෙසානුයි විශෙෂණය ඔහුවිසින් වෙසෙසනුලැබේනුයි නාමය තෙම විශෙෂ්‍ය වූයේ ද්‍රව්‍ය වේ එහෙයින් විශෙෂණ විශෙෂ්‍යත්වය කාමචාරය යනු හාවයි.

හුදෙක් ක්‍රියාදින් විසින්ම අර්ථය වෙසෙසිය යුතුවූයේ නොවෙයි ක්‍රියාදි වාචක නාමයන් විසිනුදු යථා සම්භවයවූ තත්තත් පදත්ථය වෙසෙසනු ලැබෙයි දතයුතු.

එහෙයින් කීහ—

“යථාසම්භවං නාමභිඃ ස්වාත්ථස්සෙව එව විශෙෂ්‍යතෙ” ඉති.

1. සබ්බත්ථ, හැමතන්හිම; විසෙසනං, විශෙෂණය තොම; යථා රහං, සුදුසු සුදුසු පරිද්දෙන්; සකත්ථො, ස්වාත්ථ නම් වේ.

සස්ස ඉදං සකො–සකොච සො අත්ථො චාති සකත්ථො–*

මෙහි සක නම් ගවාශ්වාදි ද්‍රව්‍යය තෙමේ මැයි–සකත්ථ නම් ද්‍රව්‍ය නිශ්‍රිත යයි එහෙයින් ක්‍රියාජාත්‍යාදිය ද්‍රව්‍ය නිශ්‍රිත හෙයින් විශෙෂණ වූයේ සකත්ථ නම්වේ–ජාත්‍යාදින්ට නිශ්‍රයවූ ද්‍රව්‍යයවූ කලී විශෙෂණ වූයේද සකත්ථ නම් නොවෙයි හඟවනපිණිස “යථාරහං” යුහු.

* සකො අත්තනියො අත්ථො සකත්ථො–යි ටීකා.

නෙකත්ථවුත්තියා ගොති වුත්තෙ වාචා න ඤායතෙ
ගො වාචාති තු වුත්තෙ'සමා පරියායො ච භෙදකං. 1.

පරිච්ඡින්නමායන්ත්‍යව්‍යවච්ඡින්නත්ථමනෙනෙති පරියායො අභිධානත්ථා සද්දා. 2.

---

හුදෙක් ක්‍රියාද්‍යර්ථයන් විසින්ම සාමාන්‍ය ශබ්දය වෙසෙසනුලබන්නේ නොවෙයි පර්‍යාය ශබ්දයා විසින්ද වෙසෙසනලදනුයි දක්වන්නාහු "නෙකත්ථ වුත්තියා" යි කීහු.

1. නෙකත්ථවුත්තියා, (ගො ශබ්දයාගේ ඉෂ්වාද්‍ය) නෙකාර්ථයෙහි ප්‍රවෘත්තිය හෙතුකොට ගෙණ; ගොති, ගෝ යි කියා; වුත්තෙ, කියනලද කල්හි; වාචා, වාක්තොමෝ; න ඤායතෙ, නොදන්නාලැබේද; ගො වාචාති, ගො වාචා යි කියා; වුත්තෙතු, කියනලද කල්හි වනාහි; (ඤායතෙ, (යම්හෙයකින්) දන්නා ලැබේද;) අසමා, එහෙයින්; පරියායො ච, පර්‍යාය ශබ්දයද; භෙදකං, විශෙෂකයි (හෙවත් විශෙෂණ වේ).

ගවාද්‍යනෙකාර්ථ වෘත්තිවූ ගො ශබ්දයා "ගො" යි කියා ප්‍රයොග කළ කල්හි ගො ශබ්දයාගේ ඉෂ්වාදි දශඅර්ථයෙන් මෙහි කවර අර්ථයෙක් විවක්ෂිත ද්‍යේගෝ යි නොහැඟෙන්නේය "ගො වාචා" යි කියා විශිෂ්ටවූ පර්‍යාය ප්‍රයොගකළ කල්හි මෙතැන ගො ශබ්දයෙන් වාක් ලක්ෂණවූ අර්ථයම කියනු ලැබෙයි පශ්වාදි සෙසු අර්ථයෙක් නොවෙයි කියා ගො ශබ්දයෙන් වාච්‍යවූ අර්ථය "වාචා" යන මේ පර්‍යාය ශබ්ද ප්‍රයොගයා විසින් පිරිසිඳිනු ලැබේනුයි නීලාදි සෙසු විශෙෂණය පරිද්දෙන් පර්‍යාය ශබ්දයද විශිෂ්ටාර්ථ ව්‍යවස්ථාපක හෙයින් විශෙෂණ වෙයි යනු භාවයි.

"ඉෂෞ භූමෞ පශෞ රශ්මෞ දිශි වාචි ජලෙක්ෂණෙ
ස්වර්ගෙ වජ්‍රෙ ච ගො ශබ්දො දශස්වර්ථෙෂු දෘශ්‍යතෙ" ඉති.

ගො ශබ්දඃ, ගො ශබ්දය තෙම; ඉෂෞ, ශරයෙහිද; භූමෞ පෘථිවියෙහිද; පශෞ, ගො පදාර්ථයෙහිද; රශ්මෞ, රශ්මියෙහිද; දිශි, දිශායෙහිද; වාචි, වචනයෙහිද; ජලෙ, ජලයෙහිද; ඊක්ෂණෙ, නෙත්‍රයෙහිද; ස්වර්ගෙ, දෙව්ලොව්හිද; වජ්‍රෙච, විදුරෙහිද යන; දශසු අර්ථෙෂු, මේ දශඅර්ථයෙහි; දෘශ්‍යතෙ, දක්නාලැබේ.

"ගො මණ්ඩල පරිබ්බූළ්හො" යනාදීහන්හි සත්‍රින්කෙරෙහි වැටේ–

මෙසේ "පදත්ථො නිස්සයො" යනාදීන් අර්ථවිශෙෂණ විශෙෂ්‍යත්වයද "නෙකත්ථ වුත්තියා" යනාදීන් ශබ්ද විශෙෂණත්වයද දක්වා දැන් තත් ප්‍රාසඞ්ගිකවූ පර්‍යාය ශබ්දය කුමක්හෙයින් පර්‍යාය නම් විද?

2. අනෙන, මේ (පර්‍යාය ශබ්දයා) කරණකොට ගෙණ; අත්ථං, (විවක්ෂිතවූ) අභිධෙයය; පරිච්ඡින්නං, (අර්ථාන්තර ව්‍යවච්ඡෙදයෙන්) සඳුට

විසෙසෙසු දිස්සමානා යා ලිඞ්ගසඞ්ඛ්‍යාවිභත්තියො
තුල්‍යාධිකරණෙ භීයො කාතබ්බා'තා විසෙසනෙ–1

තං යථා–නීලමුප්පලම්වචාදි *–එත්ථ පන නීලන්ති නීල ගුණෙන නිස්සයො විසෙසිතො තෙන'ස්ස උප්පලෙන තුල්‍යාධිකරණතා සද්දානං හි තුල්‍යාධිකරණතා අත්ථවාරෙන–2

---

කොට; ආයන්ති, ආයන්ති යයි සේය–අවගච්ඡන්තිති, ශ්‍රොතෘහු දනිත් නුයි; පරියායො, පර්‍යාය නම් වේ; (හේ කිමෙක්ද යත්?) අභින්නත්ථො සද්දා, (විශෙෂ්‍යයා කෙරෙන්) වෙන් නුවූ අර්ථ ඇති ශබ්දයයි. †

මෙසේ දක්වනලද විශෙෂණ විශෙෂ්‍ය පදයෝ සමානාධිකරණ පක්ෂයෙහිදු වියයුතු ලිඞ්ගසඞ්ඛ්‍යා විභක්ති නියමය දක්වන්නාහු.

1. විසෙසෙසු, (උත්පලාදි) විශෙෂ්‍යයා කෙරෙහි; දිස්සමානා, දක්නා ලබන්නාවූ; යා ලිඞ්ගසඞ්ඛ්‍යා විභත්තියො, යම් ලිඞ්ගසඞ්ඛ්‍යා විභක්ති කෙනෙක් ඇද්ද; තා, ඒ (විශෙෂ්‍ය ගතවූ) ලිඞ්ගසඞ්ඛ්‍යා විභක්තිහු; තුල්‍යාධිකරණෙ, සමානාධි කරණවූ (හෙවත් තුල්‍යාර්ථවූ); විසෙසනෙ, විශෙෂණයා කෙරෙහි; භීයො, බොහෝ සේ; කාතබ්බා, කට යුත්තාහුයි.

අධිකරීයති නියුජ්ජති අභිධානාය සද්දා අස්මිං අත්ථෙති අධිකරණං–තුල්‍යං සමානං අධිකරණං අත්ථො එතස්මින්ති තුල්‍යාධිකරණං–තස්මිං–‡

අධිකරණ ශබ්දයෙන් මෙතන අර්ථ කියනුලැබේ.

2. තං යථා, හේ මෙසේයි; නීලමුප්පලං ඉති ආදි, නීලමුප්පලං–යන මේ ආදියයි–එත්ථ පන, මෙහි වනාහි; නීලන්ති, නීලං කියා; නීලගුණෙන, නීලගුණයා විසින්; නිස්සයො, (ඒ නීලගුණයට ආධාරවූ උත්පල සඞ්ඛ්‍යාත) නිශ්‍රය තෙම; විසෙසිතො, වෙසෙසෙනලද; තෙන, එහෙයින්; අස්ස, මේ නීලශබ්දයාගේ; උප්පලෙන, උත්පල ශබ්දයාගා; තුල්‍යාධිකරණතා, සමානාර්ථබව වන්නීයි; හි, එසේමැයි; සද්දානං, ශබ්දයන්ගේ; තුල්‍යාධිකරණතා, සමානාර්ථ බැව්, අත්ථවාරෙන, අර්ථමුඛයෙනි; (ශබ්දයන්ගේ තුල්‍යාධි කරණත්වය ද ඔවුන් විසින් වාච්‍යවූ අර්ථයන්ගේ වශයෙන් වන්නේයයි සේයි)

---

* නීලුප්පලන්ති පාඨො දිස්සති නීලමුප්පලන්ති පන පාඨෙන භවිතබ්බං—ටීකා

† වෘක්ෂ ශබ්දයෙන්ද තරුශබ්දයෙන්ද කියනු ලබන්නාවූ එකම ශාඛාදිමත්වූ අර්ථයෙහින් වෘක්ෂ තරු ශබ්ද දෙදෙන පරියාය නම් වෙත්–ගඩලාදෙණිසන්න.

‡ තුල්‍යමෙකමධිකරණමත්ථො යස්ස තං තුල්‍යාධිකරණං—ටීකා.

**තුල්‍යාධිකරණෙති කිං? ගාවස්ස ගමනං රඤ්ඤො ධනමිච්චාදි අතුල්‍යාධිකරණ විසෙසනෙසු නිසෙධනත්ථං–1**

---

යම් උත්පලාදි වස්තුවෙක් නීලවර්ණයෙන් යුක්තවිනම් ඒ නීල වර්ණවත් මිස රක්තාදි වර්ණ ඇත්තේ නොවෙයි නීලස්වභාවයෙන්ම විශිෂ්ටවූයේ පවත්නේ වීනමුත් උත්පලාදි සාමාන්‍ය ශබ්දයෙන් නොදක්නාලැබේනුයි රක්තාදි ස්වභාවයෙන් ව්‍යවච්ඡේද නොකොට නීලස්වභාවයෙන් යුක්තවූ උත්පලාදිය කියන පිණිස නීලශබ්දය විශෙෂණත්වයෙන් හා උත්පලාදිශබ්ද විශෙෂ්‍යත්වයෙන් ප්‍රයොග කරණු ලැබේනුයි මෙහි නීලශබ්දය උත්පල ශබ්දයහට විශෙෂණද වෙයි ගුණවාචී ශබ්දයෝ ගුණගුණී දෙදෙනාගේ අභෙද විවක්ෂායෙන් ගුණීහු කෙරෙහි පවතිත්නුයි නීලශබ්දය නීල ගුණයෙන් යුක්ත උත්පල ද්‍රව්‍යය කියන හෙයින් උත්පලශබ්දය හා තුල්‍යාධිකරණද වෙයි එහෙයින් "උප්පලං" යන විශෙෂ්‍ය ගතවූ නපුංසක ලිඞ්ගයද ප්‍රථමෛක වචනයද විශෙෂණ තුල්‍යාධිකරණවූ නීලශබ්දයෙහි ද ප්‍රයොග කරණු ලැබෙයි යනුභාවයි.

1. තුල්‍යාධි කරණෙති, තුල්‍යාධිකරණෙ යනු; කිං, කුමක් පිණිසද යත්?; ගාවස්ස ගමනං රඤ්ඤො ධනං ඉති, ගාවස්ස ගමනං රඤ්ඤො ධනං යන; ආදි, මේ ආදිවූ; අතුල්‍යාධිකරණ, අසමානාර්ථවූ; විසෙසනෙසු, විශෙෂණයන් විෂයෙහි; නිසෙධනත්ථං, (ලිඞ්ගසඞ්ඛ්‍යා විභක්තීන්) නොවීම ප්‍රයොජනකොට ඇත්තේයි.

මෙහි ගො ශබ්ද රාජශබ්ද දෙදෙනා ගමන ශබ්ද ධන ශබ්ද දෙදෙනා හා අසමානාර්ථවූ වාහු ස්වාම්‍යන්තරයෙන් වෙසෙසත්නුයි අතුල්‍යාධිකරණ විශෙෂණ නම් වෙත්.

"ගාවස්ස ගමනං" යනමෙයින් නිශ්‍රයෙන් ක්‍රියා ජාති ගුණ ද්‍රව්‍ය නාමයන් වෙසෙසනලද තන්හි "ගාවස්ස ගමනං" යනාදින්ගේ භින්නාධිකරණ බව දක්වනලද. "රඤ්ඤො ධනං" යනමෙයින් යථොක්ත විෂයෙන් පිටත් තන්හිදු භින්නාධිකරණත්වය ඇතිබව දක්වනලදී– එසේම හස්ත්‍යශ්වාදීන්ට සාධාරණවූ ගමනද බ්‍රාහ්මණාදීන්ට සාධාරණවූ ධනයද උන්කෙරෙන් වෙන්කොට ගො පදාර්ථයාගේ ගමනයයි රජහුගේ ධනයයි විශෙෂණත්වයෙන් පිහිටුවන හෙයින් "ගාවස්ස" යනු "ගමනං" යන්නට විශෙෂණය "රඤ්ඤො" යනු "ධනං" යන්නට විශෙෂණය එතකුදු උවත් ගො ශබ්දයෙන් වාච්‍යවූ ගො පදාර්ථයද ගමන ශබ්දයෙන් වාච්‍යවූ පාදෙත්ක්ෂෙපනාවපතනාදි ලක්ෂණවූ ගතියද රාජශබ්දයෙන් වාච්‍යවූ නරෙන්ද්‍රාඛ්‍යවූ අර්ථයද ධනශබ්දයෙන් වාච්‍යවූ භොනාඛ්‍යවූ අර්ථයද වෙන වෙන හෙයින් ගො ශබ්ද ගමනශබ්ද දෙදෙනාගේද රාජශබ්ද ධනශබ්ද දෙදෙනාගේද තුල්‍යාධිකරණ බවෙක්

භියෝයාති කිං? ගුණා පමාණං වීසති කටා ඉච්චාදි—1

ඉච්චෙවමෙතාදිසො විසෙසනවිසෙස්සභාවවසප්පවත්තො පඤ්චවිධොපි අත්ථො කරොති කිරියං නිප්ඵාදෙතීති කාරකන්ති වුච්චති—ක්‍රියා නිප්ඵත්ති නිමිත්තන්තාන්‍යත්ථො-2

---

නැත්නුයි විශෙෂ්‍යවූ ගමනශබ්ද ධනශබ්දයන් කෙරෙහි පෙණෙන්නාවූ නපුංසක ලිඞ්ගයද ප්‍රථමෛකවචනයද විශෙෂණවූ ගො ශබ්ද රාජශබ්දයන් කෙරෙහි නොවේ නුයි පුල්ලිඞ්ගම ෂෂ්ඨ්‍යෙකවචනාන්තම වෙත් එහෙයින් මේ උදාහරණවයෙහි විශෙෂණවිශෙෂ්‍ය පදයෝ භින්නාධිකරණ භින්නලිඞ්ග භින්නවිභක්තිකයෝ හයි දතයුතු.

1. භියෝයාති, භියෝයා යන්නෙන්; කිං, ප්‍රයොජන කිමෙක්ද යත්?; ගුණා පමාණං වීසති කටා ඉති, ගුණා පමාණං වීසති කටා යන; ආදී, මේ ආදියයි; ගුණා, ගුණයෝ; පමාණං, ප්‍රමාණයි; වීසති කටා, කටපදත්ථයෝ විස්සෙකි.

"ගුණා පමාණං" යන මෙහි ගුණශබ්දයෙන්ද පමාණශබ්දයෙන්ද එකම ගුණය වාච්‍ය වනහෙයින් තුල්‍යාධිකරණවුවද පමාණශබ්දයා නියත නපුංසකලිඞ්ගහෙයින් ස්වලිඞ්ගයෙන්ම සිට පුල්ලිඞ්ග ප්‍රථමා බහුවචනාන්තවූ ගුණශබ්දයහට විශෙෂණ වෙයි මෙහි ප්‍රමාණය එකක් හෙයින් එකවචනාන්තම වෙයි ගුණශබ්දයාගේ පුම් බහුත්වය තකා පුල්ලිඞ්ගද්‍ බහුවචනාන්තද නොවේ.

"වීසති කටා" යන මෙහි වීසතිශබ්දයෙන්ද කටශබ්දයෙන්ද වීසති සඞ්ඛ්‍යාවෙන් පරිච්ඡින්නවූ කටයන්ම වාච්‍ය වනහෙයින් තුල්‍යාධිකරණවුවද වීසතිශබ්දයා නියත ස්ත්‍රීලිඞ්ග එකවචනාන්ත හෙයින් ස්වලිඞ්ග වචනයෙන්ම සිට පුල්ලිඞ්ග ප්‍රථමා බහුවචනාන්තවූ කටශබ්දයාහට විශෙෂණ වෙයි කටශබ්දයාගේ ලිඞ්ගසඞ්ඛ්‍යා අපෙක්ෂාකොට තෙමේ පුල්ලිඞ්ගද්‍ බහුවචනාන්තද නොවෙයි එහෙයින් මෙහි විශෙෂණ විශෙෂ්‍ය පදයෝ තුල්‍යාධිකරණවුවද භින්නලිඞ්ග භින්නවචනයෝ මැයි–මෙසේම සෙසු තන්හිදු නියත ලිඞ්ගවචන ඇති ශබ්දයෝ ස්වලිඞ්ග වචනයෙන්ම සිට විශෙෂණ වෙති එහෙයින් "භියෝයා" ග්‍රහණය කරණලද යනු භාවයි.

2. ඉච්චෙවං, මෙසේ; විසෙසනවිසෙස්සභාව වසප්පවත්තො, විශෙෂණ විශෙෂ්‍යභාවයාගේ වශයෙන් පැවැත්තාවූ; එතාදිසො, මෙබඳුවූ; පඤ්චවිධොපි අත්ථො, (ක්‍රියා ජාති ගුණ ද්‍රව්‍ය නාම වශයෙන්) පඤ්චප්‍රකාරවූම අර්ථය තෙමේ; කරොති යයි සේය; කිරියං, (ගමනපචනාදිවූ) ක්‍රියාව; නිප්ඵාදෙතීති, නිපදවා නුයි; කාරකන්ති, කාරක යයි; වුච්චති, කියනුලැබෙයි; ක්‍රියා නිප්ඵත්ති නිමිත්තන්ති, ක්‍රියා නිෂ්පත්තියට කාරණ යයි යන; අත්ථො, අර්ථයි.

නනු තප්පභෙදම්'නුවත්තමානො සද්දෙපි සද්ද'ත්ථං වදන්තියාදෙ සියා කාරකතාති? සච්චං සොපි දබ්බපදත්ථසඞ්ගහිතොති න දොසො–1

තස්ස පඤ්චවිධත්ථස්ස කාරකත්තා විසුං විසුං
කම්මාදි කාරකානි ච පච්චෙක'නවත්ථනාමතො.2

---

කාරකශබ්දය නිමිත්තපර්‍යාය වීනම් නියත නපුංසකලිඞ්ගය එසින් පිටත් තන්හි අභිධෙය ලිඞ්ගයි එහෙයින් "කාරකො පුමා කාරකා ඉත්ථි කාරකං කුලං" යි වේ. කාරකය සාධකය නිබ්බත්තකය ක්‍රියා නිමිත්තය යනු සමානාර්ථයි. මෙසේ ක්‍රියාදි වශයෙන් පඤ්චප්‍රකාරවූ අර්ථය කාරක නම් වන පරිදි දක්වා දැන් තත් ප්‍රකාශකවූ ශබ්දයටද කාරකත්වය ප්‍රසඞ්ග කරන්නාහට පරිහාර දක්වත්.

1. තප්පභෙදං, ඒ (ක්‍රියා ජාත්‍යාදි පඤ්චප්‍රකාරවූ අර්ථයාගේ) ප්‍රභෙදය; අනුවත්තමානො, අනුව පවත්නාවූ; (හෙවත් ක්‍රියාශබ්දය ජාති ශබ්දය ගුණශබ්දය ද්‍රව්‍යශබ්දය නාමශබ්ද යයි මෙසේ ශබ්දයාගේ පඤ්චප්‍රකාරවූ අර්ථයෙහි පවත්නාවූ); සද්දෙපි, ශබ්දයෙහිද; සද්දත්ථං වදන්තීති, සද්ද අත්ථං වදති යන; ආදො, මේ ආදියෙහි; කාරකං සියා නනු ඉති, කාරක වන්නේ වේද යත්? සච්චං, සැබව; සොපි, ඒ ශබ්දයද; දබ්බපදත්ථසඞ්ගහිතොති, ද්‍රව්‍ය පදාර්ථයෙහි සඞ්ග්‍රහ කරණලදනුයි; න දොසො, (ඒ පඤ්චවිධවූ අර්ථය කාරක යයි කීම) දොෂ නොවේ.*

2. තස්ස පඤ්චවිධත්ථස්ස, ඒ (ක්‍රියා ජාත්‍යාදි) පඤ්චප්‍රකාරවූ අර්ථයාගේ; විසුං විසුං, වෙන වෙනම; කාරකත්තා, කාරකබව හෙතුකොට ගෙණ; පච්චෙකං, (ක්‍රියාජාත්‍යාදීන් කෙරෙන්) එකෙක්එකෙක්ම; අනවත්ථනාමතො, අර්ථානුගතසංඥ වශයෙන්; කම්මාදී, කර්මාදි නම්වූ; කාරකානි ච, කාරකයෝ සදෙනෙක් වෙත්.

ක්‍රියා කාරකය ජාති කාරකය ගුණ කාරකය ද්‍රව්‍ය කාරකය නාම කාරක යයි මෙසේ ක්‍රියාද්‍යර්ථපඤ්චකය වෙන වෙනම සාමාන්‍යයෙන් කාරක නම් වන හෙයින් ක්‍රියාදීන් අතුරෙන් එකෙක්එකෙක්ම අනවර්ථසංඥ වශයෙන් කර්මය කර්තෘය කරණය සම්ප්‍රදානය අවධිය ආධාර යයි කාරකයෝ අවිශෙෂයෙන් ෂට් ප්‍රකාරවෙති විශෙෂයෙන් වනාහි ක්‍රියා කර්මය ක්‍රියා කර්තෘය යනාදීන් වෙන වෙනම සදෙනෙක් වෙති යනු භාවයි.

"පාකං කරොති පාකෙන කතං පාකෙන සුඛි භවති පාකස්ස දෙති පාකා අපෙති පාකෙ පතිට්ඨිතං" † යි මෙසේ එකම ක්‍රියාවෙහි කාරක ෂට්කය යම් ලෙසක වේද? එසේම ජාත්‍යාදී යෙහිද ලභ්‍යමාන වශයෙන් යෙදියයුතු.

---

* "ප්‍රශ්නාවධාරණානුඥ සම්පාදො භවෙත්තනු" යනු මෙතෙන ප්‍රශ්නයෙහි වැටෙයි. † පාකෙ පසීදති–සමගර.

තත්‍ථ.

කම්මං තදුච්චතෙ කත්තු යං ක්‍රියාය කරීයති
නිබ්බත්ති විකතිප්පත්ති භෙදෙනෙතං තිධා මතං. 1

තත්‍ථ යං නිබ්බත්තීයති නිප්ඵාදීයත්‍යවිජ්ජමානමෙව සා නිබ්බත්ති-යථා කටං කරොති දෙවදත්තොති-2

යං විකරීයන්ති විජ්ජමානමෙව පාකාදි ක්‍රියාය'ඤ්ඤථා කරීයති සා විකති-යථා ඔදනං පචති සූදොති-3

---

මෙසේ ක්‍රියා කාරක විභාගය සංක්‍ෂෙපයෙන් දක්වා දූන් එම කර්‍මාදීන්ගේ නිර්‍වෘත්‍යාදි විකාර්‍ය්‍යාදි භෙද දක්වමින් තත්තත් කාරකයන්ගේ ඒ ඒ ක්‍රියාවන්හා යොගය "කටං කරොති දෙවදත්තො" යනාදි තත්තත් කර්‍මාදි භෙදොදාහරණ සන්‍දර්‍ශනව්‍යාජයෙන් දක්වන්නානු "තත්‍ථ" යනාදි සූත්‍ර.

1. තත්‍ථ, ඒ (කර්‍මාදි කාරකයන් සදෙනා අතුරෙන් කර්‍මය කිමෙක්ද යත්?); කත්තු, කර්‍තෘහුගේ; ක්‍රියාය, (කර්‍තෘස්ථවූ හෝ කර්‍මස්ථවූ හෝ ගමනපචනාදි) ක්‍රියායෙන්; යං, යම් වස්තුවෙක්; කරීයති, කරණු ලැබේද; (හෙවත් සම්බන්‍ධකරණු ලැබේද) තං, ඒ වස්තුව; කම්මං, කර්‍ම යයි; උච්චතෙ, කියනුලැබේ; එතං, මේ කර්‍මකාරකය තෙමේ; නිබ්බත්තිවිකතිප්පත්තිභෙදෙන, නිර්‍වෘත්තිකර්‍මය විකෘතිකර්‍මය ප්‍රාප්තිකර්‍මය යන භෙදයෙන්; තිධා, තුන් පරිද්දෙකින්; මතං, දන්නාලදී.

කර්‍තෘහු විසින් සාධ්‍ය හෙයින් කර්‍තෘහු සම්බන්‍ධවූ ගමනපචනාදි ක්‍රියායෙන් යම් කිසි පදාර්‍ථයෙක් සම්බන්‍ධකරණුලැබේද හේ කර්‍ම නම් වෙයි හෙද නිර්‍වෘත්‍යාදි වශයෙන් ත්‍රිවිධ වේ.

2. තත්‍ථ, ඒ ත්‍රිවිධ කර්‍මයන් අතුරෙන්; යං, යම් වස්තුවෙක් තෙම; නිබ්බත්තීයති, යයි සේය; අවිජ්ජමානමෙව, (පෙර) අවිද්‍යමානවූ සේම; නිප්ඵාදීයති, නිපදවනු ලැබේද; සා නිබ්බත්ති, හෝ නිර්‍වෘත්ති නම් වා; යථා, ඒ මෙසේ කි; "කටං කරොති දෙවදත්තොති" යන මෙහි කටයයි; (මෙහි කටය තෙම පෙර අවිද්‍යමානවූ සේම තෘණයෙන් නිපදවනුලැබේ නුයී නිර්‍වෘත්ති කර්‍ම නම් වේ) දෙවදත්තො, දෙවදත්ත තෙම; කටං, කටය (කළාල); කරොති, කෙරේ.

3. යං, යම් වස්තුවෙක්; විකරීයති, යයි සේය; විජ්ජමානමෙව, (පෙර) විද්‍යමානවූ සේම; පාකාදි ක්‍රියාය, පාකාදි ක්‍රියායෙන්; අඤ්ඤථා කරීයති, අනික් පරිද්දෙකින් කරණු ලැබේද; (හෙවත් පූර්‍වාවස්ථාවෙන් අන්‍යාවස්ථාවකට පමුණුවනු ලැබේද)* සා, හෝතොමෝ; විකති, විකෘති නම් වා-යථා, මෙසේකි; "ඔදනං පචති සූදොති" යන මෙහි ඔදන යයි.

---

* අවස්ථාන්තරයකට පමුණුවනු ලැබේද යුතැනි-සමහර

යන්තූභයව්‍යතිරේකෙන පාපියති දස්සනාදිකිරියාය විසයීකාරියති සා පත්ති–යථා ආදිච්චං පස්සති දෙවදත්තොත්‍යාදි.1

කරණාදිපුරෙක්ඛාරොභයං යො කුරුතෙ ක්‍රියං
සකත්තා'යං සප්පධානප්පයොජකවසා ද්විධා. 2

නනු සාමග්ගියායත්තත්තා ක්‍රියා නිප්ඵත්තියා කාරකන්තරානම්පි කත්තුත්තප්පසඞ්ගතො ජබ්බිධත්තං න සියාති? සච්චං–තථාපි. 3

---

(මෙහි ඔදන නම් තඬුලය ඒ තඬුලය විද්‍යමානවූයේම පාකාදි ක්‍රියායෙන් අනික් පරිද්දෙකින් කරණු ලැබේනුයි විකෘති නම් වේ.) සූදො, සූද තෙම; ඔදනං, තඬුලය; පචති, පිසේ.

1. යන්තු, යම් වස්තුවෙක් වනාහි; උභයව්‍යතිරෙකෙන, නිර්වෘත්ති විකෘතිවයෙන් වෙන්ව පැවැත්ම හෙතුකොට ගෙණ; පාපියති, යයි සේය; දස්සනාදි ක්‍රියාය, දශීනාදි ක්‍රියායෙන් විසයීකාරියති, විෂය කරණු ලැබේද; සා පත්ති, හෝ ප්‍රාප්ති නම් වා– "යථා ආදිච්චං පස්සති දෙවදත්තො" යන මෙහි ආදිත්‍ය යායි (මෙහි ආදිත්‍ය තෙම අපූර්වවූයේ නොද කරණු ලැබෙයි නොද අනික් පරිද්දෙකින් කරණු ලැබෙයි විද්‍යමානවූයේම හුදෙක් දශීන ක්‍රියාවෙන් විෂය කරණු ලැබේනුයි ප්‍රාප්තිකර්ම නමි.) දෙවදත්තො, දෙවදත්ත තෙම; ආදිච්චං, සූය්‍යීා; පස්සති, බලා.

ශාස්ත්‍රාන්තරයෙහි ඊප්සිත කර්මය අනීප්සිත කර්මය නෛවේප්සිත කර්මය නානීප්සිත කර්මය කර්තෘ කර්මය කථිතාකථිත කර්මය අභිහිතානභිහිත කර්මයයි කර්මය සප්තවිධකොට කියති ඒ මේ නිර්වෘත්ත්‍යාදි ත්‍රිවිධ කර්මයෙහි ම අන්තර්ගත නුයි වෙන්කොට නොදක්වන ලදී–පරව්‍යාකරණයෙහි මේ කර්මකාරකය ව්‍යාප්‍යකාරකයයි කියත්.

දැන් කර්තෘකාරකය දක්වත්.

2. කරණාදිපුරෙක්ඛාරො, කරණාදි කාරකයන්ට අග්‍රෙසරවූ (හෙවත් පෙරදැරිවූ); යො, යමෙක් තෙම; උභයං ක්‍රියං, (කර්තෘසථය කර්මසථය යන) උභය ක්‍රියාව; කුරුතෙ, කෙරේද; සො, හෙතෙම; කත්තා, කර්තෘ නම් වෙයි; අයං, මේ කර්තෘ තෙම; සප්පධානප්පයොජකවසා, ස්වප්‍රධානකර්තෘය ප්‍රයොජක කර්තෘය යන මොවුන්ගේ වශයෙන්; ද්විධා, දෙපරිද්දෙකින් වේ.

දැන් යථොක්ත කර්තෘත්වය ක්‍රියා සංසිද්ධිකරණ සාමාන්‍යයෙන් සියලු කාරකයන්ටම ප්‍රසඞ්ග කරන්නාවූ චොදකයාගේ චොදනාවද තන්නිරාකරණ පරිහාර දක්වන්නාහු. "නනු" යනාදී කීහු.

3. ක්‍රියා නිප්ඵත්තියා, ක්‍රියානිෂ්පත්තිය තමා; *සාමග්ගියායත්තත්තා, කාරක සාමාග්‍රිය අයත් බව හෙතුකොට ගෙණ;† කාරකන්තරානම්පි,

---

* ක්‍රියා සංසිද්ධියගේ–ඇතම් පොත්.
† කාරක සමූහ ප්‍රතිබද්ධ බව හෙතුකොට ගෙණ.

පධානභාවෙන'යෙව ක්‍රියා කරණමිච්චයං
කත්තා න'ඤ්ඤම්පි අඤ්ඤෙසං තං තං කාරක භාවතො. 1

(කර්තෘහු කෙරෙන් පිටත්) කරණාදිසෙසු කාරකයන්ටද; කත්තුත්ත ප්පසඞ්ගතො, කර්තෘත්ව ප්‍රසඞ්ගයට පැමිණෙන හෙයින්;* ඡබ්බිධත්තං, (කාරකයන්ගේ) ෂට් ප්‍රකාරත්වය; න සියා නනුති, නොවන්නේ වේද යත්?; සච්චං, සැබව; තථාපි, එතකුදුවුවත්.

1. පධානභාවෙන, ප්‍රධාන භාවයෙන්; අයෙව, මේ කර්තෘහුගේම; ක්‍රියාකරණං ඉති, ක්‍රියාව කිරීම වේ නුයි; අයං, මේ තෙම; කත්තා, කර්තෘ නම් වෙයි; අඤ්ඤම්පින, අනිකෙකුදු නොවේ; (කරණාදි අනික් කාරකයෙකුදු කර්තෘ නම් නොවෙයි සේයි) කුමක්හෙයින්දයත්? අඤ්ඤෙසං, සෙසු ඉන්ධනාදීන්ගේ (නොහොත්) සෙසු කරණාදි කාරකයන්ගේ; තං තං කාරක භාවතො, කරණාදි ඒ ඒ කාරකත්වය හෙතුකොට ගෙණයි.

- ක්‍රියා සංසිද්ධිය කාරක සමූහ ප්‍රතිබද්ධ හෙයින් ක්‍රියා සංසිද්ධි නිමිත්තත්වයෙන් සෙසු කාරකයන්හා විශෙෂයෙක් නැත්නුයි ප්‍රධාන වූයේ කර්තෘ යයි කල්පනායෙහි කරණාදි සෙසු කාරකයන්ටද කර්තෘත්වය පැමිණේ නුයි කාරකයන්ගේ ෂඩ් විධත්වය නොවන්නේ වේදයත්? ඉන්ධනස්ථාල්‍යාදීහු ජ්වලනධාරණාදි ක්‍රියාවට සාක්‍ෂාත් කර්තෘවූවාහුම පාකාදි ප්‍රධාන ක්‍රියාවටත් කර්තෘහු නුයි ව්‍යසනව්‍යවූ කර්තෘත්වය ඉන්ධනස්ථාල්‍යාදීන්ට ඇද්ද යම් හෙයකින් ඉන්ධනස්ථාල්‍යාදීහු සම්‍යක්ජ්වලනධාරණාදිය කෙරෙද්ද එහෙයින් ඉන්ධනස්ථාල්‍යාදියෙන් පිසන්නාහු නම් වේ නුයි ඉන්ධනස්ථාල්‍යාදීන්ගේ ව්‍යසනව්‍යවූද ඒ කර්තෘත්වය ඔවුන්ගේ කරණාවධිකරණත්වාදියටම අඞ්ගනුයි අප්‍රධානය කරණත්වාදිය වනාහි ප්‍රධානය එහෙයින් ඉන්ධනස්ථාල්‍යාදීන් සම්‍යක්ජ්වලනධාරණාදි ක්‍රියායෙහි යොදමින් ප්‍රාධාන්‍යයෙන් ක්‍රියාකරණය මොහුගේම යයි මෙම කර්තෘ නම් වෙයි කරණාදිත්වයවූ කල්හි කරණාදිකාරකයන් කෙරෙහිම ප්‍රාධාන්‍යයෙන් විවක්‍ෂිතනුයි කරණාදි අනිකෙකුදු තදඞ්ගවූ කර්තෘත්වය අපෙක්‍ෂාකොට කර්තෘ නම් නොවෙයි. එහෙයින් කාරකයන්ගේ ෂඩ්විධත්වය ඇත්නුයි අභ්‍යුපගම විරොධය නැත යනු භාවයි.

මෙම කිහු.

“යද්‍යප්‍යස්ති හි කර්තෘත්වං ව්‍යත්‍යුතඃ කරණාදිෂු
ක්‍රියාසිද්ධෞ තථාප්‍යෙතදප්‍රධානං පරාඞ්ගතඃ

කරණාදිත්වමන්‍යෙෂු කාරකෙෂු ප්‍රධානතඃ
විවක්‍ෂිතං තදඞ්ගත්තු කර්තෘත්වමුපසර්ජනම්” ඉති. †

* කර්තෘත්වයාගේ පැමිණීම හෙතුකොට ගෙණ.
† කර්තෘත්ව මුපසංඥනම් සි–සමහර.

එවං සබ්බත්ථ යථායොගං වාච්චං. 1

තත්ථ යො යෙන කෙනචි පයුත්තො වා අප්පයුත්තො වා පධානභාවෙන ක්‍රියං කරොති සො සප්පධානො—යථා ඔදනො පච්චතෙ දෙවදත්තෙනාති.2

---

1. එවං, මෙසේම; සබ්බත්ථ, (කරණාදි) හැමතන්හිම; යථායොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; වාච්චං, කිය යුතුයි.

ක්‍රියාසිද්ධිය සාමග්‍ර්‍යාධීන හෙයින් ක්‍රියා නිෂ්පත්ති කරණත්වයෙන් කාරකාන්තරයන් හා විශෙෂයෙක් නැත්නුයි. කර්තෘහුගේ ක්‍රියා සිද්ධියෙහි අත්‍යර්ථොපකාරී වූයේ කරණ යයි කල්පනායෙහි කාරකාන්තරයන්ටද කරණත්වය පැමිණේ නුයි කාරකයන්ගේ ෂඩ්විධත්වය නොවන්නේ වේද යත්? ඒ එසේමය එතකුදුවී නමුත් ප්‍රාධාන්‍යයෙන් මොහුගේම ක්‍රියා සිද්ධියෙහි අත්‍යර්ථොපකාරිත්වය නුයි මෙම කරණ නම් වෙයි සෙස්සවුන්ගේ තත් තත් කාරකත්වය හෙතුකොටගෙණ කර්මාදී අනිකෙකුදු කරණ නම් නොවෙයි එසේමැයි කර්තෘහුගේ ක්‍රියාව හා සම්බන්ධ්‍යමාන වූයේ කර්ම යයි කල්පනාවෙහි කාරකාන්තරයන්ටද කර්මත්වය පැමිණේ නුයි කාරකයන්ගේ ෂඩ්විධත්වය නොවන්නේ වේදයත්? ඒ එසේමය එතකුදුවී නමුත් ප්‍රාධාන්‍යයෙන් මොහුගේම කර්තෘ ක්‍රියාභිසම්බන්ධත්වය නුයි මෙම කර්ම නම් වෙයි සෙසු කාරකයන්ගේ තත් තත් කාරකත්වය හෙතුකොටගෙණ සම්ප්‍රදානාදි අනිකෙකුදු කර්ම නම් නොවෙයි යනාදීන් යෙදෙන යෙදෙන පරිද්දෙන් කියයුතු යයි සේයි.

2. තත්ථ, ඒ (ස්වප්‍රධානවූ ප්‍රධාන කර්තෘන්)දෙදෙනා අතුරෙන්; යො, යමෙක් තෙම; කෙනචි, (සචෙතනවූ හෝ නිශ්චෙතනවූ හෝ) කිසි වස්තුවක්හු විසින්; පයුත්තො වා, මෙහෙයනලද්දේ හෝ; අප්පයුත්තො වා, නොමෙහෙයනලද්දේ හෝ; පධානභාවෙන, (සෙසු කාරකයන්ට වඩා) ප්‍රාධාන්‍යයෙන්; ක්‍රියං, (පාකාදි) ක්‍රියාව; කරොති, කෙරේද; සො, හෙතෙම; සප්පධානො, ස්වප්‍රධාන කර්තෘ නම් වේ; යථා, මෙසේයි; "ඔදනො පච්චතෙ දෙවදත්තෙන" යන මෙහි දෙවදත්තයි. (මෙහි දෙවදත්ත ඉන්ධනස්ථාල්‍යාදීන් ජ්වලනධාරණාදී ක්‍රියායෙහි යොදළින් ප්‍රාධාන්‍යයෙන් පාකාදි ක්‍රියාව කෙරේනුයි ස්වප්‍රධාන කර්තෘ නම් වේ.) දෙවදත්තෙන, දෙවදත්තයාවිසින්; ඔදනො, ඔදනය තෙම; පච්චතෙ, පිසනු ලැබේ.

මෙහි කර්මයෙහි විහිත "තෙ" ප්‍රත්‍යයා විසින් "ඔදනො" යනු උක්තකර්මය "දෙවදත්තෙන" යනු අනුක්ත කර්තෘයි "උක්තෙ කම්මණි ප්‍රථමා" යනුහෙයින් උක්තවූ ඔදන ශබ්දයා කෙරෙන් ප්‍රථමා විභක්ති වේ. "අනුක්තෙ කත්තරි තෘතියා" යනුහෙයින් අනුක්ත කර්තෘවූ දෙවදත්ත ශබ්දයා කෙරෙන් තෘතියා වේ.

යො පනෙතං පයොජෙති සො පයොජකො—සො තිවිධො පෙසකො'ජ්ඣෙසකො'නුකූලොති—තත්ථ යො පේසෙති පභුත්තෙන නියොජෙති සො පෙසකො–යථා කටො කාරියති දාසෙන දෙවදත්තෙනෙත්‍යත්‍ර–දෙවදත්තො–1

යො පන'ජ්ඣෙසති සක්කාරපුබ්බකං නියොජෙති සො'ජ්ඣෙසකො–යථා ඔදනං භොජියති ගුරු සිස්සෙනෙත්‍යත්‍ර. සිස්සො–2

---

1. යො පන, යමෙක් වනාහි; *එතං, මේ(අනන්තරොක්තවූ ස්වප්‍රධාන) කර්තෘහු; පයොජෙති, (ක්‍රියාකරණයෙහි) මෙහෙයාද; සො, හෙතෙම; පයොජකො, ප්‍රයොජක කර්තෘ නම් වේ–සො, ඒ (ප්‍රයොජක කර්තෘ) තෙම; පෙසකො, ප්‍රෙෂකය; අජ්ඣෙසකො, අධ්‍යෙෂකය; අනුකූලොති, අනුකූල යයි; තිවිධො, ත්‍රිවිධ වේ–තත්ථ, ඒ (ත්‍රිවිධ ප්‍රයොජක කර්තෘන්) අතුරෙන්; යො, යමෙක් තෙම; පෙසෙති, යයි සේය; පභුත්තෙන, ප්‍රභුත්වයෙන්; † නියොජෙති, (ක්‍රියා කරණයෙහි) මෙහෙයාද; සො, හෙතෙම; පෙසකො, ප්‍රෙෂක නම්–යථා, මෙසේයි; කටො කාරියති දාසෙන දෙවදත්තෙනෙති–කටො කාරියති දාසෙන දෙවදත්තෙන යන; අත්‍ර, මෙහි; දෙවදත්තො, දෙවදත්තයි. (මෙහි දෙවදත්තතෙම ප්‍රභුත්වයෙන් දාසයා ලවා කටය කරවා නුයි ප්‍රෙෂක නම් වේ.) දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; දාසෙන, දාසයා ලවා; කටො, කටය තෙම; කාරියති, කරවනු ලැබේ.

මෙහි ප්‍රයොජක විෂයෙහි කරණලද “ණි” ප්‍රත්‍යයාන්තයා විසින් “කර” ධාතුහු කෙරෙන් කර්මයෙහි විහිත “ති” ප්‍රත්‍යයා විසින් “කටො” යනු උක්තකර්මය “දාසෙන දෙවදත්තෙන” යනුත් අනුක්ත කර්තෘයි–ප්‍රයොජක විෂය හෙයින් කර්තෘ දෙදෙනෙක්වූ මෙහිද උක්තකර්ම කට ශබ්දයා කෙරෙන් ප්‍රථමාවූව අනුක්ත ප්‍රයොජක කර්තෘවූ දාස ශබ්දයා කෙරෙන්ද දෙවදත්ත ශබ්දයා කෙරෙන්ද තෘතීයා වේ.

2. යො පන, යමෙක් වනාහි; අජ්ඣෙසති, යයි සේය; සක්කාරපුබ්බකං; සත්කාර (ආදර) පෙරදැරි කොට; නියොජෙති, (ක්‍රියායෙහි) මෙහෙයාද; සො, හෙතෙම; අජ්ඣෙසකො, අධ්‍යෙෂක නම්; යථා, මෙසේයි; ඔදනං භොජියති ගුරු සිස්සෙනෙති–ඔදනං භොජියති ගුරු සිස්සෙන යන; අත්‍ර, මෙහි; සිස්සො, ශිෂ්‍යයි. (මෙහි ශිෂ්‍යතෙම අනුභවකරණු පිණිස ආදර සහිතව ගුරු භොජන ක්‍රියා වෙහි යොද නුයි අධ්‍යෙෂක නම් වේ) සිස්සෙන, ශිෂ්‍යයාවිසින්; ගුරු, ගුරු තෙම; ඔදනං, බත; භොජියති; වළඳවනු ලැබේ.

---

* සචෙතනවූ හෝ නිශ්චෙතනවූ හෝ යම් පදාර්ථයෙක් වනාහි–

† ඊශ්වරත්වයෙන්–සමහර.

යො පන පයොජියමානස්සා'නුකූලමත්තභාගී සො'නුකූලො—යථා සුපුත්තෙන ජනකො තොසීයතීත්‍යත්‍ර—සුපුත්තො—1

අජ්ඣාපීයතෙ'ගහිනා භික්ඛු ධම්මමිච්චාදෙ—අචෙතනස්ස පෙසනා'ජ්ඣෙසනා'යොගා'නුකූලො භවත්‍ය'ග්න්‍යාදි-2

---

මෙහිදු ප්‍රයොජකවිෂයෙහි "ණි" ප්‍රත්‍යයාන්තවූ "භුජ" ධාතුහු කෙරෙන් කර්මයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "ගුරු" යනු උක්ත කර්මය "ඔදනං" යනු අනුක්තකර්මය "සිස්සෙන" යනු අනුක්තකර්තෘයි. මෙහි උක්තකර්ම ගුරුශබ්දයාකෙරෙන් ප්‍රථමා විය අනුක්ත කර්ම ඔදනශබ්දයාකෙරෙන් ද්විතියා වුව අනුක්තකර්තෘ ශිෂ්‍යශබ්දයා කෙරෙන් තෘතියා වූ—ආහාරශබ්දයාගේ ප්‍රයොජක විෂයෙහි කර්තෘ ද්විකර්මක හෙයින් ගුරුය ඔදන යයි කර්මද්වයෙක් වි.

1. යො පන, යමෙක් වනාහි; පයොජියමානස්ස, මෙහෙයනු ලබන්නා හට; අනුකූලමත්තභාගී, අනුකූලමාත්‍රභාවයක් සෙවිනේද (හෙවත්) සෙවිනාසුලුද (නොහොත් ප්‍රෙෂණාධ්‍යෙෂණරහිතව) අනුකූලමාත්‍ර යක්ම සෙවිනේද; * සොනුකූලො, හෙ තෙම අනුකූල නම් වේ; යථා, මෙසේයි; සුපුත්තෙන ජනකො තොසීයතීති—සුපුත්තෙන ජනකො තොසීයති යන; අත්‍ර, මෙහි; සුපුත්තො, සුපුත්‍රයි; (මෙහි සුපුත්‍ර තෙම ජනකයාගේ හර්ෂොත්පත්තියෙහි ප්‍රෙෂණාධ්‍යෙෂණයක් නැතිව හුදු අනුකූලමාත්‍රයක් භජනය කෙරේනුයි අනුකූල නම් වේ) සුපුත්තෙන, සුන්දරවූ පුත්‍රයා විසින්; ජනකො, පිතෘතෙම; තොසීයති, සතුටුකර වනු ලැබේ.

මෙහි "තුස තුසියං" යන ධාතුහු කෙරෙන් කර්මයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "ජනකො" යනු උක්තකර්මය "සුපුත්තෙන" යනු අනුක්තකර්තෘයි සචෙතන කර්තෘ විෂයෙහි ප්‍රෙෂකාධ්‍යෙෂකානුකූලත්‍රයම සම්භව වෙයි අචෙතන කර්තෘ විෂයෙහි වනාහි නිශ්චෙතනයාගේ ප්‍රෙෂණාධ්‍යෙෂණයොගයෙක් සම්භව නොවේ නුයි ක්‍රියාවට අවිරොධිත්වයෙන් හුදු අනුකූලමාත්‍රභාවයෙක්ම වෙයි දක්වත්.

2. අජ්ඣාපීයතෙගහිනා භික්ඛු ධම්මමිති—අජ්ඣාපීයතෙගහිනා භික්ඛු ධම්මං යන; ආදෙ, මේආදියෙහි; අචෙතනස්ස, නිශ්චෙතනවූ වහ්න්‍යාදීහු ගේ;පෙසනාජ්ඣෙසනායොගා,ප්‍රෙෂණාධ්‍යෙෂණ ක්‍රියාවක්හා යෙදීමක්

---

* අනුකූල මත්තභාගීති පෙසනාජ්ඣෙසනාදිං අකරොන්තොපි ක්‍රියානිප්ඵත්තිං අනුකූල්‍යං මත්තං භජතීති අනුකූල මත්තභාගී සුපුත්තො හි නජනකං පෙසෙති නපවෙචසති කෙවලං සදචාරවුත්‍යාතුසිං උප්පාදෙන්තො තං තත්‍ථ නියොජෙන්තොවිය හොති ආදිසද්දෙන භික්ඛා වාසයතිච්චාදි ගය්හතෙ—ටීකා.

යං ක්‍රියා සාධනං කත්තු පරං තං කරණං ක්‍රියං
කරොත්‍ය'නෙනෙතෙනත්තු බාහ්‍යබ්භන්තරතො ද්විධා. 1
තත්‍ථ සරීරතො බහිභූතං බාහ්‍යං–යථා–ඵරසුනා රුක්ඛං ඡින්දති දෙවදත්තොති. 2
සරීරනිස්සිතම'බ්භන්තරං-යථා-චක්ඛුනා රූපං පස්සති දෙවදත්තොති.3

---

නැතිහෙයින්; අග්‍යාදි, වග්‍යාදිය තෙම; අනුකූලො භවති, (වග්‍යා ලොකයෙන් හදරණ භික්‍ෂුහුගේ අධ්‍යයන ක්‍රියාවට අනුකූල මාතෘභාවයක් භජනය කිරීමෙන්) අනුකූල නම් වේ–අග්ගිනා, වග්ගිහු විසින්; භික්ඛු, භික්‍ෂු තෙම; ධම්මං, ධර්මය; අජ්ඣාපියතෙ, හදරවනු ලැබේ.

මෙහි කාරිතවිෂයෙහි කරණලද "ණි" ප්‍රත්‍යයෙහිවූ "අජ්ඣාපිත" ධාතුහු කෙරෙන් කර්මයෙහි විහිත "ති" ප්‍රත්‍යයාන්තයා විසින් "භික්ඛු" යනු උක්තකර්මය "ධම්මං" යනු අනුක්තකර්මය "අග්ගිනා" යනු අනුක්තකර්තෘයි.

දැන් කරණ කාරකය දක්වත්.

1. යං, යම් වස්තුවෙක් තෙම; පරං, අත්‍යර්ථයෙන්; කත්තු, (දෙවදත්තාදි)කර්තෘහුගේ; ක්‍රියා සාධනං, (කර්තෘස්ථවූ හෝ කර්මස්ථවූ හෝ) ක්‍රියාවගේ සිඩියට කාරණාද; තං, ඒ (සාධකතම) වස්තුව; අනෙන, මේ (අත්‍යර්ථොපකාරිවූ සාධනයා) කරණකොට ගෙණ; ක්‍රියං, ක්‍රියාව; කරොතීති, (කර්තෘතෙම) කෙරේ නුයි; කරණං, කරණ නම් වේ; එතන්තු, මේ කරණකාරකය වනාහි; බාහ්‍යබ්භන්තරතො, බාහ්‍ය කරණ අභ්‍යන්තරකරණ හෙයින්; ද්විධා, දෙපරිද්දෙකින් වේ.

2. තත්‍ථ, ඒ ද්විවිධකරණයන් අතුරෙහි; සරීරතො, ශරීරයෙන්; බහිභූතං, පිටත්හි වූයේ; බාහ්‍යං, බාහ්‍යකරණ නම් වේ—යථා, මෙසේයි. "ඵරසුනා රුක්ඛං ඡින්දති දෙවදත්තොති" යන මෙහි ඵරසුවයි (මෙහි ඵරසුව තෙම බාහ්‍ය වූයේ කර්තෘහුගේ ඡෙදන ක්‍රියා සිඩියෙහි අතිශයින් උපකාරිවූයේ බාහ්‍යකරණ නම්) දෙවදත්තො, දෙවදත්තතෙම; ඵරසුනා, ඵරසුව කරණකොට ගෙණ; රුක්ඛං, වෘක්ෂය; ඡින්දති, කපා.

මෙහි "ඡිදි ද්වෙධාකරණෙ" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "දෙවදත්තො" යනු උක්ත කර්තෘය "රුක්ඛං" යනු අනුක්ත කර්මය "ඵරසුනා" යනු අනුක්ත කරණයි.

3. සරීරනිස්සිතං, ශරීර නිශ්‍රිත වූයේ; අබ්භන්තරං, අභ්‍යන්තර කරණ නම–යථා, මෙසේයි "චක්ඛුනා රූපං පස්සති දෙවදත්තොති" යන මෙහි චක්‍ෂුසයි. (මෙහි චක්‍ෂුස ශරීර නිශ්‍රිත වූයේ කර්තෘහුගේ දර්ශන ක්‍රියාවට අතිශයින් උපකාර නුයි අභ්‍යන්තර කරණ නම්.) දෙවදත්තො, දෙව්දත්; චක්ඛුනා, චක්‍ෂුස කරණකොට ගෙණ; රූපං, රූපය; පස්සති, දකී.

උක්තානුක්ත අනන්තරොක්ත ක්‍රමයෙන් දතයුතු.

D

සම්මා පදීයතෙ යස්ස සම්පදානං තමා'හු තං
අනුමන්ත'නිරාකත්තා'රාධකානං වසා තිධා. 1

තත්‍ථ අනුමඤ්ඤතීත්‍ය'නුමන්තා–යථා–භික්ඛුස්ස ගුණවා භත්තං දෙති.2
එත්‍ථ විජ්ජමානෙ'පා'නිරාකරණෙ'යම'ධිකම'නුමඤ්ඤති. 3

---

දැන් සම්ප්‍රදාන කාරකය දක්වත්.

1. යස්ස, (සචේතනාචේතනවූද) යමක්හට; සම්මා පදීයතෙ, (පූජානුග්‍රහ බුද්ධියෙන්) මනාකොට දෙනු ලැබේද; තං, ඔහු (හෙවත් ප්‍රතිග්‍රාහක භාවයෙන් අපෙක්ෂිතවූ ඔහු); සම්පදානං, සම්ප්‍රදානවූවා (හෙවත්) සම්ප්‍රදාන කාරකයයි; ආහු, කියති; තං, ඒ (සම්ප්‍රදාන කාරකය) තෙම; අනුමන්තු, අනුමන්තෘය; අනිරාකත්තු, අනිරාකර්තෘය; ආරාධකානං වසා, ආරාධකය යන මොවුන්ගේ වශයෙන්; තිධා, තුන් පරිද්දෙකින් වේ.

2. තත්‍ථ, ඒ සම්ප්‍රදානයන් තුන්දෙනා අතුරෙන්; අනු මඤ්ඤතීති; (ප්‍රතිග්‍රහණාශාවෙන්) සවිකාර කෙරේනුයි (හෙවත්) අනුඥව කෙරේනුයි; අනුමන්තා, අනුමන්තෘ නම–"යථා භික්ඛුස්ස ගුණවා භත්තං දෙති" යන මෙහි භික්ෂුයි. (මෙහි භික්ෂු තෙම භක්තය දෙමි කී කල්හි අනුඥව කොට භක්තය පිළිගණී නුයි අනුමන්තෘ නම්.) ගුණවා, ගුණ ඇති පුරුෂතෙම; භික්ඛුස්ස, භික්ෂුහට; භත්තං, ආහාරය; දෙති, දේ.

මෙහි "දා දානෙ" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "ගුණවා" යනු උක්ත කර්තෘය "භික්ඛුස්ස" යනු අනුක්ත සම්ප්‍රදානය "භත්තං" යනු අනුක්ත කර්මයි.

දැන් අනුමන්තෘඅනිරාකර්තෘ දෙදෙනා ගේම ප්‍රතික්ෂෙපයෙක් නැති බැවින් අනිරාකර්තෘහු හා අනුමන්තෘහුගේ වෙනස කිමෙක්ද? යන් නාහට පරිහාර දක්වන්නාහු.

3 එත්‍ථ, මේ දෙදෙනා කෙරෙහි; අනිරාකරණෙ, අනිරාකරණය (හෙවත්) නොවැළැකිම; විජ්ජමානෙ අපි, විද්‍යමාන කල්හිදු; අයං, මේ (අනුමන්තෘ) තෙම; අධිකං, අධිකයක් (හෙවත්) අධික කොට; අනුමඤ්ඤති, අනුඥව කෙරේ.

අනුමන්තෘ අනිරාකර්තෘ දෙදෙනාහටම අනිරාකරණය ඇතද අනිරාකරණය ඇති හැමතැනම අනුඥව ඇත්තේ නොවෙයි. අනුඥව වූකලී යම් තැනෙක ඇද්ද එහි අනිරාකරණයත් ඇත එහෙයින් හුදු අනිරාකරණ මාත්‍රයක් ඇත්තෝ අනිරාකර්තෘ නම අනුඥවද අනුඥවෙන් සිඩවූ අනිරාකරණයද ඇත්තේ අනුමන්තෘ නම අචෙතනවූ අනිරා කර්තෘට වඩා සචෙතනවූ අනුමන්තෘහුගේ අනුඥව අධිකයක් ඇත්නුයි අනුමන්තෘහට අනිරාකර්තෘ බව නැත යනු භාවයි.

න නිරාකරොතීත්‍ය'නිරාකත්තා–යථා–බොධිරුක්ඛස්ස ජලං දදාති පුරිසොති–ආරාධෙති අපෙක්ඛතීත්‍යා'රාධකො–යථා–යාචකස්ස ධනං දෙති ධනීති. 1

අවධීයති යං කිඤ්චි යතො පුථු කරීයති
ක්‍රියා පුබ්බඞ්ගම'වධි'යං සො චලාචලතො දුධා. 2

තත්‍ථ චලො යථා–ධාවතා'ස්සා පුරිසො පතති. 3

---

1. න නිරාකරොතීති, (දීයමාන වස්තුව) නිරාකරණය නොකෙරේනුයි (හෙවත්) නොවළකානුයි; අනිරාකත්තා, අනිරාකර්තෘ නම් වේ–"යථා බොධිරුක්ඛස්ස ජලං දදාති පුරිසොති"–යන මෙහි බොධිවෘක්ෂයි. (බොධිවෘක්ෂය තෙම ප්‍රතිග්‍රහණාශාවක් නැති හෙයින් ස්වීකාරයකුත් අපේක්ෂණයකුත් නොකොට හුදෙක් දීයමාන ජලය නොවළකානුයි අනිරාකර්තෘ නම) පුරිසො, පුරුෂතෙම; බොධි රුක්ඛස්ස, බොධිවෘක්ෂයට; ජලං දදාති, ජලය දේ.

ආරාධෙති, යයි සේය, අපෙක්ඛතීති, අපේක්ෂණය කෙරේනුයි (හෙවත් සාදරව යාච්ඤා කෙරේනුයි); ආරාධකො, ආරාධක නම්. "යථා යාචකස්ස ධනං දෙති ධනීති" යන මෙහි යාචකයි. (යාචකතෙම දාතෘහු අතින් මට වස්තුවක් දුනමැනවැයි යාච්ඤාකොට ප්‍රතිග්‍රහණය කරණ හෙයින් ආරාධක නම්) ධනී, ධනවත් පුරුෂතෙම; යාචකස්ස, යාචකයාහට; ධනං දෙති, වස්තු දේ.

මෙහිදු උක්තානුක්ත උක්ත ක්‍රම මැයි.

දැන් අවධිකාරකය දක්වත්.

2. යතො, යම් (ග්‍රාමාදි) වස්තුවක්හු කෙරෙන්; යං කිඤ්චි, (සචෙතනා චෙතනාවූද) යම් කිසි වස්තුවෙක්; ක්‍රියාපුබ්බං, ක්‍රියා වට පූර්වඞ්ගම කොට (හෙවත් අප ගමනාදි ක්‍රියානිමිත්තව); අවධියති, යයි සේය– පුථු කරියති, වෙන්කරණු ලැබේනුයි; අයං තු, (අප ගමන ක්‍රියානිමිත්තව වෙන් වන්නාවූ පදාර්ථයන්ට සීමාවූ) මේ වනාහි; අවධි, අවධි නම් වේ; සො, ඒ (අවධිය) තෙම; චලාචලතො, චලාවධි අචලාවධි වශයෙන්; දුධා, දෙපරිද්දෙකින් වන්නේයි.

3. තත්‍ථ, ඔවුන් අතුරෙන්; චලො, චලාවධි තෙම; යථා, මෙසේයි– "ධාවතාස්සා පුරිසො පතති" යන මෙහි දිවන්නාවූ අශ්වයි. (මෙහි දිවන්නාවූ අශ්වතෙම චල වූයේ පතනක්‍රියා ප්‍රවෘත්තියට නිමිත්තනුයි චලාවධි නම්) ධාවතා, දිවන්නාවූ; අස්සා, අශ්වයා කෙරෙන්; පුරිසො, පුරුෂතෙම; පතති, හෙන්නේයි.

මෙහි "පත ගමනෙ" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත 'ති' ප්‍රත්‍යයා විසින් "පුරිසො" යනු උක්ත කර්තෘය "ධාවතා" යනුත් "අස්සා" යනුත් අනුක්තාවධියි.

අවලො යථා–ගාමා අපෙන්ති මුනයො–අයං කායසංසග්ග පුබ්බ කො'වධි උදාහටො බුඩ්ඪසංසග්ගපුබ්බකො තු පුරිසො චොරෙහි භායති'ච්චාදි දස්සිතං. 1

---

1. අවලො, අචලාවධිතෙම; යථා, මෙසේයි–"ගාමා අපෙන්ති මුන යො" යන මෙහි ග්‍රාමයයි—(මෙහි ග්‍රාමය තෙම නිශ්චල වූයේ අප ගමනක්‍රියා ප්‍රවෘත්තියට නිමිත්තනුයි අචලාවධි නම්) මුනයො, මුනිහු; ගාමා, ග්‍රාමයෙන්; අපෙන්ති, පහවෙත්. *

මෙහි 'අප' පූර්වවූ "ඉ අජ්ඣානගතිසු" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත 'අන්ති' ප්‍රත්‍යයා විසින් "මුනයො" යනු උක්ත කර්තෘය "ගාමා" යනු අනුක්තාවධියි.

අයං අවධි, මේ (කියනලද) අවධිතෙම; කායසංසග්ගපුබ්බකො, කායසංශ්ලෙෂය පූර්වාඞ්ගමකොට ඇත්තේ; උදාහටො, උදාහරණ කරණලද; බුඩ්ඪසංසග්ගපුබ්බකො තු, බුඩ්ඪසංසර්ග පූර්වාඞ්ගමවූ අවධියෙහි වනාහි; පුරිසො චොරෙහි භායතීති, පුරිසො චොරෙහි භායති යන; ආදී, මේ ආදිය, දස්සිතං, දක්වනුයි; පුරිසො, පුරුෂතෙම; චොරෙහි, සොරුන් කෙරෙන්; භායති, භයපත් වේ.

"චොරෙහි භායති" යනාදියෙහි චොරාදීන්හා බුඩ්ඪසංසර්ගයට පැමිණ චොරාදීහු නම් ජීවිත විනාශකරන්නාහයි පසුව ඔවුන් කෙරෙන් අප ගමනාකාරවූ උත්‍රස්තතාව හෙතුකොටගෙණ "චොරෙහි" යනාදිය බුඩ්ඪසංසර්ගය නියමකොට ඇති අවධියෙහි උදාහරණය යනු භාවයි.

මෙහි "ඤී භයෙ" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "පුරිසො" යනු උක්ත කර්තෘය "චොරෙහි" යනු අනුක්තාවධියි.

---

* මෙහි අප ගමනය නම් විශ්ලෙෂය එද දෙදෙනෙකු පිළිබඳ වත්මුත් එකෙකු පිළිබඳ වන්නේ නොවෙයි එසේ කල්හි "ගාමා අපෙන්ති මුනයො" යනාදියෙහි ගමින් පහවීම මුනීන්ටද මුනීන්කෙරෙන් පහවීම ගමටද ඇති බැවින් ග්‍රාමය මුනිය යන දෙදෙනම අවධි වුවමනා වේද යත්? කි පරිද්දෙන් අප ගමනය දෙදෙනාටම සමවුවද යමෙක් පූර්වාවස්ථාවෙන් අන්‍යාවස්ථාවකට නොගොස් ස්වස්වරූපයෙන්ම සිටියේ වේද හෙතෙම අවධි නම් වෙයි එහෙයින් ඔවුනොවුන් කෙරෙන් අප ගමනය ග්‍රාම මුනි දෙදෙනාටම ඇත පෙර යම් ස්ථිති ස්වරූපයකින් යුක්තව ගැගෙන ග්‍රාමයම අවධි නම් වෙයි පෙර ඇතිව පෙණෙන ස්ථිති ක්‍රියාවෙන් යුක්තාවස්ථාව හැර පසුව ගමන ක්‍රියාවෙන් යුක්තාවස්ථාවට පැමිණි බැවින් පූර්වාවස්ථාවෙන් පිරිහුනුවා නම්වූ මුනිහු අවධි නම් නොවෙත්.

මෙම කීහු.

"සමේ'ප්‍ය'පගමෙ විශ්‍රාං පුබ්බරූපා යදච්චුතං

ආධාරයති යො කත්තු කම්මං කිරියනිස්සයං
ආධාරොති පවුත්තො'යං ව්‍යාපකෝපසිලෙසිකො
සාමීපිකො ච විසයොචෙවවං සො චතුධා මතො. 1

තත්‍ථ යො ආධෙය්‍යම'භිව්‍යාපෙත්‍වා වත්‍තති සො ව්‍යාපකො–යථා තිලෙසු තෙලමත්‍ථීති–2

---

දැන් ආධාරකාරකය දක්වත්.

1. යො, යම් පදාර්ථයෙක් තෙම; කිරියනිස්සයං, (භවනපචනාදි) ක්‍රියාවටආශ්‍රයවූ (හෙවත් ආධාරවූ); කත්තුකම්මං, කර්තෘ කර්ම දෙදෙනා; ආධාරයති; දරාද; සො, හෙතෙම; ආධාරොති, ආධාරයයි; පවුත්තො. කියනලද; අයං, මේ (ආධාරය) තෙම; ව්‍යාපකොපසිලෙසිකො, ව්‍යාපකාධාර ඖපශ්ලෙෂිකාධාර දෙදෙනද; සාමීපිකොච, සාමීපිකාධාරයද; විසයොචෙති, විෂයාධාරයදැයි; එවං, මෙසේ; චතුධා, සතරපරිද්දෙකින්; මතො, දන්නාලදී.

ක්‍රියාසංසිද්ධි නිමිත්තත්‍වයෙන් කාරක නම් වේනුයි ක්‍රියාවටනිශ්‍රය වූව හුම ආධාරවත් මිස කර්තෘකර්මදෙදෙනාට නිශ්‍රය වූයේ කෙසේ ආධාර නම් වේද යත්? ක්‍රියාව තමාම අද්‍රව්‍යහෙයින් කර්තෘ කර්මදෙදෙනා විනා ප්‍රවෘත්තියෙක් නැත්නුයි ක්‍රියාවට නිශ්‍රයවූ කර්තෘ කර්ම දෙදෙනා දැරීමෙන් තන්නිශ්‍රයවූ ක්‍රියාවත් දරුවානම් වේනුයි ක්‍රියා නිශ්‍රිතත්‍වවශයෙන් ආධාර නම් වේ.

2 තත්‍ථ, ඒ චතුර්විධ ආධාරයන් අතුරෙන්; යො, යමෙක් තෙම; ආධෙය්‍යං, ආධෙයයා; අභිව්‍යාපෙත්‍වා, ව්‍යාපනය කොට; වත්‍තති, පවතිද; සො; හෙතෙම; ව්‍යාපකො, ව්‍යාපක නම් වේ—"යථා තිලෙසු තෙලමත්‍ථීති" යන මෙහි තිලයෝයි. (මෙහි තිලයෝ තුමූ භවනක්‍රියාවට කර්තෘ ස්වරූපවූ ආධෙයවූ තෛලය එකතැනකුත් නොහැර හැම තැනම ව්‍යාපනය කරන්නාහු ඒ තෛලයාගේ අවස්ථිතියට ආධාර වෙත් නුයි ව්‍යාපකාධාර නම් වෙත්.) තිලෙසු, තිලයන් කෙරෙහි; තෙලං, තෛලය; අත්‍ථි, ඇති.

---

වුච්චතෙ තදපාදනං තං චලාචලතො ද්විධා
යථාස්සා ධාවතා පොසො පතෙ රුක්ඛා ඵලානිති ච" යි

ශාස්ත්‍රාන්තරයෙහි නිර්දිෂ්ටවිෂය උපාත්තවිෂය අනුමෙය විෂයයි දක්වනලද ත්‍රිවිධ අපාදානයද මේ අවධියෙහිම අන්තර්ගතනුයි වෙනම නොදක්වනලදී.

චාන්ද්‍ර මෞද්ගල්‍යායන දෙක්හි මෙයට අවධිකාරකයයි කියති පාණිනි කාත්‍යායන දෙක්හි අපාදානකාරකයයි කියත්.

උපසිලෙසො ආධෙය්‍යෙන සංයොගො තත්‍ථ භවො ඔපසිලෙසිකො–යථා–ථාලියං පචත්‍යොදනං භත්තකාරකොති. 1

අත්‍රොදනසද්දෙ තණ්ඩුලවාචී තස්මා තණ්ඩුලාභිධෙය්‍යෙන කම්මභූතෙන සහොපසිලෙසො අස්සා අත්‍ථීත්‍යොපසිලෙසිකාධාරො ථාලි—සමීපෙ භවො සාමීපිකො–යථා ගඞ්ගායං වජො හොතීති. 2

---

මෙහි “අස භුවි” යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත ‘ති’ ප්‍රත්‍යයා විසින් “තෙලං” යනු උක්ත කර්තෘය “තිලෙසු” යනු අනුක්තාධාරයි.

1. උපසිලෙසො, උපශ්ලේෂ නම්; ආධෙය්‍යෙන, ආධෙය්‍යා හා; සංයොගො, (ආධාරයාගේ) එක්ව යෙදීමය; තත්‍ථ; ඒ (උපශ්ලේෂසඞ්ඛ්‍යාතවූ) සංයොගයෙහි; භවො, වූයේ; ඔපසිලෙසිකො, ඖපශ්ලේෂික නම් වේ. (යමෙක් ආධෙය්‍යා හා උපශ්ලේෂය අනුභවකෙරේද හෙතෙම ඖපශ්ලේෂික නම් වෙයි සේයි) යථා, මෙසේයි–“ථාලියං පචත්‍යොදනං භත්තකාරකො” යන මෙහි ථාලියයි (මෙහි සථාලි තොමෝ පචනක්‍රියාවට නිශ්‍රයවූ තණ්ඩුලාඛ්‍යකර්මය උපශ්ලේෂ කරන්නී තමාකෙරෙහි පිහිටුවානුයි. ඖපශ්ලේෂික නම් වා) භත්තකාරකො, භක්තකාරක-තෙම; ථාලියං, තාලියෙහි;* භත්තං, තණ්ඩුලය; පචති, පිසයි.

මෙහි “පච පාකෙ” යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත ‘ති’ ප්‍රත්‍යයා විසින් “භත්තකාරකො” යනු උක්තකර්තෘය “ථාලියං” යනු අනුක්තාධාරය “භත්තං” යනු අනුක්ත කර්මයි.

දැන් යථොක්තොදාහරණයෙහි ඖපශ්ලේෂිකත්වය ප්‍රකාශ කොට දක්වන්නාහු.

2. අත්‍ර, මේ උදාහරණයෙහි; ඔදනසද්දෙ, ඔදනශබ්දය තෙමේ; තණ්ඩුලවාචී; (යම් හෙයකින්) තණ්ඩුලය කියාද; තස්මා, එහෙයින්; කම්මභූතෙන; (පචනක්‍රියාවට) කර්මවූ; තණ්ඩුලාභිධෙය්‍යෙන, තණ්ඩුලාඛ්‍යවූ ආධෙය්‍යා, සහ, සමග; උපසිලෙසො, උපශ්ලේෂය; අස්සා, මේ සථාලියට; අත්‍ථීති, ඇත්තුයි; ථාලි, සථාලිතොමෝ; ඔපසිලෙසිකාධාරො, ඖපශ්ලේෂිකාධාර නම් වා; සමීපෙ, සමීපදෙශයෙහි; භවො, වූයේ; සාමීපිකො, සාමීපිකාධාර නම් වේ. (යමක්හුගේ සමීප දෙශයෙහි ආධෙය පවතිද හෙතෙම සාමීපිකා නාම් වෙයි සේයි.) “යථා ගඞ්ගායං වජො හොතීති” යනමෙහි ගඞ්ගාවයි. (ගඞ්ගාව සමීපවර්තිනී වූයේම භවන ක්‍රියාවට කර්තෘවූ වජයාගේ ස්ථිතියට හෙතු වන හෙයින් සාමීපික නම්.) ගඞ්ගායං, ගඞ්ගාව සමීපයෙහි; වජො හොති, ගොවුද වෙයි.

---

* සැලෙහි.

මුඛ්‍යාමුඛ්‍යවසා සද්දවොහාරො දුවිධො මතො
මුඛ්‍යං ගඞ්ගාය පානන්ත්‍ය'මුඛ්‍යො'ත්‍රූපචාරතො. 1

මෙහි “භූ සත්තායං” යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත ‘ති’ ප්‍රත්‍යයා විසින් “වජො” යනු උක්තකර්තෘය “ගඞ්ගායං” යනු අනුක්තාධාරයි.

ගඞ්ගාව නම් ජලප්‍රවාහයවුව ගඞ්ගාශබ්දයෙන් ජලප්‍රවාහයම නොකියා ගඞ්ගාවගේ සමීපදෙශය ගඞ්ගායයි කීම කුමක් හෙයින්දැයි යන්නාහට පරිහාර දක්වන්නාහු “මුඛ්‍යාමුඛ්‍යවසා” යනාදී කීහු.

1. සද්දවොහාරො, (සියලු) ශබ්දව්‍යවහාරය තෙම; මුඛ්‍යාමුඛ්‍යවසා, මුඛ්‍යාර්ථ ගෞණාර්ථ වශයෙන්; දුවිධො, ද්විප්‍රකාරවූයේ; මතො, දන්නා ලද; (එහෙයින්) ගඞ්ගාය පානන්ති, ගඞ්ගාය පානං යනමෙහි; මුඛ්‍යං, (ජලප්‍රවාහය ගඞ්ගාශබ්දයාගේ) මුඛ්‍යාර්ථය; අත්‍රතු, (ගඞ්ගායං වජො හොති) යන මෙහි වනාහි; උපචාරතො, මුඛ්‍යවෘත්ත්‍යභා අභෙදධ්‍යාරොපණයෙන්, අමුඛ්‍යො (තත්සමීප ගඞ්ගාශබ්දයාගේ) අමුඛ්‍යාර්ථයි.

සියලු ශබ්දව්‍යවහාරයම-මුඛ්‍යාර්ථගෞණාර්ථ වශයෙන් ද්විප්‍රකාරව පවත්නාහෙයින් “ගඞ්ගාය පානං” යනතන්හි ගඞ්ගාශබ්දය තමා විසින් සාක්ෂාත්වාච්‍ය ජලප්‍රවාහයම කියා සිටිහෙයින් ජලප්‍රවාහය ගඞ්ගාශබ්දයාගේ මුඛ්‍යාර්ථය–“ගඞ්ගායං වජො හොති” යනතන්හි ගඞ්ගාශබ්දය තෙම ගොවිදැක් නම් ගඞ්ගා සමීපයෙහි වත්මුත් ජලප්‍රවාහයෙහි නොවන හෙයින් තමා විසින් මුඛ්‍යකොට වාච්‍ය ජලප්‍රවාහලක්ෂණවූ ගඞ්ගාව හැර උපචාරයෙන් ගඞ්ගාසමීපදෙශය කියානුයි සමීපදෙශය ගඞ්ගාශබ්දයාගේ අමුඛ්‍යාර්ථය යනුහාවයි. *

---

* මෙහි උපචාර නම් අතථාභූත වූයතුහු කෙරෙහි තථාභූතඥාන විශෙෂයි ගේ තාත්ස්ථ්‍යය තාද්ධර්ම්‍යය තත්සාහචර්‍ය්‍යය තත්සාමීප්‍ය යයි චතුර්විධ වේ.

එහි තාත්ස්ථ්‍ය නම් “මඤ්චාඃ ක්‍රොශන්ති ගිරිර්දහ්‍යතෙ” යනාදි තන්හි මඤ්චස්ථ ජනයෝ මඤ්චශබ්දයෙන් කියනුලැබෙති ගිරිස්ථදහණය ගිරිශබ්දයෙන් කියනුලැබේ.

තාද්ධර්ම්‍ය නම් “අග්නිර්මාණවකඃ ගෞර්වාහීකඃ” මෙහි අග්නිධර්ම්ම මානවක අග්නිශබ්දයෙන් කියනු ලැබේ. ගොධර්ම්මවාහීක ගො ශබ්දයෙන් කියනු ලැබේ. මෙතන ධර්ම්මශබ්ද ස්වභාවපර්‍ය්‍යායයි.

තත්සාහචර්‍ය්‍ය නම් “යෂ්ටීන් ප්‍රවෙශය කුන්තාන් ප්‍රවෙශය” මෙහි යෂ්ටි සහ චරිතපුරුෂයෝ යෂ්ටිශබ්දයෙන් කියනු ලැබෙති කුන්තසහචරිත පුරුෂයෝ කුන්තශබ්දයෙන් කියනු ලැබෙත්.

තත්සාමීප්‍ය නම් “ගඞ්ගායාං ඝොෂඃ කූපෙ ගර්ගකුලං” මෙහි ගඞ්ගා සමීපවර්ත්තිවූ ඝොෂාධාරදෙශය ගඞ්ගාශබ්දයෙන් කියනු ලැබෙයි කූප සමීපවර්ත්තිවූ ගර්ගකුලනිවාස දෙශය කූපශබ්දයෙන් කියනු ලැබේ මෙසේ භෙදයෙහි අභෙදකල්පනාව උපචාර නම්. “ගඞ්ගායාං ඝොෂඃ” යන තන්හි ඝොෂ නම් ගොපලුගමයි.

විසයො ගොචරො යං විනා'ධෙය්‍යං නප්පවත්තතෙ.
යථා ආකාසෙ පක්ඛිනො චරන්තීති. 1
විසෙසනවිසෙස්සානං සම්බන්ධීනං ක්‍රියාකතො
අස්සෙදම්භාව හෙතු යො සම්බන්ධො නාම'යං මතො. 2
යථා රඤ්ඤො පුරිසො තිට්ඨති. 3

---

1. විසයො, විෂය නම්; ගොචරො, ගොචරයි; (හේ කිමෙක්ද යත්?) යං විනා, යමක්හු හැර; ආධෙය්‍යං, ආධෙයයා; නප්පවත්තතෙ, (සර්වාකාරයෙන් හෝ බාහුල්‍යයෙන් හෝ අනික්තැනෙක) නොපවතීද (ආධෙයයා පවත්නා තැනයයි සේයි.) යථා, හේ මෙසේයි–"ආකාසෙ පක්ඛිනො චරන්ති" යන මෙහි ආකාශයයි (ආකාශය මූර්තිමත් නොවන හෙයින් අනුපශ්ලේෂික වූයේ චරණ ක්‍රියා කර්තෘවූ පක්ෂීන්ගේ ප්‍රවෘත්තිවිෂයත්වයෙන් විෂයාධාර නම්) ආකාසෙ, ආකාශයෙහි; පක්ඛිනො, පක්ෂීහු; චරන්ති, හැසිරෙත්.

මෙහි "චර ගතිභක්ඛණෙසු" යන ධාතුහුකෙරෙන් කර්තෘයෙහි විහිත "අන්ති" ප්‍රත්‍යයා විසින් "පක්ඛිනො" යනු උක්තකර්තෘය "ආකාසෙ" යනු අනුක්තාධාරයි. මෙහි සර්වප්‍රකාරයෙන් ආධෙයයා අනික් තැනෙක නොපවත්නාහෙයින් විෂයව සිටි ආධාර නම් "රූපෙ චක්ඛුනො" යනාදියෙහි රූපාදිය–බාහුල්‍යයෙන් අනික්තැනෙක්හිනොපවත්නාහෙයින් විෂයව සිටි ආධාර නම් "ආකාසෙ පක්ඛිනො චරන්ති" යනාදියෙහි ආකාශාදියයි. *

මෙසේ උද්දේශානුක්‍රමයෙන් ක්‍රියාකාරකසම්බන්ධ විභාගය දක්වා දැන් ෂෂ්ඨීප්‍රකාශ සම්බන්ධස්වරූප දක්වන්නාහු "විසෙසනවිසෙස්සානං" යුහු.

2. සම්බන්ධීනං, (අන්‍යොන්‍ය) සම්බන්ධය ඇත්තාවූ; විසෙසනවිසෙස්සානං, විශෙෂණ විශෙෂ්‍ය දෙදෙනාගේ; ක්‍රියාකතො, (පරිපාලනාදි ලක්ෂණවූ) ක්‍රියාව විසින් කරණලද්දවූ (හෙවත් ජනිතවූ); අස්සෙදම්භාව, මොහුගේ මේ යයි පවත්නාවූ සම්බන්ධ බුද්ධියගේ වීමට; හෙතු, කාරණාවූ; යො, යමෙක් ඇද්ද; අයං, මේ තෙම; සම්බන්ධො නාම, සම්බන්ධ නමැයි; මතො, දන්නාලදී.

3 යථා, මෙසේයි; රඤ්ඤො පුරිසො තිට්ඨති යන්නෙහි "රඤ්ඤො පුරිසො" යනුයි. රඤ්ඤො, රජහුගේ; පුරිසො, පුරුෂ තෙම; තිට්ඨති, සිටිනේයි.

"තිට්ඨති" යනතැන "ඨා ගතිනිවුත්තියං" යන ධාතුහු කෙරෙන් කර්තෘයෙහි විහිත "ති" ප්‍රත්‍යයා විසින් "පුරිසො" යනු උක්තකර්තෘය "රඤ්ඤො" යනු අනුක්ත සම්බන්ධයි.

---

* චාන්ද්‍ර මෞද්ගල්‍යායන දෙක්හි මෙයට ආධාරකාරක යයි කියති පාණිනී කාත්‍යායන දෙක්හි ඕකාශ කාරක යයි කියත්.

අත්‍රා'ස්ස'යමිත්‍ය'ත්ථාන්තරතො ව්‍යවච්ඡින්නො සම්බන්ධනිස්සිතො තතොයෙව සම්බන්ධී පුරිසො විසෙස්සො ව්‍යවච්ඡෙදකො තු සම්බන්ධනිස්සිතො තතොයෙව සම්බන්ධී රාජා විසෙසනං. 1

තෙසං සම්බන්ධනිස්සිතානං සම්බන්ධීනං ක්‍රියං නිස්සාය භවත්‍ය'ඤ්ඤමඤ්ඤාපෙක්ඛලක්ඛණො සම්බන්ධො. 2

තථාහි රාජා පුරිසං පාලෙති තතො 'යමුපකාරසභාවා පාලනක්‍රියා විනාමපි තෙසං සම්බන්ධිනී භවති රක්ඛා හි කරියමානා තංසම්බන්ධිනී පුරිසවිසයත්තා ච පුරිසසම්බන්ධිනී ක්‍රියා'යන්ති. 3

---

* යථොක්තවූ සම්බන්ධස්වරූපයම යථා නිද්දිෂ්ටොදාහරණය හා එක් කොට විස්තරයෙන් දක්වත්.

1. අත්‍රතු, මේ උදාහරණයෙහි වනාහි; අස්ස, මේ රජහුගේ; අයං ඉති, මේ පුරුෂයයි කියා; අත්ථන්තරතො, (බ්‍රාහ්මණාද්‍ය) අර්ථාන්තරයෙන්; ව්‍යවච්ඡින්නො, තොරකරණලද්දවූ; සම්බන්ධනිස්සිතො, සම්බන්ධය ඇසිරුකොට පැවැත්තාවූ; තතොයෙව, එහෙයින්ම, සම්බන්ධී, සම්බන්ධය ඇත්තාවූ; පුරිසො, පුරුෂතෙම; විසෙස්සො, විශෙෂ්‍යය; ව්‍යවච්ඡෙදකො, (පුරුෂයා ස්වාම්‍යන්තරයෙන්) පිරිසිඳිනාවූ; සම්බන්ධනිස්සිතො, සම්බන්ධය ඇසිරුකොට පැවැත්තාවූ; තතොයෙව, එහෙයින්ම; සම්බන්ධී, සම්බන්ධය ඇත්තාවූ; රාජා තු, රජ වනාහි; විසෙසනං, විශෙෂණ වේ.

2. සම්බන්ධ නිස්සිතානං, (අන්‍යොන්‍ය) සම්බන්ධය ආශ්‍රයකළාවූ; තෙසං සම්බන්ධීනං, ඒ (රාජය පුරුෂය යන) සම්බන්ධීන් දෙදෙනාගේ; ක්‍රියං නිස්සාය, (පරිපාල්‍යපරිපාලන ලක්ෂණවූ) ක්‍රියාව නිසා; අඤ්ඤමඤ්ඤාපෙක්ඛලක්ඛණො, ඔවුනොවුන් අපෙක්ෂාකිරිම ස්වභාවකොට ඇති; සම්බන්ධො, සම්බන්ධය තෙම; භවති, වේ.

දැන් සම්බන්ධය ක්‍රියාව විසින්ම ජනිත පරිදි සමර්ථනය කරන්නාහු "තථාහි" යනාදී කීහු.

3. තථාහි, එසේමැයි; රාජා, රජතෙම; පුරිසං, පුරුෂයා; පාලෙති, (යම් හෙයකින්) රක්ෂාකෙරේද; තතො, එහෙයින්; (නොහොත් ඒ රජහු කෙරෙන් පැවැත්තාවූ); උපකාරසභාවා, උපකාරස්වභාවවූ; අයං පාලනක්‍රියා, මේ පාලනක්‍රියා තොමෝ; තෙසං විනාමපි, ඒ (රාජ පුරුෂ) දෙදෙනාගේම; සම්බන්ධිනී භවති, සම්බන්ධය ඇතිවන්නීයි; (ඔවුන් දෙදෙනාම සම්බන්ධය වන්නීයයි සේයි) හි, එසේමැයි; රක්ඛා, රජහු විසින්; කරියමානා, කරණුලබන්නාවූ; අයං ක්‍රියා, මේ

---

* චාන්ද්‍ර මෞද්ගල්‍යායන දෙක්හි මෙයට සම්බන්ධකාරකයයි කියති පාණිනි කාත්‍යා යන දෙක්හිසාමි යයි කියත්.

තස්මා තක්‍රියං නිස්සාය පවත්තමානො අස්සෙදන්ත්‍යෙවං පවත්ත සම්බන්ධබුද්ධිසභාවස්ස හෙතුභූතො පරිපාල්‍යපරිපාලනලක්ඛණො සම්බන්ධො එවං ක්‍රියා ජනිතොති වෙදිතබ්බො. 1

---

(පාලන) ක්‍රියාතොමෝ; තං සම්බන්ධිනිච, ඒ රජහුගේ සම්බන්ධය ඇත්තිද වෙයි; පුරිසවිසයත්තා, පුරුෂයා විෂයකොට ඇතිබව හෙයින්; පුරිස සම්බන්ධිනිච ඉති, පුරුෂයාගේ සම්බන්ධය ඇත්තීද වෙයි කියායි. (රජහු විසින් කරණු ලබන බවහෙයින් රජ සම්බන්ධද වෙයි පුරුෂයා විෂයකොට පවත්නා හෙයින් පුරුෂයා සම්බන්ධද වෙයි සේයි.)

1.තස්මා, එහෙයින් (හෙවත් ක්‍රියාව දෙදෙනාම සම්බන්ධහෙයින්; තක්‍රියං නිස්සාය, ඒ (සම්බන්ධීන් දෙදෙනා අයත් පරිපාලන) ක්‍රියාව නිසා; පවත්තමානො, පවත්නාවූ, අස්සෙදන්ති, මේ මොහුගේයයි; එවං පවත්ත, මෙසේ පැවැත්තාවූ; සම්බන්ධබුද්ධිසභාවස්ස, සම්බන්ධබුද්ධියගේ සද්භාවයට (හෙවත්) සම්බන්ධඥනයාගේ වීමට; හෙතුභූතො, කාරණාවූ; පරිපාල්‍යපරිපාලනලක්ඛණො, පරිපාල්‍යපරිපාලනස්වභාවවූ; සම්බන්ධො, සම්බන්ධය තෙම; එවං, මේ උක්තක්‍රමයෙන්; ක්‍රියාජනිතොති, ක්‍රියාව විසින් උපදවනලද්දයි; වෙදිතබ්බො, දතයුතු..

“රඤ්ඤො පුරිසො” යන මෙහි සම්බන්ධය පරිපාලන ක්‍රියාව විසින් ජනිතනියායයි සේයි. එසේ මැයි “රාජා පාලෙති” කියනලද කල්හි කවරක්හුද පාලනය කරන්නේයයි විශෙෂයෙක්හි අපෙක්ෂාව ඇති කල්හි පුරුෂයා අපෙක්ෂා කරණු ලබනහෙයින් පුරුෂයාහා රජහුගේ සම්බන්ධය වෙයි.

“පුරිසො පාලියති” කියනලදකල්හි කාවිසින් පාලනය කරණු ලැබේදූයි විශෙෂයෙක්හි අපෙක්ෂාව ඇති කල්හි රජහු විසිනැයි අපෙක්ෂා කරණු ලබනහෙයින් රජහු හා පුරුෂයාගේ සම්බන්ධය වෙයි. මෙසේ ඔවුනොවුන් කෙරෙහි අපෙක්ෂාව ලක්ෂණකොට ඇති සම්බන්ධය පරිපාලනක්‍රියාව විසින් වන්නේය “බ්‍රාහ්මණස්ස පුරිසො වෙස්සස්ස පුරිසො” යි කියන්නටද පිළිවන් බැවින් බ්‍රාහ්මණාදීන්ට සාධාරණවූ පුරුෂයා ඒ බ්‍රාහ්මණාදීන් කෙරෙන් වෙනස් කෙරේනුයි රජතෙම විශෙෂණය පුරුෂ වනාහි ඒ බ්‍රාහ්මණාදීන් කෙරෙන් වෙනස්කරණු ලැබේනුයි විශෙෂ්‍ය වෙයි එහෙයින් විශෙෂණවාචීවූ රාජශබ්දයා කෙරෙන්ම ෂෂ්ඨී විභක්ති වෙයි විශෙෂ්‍යවාචිවූ පුරුෂශබ්දයා කෙරෙන් නොවෙයි දතයුතු.

කියේමැනු.

“පාරතන්ත්‍ර්‍යං හි සම්බන්ධස්තත්‍ර ෂෂ්ඨී විධීයතෙ
උපාධිස්ථාන්‍යගමිතො න විශෙෂ්‍යාදිතස්ත්‍රිතඃ” යි–

එවං සබ්බත්ථාපි යථායොගං වාච්චං. 1

යො පන දෙවදත්තො කඩෙහි ථාලියං ඔදනං පචතීත්‍යාදි වාක්‍යෙ ක්‍රියාචාරකො කාරකානමඤ්ඤමඤ්ඤාපෙක්ඛලක්ඛණො ක්‍රියාකාරක සම්බන්ධොනාම නා'යං ජඤ්ඤා විසයො කත්තාදි වචනිච්ඡාය තං තං විභත්තිප්පසඞ්ගතොති. 2

---

1. සබ්බත්ථාපි, හැම සම්බන්ධයෙහිම; යථායොගං, යෙදෙනයෙදෙන පරිද්දෙන්; එවං, මෙසේ; වාච්චං, කිය යුතුයි.

"රඤ්ඤො පුත්තො සද්දස්ස අත්ථො ඛීරස්ස විකාරො දධි තිලානං මුට්ඨි වස්සානං තතියෙ මාසෙ රඤ්ඤො ධනං රුක්ඛස්ස සාඛා රාජස්ස හිරඤ්ඤං" යනාදිවූ ජන්‍යජනක සම්බන්ධය වාච්‍ය වාචක සම්බන්ධය විකාරවිකාරයයි පරිමාණපරිමෙය පූරණ පූසි ස්වාමි සම්බන්ධය අවයව අවයවි ආදෙසාදෙසි ආගමාගමි සම්බන්ධ යනාදි චතුෂ්ෂෂ්ටිප්‍රභෙදවූ සියලු සම්බන්ධයම මෙකිලෙස දතයුතු.

මෙහි සම්බන්ධ සම්බන්ධී වස්තූන් දෙදෙනා කෙරෙන් අනික් සම්බන්ධ නම් වස්තුවෙක් නොදක්නා ලබන්නේ වේද යත්?. එසේවිනම් ව්‍යක්තවූ මේ සම්බන්ධ බුද්ධිතොමෝ සම්බන්ධ සම්බන්ධී දෙදෙනා කෙරෙහි නිෂ්කාරණව කෙසේ වේද? ඉදින් සම්බන්ධබුද්ධිනිෂ්කාරණයෙහි උපදුත් හොත් උත්පත්ති කාරණයක් අපෙක්ෂා නොකරණ හෙයින් හැම කල්හිම උපනමැනව යම් හෙයකින් සම්බන්ධබුද්ධිය උපදිද එහෙයින් ඒ බුද්ධියගේ උත්පත්තියට හෙතුවකුත්වුව මැනව ඒ හෙතුවද මෙහි සම්බන්ධය එහෙයින් සම්බන්ධීන් කෙරෙන් ව්‍යතිරික්තවූ සම්බන්ධය ඇත්තේය. ඉදින් සම්බන්ධබුද්ධිතොමෝ නිමිත්ත නොවෙයි සම්බන්ධීවූ වස්තූන්ද යම් හෙයකින් සම්බන්ධබුද්ධියට කාරණාය එහෙයින් අනික් නිමිත්තයෙකින් ප්‍රයොජන කිම්දැයි යතහොත් එසේද නැති කුමක්හෙයින්ද යත්? අසම්බන්ධවූද වස්තුවයෙහි සම්බන්ධබුද්ධි ප්‍රසඞ්ගය වනහෙයින එහෙයින් යම් කිසි වස්තුවෙක් විශිෂ්ටවූයේම සම්බන්ධබුද්ධියට හෙතුයයි යතහොත් ඒ ඉෂ්ටවූ විශිෂ්ටතාව නම් සම්බන්ධ මය සම්බන්ධබුද්ධියට නිමිත්තවූ වස්තුවය යම් බඳුවූ විශිෂ්ටතා යොගයකින් විශිෂ්ටනම් වීද ඒ විශිෂ්ටතාවන්ගේ අභීහෙයින් සම්බන්ධය නුයි. සම්බන්ධීන් කෙරෙන් ව්‍යතිරික්තවූ සම්බන්ධ ඇත්තේමැයි.

දැන් ක්‍රියාකාරක සම්බන්ධයද අන්‍යොන්‍යාපෙක්ෂා ලක්ෂණවූම එහි ෂෂ්ඨී කුමක්හෙයින් නොවේද යන්නාහට පරිහාර දක්වත්.

2. "දෙවදත්තො කඩෙහි ථාලියං ඔදනං පචති" යන; ආදිවාක්‍යෙ, මේ ආදි වාක්‍යයෙහි; ක්‍රියාචාරකො, ක්‍රියා ප්‍රවෘත්තියට කාරණාවූ;

භෙද්‍ය භෙදක භූතත්‍ථ පදක්ඛ්‍යාතසමාගමා
සමුදෙති සමත්තත්‍ථං වාක්‍යං වොහාරනිස්සිතං. 1

කාරකානං, කාරකයන්ගේ; අඤ්ඤමඤ්ඤපෙක්ඛලක්ඛණො, ඔවුනොවුන් අපෙක්‍ෂාකිරීම ස්වභාව කොට ඇති; ක්‍රියාකාරක සම්බන්ධො නාම, ක්‍රියාකාරක සම්බන්ධ නම් වූ; යො, යම් සම්බන්ධයෙක් ඇද්ද; අයං පන, මේ (ක්‍රියාකාරක සම්බන්ධය) වනාහි; ඡට්ඨියා, ෂෂ්ඨී විභක්තියට; විසයො න, විෂය වූයේ නොවේ; (කුමක්හෙයින්ද යත්)? කත්තාදිවචනිච්ඡායං, කර්තෘාදි වචන විවක්‍ෂාවක් ඇති කල්හි; තං තං විභත්තිප්පසඞ්ගතොති, ඒ ඒ විභක්තීන්ගේ ප්‍රසඞ්ගය හෙයිනි.

සම්බන්ධය අන්‍යොන්‍යාපෙක්‍ෂා ස්වරූපහෙයින් "දෙවදත්තො කාළෙ හි ථාලියං ඔදනං පචති" යනාදි වාක්‍යයෙහිදු ක්‍රියාකාරකයන්ගේ අන්‍යොන්‍යාපෙක්‍ෂාව ඇත්තුයි වෙන වෙනම ෂෂ්ඨී සම්බන්ධය කුමක් පිණිස නොවිද යත්? වක්තෘන් විසින් වක්‍ෂ්‍යමාණ සම්බන්ධය අවිවක්‍ෂිත හෙයින් ෂෂ්ඨී නොවෙයි කර්තෘාද්‍යර්ථය විවක්‍ෂිතහෙයින් දෙවදත්ත ශබ්දයා කෙරෙන් ප්‍රථමාවිභක්තිවුව කාලශබ්දයා කෙරෙන් තෘතීයාවුව ථාලිශබ්දයා කෙරෙන් සප්තමිවුව ඔදන ශබ්දයා කෙරෙන් විතියාවූ.*

දැන් සම්බන්ධ ප්‍රකාශ මුඛයෙන් ප්‍රස්තුතවූ † වාක්‍යයාගේ ලක්‍ෂණ ස්වරූප හෙයින් දක්වත්.

1. භෙද්‍ය භෙදක භූතත්‍ථ, විශෙෂ්‍ය විශෙෂණවූ අර්ථ ඇති; පදක්ඛ්‍යාත, (පදයයි කියනලද්දවූ ස්‍යාද්‍යන්තත්‍යාද්‍යන්තයන්ගේ නොහොත්) ස්‍යාද්‍යන්ත පදයන්ගේහා ආඛ්‍යාත පදයන්ගේ; සමාගමා, සමවාය හෙතුකොටගෙණ (හෙවත් සාධ්‍යසාධක භාවලක්‍ෂණවූ හෝ ක්‍රියාකාරකයන්ගේ අන්‍යොන්‍යාපෙක්‍ෂා ලක්‍ෂණවූ හෝ සම්බන්ධය හෙතුකොටගෙණ); සමත්තත්‍ථං, පරිසමාප්තවූ අර්ථ ඇති (හෙවත් ක්‍රියාකාරක සම්බන්ධ විශෙෂණ විශෙෂ්‍යවූ පරිද්දෙන් පරිපූර්ණවූ අභිධෙය ඇති නොහොත් ආකාඞ්ක්‍ෂාස්පද නොවන්නාවූ); වොහාරනිස්සිතං, (විධිනිෂෙධ ලක්‍ෂණවූ) ලොක ව්‍යවහාරය ආශ්‍රයකොට පැවැත්තාවූ; වාක්‍යං, (එහෙයින්ම පුරුෂයා ප්‍රතිනියතාර්ථයෙහි ප්‍රවෘත්තකවූද නිවෘත්තකවූද) වාක්‍ය පදසමූහය තෙම; සමුදෙති, නිෂ්පන්න වන්නේයි— මේ වාක්‍ය ලක්‍ෂණයි.

---

දැන් ඒ වාක්‍යයද සමාසාදි වශයෙන් අනෙකප්‍රකාරනුයි තත් ප්‍රසඞ්ගයෙන් සමාසාදි ලක්‍ෂණ ස්වරූප හෙයින් දක්වත්. ‡

---

* "එකාඛ්‍යාතො පදචයො සියා වාක්‍යං සකාරකො" යනු හෙයින් "දෙවදත්තො කාළෙහි ථාලියං ඔදනං පචති" යනාදී වාක්‍ය නම් වේ.

† වාක්‍යයන්ගේ ස්වරූප දක්වනු පිණිස "භෙද්‍යභෙදක" යනාදී කියන ලදී–සම්භර.

‡ මෙසේ ක්‍රියාකාරක සම්බන්ධ ෂෂ්ඨීසම්බන්ධ ස්වරූපවිභාග දක්වා දැන් ඔවුන්ගේම අනුකූලත්වය යම් සමාසාදියෙකින් වේද ඒ සමාසාදීන් ස්වරූපහෙයින් දක්වන්නෝ "විසෙසනවිසෙස්සානං" යනාදී සූත්‍ර—සම්භර පොත්.

විසෙසනවිසෙස්සානම'භින්නත්ථපරත්තනං
එකත්ථතා'න්වත්ථතො'ස්සා චත්ථස්සාපි සමාසතා. 1

---

1. විසෙසනවිසෙස්සානං, විශෙෂණවිශෙෂ්‍ය පදයන්ගේ; අභින්නත්ථ පරත්තනං, අභින්නාර්ථපරත්වය (හෙවත් එකම අර්ථයක් ප්‍රධාන කොට ඇතිබව); එකත්ථතා, එකාර්ථතා නම් වෙයි. (මෙහි විශෙෂණ විශෙෂ්‍යයෙන් වාච්‍යවූ අර්ථයන් දෙදෙනා කෙරෙන් කවර එකම අර්ථයක් ප්‍රධාන වේද යත්? විශෙෂණ විශෙෂ්‍යයන්ගේ එකාර්ථ ප්‍රධානත්වය විශෙෂණයාගේ ස්වාර්ථ පරිත්‍යාගයෙන් විශෙෂ්‍යයෙහි ප්‍රවෘත්තියක් ඇතිකල්හි සැපයේ නුයි විශෙෂණාර්ථය අප්‍රධානය විශෙෂ්‍යාර්ථය ප්‍රධානයි. එසේමැයි "නීලුප්පලමානය" යනාදියෙහි නීලාදිවූ විශෙෂණාර්ථය උත්පලාදි ව්‍යතිරෙකයෙන් නීලාදිහුගේ වෙනස "ආනය" යනාදියක් සමහව නොවන හෙයින් ස්වතන්ත්‍ර ව්‍යාපාරය හරණේ උත්පලාදි විශෙෂ්‍යයාගේ රක්තාද්‍යන්‍යයොග ව්‍යවච්ඡේදය පිණිස ප්‍රයුක්තනුයි අප්‍රධානයි උත්පලාදිවූ විශෙෂ්‍යය මෙහි ස්වප්‍රධානව "ආනය" යනාදී ක්‍රියා සම්බන්ධය අනුභව කරණහෙයින් ප්‍රධානයි. ඉදින් මෙසේ නීලාදි විශෙෂණයක් ස්වාර්ථ පරිත්‍යාගවෘත්තින් අප්‍රධාන වේ නම් "නීලුප්පලං" යනාදී නීලාද්‍යර්ථවිශිෂ්ටවූ උත්පලාද්‍යර්ථ ප්‍රතිපත්තිය කෙසේ වේද යත්? කුසුමාපගමයෙහි අර්ථානුගමයෙන් චම්පකපුටය මල්ලිකාපුටය යනුමෙන් ස්වාර්ථය හරණේද අර්ථය නොහරින්නුයි කියායි. තවද යම්සේ රාජ කර්මයෙහි ප්‍රවෘත්තවූ තක්ෂකාරාදිතෙම රාජකර්ම විරුද්ධවූ ස්වකර්ම පරිත්‍යාගය කරණ බව මුත් ඒ රාජ කර්මයට විරුද්ධ නොවන්නාවූ හසිත කණ්ඩුවනාදිය නොහරණේද එසේම විශෙෂණයද විශෙෂ්‍යවිරුද්ධවූ ස්වතන්ත්‍රවූ කාරකත්වය හරණබව මුත් විශෙෂ්‍යයාගේ අර්ථාන්තරව්‍යවච්ඡෙදකත්වය නොවන නියායෙන් අත්‍යර්ථයෙන් සාහාය්‍යහෙයින්ම "නීලං සරොජමුපනියතං" යනාදියෙහි නීලාදි විශෙෂණයාගේ සරොජාදි විශෙෂ්‍යයාහා අවිනාභාවිත්වය හෙතු කොට ගෙණ උපනයනාදි ක්‍රියා සම්බන්ධය ඇතද විධෙයත්වයෙන් ප්‍රධානව සිටියාවූ සරොජාදි විශෙෂ්‍යයම උපනයනාදි ක්‍රියා සම්බන්ධ ප්‍රාධාන්‍යයෙන් අනුභව කරන්නේයි. එහෙයින් විශෙෂණ විශෙෂ්‍යයන්ගේ අභින්නාර්ථ පරත්වය එකාර්ථ නම් වෙයි. යනු අභිප්‍රායි.) අන්වත්ථතො, අන්වර්ථහෙයින් (හෙවත්) අර්ථානුගත සංඥවශයෙන්; අස්සා, මේ එකාර්ථතාවගේද; චත්ථස්සාපි, චාර්ථයාගේද; සමාසතා, සමාසබව වන්නීයි.

චාර්ථ සමාසයෙහි පදයන්ගේ පරස්පරවිශෙෂණත්වය නැත් නුයි ඒ හැර රාජපුරුෂාදි සෙසු සියලු සමාසයෙහි රාජාදිවූ විශෙෂණය තෙම

සප්පධානාපි යත්ථ'ත්ථා මිථො සාපෙක්ඛකා ඉව
ක්‍රියාසම්බන්ධසාමඤ්ඤං චත්ථෙකත්ථං තමුච්චතෙ. 1.
ඉතරීතරයොගො'යං සමාහාරොති වත්තතෙ
කමතො අවයවභෙදනුගතො තිරොහිතාවයවභෙදෙච. 2.

---

පුරුෂාදිවූ විශෙෂ්‍යයාගේ සාමාන්‍යන්තරාදින් ව්‍යවච්ඡෙදය කෙරේ නුයි ද පුරුෂාදිය තෙම රාජාදින් විසින් ව්‍යවච්ඡෙද්‍ය නුයි ද විශෙෂණ විශෙෂ්‍යත්වය ලැබේ නුයි විශෙෂණවිශෙෂ්‍යයන්ගේ එකාර්ථප්‍රධාන ත්වය ඓකාර්ථ්‍ය නම් වෙයි ඒ ඓකාර්ථ්‍යයද චාර්ථයද ශබ්දාර්ථ දෙදෙ නාගේ සංක්ෂෙපයක් හෙයින් "සමසනං සමාසො" යි අන්වර්ථසංඥා වෙන් සමාස නම් ද වෙයි එහෙයින් එකාර්ථතාව සමාසයයි ද්විප්‍රකාර යෙන් ව්‍යවහාරය පවත්නී යනුහාවයි. *

චාර්ථසමාසයෙහි පදයන්ගේ අන්‍යොන්‍ය විශෙෂණත්වයක් නැතද සාපෙක්ෂයන්මෙන් දන්නා ලැබෙත්නුයි එකාර්ථතාව ඇතැයි චාර්ථ යාගේ ස්වරූප හඟවනපිණිස "සප්පධානාපි" යනාදි කීහු.

1. යත්ථ, යම් සමාසයෙක්හි; අත්ථා, (ධවඛදිරපලාසාදි) අර්ථයෝ; සප්ප ධානාපි, (ස්වාර්ථපරිත්‍යාග නොකිරීමෙන්) ස්වතන්ත්‍ර වූවාහුද; මිථො, ඔවුනොවුන් කෙරෙහි; සාපෙක්ඛකා ඉව, (ඡෙදනාදි ක්‍රියා සම්බන්ධ සාමාන්‍යය නිසා ඔවුනොවුන් කෙරෙහි) සාපෙක්ෂයන් මෙන් වේද්ද; ක්‍රියාසම්බන්ධසාමඤ්ඤං, ඡෙදනාදි ක්‍රියා සම්බන්ධ සාමාන්‍යය ඇති; තං, ඒ සමාසය, චත්ථෙකත්ථං, චාර්ථෛකාර්ථ සමාසයයි; වුච්චතෙ, කිය නු ලැබේ.

සමුච්චයාන්වාචය ඉතරීතරයොගසමාහාරයයි චාර්ථ චතුර්විධ වුවද සමාස සම්භවයක් නැති සමුච්චයාන්වාචය දෙදෙනා හැර සමාස වන ඉතරීතරයොගසමාහාර දෙදෙනාගේ ස්වරූප විභාවනය කෙරෙත්.
2. අවයව භෙදනුගතො, (ප්‍රකටවූ) අවයවාර්ථ විශෙෂය අනුව පැවැත් තාවූද; තිරොහිතාවයවභෙදෙච, අප්‍රකටවූ අවයවාර්ථ විශෙෂය ඇ ත්තාවූද; (සො) අයං සමාසො, (ඒ) මේ චාර්ථ සමාසයතෙම; කමතො,

---

* චාර්ථසමාසයෙහි පදයන්ගේ විශෙෂණ විශෙෂ්‍යත්වයෙන් අන්‍යො න්‍යාපෙක්ෂාවක් නැතිහෙයින් චාර්ථසමාසය හැර සියලු සමාසයට "එක ත්ථතා" යනු අන්වර්ථසංඥය "සමසනං සමාසො" යන මේ අර්ථයෙන් යථොක්තවූ එකාර්ථතාවටද චාර්ථයටද සමාසය යනු අන්වර්ථසං ඥයි–සමහරපොත්.

පුබ්බුත්තරුභයඤ්ඤත්ථප්පධානත්තා චතුබ්බිධො
යථාවුත්තො සමාසොයමසඞ්ඛ්‍යකාරකාදිකො. 1.

යථා ක්‍රමයෙන්; ඉතරීතර යොගො, ඉතරීතර යොගය; සමාහාරොති, සමාහාරයයි; වත්තතෙ, දෙපරිද්දෙකින් පවත්නේයි. *

අවයව විශෙෂය අනුව පැවැත්තේ හෙවත් අවයවප්‍රධාන වූයේ ඉතරෙතර නම් වෙයි. මුවහවූ අවයව විශෙෂ ඇතිහෙයින්ම සමූහයාගේ පහලවීම් ඇත්තේ සමාහාර නම් වේ.

දැන් අසඞ්ඛ්‍ය සමාසාදියෙහි ස්වරූප දක්වත්.

1. යථාවුත්තො, යථොක්තවූ; අසඞ්ඛ්‍යකාරකාදිකො, (සමාසකාණ්ඩයෙහි කියන ලද්දවූ) අසඞ්ඛ්‍ය සමාසය කාරක සමාසය යනාදිවූ; අයං සමාසො, මේ සියලු සමාසය තෙම; පුබ්බත්ථ, පූර්වපදාර්ථය; උත්තරත්ථ, උත්තරපදාර්ථය; උභයත්ථ, උභයපදාර්ථය; අඤ්ඤත්ථ, අන්‍යපදාර්ථය (යනමොවුන්); පධානත්තා, ප්‍රධානකොට ඇතිබව හෙයින්; චතුබ්බිධො, සතර වැදෑරුම් වේ.

* "චන්දිමසුරියා" යනාදියෙහි මෙන් අවයවාර්ථ ප්‍රධානව උත්තරපදයහට බඳු පුලලිඟු ඇත්තේ ඉතරීතරයොග නම්. "ජත්තුපාගනං" යනාදියෙහි මෙන් සමුදායාර්ථ ප්‍රධානව නපුංසකලිඟු වූයේ සමාහාර නම්. කියේමැනු.

"ඉතරෙතරයොගස්මින්නාර්ථභෙද සමුද්භවඃ
සංඝාතසංතිරොභාවඃ පරවල්ලිඞ්ගමත්‍ර ච.
යත්සතෙරුද්භවො යස්මින් භෙද යත්‍ර තිරොහිතාඃ
සමාහාරස්වයං චාර්ථස්මාසො න පුංසකවස්‍යච" යි

"චත්ථෙ" හි සූත්‍රය සාමාන්‍යවුවද සමුච්චයාන්වාචය දෙක්හි සමාස නොවෙයි ඉතරීතරයොගය සමාහාරය යන දෙක්හි සමාස වෙයි යන මේ නියමය ශබ්දවත් නොවන්නේද යුක්තින්ම සිඩයයි දත යුතු. මෙම කිහු.

"පරස්පරව්‍යපෙක්ෂාණාමෙකාර්ථභාවසම්භවඃ
අන්වාචයාදිකොචෛවමභාවාන්නාස්‍ය සම්භවඃ" යි.

මෙහි සමුච්චය නම් "දානච දෙහි සීලඤ්ච රක්ඛ" යනාදියය–අන්වාචය නම් "භික්ඛං චර ගාවොචානය" යනාදියෙහි මෙන් පළමුකොට එකක් මුඛ්‍ය කොට කියා පසුව අනිකක් නියොග කිරීමයි–ඉතරෙතර යොග සමාහාරාදිය ඉතරෙතර යුක්තාද්‍යර්ථවාචීවූ ශබ්දයන්ගේම අර්ථවූ චශබ්දයාගේ අර්ථයයි කුමැයි කියනු ලැබේද?

"ඉතරෙතරයොගාදි ශබ්දනාමෙව තාදෘශාම්
අර්ථශ්චකාරස්‍යානභිධ්‍යාත් ව්‍යක්ත ඉත්‍යස්‍ය කථ්‍යතෙ" යි.

මෙහි ධර්මකාමාදි ඉතරෙතරයොගාද්‍යර්ථයම ශබ්දනපෙක්ෂිතවූ ධර්මකාමාද්‍යර්ථයන්ගේ අර්ථය. එතකුදුවුව ඒ ධර්මාර්ථකාමාදි ශබ්දයන් අර්ථාන්තරසාධාරණ හෙයින් අභිව්‍යක්ත නොවන්නේ ච ශබ්දප්‍රයොගයෙහි අභිව්‍යක්තනුයි ච ශබ්දයාගේ අර්ථයයි කියනුලැබේ.

චාන්ද්‍රමෞද්ගල්‍යායන දෙක්හි මෙයට චාර්ථ සමාසයයි කියති පාණිනී කාත්‍යායන දෙක්හි ද්වන්ද්වසමාස යයි කියත්.

අපච්චාද්‍යත්ථවිසයෙ විභත්‍යන්තා භවන්ති යෙ
අභින්නත්ථපරා තෙමෙ ණාදයො නාම කිත්තිතා. 1.
චිසු කාරකභාවෙසු සකම්මාකම්මධාතුහි
යථායොගං සමුප්පජ්ජමානා තබ්බාදයො මතා. 2.

---

යථොක්තවූ "උපනගරං" යනාදී අසඞ්ඛ්‍ය සමාසයද "අබ්‍රාහමණො" යනාදිවූ නඤ් සමාසයද "අවකොකිලං" යනාදිවූ ප්‍රාදිසමාසයද අන්‍යපදාර්ථප්‍රධාන නම් වේ. කාරක සමාසයද විශෙෂණ සමාසයද "පාචරියො" යනාදී ප්‍රාදිසමාසයද උත්තරපදාර්ථප්‍රධාන වේ. චාර්ථසමාසය උභයපදාර්ථප්‍රධාන වේ. "ලූනයවං" යනාදි අසඞ්ඛ්‍ය සමාසයද අන්‍යාර්ථ සමාසයද අන්‍යපදාර්ථප්‍රධාන වේ නුයි. සියලු සමාස චතුර්විධ වෙයි යනුභාවයි. *

---

දැන් ණාදිතබ්බාදීන්ගේ ස්වරූප විභාවනයපිණිස,

1. යෙ, යම් ප්‍රත්‍යය කෙණෙක්; විභත්‍යන්තා(ෂෂ්ඨ්‍යාදි)විභක්ත්‍යන්ත නාමයන් කෙරෙන්; අපච්චාද්‍යත්ථවිසයෙ, අපත්‍යාදිවූ අර්ථයන්ගේ විෂයෙහි; භවන්ති, වෙද්ද; අභින්නත්ථපරා, ප්‍රකෘත්‍යර්ථයෙන් වෙන්නුවූ ප්‍රධානකොට අභිධෙය ඇති (හෙවත් එකාර්ථප්‍රධානවූ); තෙ ඉමෙ, ඒ මේ ප්‍රත්‍යයෝ; ණාදයො නාම, ණාදිනම් හයි; කිත්තිතා, කියන ලදහු.

ණාදිහු රාජාදි විශිෂ්ටවූ පුරුෂාදි එකාර්ථයෙහි රාජපුරුෂාදි සමාස වෘත්තියමෙන් රඝුවාදි විශිෂ්ට අපත්‍යාදිවූ එකාර්ථයෙහි රඝුවාදි ණාදිවෘත්තියගේ පැවැත්ම හෙතු කොටගෙණ එකාර්ථයා ප්‍රධාන නම් වේ.

2. කාරකභාවෙසු චිසු, කාරකභාවදෙක්හි; සකම්මාකම්මධාතුහි, සකර්මකඅකර්මකධාතූන් කෙරෙන්; යථායොගං, (ඒ ඒ සාධනයන්ට) යෙදෙනයෙදෙන පරිද්දෙන්; සමුප්පජ්ජමානා, වන්නාවූ ප්‍රත්‍යයෝ; තබ්බාදයො, තබ්බාදිනම් වෙතියි; මතා, දන්නාලදහු.

---

* තවද
"විසෙසනඤ්ඤූභයත්ථත්තා තිධා විකබ්බන්ති තම්පරෙ" යි
යනුහෙයින් විශෙෂ්‍යාර්ථ ප්‍රධානය අන්‍යාර්ථ ප්‍රධානය උභයාර්ථ ප්‍රධානයයි සියලු සමාසය ත්‍රිප්‍රකාර වෙතියි කියත්.

මෙහි අසඞ්ඛ්‍ය සමාසයට පාණිනි කාත්‍යායන දෙක්හි අව්‍යයීභාව සමාසයයිද කාරක සමාසයට තත්පුරුෂයයිද විශෙෂණ සමාසයට කර්මධාරය සමාසයයිද අන්‍යාර්ථසමාසයට බහුව්‍රීහි සමාසයයිද කියත්.

වත්තමානාදිකාලෙසු සකම්මාකම්මධාතුහි
යථායොගං කත්තුකම්ම භාවසඞ්ඛ්‍යාතසාධනෙ
සුත්තානුරූපං යෙ හොන්ති ත්‍යාදයො නාම හොන්ති තෙ. 1

1. වත්තමානාදි කාලෙසු, වර්තමානාදි කාලත්‍රයෙහි වැටෙන්නාවූ; සකම්මාකම්මධාතුහි, සකර්මක අකර්මක ධාතූන් කෙරෙන් පරව; යථායොගං, (ඒ ඒ පුරුෂකාරකවචනයන්ට) යෙදෙනසෙදෙන පරිද්දෙන්; කත්තුකම්මභාවසඞ්ඛ්‍යාතසාධනෙ, කර්තෘකර්මභාවයයි සලකුණලද සාධනත්‍රය කියයුතුකල්හි; සුත්තානුරූපං, ("වත්තමානෙ ති අන්ති" යනාදි ඒ ඒ) සූත්‍රයන්ට අනුරූපව; යෙ, යම් ප්‍රත්‍යයකෙනෙක්; හොන්ති, වෙද්ද; තෙ, ඒ ප්‍රත්‍යයෝ; ත්‍යාදයො නාම හොන්ති, ත්‍යාදි නම් වෙත්.*

අපිච.

ආඛ්‍යාතප්පච්චයා සබ්බෙ භවෙය්‍යුං සාධනත්තයෙ
කත්තා කම්මම භාවො ච සාධනානිධ වුච්චරෙ.

පරව්‍යාකරණයෙහි සාධන ව්‍යවහාර කාරකයන ව්‍යවහාරයට මය මෙහි භාවයහටද ඇත එහෙයින් "ඉධ" යනු කීහු.

සකම්මකම්හා ධාතුම්හා කත්තුකම්මෙසු හොන්ති තෙ
න භාවෙ කම්මරහිතම්හා කත්තුභාවෙසු නාපරෙ.

"අපරෙ" යි සාමාන්‍යයෙන් කිව කර්මයම යනු කෙසේ හැඟේද යත්? යම්සේ සෛන්ධව ශබ්දයෙන් ලවණාශ්වයන් කියතුදු භොජන කාලයෙහි සෛන්ධවයයි කිකල ලූණුයයි යනු හැඟේද එසේම "අප රෙ"යි සාමාන්‍යයෙන් කිවද පළමුකොට කර්තෘ භාව දෙදෙනා කීහෙයින් ප්‍රස්තාවහෙයින් ඔවුන්කෙරෙන් අපරනම් වන්නේ කර්මයයි හැඟේ. සකර්මක අකර්මක ධාතූන්ට ලක්ෂණ කිම යත්?.

කත්තුවාචිනි ධාතුම්හි යස්මිං කම්මං ගවෙස්සතෙ
සකම්මකොති සො ඤෙය්‍යො තබ්බිරුද්ධො අකම්මකො.

යම් ධාතුවක්හුවිසින් කර්තෘහු කියන ලබනකල්හි කර්මයෙක් අපෙක්ෂා කරණු ලැබේනම් ඒ ධාතු සකර්මක නම යම් ධාතුවක්හු

* නනු කත්තුකම්මානං ක්‍රියානිමිත්තත්තා සාධනත්තං යුජ්ජති සාධෙන්ති අනෙනාති කත්වා–භාවස්ස පන ක්‍රියා රූපස්ස සාධනත්තං කථං සාධිත්‍යාන්තන්ති? සච්චං සාධනඵලත්තා පන තථා වුච්චති යථාලාභවෙසනවා යොජෙතබ්බං–"සහෙතුකාමාවචර පුඤ්ඤපාකක්‍රියාමනෙ" ත්‍යාදිසු විය–එත්ථහි පාකක්‍රියා පෙක්ඛං සහෙතුගහණං යොජියති තථාත්‍රාපි කත්තු කම්මාපෙක්ඛා සාධනගහණන්ති–යනු ටීකායි.

F

යථාවුත්තො පන.

පච්චයො වා සමාසො වා ඤායතෙ යත්ථ යො ස තං
යුඤ්ජමානො වදෙ තස්ස භියො ලිඞ්ගත සඞ්ඛ්‍යයා. 1
තතො අවුත්ත ම'ඤ්ඤදත්ථ වුත්ත'ත්ථෙ පඨමා සියා
අත්ථමත්තෙ යථාසුත්තම'වුත්තෙ දුතියාදයො. 2

---

විසින් කර්තෘහු කියන ලබනකල්හි කර්මයෙක් අපෙක්ෂා කරණු නො ලැබේද ඒ ධාතු අකර්මක නම්.

"සො පචති" කිකල්හි පාක ක්‍රියාවෙන් සම්බන්ධ කරණු ලබන්නේ කිමෙක්දැයි ඔදනාදී කර්මය සොයනු ලැබෙයි.

"සො භවති" කී කල භවන ක්‍රියාවෙන් සම්බන්ධකරණු ලබන්නේ කිමෙක්දැයි කිසි කර්මයෙක් සොයනු නොලැබේ කුමක් හෙයින්ද යත්? එබඳු ශබ්ද ශක්ති ස්වභාවයක් නැතිහෙයිනි.

උක්තානුක්ත මෙසේයි.

1. යථාවුත්තො, යථොක්තවූ; යො පච්චයො වා, (ත්‍යාදීතබ්බාදීණාදිවූ) යම් ප්‍රත්‍යයෙක්හෝ; යො සමාසො වා පන, යම් සමාසයෙක්හෝ වනාහි; යත්ථ, යම් කර්ම කර්ත්‍රාද්‍යර්ථයෙක්හි; ඤායතෙ, වේද; සො, ඒ ප්‍රත්‍යයතෙම; තස්ස, ඒ කර්ම කර්ත්‍රාද්‍යර්ථයාගේ; ලිඞ්ගත, ලිඞ්ගය හාද; සඞ්ඛ්‍යයා, සඞ්ඛ්‍යාවහාද; භියො, බොහෝසේ; යුඤ්ජමානො, යොදන්නේ; තං, ඒ කර්මකර්ත්‍රාද්‍යර්ථය; වදෙ, කියන්නේයි (ප්‍රත්‍යය සමාසයෝ යම් අර්ථයෙක්හි වූද ඒ අර්ථය ප්‍රත්‍යය සමාසාදීන් විසින් උක්ත නමැයි සේයි.)

2. තතො අඤ්ඤදත්ථ, ඒ උක්තයෙන් අන්‍යයා වනාහි(හෙවත් කර්මාද්‍යර්ථයෙහි අවිහිතවූ ප්‍රත්‍යය සමාසයන් ඇති අර්ථය වනාහි;)*අවුත්තං, (ඒ ත්‍යාදි තබ්බාදීන් විසින් අප්‍රකාශිත හෙයින්) අනුක්තනම් වෙයි; අත්ථෙ, කර්මාද්‍යර්ථය; වුත්තෙ, (ප්‍රත්‍යය සමාසාදීන් විසින්) උක්ත කල්හි; අත්ථමත්තෙ, අර්ථමාත්‍රයෙහි; පඨමා සියා, ප්‍රථමාවිභක්ති වන්නීය; අවුත්තෙ, (ප්‍රත්‍යයාදීන්විසින් කර්මාද්‍යර්ථය) අනුක්ත කල්හි; යථාසුත්තං, ("කම්මෙ දුතියා" යනාදි ඒ ඒ) සූත්‍රවූ පරිද්දෙන්; දුතියාදයො, (අනුක්ත කර්මාදිය ප්‍රකාශකොට) විතියාදීහු වෙත්.

මෙසේ ක්‍රියාකාරක සම්බන්ධයන්ගේ උක්තානුක්ත ස්වරූපද උක්තානුක්ත විෂයෙහි වන විභක්තීන්ද සංක්ෂේපයෙන් දක්වා දැන් උද්දෙශානුක්‍රමයෙන් අනුක්ත කර්මාදියෙහි ද සම්බන්ධාදියෙහි ද විතීයාදීන් විස්තර හෙයින් දක්වනු පිණිස "තත්ථ තාව" යනාදී කියනලදී.

---

* හෙවත් ප්‍රත්‍යය සමාසයෝ යම් අර්ථයෙක්හි නුවූද ඒ අර්ථය—සම්ගරපොත්.

තත්ථ තාව ත්‍යාදිතබ්බාදිණාදි සමාසානම 'වුත්තෙසු කම්මාදිසු ත්‍යාදිහි දුතියාදයො කාරකප්පභෙදවසරෙ දස්සිතානි සම්පති තදඤ්ඤෙහි අවුත්තෙසු කම්මාදිසු ජොතනියෙසු දුතියාදයො යථාලාභං දස්සියන්තෙ–ජොතකා හි ස්‍යාදයො නවාචකා– 1

තත්ථ තබ්බාදිනා'නුත්තකම්මං යථා ඔදනං භොත්තුං–යදා භාවෙ පච්චයො තදා නාකිඤ්චි වුත්තං හොතීති කම්ම'මවුත්තං 2

---

තාව යනු අනුක්‍රමයෙහි වැටෙයි එහෙයින් උද්දෙශක්‍රමයෙන් ආදි කොට අනුක්තයෙහි විභක්ති භෙදයක්ද පසු උක්තයගා උක්තයෙහි විභක්තිද දක්වනු ලැබෙයි යනුභාවයි. *

1. තත්ථ, ඒ උක්තානුක්තයන් කෙරෙන්; තාව, පළමුකොට; † ත්‍යාදිතබ්බාදිණාදිසමාසානං, ත්‍යාදිතබ්බාදිණාදිසමාසයන් අතුරෙන්; ත්‍යාදිහි, ත්‍යාදීන්විසින්; අවුත්තෙසු, අනුක්තවූ; කම්මාදිසු, කර්මාදියෙහි; දුතියාදයො, ද්විතියාදී විභක්තිහු; කාරකප්පභෙදවසරෙ, කාරකප්‍රභෙද ප්‍රස්තාවෙහි; දස්සිතානි, "කටං කරොති" යනාදින් දක්වනලදහු නුයි; සම්පති, දැන්; තදඤ්ඤෙහි, එයින් අන්‍යයන් විසින් (හෙවත් ත්‍යාදින් කෙරෙන් අන්‍යවූ තබ්බාදිණාදි සමාසයන්විසින්;) අවුත්තෙසු, අනුක්තවූ; කම්මාදිසු, කර්මකර්ත්‍රාද්‍යර්ථයන්; ජොතනියෙසු, ද්‍යොතිතව්‍යකල්හි; (ප්‍රකාශයාට යුතුකල්හි) දුතියාදයො, ද්විතීයාදි විභක්තිහු; යථාලාභං, ලැබෙනලැබෙන පරිද්දෙන්; දස්සියන්තෙ, දක්වනු ලැබෙත්—හි, එසේමැයි; ස්‍යාදයො, ස්‍යාදිහු; ජොතකා, (ශබ්දයා කෙරෙහි විද්‍යමානවූ කර්මාද්‍යර්ථය) ප්‍රකාශ කරන්නාහ; නවාචකා, වාචක නොවන්නාහු වෙති.

2. තත්ථ, ඒ තබ්බාදිණාදින් අතුරෙන්; තබ්බාදිනා, තබ්බාදි ප්‍රත්‍යයා විසින්; අනුත්තකම්මං, අනුක්ත කර්මය; යථා, මෙසේයි. "ඔදනං භොත්තුං" යන මෙහි ඔදනයයි–ඔදනං, බත; භොත්තුං, අනුභව කරණ පිණිස.

යදා, යම්කලෙක්හි; භාවෙ පච්චයො, භාවයෙහි ප්‍රත්‍යය වේද; තදා, එකල්හි; කිඤ්චි, කර්මාදි කිසි කාරකයක්; වුත්තං නහොතීති, උක්ත නොවේනුයි; කම්මං, "ඔදනං" යන කර්මයනොම; අවුත්තං, (භාවයෙහි කරණලද තුං ප්‍රත්‍යයා විසින්) අනුක්තයි (නොකියනලදී). ‡

---

* "තාව" යනු ක්‍රමයෙහි වැටේ. සමහර පොත්.

† "අවුත්තෙසු කම්මාදිසු ජොතනියෙසු දුතියාදයො" යනුහාසම්බන්ධයි. සමහර

‡ තුංප්‍රත්‍යයා විසින් අනුක්තවූයේ වේ. සමහර.

කථං කටං කරොති විපුලං දස්සනීයන්ත්‍යෙත්ථ විපුලාදිතො දුතියා. කටං කරොති විපුලං කරොති දස්සනීයං කරොතීති පච්චෙකං කරො ත්‍යභිසම්බන්ධෙන කම්මත්තා දුතියා–1

පථවිං අධිසෙස්සති ගාමමධිතිට්ඨති රුක්ඛමජ්ඣාවසතෙ ධම්මමභිනි විසතෙ රත්තිමුපවසති ගාමමනුවසති පබ්බතමධිවසති ඝරමාවසති නදිං පිබති ගාමං චරතිච්චාදිස්වාධාරෙ කම්මවචනිච්ඡායං කම්ම මෙව දුතියා. 2

---

කර්තෲහුගේ ක්‍රියාවෙන් සම්බන්ධ කරණ ලබන්නහුගේ කර්මත්වය නිසා ඔහු කෙරෙන් ද්විතියා වේවයි ඕහට විශේෂණවාචිවූ ගුණවාචී ශබ්දයන්කෙරෙන් ද්විතීයා කෙසේ වේද යන ආශංකාවෙහි "කථං" යනාදි කීහු.

1. "කටං කරොති විපුලං දස්සනීයන්ති" කටං කරොති විපුලං දස්ස නීයං. යන; එත්ථ, මෙහි; විපුලාදිතො, විපුලාදි ශබ්දයන් කෙරෙන්; දුතියා, ද්විතියා විභක්තිතොමෝ; කථං, කෙසේ වේද? "කටං කරොති විපුලං කරොති දස්සනීයං කරොතීති" කටං කරොති විපුලං කරොති දස්සනීයංකරොති, යි කියා; පච්චෙකං, වෙන වෙනම; කරොත්‍යභි සම්බන්ධෙන, "කර" යන ධාතුවහා යොගය හෙතුකොටගෙණ; (හෙවත්) කරොති යන ක්‍රියාවෙන් පදයාහා යෙදීම හෙතුකොට ගෙණ; කම්මත්තා, (විපුලාදි ශබ්දයන්ගේද) කර්මත්වය ඇති බව හෙයින්; දුතියා, ද්විතියා විභක්ති වන්නීයි.

අධිපූර්වවූ සී සයෙ ඨා ගතිනිවෘත්තියං ආස උපවෙසනෙ යන ධාතූන් ගේ ප්‍රයොගයෙහිද උප අනු අධි ආ පූර්වවූ වස නිවාසෙ යන ධාතුහු ගේ ප්‍රයොගයෙහිද පානාභ්‍යවහරණාර්ථ ධාතූන්ගේ ප්‍රයොගයෙහිද සූත්‍ර යක් නැතිව ද්විතීයා කෙසේ වේද යන ආශංකාවෙහි "පඨවිං අධිසෙ ස්සති" යනාදි කීහු.

2. "පඨවිං අධිසෙස්සති–පෙ–ගාමං චරතීති" පඨවිං අධිසෙස්සති–පෙ– ගාමං චරති. යන; ආදිස්සු, මේ ආදියෙහි; ආධාරෙ, ආධාර විෂයෙහි; කම්මවචනිච්ඡායං, කර්මවචන විවක්ෂාවක් ඇති කල්හි; කම්මමෙව, කර්මකාරකයෙහි ම; දුතියා, ද්විතීයා විභක්ති වන්නීයි.

"පඨවිං අධිසෙස්සති, පෘථිවිය මත්තෙහි හොවී; ගාමමධිතිට්ඨති, ගම ඇතුළෙහි සිටී; රුක්ඛමජ්ඣාවසතෙ, රුක් මත්යෝ හිඳී; *ධම්මං අභිනි විසතෙ, ධර්මයෙහි අභිනිවේෂය කෙරේ; † රත්තිමුපවසති, රාත්‍රියෙහි උපවාසය කෙරේ(රාත්‍රි භොජනය නොකෙරේ;) ‡ ගාමමනුවසති, ගම

---

* රුකට නැගී හිඳී. † ධර්මයට අභිනිවේශය කෙරේ හෙවත් වදී.
‡ රාත්‍රියෙහි වෙසේ–ඇතැම් පොත්.

විභත්තිවජ්ජාතො හි කාරකානි හොන්ති සාච හොති යථාගමං. 1

තං යථා වලාහකා විජ්ජොතතෙ වලාහකස්ස විජ්ජොතතෙ වලාහකො විජ්ජොතතෙ වලාහකෙ විජ්ජොතතෙ වලාහකෙන විජ්ජොතතෙති. 2

---

ලගයි; * පබ්බතමධිවසති, පර්වත මත්තේ වෙසේ; ඝරමාවසති; ගෙට අවුත් වෙසේ; නදිං පිවති, නදියෙහි පැන්බෝ; (මෙහි නදී ශබ්දයෙන් නදියෙහි ජලයම උපචාරයෙන් කියන ලදි) ගාමං චරති, ගම ඇවිදී. †

විභක්තිවිවක්ෂාවශයෙන් ශබ්දයන්ගේ කර්මත්වය කෙසේ වේද යනු ආශංකාකොට “විභත්තිවජ්ජාතො” යනාදී කීහු, ‡

1. හි, එසේමැයි; කාරකානි, කාරකයෝ; විභත්තිවජ්ජාතො, විභක්තීහුගේ ඉච්ඡාව හෙතුකොටගෙණ; හොන්ති, වෙති; සාච, ඒ විභක්තිවජ්ජාවද; යථාගමං හොති, ආගමවූ පරිද්දෙන් වන්නීයි.

කිසි ප්‍රයොගයක්ම විභක්තිවජ්ජාවශයෙන් කාරකයෝ ලැබෙන්නාහු නොවෙතියි කිසි කලෙක්හි සමහරකෙනෙකුන්ට මෙසේවූ අදහසෙක් වේද ඔවුන්ට ප්‍රයොග පානාපිණිස “තං යථා” යනාදි කීහු,

2. තං යථා, හේ මෙසේයි; “වලාහකා විජ්ජොතතෙ–පෙ–වලාහකෙන විජ්ජොතතෙති” වලාහකා විජ්ජොතතෙ—පෙ—වලාහකෙන විජ්ජොතතෙයි කීහයි,

මෙහි අභිප්‍රාය කිමයත්? ඉදින් විවක්ෂාවශයෙන් කාරකයෝ නොවෙත් නම් “වලාහකා”යි අවධි වූයේ “වලාහකස්ස”යි කෙසේ සම්බන්ධ වේද? “වලාහකො වලාහකෙ වලාහකෙන”යි කර්ත්‍රාධාර කරණ වූයේ කෙසේ ද.

යම්සේ ඒ කාරක විවක්ෂාවෙන් පඨමයාදී විභක්තීහු වෙද්ද එසේම “පථවිං අධිසෙස්සති” යනමේ ආදියෙහිදු කර්මවිවක්ෂාවෙන් විතියා වෙයි ඉදින් මෙහි කර්ම විවක්ෂාවෙහි විතියා නොවේ නම් එහිදු පඨමයාදී විභාගකියපිණිස සූත්‍ර හැදූරිය යුතුය යනු මෙහි අභිප්‍රායයි,

වලාහකා, වලාහකයෙන් නික්ම; විජ්ජොතතෙ, බබලාද; වලාහකස්ස, වලාහකයා සම්බන්ධව; වලාහකො, වලාහකතෙම; වලාහකෙ, වලාහකයෙහි; වලාහකෙන, වලාහකයා කරණකොටගෙණ; විජ්ජොතතෙ, බබලා,

---

* ග්‍රාමය අනුව වෙසේ. † ගම හැසිරේ. සමහර පොත්.

‡ යම් විභක්තිවජ්ජායෙකින් ඊතියා වේද විභක්තිවජ්ජායෙන් කෙසේ කර්මත්වය වේද යනු ආශංකාකොට “විභත්තිවජ්ජාතො” යනාදි කියන ලදි. සමහර පොත්.

සද්දලක්ඛණවිඤ්ඤූනං මතෙනෙත්ථ සද්දත්ථවවත්ථානානති සත්ති මුඛ්‍යං කාරකං තදධිකරණා දබ්බාදයො තු අමුඛ්‍යං කාරකං තස්මා දබ්බාද්‍යභෙදෙපි සත්තිභෙද තං තං කාරක වචනිච්ඡා යුජ්ජතෙ. 1

---

එකවස්තුහුගේ අනෙකත්වය විරුද්ධනුයි “වලාහකා විජ්ජොතනෙ” යනාදියෙහි එකම වලාහකයාගේ අවධි කර්තෘාධාරාදිවූ අනෙකස්වරූපයෙන් විවක්ෂාව අයුක්ත වේද යනු ආශංකාකොට “සද්දලක්ඛණ විඤ්ඤූනං” යනාදී කීහු,

1. එත්ථ,මෙහි; සද්දලක්ඛණවිඤ්ඤූනං;ශබ්දලක්ෂණ විඥානකයන්ගේ (හෙවත් ව්‍යාකරණ කර්තෘන්ගේ)මතෙන, මතයෙන්; සද්දත්ථවවත්ථා නානති, ශබ්දාර්ථයන්ගේ ව්‍යවස්ථාව වේනුයි; සත්ති, (ක්‍රියානිෂ්පත්ති ස්වරූපවූ ශක්තිතොමෝ;*මුඛ්‍යං කාරකං, මුඛ්‍යකාරකනම් වෙයි; තද ධිකරණා, ඒ ශක්තියට ආධාරවූ; දබ්බාදයො තු,(ස්ථාලීන්ධනාදි)ද්‍රව්‍යාදී හු වනාහි; අමුඛ්‍යං කාරකං;(ඒශක්තියහා යොගය හෙතුකොටගෙණ;) ගෞණකාරක නම් වේ; තස්මා, එහෙයින්; දබ්බාද්‍යභෙදෙපි, (කාරක ශක්තියට ආධාරවූ) ද්‍රව්‍යාදීන්ගේ විශෙෂයක් නැතිකල්හිදු; සත්ති භෙද, ද්‍රව්‍යයෙහි පිහිටියාවූ කාරක ශක්තිවිශෙෂය හෙතුකොටගෙණ;† තං තං කාරකවචනිච්ඡා, ඒ ඒ කාරක විවක්ෂාතොමෝ; යුජ්ජතෙ, යෙදෙන්නීයි.

ශක්තිය මුඛ්‍යකාරකය තදාධාරවූ ද්‍රව්‍යාදීහු කර්තෘස්ථබැවින් කාරකනම් වෙති‡ මුඛ්‍යහෙයින් නොවෙති මුඛ්‍යහෙයින් වෙත් නම් ඔවුන් අන්‍යොන්‍ය ව්‍යාවෘත රූප බැවින් යමෙක් ආධාර විද ඒ ආධාරම වෙයි කිසිකලෙක්හි කර්තෘවූයේහෝ කරණවූයේහෝ නොවෙයි එසේකල් හි “ථාලි පචති ථාලියා පචති ථාලියං පචති” යනාදියෙහි එකස්හට කර්තෘ කරණාධාරත්වය වන්නේහෝ නොවන්නේහෝය ශක්තිපක්ෂ යෙහි වනාහි ද්‍රව්‍යාදීන් නොඑක් ශක්තියට ආධාරබැවින් යම්යම් ශ ක්තියෙකින් ද්‍රව්‍යාදීහු විවක්ෂිතයෝ වෙද්ද ඒ ඒ ශක්තිය කාරක වේනුයි ද්‍රව්‍යාදීන්ගේ භෙදයෙහිදු කාරක භෙද යෙදේ–යම්සේ එකම නෘත්‍ය කතෙමේ නාටයිතව්‍යවූ රාමරාවණාදීන්ගේ වෙෂධාරී වූයේ නාටයිත ව්‍යවූ ඒ රාමරාවණාදීන්ගේ භෙදයෙන් මේ රාමය මේ රාවණය යනාදී න්ගේ භෙදයට යේද තවද යම්සේ අභින්නස්වභාවවූ ව්‍යක්ත්‍රය ශුක්ල

---

* ක්‍රියා නිර්වෘත්තන සාමර්ථ්‍යස්වරූපවූ ශක්තිතොම.

† ද්‍රව්‍යයෙහි පිහිටියාවූ ශක්තීන්ගේ භෙදයෙන්. සමහරපොත්.

‡ ශක්තිය මුඛ්‍ය කාරකය ඒ ශක්තියට ආධාරව සිටි ද්‍රව්‍යාදීහුද ඒ ශක්ති යොගය හෙතුකොටගෙණ ගෞණ කාරකනම් වෙති–ඇතම් පොත්.

මාසම'ධීතෙ මාසං කල්‍යාණී මාසං ගුළධානා–කොසම'ධීතෙ කොසං කුටිලා නදී කොසං පබ්බතොත්‍යාදිසු "කාලද්ධානම'ච්චන්තසංයොගෙ"ති දුතියා—ක්‍රියාගුණද්‍රබ්බෙහි සාකල්ලෙන කාලද්ධානං සංයොගො සම්බන්ධො අච්චන්ත සංයොගො–1

---

පීත රක්තාදි වර්ණයෙන් යුක්තවූයේ ශුක්ල පටය පීත පටය රක්ත පටය නීලාදි පටයයි ශුක්ලාදි භෙදයෙන් අනෙක භෙදයට යේද එසේම එකම වලාහකාදියද අවධිභූත කර්තෘභාවාදි භෙද සම්බන්ධය හෙතුකොට ගෙණ අවධිභූත කර්තෘභාවාදියෙන් භෙදයට යේනුයි ඒ ඒ කාරක විවක්ෂාව යුක්තය යනුභාවයි.

1. මාසම'ධීතෙ–පෙ–කොසං පබ්බතොති–මාසම'ධීතෙ—පෙ—කොසං පබ්බතො යන; ආදිසු, මේ ආදියෙහි; "කාලද්ධානම'ච්චන්තසංයොගෙ"ති–කාලද්ධානම'ච්චන්ත සංයොගෙ යන සූත්‍රයෙන්; දුතියා, විතීයාවේ–

මාසං, මසක් මුලුල්ලෙහි; අධීතෙ, හදරා; මාසං මසක් මුලුල්ලෙහි, කල්‍යාණී, කලණයි, මාසං, මසක් මුලුල්ලෙහි; ගුළධානා, ගුඩධානා වෝයි–(ගුඩ නම් අත්ගලාද උක් සකුරු කැටද කියති ධානාශබ්දයෙන් විලඳ කියති-යක්‍රිලිගුයි) * කොසං, ගව්සනක් මුලුල්ලෙහි; අධීතෙ, හදරා; † කොසං, ගව්සනක් මුලුල්ලෙහි; නදී, නදියොමෝ; කුටිලා, වඞ්කයි; කොසං, ගව්සනක් මුලුල්ලෙහි; පබ්බතො, පර්වතයයි,

ක්‍රියාගුණද්‍රබ්බෙහි, ක්‍රියාය ගුණය ද්‍රව්‍යය යන මොවුන්හා; සාකල්ලෙන, සාකල්‍යයෙන්; කාලද්ධානං, කාල අධ්ව දෙදෙනාගේ; සම්බන්ධො, යෙදීම; අච්චන්ත සංයොගො, අච්චන්තසංයොග නම් වේ,

අධ්‍යයන ක්‍රියාව හාද කල්‍යාණගුණය හාද ගුඩධානාද්‍රව්‍යයන් හාද මාසසඞ්ඛ්‍යාත කාලයාගේ සාකල්‍යයෙන් සම්බන්ධ වීනුයි කාලවාචී මාස ශබ්දයා කෙරෙන් මේ සූත්‍රයෙන් විභියා වෙයි–මෙසේම අධ්‍යයන ක්‍රියාව හාද කෞටිල්‍ය ගුණය හාද පර්වතද්‍රව්‍ය හාද ක්‍රොශාඛ්‍ය අධ්වයාගේ සාකල්‍යයෙන් සම්බන්ධය වීනුයි අධ්වවාචීකොස ශබ්දයාකෙරෙන් විභියා වේ.

---

* "ගොළෙලා උච්ඡුමයෙ ගුළෙ" සිද "ධානා භජ්ජයවෙ භවෙ" යි කියාද නිඝණ්ටුයි.

† කොසං, ගව්සනක් පමණ මග; සජ්ඣායති, හදරා–(ගව්සනක් පමණ මග මුලුල්ලෙහි හදරණ හෙයින් අධ්‍යයන ක්‍රියාවහා කොසයාගේ සංයොගය නිරන්තරයි) ගබලාදෙනිසන්න.

ධිර'ත්‍ථුමං පූතිකායං අන්තරාච රාජගහං අන්තරා ච නාළන්දන්ති ආදිසු "ධ්‍යාදීහි යුත්තා" ති–1

රුක්ඛම'භිවිජෝතතෙ විජ්ජු සාධු දෙවදත්තො මාතරම'භි රුක්ඛං රුක්ඛම'භි තිට්ඨන්ති "ලක්ඛණිත්‍ථම්භූත වීච්ඡාස්ව'භිනො" ති දුතියා. 2

---

1. ධිර'ත්‍ථු–පෙ–නාළන්දන්ති, ධීර'ත්‍ථු–පෙ–නාළන්දං යන; ආදීසු, මේ ආදියෙහි "ධ්‍යාදීහි යුත්තානි," "ධ්‍යාදීහි යුත්තා" යන සූත්‍රයෙන් විහිත යා වේ–ඉමං පූතිකායං, මේ පූති ශරීරයට; ධි අත්‍ථු, නින්‍දා වේවා–(මෙහි නින්‍දාවාචිවූ ධිශබ්දයා හා එයින් නින්‍දියමානවූ කායතෙම යුක්ත නුයි ධි යුක්තයාකෙරෙන් මෙම සූත්‍රයෙන් විහිතයාවේ) රාජගහම, රජ ගහවටද; අන්තරා, මධ්‍යයෙහි; නාළන්දාව, නාළන්දාවටද; අන්තරා, මධ්‍යයෙහි; (මෙතෙන අන්තරා ශබ්දය මධ්‍යවාචිය එහෙයින් ඒ මධ්‍යය යමක්හුගේද එයින් ඒයුක්ත වේ නුයි රාජගහ නාළන්ද ශබ්ද යන් කෙරෙන් මෙයින් විතීයා වේ.)

2. රුක්ඛම'භි–පෙ–තිට්ඨන්ති–රුක්ඛම'භි–පෙ–තිට්ඨන්ති–යන මෙහි "ලක්ඛණිත්‍ථම්භූත වීච්ඡාස්ව'භිනා" ති, ලක්ඛණිත්‍ථම්භූත වීච්ඡාස්ව'භිනා යන සූත්‍රයෙන්; දුතියා, (ලක්ෂණාද්‍යර්ථයෙහි වැටෙන්නාවූ අභි යන්නනු හා යුක්තයා කෙරෙන්) විතියා වේ.

විජ්ජු, විද්‍යුත්තොමෝ; රුක්ඛමභි, වෘක්ෂය උපලක්ෂණකොටගෙණ; විජෝතතෙ, බබලා–(මෙහි වෘක්ෂය ලක්ෂණය විද්‍යොතමානවූ විද්‍යුත් තොම ලක්ෂිතව්‍යය එහි අභි යන්නනු විසින් වෘක්ෂශබ්දයාගේ ලක්ෂණාර්ථ වෘත්තිත්වය විෂයත්වයෙන් ප්‍රකාශ කරණු ලැබේනුයි අභි ශබ්දයා හා රුක්ඛ ශබ්දය යුක්තනම් වේ) දෙවදත්තො, දෙවදත්තතෙම; මාතරමභි, මවවිෂයෙහි; සාධු, සාධුවූ ප්‍රකාරයට පැමිණීය; (මවවිෂයෙහි සාධුත්‍රණයෙන් යුක්තයි–මව විෂයෙහි සාධුත්වයට පැමිණීමෙන් යම් මේ විෂය විෂයිභාවලක්ෂණ සම්බන්ධයෙක් ඇද්ද හෙතෙම අභි ශබ්දයා විසින් ප්‍රකාශිතනුයි මාතු ශබ්දයාගේ අභිශබ්දයාහා යෙදීමයි) රුක්ඛං රුක්ඛමභි, වෘක්ෂයෙක් වෘක්ෂයෙක්පාසා; තිට්ඨන්ති, සිටී; (ස්ථිති ක්‍රියාව හා විප්සාකරණු ලබන්නාවූ මේ වෘක්ෂයාගේ ස්ථිතික්‍රියාවතිසා සාධ්‍ය සාධන ලක්ෂණවූ යම් සම්බන්ධයෙක් ඇද්ද හෙතෙම අභිශබ්දයා විසින් ද්‍යොතකනුයි රුක්ඛශබ්දය ඔහුහා යුක්තනම්—වීප්සායෙහි වැටෙන අභිහායුක්ත රුක්ඛ ශබ්දයා කෙරෙන් මේ සූත්‍රයෙන් විතියා විභක්තිකොට "වීච්ඡා භික්ඛ ක්ෂෙත්‍රදසු වෙ" යන සූත්‍රයෙන් "රුක්ඛං රුක්ඛං" යි විත්ව වේ. *

---

* විප්සාව වනාහි ද්විර්වචනයෙන්ම ප්‍රකාශ්‍යයි. ඇතම්.

ඉත්ථම්භූතො කඤ්චිපකාරං පත්තො—ක්‍රියාය ගුණේන දබ්බෙන වා භින්නො අත්ථෙ ව්‍යාපිතුමිච්ඡා වීච්ඡා–1 ,

රුක්ඛංපති විජ්ජෝතතෙ විජ්ජු ඉච්චාදෙ “පතිපරීහි භාගෙචෙ” ති.2
රුක්ඛමනු විජ්ජෝතතෙ ඉච්චාදෙ “අනුනෙ” ති–3
පබ්බතමනු තිඨිති “සහත්ථෙ” ති. 4

---

1. ඉත්ථම්භූතො, ඉත්ථම්භූත නම්; කඤ්චිපකාරං පත්තො, කිසිප්‍රකාරයකට පැමිණියේයි–භින්නො, දිශාභෙදයෙන් භින්නවූ (හෙවත් අනෙකප්‍රකාරවූ); අත්ථෙ, (ද්‍රව්‍ය ගුණ ක්‍රියා ලක්ෂණවූ) අභිධෙයයන්; ක්‍රියාය, ක්‍රියාවෙකින් හෝ; ගුණෙන, ගුණයකින් හෝ; දබ්බෙනවා, ද්‍රව්‍යයකින් හෝ; ව්‍යාපිතුං, සම්බන්ධකරණු පිණිසවූ; ඉච්ඡා, අභිලාෂාතොමෝ; වීච්ඡා, වීප්සානම් වා “රුක්ඛං රුක්ඛං සිඤ්චති ගාමො ගාමො රමණීයො ගාමෙ ගාමෙ පානීයං” යනු මෙහි ක්‍රමයෙන් උදහරණයි.

2. රුක්ඛංපති විජ්ජෝතතෙ විජ්ජු ඉති, “රුක්ඛං පති විජ්ජෝතතෙ විජ්ජු”–යන; ආදෙ, මේ ආදියෙහි; “පතිපරීහි භාගෙ චෙ” ති, “පතිපරීහි භාගෙ ච” යන සූත්‍රයෙන්; (ලක්ෂණාර්ථයෙහිද භාගාර්ථයෙහිද වැටෙන්නාවූ පතිපරීන්හා යුක්ත නාමයා කෙරෙන් විතියා වේ.) ආදි ශබ්දයෙන් “සාධු දෙවදත්තො මාතරම්පති රුක්ඛං රුක්ඛංපති තිඨති යදෙත්ථ මංපති සියා රුක්ඛංපරි විජ්ජෝතතෙ විජ්ජු සාධු දෙවදත්තො මාතරම්පරි රුක්ඛං රුක්ඛංපරි තිඨති යදෙත්ථ මං පරි සියා” යන මේ සඞ්ගෘහීතයි–එයින් ලක්ඛණෙත්ථම්භූත වීප්සායෙහි අර්ථ පෙරකී ක්‍රමයි.

එත්ථ, මෙහි; යො, යම් භාගයෙක් තෙම; මමපති සියා, මා පිළිබඳ වේද(නොහොත්)මා භජනය කෙරේද;(පතිපරි යන්නෙන් යුක්ත තෙනද අර්ථ මෙසේමැයි. මෙහි ආ භජන ක්‍රියා ජනිතවූ හෝ උපාදන ක්‍රියා ජනිතවූ හෝ සස්වාමී ස්වභාවවූ සම්බන්ධය පතිපරීන් විසින් ද්‍යොතනීයනුයි අසමර්ථවූ භාගස්වාමි තෙම පතිපරීන් හා යුක්ත නම් වේ.)

3. රුක්ඛමනු විජ්ජෝතතෙ ඉච්චාදෙ, “රුක්ඛමනු විජ්ජෝතතෙ” යනාදියෙහි; “අනුනෙ”ති, “අනුනා”යන සූත්‍රයෙන්(ලක්ෂණාදි චතුර්විධාර්ථයෙහි වැටෙන අනු යන්නහු හා යුක්තයා කෙරෙන් විතියා වේ.) මෙහි ආදිශබ්දයෙන් “සාධු දෙවදත්තො මාතරමනු රුක්ඛං රුක්ඛමනු තිඨති යදෙත්ථ මංඅනු සියා” යි ඉත්ථම්භූතාදියෙහි උදහරණ සඞ්ග්‍රහ කරණලදි–පූර්වොක්ත ක්‍රමයෙන්ම අර්ථ කියයුතු.

4. පබ්බතමනු තිඨතීති, “පබ්බතමනු තිඨති”යන්නෙන් “සහත්ථෙ”ති, “සහත්ථෙ” යන සූත්‍රයෙන් (සහාර්ථයෙහි වැටෙන්නාවූ අනු යන්නෙන් යුක්තයා කෙරෙන් විතියා වේ) පබ්බතමනු, පර්වතය හා එක්ව; තිඨති, සිටී; (පර්වතයහා ස්ථිති ක්‍රියා කර්තෘහුගේ යම් සහභාවයෙක් ඇද්ද

අනු සාරිපුත්තං පඤ්ඤවන්තොති "හීනෙ" ති. 1
උප සාරිපුත්තං පඤ්ඤවන්තොති "උපෙනෙ" ති-2
කත්තා යථා. පුරිසෙන කතං. 3
කරණං යථා-අසිනාඡෙදෙ—ජනියා සත්තවස්සිකො-4
සමෙන ධාවතීත්‍යාදෙ ආධාරෙ කරණවචනිච්ඡායෙව තතියා- 5

---

එහි අනුශබ්දය වැටේනුයි සහාර්ථය උභය සාධාරණවුවද සම්බන්ධයෙහි ෂෂ්ඨ්‍යුත්පත්තිය මෙන් සහාර්ථ ද්‍යෝතකවූ අනුශබ්දයා හා අප්‍රධානවූ පච්චත ශබ්දය තෙම යුක්ත නම් වේ.)

**1.** අනුසාරිපුත්තං පඤ්ඤවන්තොති, "අනුසාරිපුත්තං පඤ්ඤවන්තො" යන මෙහි; "හීනෙ" ති, "හීනෙ" යන සූත්‍රයෙන් (හීනාර්ථයෙහි වැටෙන්නාවූ අනු යන්නෙන් යුක්තයා කෙරෙන් විතීයා වේ.) පඤ්ඤවන්තො, ප්‍රඥවත්හු; අනුසාරිපුත්තං, ශාරිපුත්‍රයා කෙරෙන් හීනයෝයි; (ශාරිපුත්‍රයහට අඩුවෝයයි සේයි.) මෙහි යමක්හු කෙරෙන් හීනතෙම නිර්දිෂ්ට වූයේ වේද ඒ සූත්කෘෂ්ට තෙම හීනාර්ථ විෂය වන්නේය ඒ හීනොත්කෘෂ්ට සම්බන්ධයද අනුහු විසින් කියනුලැබේ නුයි ඔහු විසින් ශාරිපුත්‍ර ශබ්ද යුක්ත වූයේ වේ.

**2.** උපසාරිපුත්තං පඤ්ඤවන්තොති, "උපසාරිපුත්තං පඤ්ඤවන්තො" යනමෙහි "උපෙනෙ" ති, "උපෙන" යන සූත්‍රයෙන් (හීනාර්ථයෙහි වැටෙන්නාවූ උප යන්නහුහා යුක්තයා කෙරෙන් විතියා වේ.) අර්ථ උක්ත ක්‍රමමැයි.

**3.** කත්තා යථා, (තබ්බාදීන් විසින් අනුක්ත) කර්තෘ මෙසේයි-"පුරිසෙන කතං" යන මෙහි "පුරිසෙන" යනුයි-පුරිසෙන, පුරුෂයා විසින්; කතං, කරණලදි; (මෙහි "කතං" යන තබ්බාද්‍යන්තයා කර්මයෙහි සිඛ හෙයින් ඔහු විසින් කර්තෘ අනුක්තය ඒ අනුක්ත කර්තෘ ප්‍රකාශය පිණිස තෘතියා වේ.)

**4.** කරණං යථා, (තබ්බාදීන් විසින් අනුක්ත) කරණය මෙසේයි-"අසිනාඡෙදෙ" යන මෙහි "අසිනා" යනුයි-අසිනා, ඛඩ්ගය කරණකොටගෙණ; ඡෙදෙ, කැපිමයි. (භාවයෙහි ප්‍රත්‍යයා විසින් කිසි කාරකයෙක් උක්තනොවේ නුයි කරණය අනුක්තය තත් ප්‍රකාශය පිණිස තෘතියා වේ.)

ජනියා, ජනිය කරණකොටගෙණ; සත්තවස්සිකො, සත්හැවිරිද්ද වේ. ("සත්ත වස්සිකො" යන ණිකප්‍රත්‍යයා විසින් "ජනියා" යනු අනුක්තකරණයි. මේ ණාදීන් විසින් අනුක්තකරණොදහරණයි.)

**5.** සමෙන ධාවතීත්‍යාදෙ, "සමෙන ධාවති" යනාදියෙහි; ආධාරෙ, ආධාරාර්ථයෙහි; කරණවචනිච්ඡායෙව, කරණවිවක්‍ෂායෙන්ම;

පුත්තෙන සහාගතොති "සහත්‍ථෙතෙ"ති-1
තිදණ්ඩෙන පරිබ්බාජක මද්දක්ඛිති "ලක්ඛණෙ" ති-2
අන්නෙන වසතිති "හෙතුම්හි" ති-3
සතස්මා බද්ධො සතෙන වාති "පඤ්චමිණෙ වා" ති පඤ්චමී තතියා ච.4

තතියා, තෘතීයා වේ; සමෙන, සමස්ථානය කරණකොටගෙණ; * ධාවති, දිවේ; (මෙහි පරයන් විසින් ආධාරයෙහි තෘතීයා විහිතයි. ධාව නක්‍රියාවට සමස්ථානය කරණවන හෙයින් සවිෂයෙහිම තෘතීයා වේ)

1. පුත්තෙන සහ ආගතොති, "පුත්තෙන සහ ආගතො" යන මෙහි; "සහත්‍ථෙතෙ"ති, "සහත්‍ථෙන" යන සූත්‍රයෙන් (සහාර්ථය හා යොගයෙහි තෘතීයා වේ.) පුත්තෙන සහ, පුත්‍රයාහා සමග, ආගතො, ආයි. (ප්‍රධාන යා කෙරෙහිම කාය්‍යීපරිඥානයෙන් හෝ බහුලාධිකාරයෙන් හෝ ප්‍රධාන කර්තෘයෙහි තෘයාදී තබ්බාදීහු වෙත් නුයි මෙහි ප්‍රධාන කර්තෘතෙම් ක්තප්‍රත්‍යයා විසින් කියනු ලැබේනුයි එහි යමෙක් අප්‍රධානද එහි තෘතියාව කර්තෘයෙහිම අනන්තර සූත්‍රයෙන් සිඩ වේද යත්? එයින් සිඩ නොවන්නේයි කුමක්හෙයින්ද යත් පුත්‍රාදීන්ගේ ආගමන ක්‍රියාව නිසා කර්තෘත්වය කිසිසේත් ඇත්තේය. එතකුදු වි නමුත් පුත්‍රාදීන්ගේ සහ භාවමාත්‍රය විකක්‍ෂිතය කර්තෘත්වය සාමර්ථ්‍යයෙන් අනුමාන කරණු ලැබෙයි එහෙයින් කර්තෘයෙහි තෘතියා නොවේ.)

2. තිදණ්ඩෙන පරිබ්බාජක මද්දක්ඛි, "තිදණ්ඩෙන පරිබ්බාජක මද්දක්ඛි" යන මෙහි; "ලක්ඛණෙ" ති, "ලක්ඛණෙ" යන සූත්‍රයෙන් (උපලක්‍ෂණ යෙහි වැටෙන්නාවූ ශබ්දයා කෙරෙන් තෘතියා වේ.) තිදණ්ඩෙන, ත්‍රිදණ්ඩ යෙන් (උපලක්‍ෂිතවූ;) පරිබ්බාජකං, පරිබ්‍රාජකයා; අද්දක්ඛි, දිටි; (මෙහි ත්‍රිදණ්ඩය උපලක්‍ෂණය පරිබ්‍රාජකයා උපලක්‍ෂිතවූයි.)

3. අන්නෙන වසතිති, "අන්නෙන වසති" යන මෙහි; "හෙතුම්හි" ති "හෙතුම්හි" යන සූත්‍රයෙන් (හෙත්වර්ථයෙහි තෘතියා වේ.) අන්නෙන, ආහාරය හෙතුකොටගෙණ; වසති, වෙසේ; (අන්නාදිය වාසාදි ලක්‍ෂණවූ ක්‍රියාව සම්පාදනය නොකෙරෙයි එතකුදුවි නමුත් ඒ ක්‍රියාවට යොග්‍ය තාවෙන් හෙතු වේ නුයි ඔහු කෙරෙන් හෙතුයෙහි තෘතියා වේ. තත් ක්‍රියා යොග්‍යතාමාත්‍රවිවක්‍ෂායෙහි සාධකතමත්වයක් නැති හෙයින් කරණයෙහි තෘතියා නොවේ.)

4. සතස්මා බද්ධො සතෙන වාති, "සතස්මා බද්ධො සතෙන වා" යන මෙහි; "පඤ්චමිණෙ වා" ති, "පඤ්චමිණෙ වා" යන සූත්‍රයෙන් (ඍණ හෙතුයෙහි විකල්පයෙන්;) පඤ්චමී, පඤ්චමි වෙයි; තතියාච, (නුවූ පක්‍ෂයෙහි) තෘතියාද වේ; සතස්මා, සියක්නය හෙතුකොටගෙණ; බද්ධො, බඳනාලදී; සතෙන වා, සතෙන බද්ධො කියා හෝ වේ.

* සමබව කරණකොටගෙණ-ඇතම් පොත්.

ජළත්තා බද්ධො ජළත්තෙනාති "ගුණෙ" ති–1
සම්පදානං යථා–සඞ්ඝස්ස දනං–2
යූපාය දරුති "තදත්ථෙ" ති–3
අවධි යථා–ගාමස්මා ආගතො. 4

1. ජළත්තා බද්ධො ජළත්තෙනාති, "ජළත්තා බද්ධො ජළත්තෙන"යන මෙහි; "ගුණෙ"ති, "ගුණෙ" යන සූත්‍රයෙන් (ගුණහෙතුයෙහි විකල්පයෙන් පඤ්චමී වෙයි. පූර්වයෙහි සේ තෘතීයාද වේ.) ජළත්තා, ජඩබව හෙතුකොටගෙණ; බද්ධො, බඳනාලදී; ජළත්තෙන වා, ජළත්තෙන බද්ධොයි කියා හෝ වේ.

2. සම්පදානං, (තබ්බාදීන් විසින් අනුක්තවූ) සම්ප්‍රදනකාරකය; යථා, මෙසේයි. "සඞ්ඝස්ස දනං" යන මෙහි; "සඞ්ඝස්ස" යනුයි–සඞ්ඝස්ස, සඞ්ඝයාහට; දනං, දීමයි. ("දනං" යන තබ්බාද්‍යන්තයා සම්ප්‍රදනයෙහි සිද්ධ නුවූ හෙයින් සම්ප්‍රදනය අනුක්තය අනුක්තවූ ඒ සම්ප්‍රදනය ද්‍යොතනය පිණිස චතුර්ථී විභක්ති වේ.) *

3. යූපාය දරුති, "යූපාය දරු"යන මෙහි; "තදත්ථෙ"ති, "තදත්ථෙ"යන සූත්‍රයෙන් (තදර්ථභාවයක් ද්‍යොතකකල්හි චතුර්ථී වේ.) යූපාය, යාගය පිණිස; දරු, දරුවයි; † (තදර්ථභාවය නම් නිමිත්ත නිමිත්ති සම්බන්ධය තත් ප්‍රකාශය පිණිස පැමිණියාවූ ෂෂ්ඨී වළකා මෙයින් චතුර්ථී විධානයකරණලද නිමිත්ත නිමිත්ති සම්බන්ධය උභය සාධාරණ වුවද නිමිත්ත ශබ්දයා කෙරෙන්ම වූ චතුර්ථිය නිමිත්තිගතවූ සම්බන්ධයත් භජනය කෙරේනුයි නිමිත්ති ශබ්දයාකෙරෙන් චතුර්ථී නොවේ. අර්ථමාත්‍රයෙහි ප්‍රථමා වෙයි නිමිත්ත ශබ්දයාකෙරෙන් චතුර්ථී වේ.)

4. අවධි, (තබ්බාදීන් විසින් අනුක්තවූ) අවධිතෙම; යථා, මෙසේයි. "ගාමස්මා ආගතො" යන මෙහි; "ගාමස්මා" යනුයි. ගාමස්මා, ගමින්; ආගතො, ආයේයි. ‡ (මෙහි තබ්බාදී ප්‍රත්‍යයා අවධියෙහි නුවූ හෙයින් අවධිකාරකය ඔහු විසින් අනුක්ත නම් වෙයි. අනුක්තවූ ඔහු හඟවා පඤ්චමී වේ.)

යම් තැනෙක්හි ත්‍යාද්‍යන්තවූ ශබ්දය තෙම ගම්‍යාර්ථ හෙයින් ප්‍රයොග නොකරණු ලැබේද ඒ ත්‍යාදිලොප විෂයෙහි ආධාරයෙහි පැමිණියාවූ

* "දනං" යන අනප්‍රත්‍යය භාවයෙහි හෙයින් "සඞ්ඝස්ස" යනු අනුක්ත සම්ප්‍රදනය තද්ද්‍යොතනය පිණිස චතුර්ථී වේ–ඇතම් පොත්.

† "යූප" යයි යාගස්තම්භයද ප්‍රාසාදයද කියත්.

‡ "ආගතො" යන ක්තප්‍රත්‍යයාන්තයා කර්තෘයෙහි නිපන්හෙයින් "ගාමස්මා" යනු අනුක්තයි.

ආසනා පෙක්ඛතීත්‍යා'ධාරෙ'වධිවචනිච්ඡායං පඤ්චමී–එත්ථ ආසනා අප ක්කම්ම චක්ඛුන්ද්‍රියං විසයං ගණ්හාතීත්‍යත්ථො–1

විනා වාතෙන විනා වාතං විනා වාතස්මා අඤ්ඤත්‍ර එකෙන අඤ්ඤත්‍ර ධම්මං අඤ්ඤත්‍ර ධම්මාති "විනාඤ්ඤත්‍ර තතියා චෙ" ති තතියා දුතියා පඤ්චමියො.2

පුථගෙව ජනෙන පුථගෙව ජනස්මා ජනෙන නානා ජනස්මා නානාති "පුථනානාහි" ති තතියා පඤ්චමියො.3

---

සප්තමී වළකා පඤ්චමී විධානය අන්‍යයන් විසින් කරණලද මෙහි අවධි විවක්‍ෂාවෙන්ම පඤ්චමී වෙයි. හඟවනු පිණිස "ආසනා" යනාදී කියනලදී.

1. ආසනා පෙක්ඛතීති, "ආසනා පෙක්ඛති" යන්නෙහි; ආධාරෙ, අධාර විෂයෙහි; අවධිවචනිච්ඡායං, අවධිවිවක්‍ෂායෙහි; පඤ්චමී, පඤ්චමී වේ.

යම් අවධියක්හුගේ වචනෙච්ඡාවෙන් පඤ්චමී වේද ඒ අවධිත්වය ප්‍රතිපාදනය කරණු පිණිස "එත්ථ" යනාදී කියනලදී.

එත්ථ, මේ උදාහරණයෙහි; ආසනා, ආසනයෙන්; අපක්කම්ම, පහව; චක්ඛුන්ද්‍රියං, චක්‍ෂුරින්ද්‍රියය; විසයං ගණ්හාතීති, ආලම්බනග්‍රහණය කොරෙයි යන; අත්ථො, අර්ථයි.

ආලොක මනසිකාරාදි ප්‍රත්‍යය සාමාග්‍රියෙහි චක්‍ෂුඃප්‍රසාද නිසා උපදනාවූ චක්‍ෂුර්විඥානය යොග්‍යදෙශාවස්ථිතවූ රූපය දකිමින්ම ඉපද එයින් කෙසගක් පමණත් පිටත නොගොස් ක්‍ෂණික හෙයින් එහිම නිරුද්ධ වේනුයි පහවීමක් නැතද ආසනයෙන් පිටත්හි තුබූ රූපය බලන්නාවූ ආසනගතයාගේ ප්‍රෙක්‍ෂණ ක්‍රියාවට ආසනය අවධිත්වයෙන් වක්තුම්ඡටනුයි "ආසනා අපක්කම්ම" යි කියනලදී.

2. විනා වාතෙන–පෙ–අඤ්ඤත්‍ර ධම්මාති, "විනා වාතෙන–පෙ–අඤ්ඤත්‍ර ධම්මා" යන මෙහි; "විනාඤ්ඤත්‍ර තතියා චෙ"ති, "විනාඤ්ඤත්‍ර තතියා ච" යන සූත්‍රයෙන් (විනා අඤ්ඤත්‍ර ශබ්දයන් හා යොගයක් ඇති කල්හි නාමයාකෙරෙන්) තතියාඃදුතියා පඤ්චමියො, තෘතියා විතියා පඤ්චමිහු වෙත්.

විනා වාතෙන, වාතයෙන් වෙන්ව; විනා වාතං, වායුව හැර; විනා වාතස්මා, වාතයෙන් වෙන්ව; අඤ්ඤත්‍ර එකෙන, එකක්හු හැර; අඤ්ඤත්‍ර ධම්මං, අඤ්ඤත්‍ර ධම්මා, ධර්මය හැර.

3. පුථගෙව–පෙ–ජනස්මා නානාති, "පුථගෙව–පෙ–ජනස්මා නානා" යනයන්හි; "පුථනානාහි"ති, "පුථනානාහි" යන සූත්‍රයෙන් (පුථනානා ශබ්දයන් හා යොගයෙහි) තතියා පඤ්චමියො, තෘතියා පඤ්චමිහු වෙත්.

ජනෙන, ජනයා කෙරෙන්; පුථගෙව, වෙන්මැයි; ජනස්මා, ජනයා කෙරෙන්; පුථගෙව, වෙන්මැයි; ජනෙන, ජනයා කෙරෙන්; නානා, වෙනි; ජනස්මා, ජනයා කෙරෙන්; නානා, වෙනි.

ආධාරො යථා–කටෙ නිසජ්ජා රුක්ඛමූලෙ සයනන්ති– 1

බාහාසු ගහෙත්වාති කම්මෙ ආධාර විවක්ඛායං සත්තමී-සංඝෙ දින්නන්ති සම්පදානෙ ආධාර විවක්ඛායං. 2

අජිනම්හි හඤ්ඤතෙ දීපිති “නිමිත්තෙන” ති–3

ගාවීසු දුය්හමානාසු ගතො දුද්ධාස්වාගතොති “යබ්භාවො භාවලක්ඛණං” ති–4

සිවිරාජස්ස පෙක්ඛතො පෙක්ඛමානෙ මහාජනෙති “ඡට්ඨීචානාදරෙ” ති ඡට්ඨී සත්තමියො—5

---

1. ආධාරො, (තබ්බාදීන් විසින් අනුක්තවූ) ආධාරය තෙම; යථා, මෙසේයි–“කටෙ නිසජ්ජා” යන මෙහි; “කටෙ” යනුයි–කටෙ, කටයෙහි; නිසජ්ජා, හිඳීමයි; රුක්ඛමූලෙ, රුක්මුල; සයනං, ශයනයයි; (මෙහි තබ්බාදී ප්‍රත්‍යයා ආධාරයෙහි නුවූ හෙයින් ආධාරය ඔහු විසින් අනුක්තය ඒ ප්‍රකාශකොට සප්තමී වේ.)

ක්‍රියාවට ව්‍යාප්ත කල්පනාවෙන් කර්මාර්ථයෙහි සප්තමී විධානය කාත්‍යායනයෙහි විහිතය මෙහි ආධාර විවක්ෂායෙන්ම සප්තමී වෙයි දක්වනු පිණිස “බාහාසු” යනාදි කියනලදී.

2. බාහාසු ගහෙත්වාති, “බාහාසු ගහෙත්වා” යන මෙහි; කම්මෙ, කර්මවිෂයෙහි; ආධාර විවක්ඛායං, ආධාරයාගේ කථනෙච්ඡාවක් ඇති කල්හි; සත්තමී, සප්තමී විභක්ති වේ; බාහාසු ගහෙත්වා, බාහුයෙහි ගෙණ; සංඝෙ දින්නන්ති, “සංඝෙ දින්නං” යන මෙහි; සම්පදානෙ, සම්ප්‍රදාන විෂයෙහි; ආධාර විවක්ඛායං, ආධාර විවක්ෂාවක් ඇති කල්හි; (සප්තමී වේ.) සංඝෙ, සඞ්ඝයා විෂයෙහි; දින්නං, දෙනලදී. (යනු සම්ප්‍රදානයෙහි ආධාර විවක්ෂායි.)

3. අජිනම්හි හඤ්ඤතෙ දීපිති, “අජිනම්හි හඤ්ඤතෙ දීපි” යනමෙහි; “නිමිත්තෙන” ති, “නිමිත්තෙන” යන සූත්‍රයෙන් (නිමිත්තමාත්‍රයක් ද්‍යොතක කල්හි සප්තමී වේ) දීපි, දිවිතෙම; අජිනම්හි, චර්මය නිමිත්තකොට ගෙණ; හඤ්ඤතෙ, මරණු ලැබේ.

4. ගාවීසු දුය්හමානාසු ගතො දුද්ධාස්වාගතොති, “ගාවීසු දුය්හමානාසු ගතො දුද්ධාස්වාගතො” යන මෙහි; “යබ්භාවො භාවලක්ඛණං” ති, “යබ්භාවො භාවලක්ඛණං” යන සූත්‍රයෙන් සප්තමී වේ–(යමක්හුගේ ක්‍රියාව ක්‍රියාන්තරයකට උපලක්ෂණ වේද විහන වේද උපලක්ෂණ ක්‍රියාවත්වූ ඔහු කෙරෙන් වේ). ගාවීසු, දෙනුන්; දුය්හමානාසු, දෝනාලබනකල්හි; ගතො, ගියේය; දුද්ධාසු, දෝනාලද කල්හි; ආගතො, ආයේයි; (මෙහි ගාවින්ගේ දොහනක්‍රියාව කිසිවක්හුගේ ගමනක්‍රියාවට උපලක්ෂණය අතීතවූ දොහනක්‍රියාව ආගමනක්‍රියාවට උපලක්ෂණයි).

5. සිවිරාජස්ස පෙක්ඛතො පෙක්ඛමානෙ මහාජනෙති, “සිවිරාජස්ස පෙක්ඛතො පෙක්ඛමානෙ මහාජනෙ” යනමෙහි; “ඡට්ඨීචානාදරෙ” ති,

සාලියො සූකධඤ්ඤානං පත්‍ථතමා සාලියො සූකධඤ්ඤෙසු පත්‍ථතමා කණ්හා ගාවීනං සම්පන්නඛීරතමා කණ්හා ගාවීසු සම්පන්නඛීරතමා ගච්ඡතං ධාවන්තො සීඝතමා ගච්ඡන්තෙසු ධාවන්තො සීඝතමාති. "යතො නිද්ධාරණං" ති ජාති ගුණ ක්‍රියාහි සමුදායතෙකදෙසස්ස පුථක්කරණං නිද්ධාරණං—1

---

"ඡට්ඨිචානාදරෙ" යන සූත්‍රයෙන්; ඡට්ඨී සත්තමියො, (ක්‍රියාන්තර විශනවූ ක්‍රියාවත්හු කෙරෙන් අනාදරයක් ගම්‍යමානකල්හි) ෂෂ්ඨී සප්තමීහු වෙත්; පෙක්ඛතො, බලන්නාවූ; සිවිරාජස්ස, සිවිරජහට; (ආදරයක් නොකොට සිවිරජහු බලබලා සිටියදී යයි සේයි) පෙක්ඛමානෙ, බලන්නාවූ; මහාජනෙ, මහජනයා කෙරෙහි; (ආදරයක් නොකොට මහජනයා බලබලාසිටියදී යයි සේයි. මෙහි සිවිරජහුගේද මහජනයාගේද ප්‍රෙක්ෂණ ක්‍රියාව බ්‍රාහ්මණයාගේ ආකොටන ක්‍රියාවටද මරහුගේ ආදන ක්‍රියාවටද උපලක්ෂණයි).

1. සාලියො—පෙ—ධාවන්තො සීඝතමාති, "සාලියො—පෙ—ධාවන්තො සීඝතමා" යනමෙහි; "යතො නිද්ධාරණං" ති, "යතො නිද්ධාරණං" යනසූත්‍රයෙන් (යමක්හු කෙරෙන් නිර්ධාරිතව්‍යයා නිර්ධාරණ කරණුලැබේද ඔහුකෙරෙන් ෂෂ්ඨී සප්තමීහු වෙත්) * ජාතිගුණක්‍රියාහි, ජාතිය ගුණය ක්‍රියාය යන මොවුන් කාරණකොටගෙණ; සමුදායතො, සමූහයකින්; එකදෙසස්ස, එකදෙසයක්හුගේ; පුථක්කරණං, වෙන් කිරිම; නිද්ධාරණං, නිද්ධාරණ නම් වේ.

සූකධඤ්ඤානං, බූ ඇති ධාන්‍යයන්කෙරෙන්; සාලියො, ශාලිහු; පත්‍ථතමා, අතිශයෙන්ම පත්‍ථයෝයි; "සාලියො සූකධඤ්ඤෙසු පත්‍ථතමා" යනුත් මෙසේමැයි (මෙහි ශාලිජාතිය කාරණකොටගෙණ ධාන්‍ය සමූහයෙන් ධාන්‍යෙකදෙශයක්හුගේ වෙන්කිරීමයි) ගාවීනං, දෙනුන් අතුරෙන්; කණ්හා, කෘෂ්ණ ධෙනු තොම; සම්පන්නඛීරතමා, අතිශයෙන් මධුර කිරි ඇත්තියි; "ගාවීසු" යන්නෙහිදු අර්ථ මෙසේමැයි. (මෙහි කෘෂ්ණගුණය කාරණකොටගෙණ ධෙනු සමූහයෙන් එකකගේ වෙන්කිරීමයි) ගච්ඡතං, යන්නවුන් කෙරෙන්; ධාවන්තො, දිවන්නාහු; සීඝතමා, අතිශයෙන් ශීඝ්‍රයෝයි; "ගච්ඡන්තෙසු" යනුත් මෙසේ මැයි (මෙහි ධාවනක්‍රියාව කාරණකොටගෙණ සමූහයෙන් සමූහෛකදෙශයක්හුගේ වෙන්කිරිමයි ජාත්‍යාදිය කාරණකොටගෙණ යම් සමුදායෙකින් එක දෙසයක්හුගේ වෙන්කිරිම වේද ඒ සමුදාය අවධි සව රූපයෙන් සිටිහෙයින් ඔහුකෙරෙන් අවධියෙහි පචමි පැමිණිකල්හි ඒ වළකා මේ සූත්‍රයෙන් ෂෂ්ඨී සප්තමීහු වෙත්.

---

* යමක්හු කෙරෙන් යමෙක් නිර්ධාරණය කරණුලැබේද ඒ නිර්ධාරණයට අවධිමත්හු කෙරෙන් ෂෂ්ඨී සප්තමී වේ—සමහර පොත්.

සම්බන්ධෝ යථා–රඤ්ඤො පුරිසො ගතො. 1

ඡට්ඨී විසෙසොපි සම්බන්ධො භෙදකසමාව නාඤ්ඤතො
සම්බන්ධානභිධානෙන සද්දසත්තිසභාවතො. 2

---

1. සම්බන්ධො, (තබ්බාදීන් විසින් අනුක්ත) සම්බන්ධය; යථා, මෙසේයි; "රඤ්ඤො පුරිසො ගතො" යනමෙහි "රඤ්ඤො" යනුයි. (මෙහි කර්තෘයෙහි විහිත ක්තප්‍රත්‍යයා විසින් "රඤ්ඤො" යනු අනුක්ත සම්බන්ධය තත් ප්‍රකාශ ෂෂ්ඨී වේ. විශෙෂණ විශෙෂ්‍යවූ රාජපුරුෂ දෙදෙනාකෙරෙහිම සම්බන්ධය පිහිටිය විශෙෂණවූ රාජශබ්දයා කෙරෙන් ෂෂ්ඨී වන්නේ හෝ විශෙෂ්‍යවාචී පුරුෂ ශබ්දයාකෙරෙන් නොවන්නේ හෝ කවරහෙයින යත්)?

2. සම්බන්ධො, (ස්වාම්‍යාදි ලක්ෂණවූ) සම්බන්ධය; විසෙසොපි, (විශෙෂණ විශෙෂ්‍ය වාචිවූ සම්බන්ධීන්) දෙදෙනා කෙරෙහි පිහිටියද (හෙවත් සම්බන්ධ සබ්බන්ධීන් දෙදෙනා හට සාධාරණ වුවද;) ඡට්ඨී, (සම්බන්ධ ප්‍රකාශකවූ) ෂෂ්ඨීතොමෝ; භෙදකසමාව, විශෙෂණයා කෙරෙන්ම වන්නීය; අඤ්ඤතො න, අන්‍යවූ විශෙෂ්‍යයා කෙරෙන් නොවන්නීය; (කුමක් හෙයින් ද?) සද්දසත්තිසභාවතො, ශබ්දශක්තිස්වභාව හෙතුකොටගෙණ (හෙවත් ෂෂ්ඨීලක්ෂණවූ ශබ්දයාගේ සම්බන්ධ ප්‍රකාශක සාමර්ථ්‍ය ස්වරූපය හෙතුකොටගෙණ;) සම්බන්ධානභිධානෙන, විශෙෂ්‍යයා කෙරෙන්වූ ෂෂ්ඨීය උභයගත සම්බන්ධය නොකියනහෙයිනි; (නොහොත්) සම්බන්ධො, (පරිපාල්‍ය පරිපාලන ලක්ෂණවූ) සම්බන්ධය; විසෙසොපි, (විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධීන්) දෙදෙනා කෙරෙහි පිහිටියද; ඡට්ඨී, (සම්බන්ධ ප්‍රකාශකවූ) ෂෂ්ඨී විභක්තිතොම; භෙදකසමාව, විශෙෂණයා කෙරෙන්ම වන්නීය; සම්බන්ධානභිධානෙන, විශෙෂ්‍යයා කෙරෙන්වූ ෂෂ්ඨියගේ සම්බන්ධකථනයක් නැතිහෙයින්; අඤ්ඤතො න, විශෙෂණයා කෙරෙන් අන්‍යවූ විශෙෂ්‍යයා කෙරෙන් නොවන්නිය; (විශෙෂණයා කෙරෙන් පරවූ ෂෂ්ඨී සම්බන්ධය ප්‍රකාශකෙරෙයි විශෙෂ්‍යයා කෙරෙන් පරවූ ෂෂ්ඨී සම්බන්ධය ප්‍රකාශ නොකෙරෙයි යනු. කුමක්හෙයින්ද යත්) සද්දසත්තිසභාවතො, ශබ්දශක්තිස්වභාව හෙයිනි; (ෂෂ්ඨීවිෂයවූ හෝ ෂෂ්ඨී ලක්ෂණවූ හෝ ශබ්දයාගේ සම්බන්ධප්‍රකාශක සාමර්ථ්‍යස්වරූපයක් හෙයිනි)

තවද පුරුෂාදිවූ විශෙෂ්‍යයා තෙමේ විධානය කටයුතු හෙයින් විශෙෂණත්වයට අඞ්ගනුයි ප්‍රධාන කාරක භාවයෙන් ව්‍යතිරික්ත නොවේනුයි විශෙෂණවූ රාජාදිය වනාහි විශෙෂ්‍යවූ පුරුෂාදියට අඞ්ගත්වයෙන් අනුවාද කරණු ලැබේනුයි ප්‍රධාන කාරකස්වරූපයෙන් ව්‍යතිරික්තය ඒ හෙයින් ව්‍යතිරෙක ලක්ෂණවූ සම්බන්ධය තෙම සම්බන්ධ ෂෂ්ඨීන් දෙදෙනා කෙරෙහි පවත්නේද කාරක ව්‍යතිරික්තවූ විශෙෂණත්වයෙන්ම ප්‍රතීත විශෙෂ්‍යයෙහි නුයි විශෙෂණයා කෙරෙන් ෂෂ්ඨී වේ.

සරති රජ්ජස්ස පූරෙති බාලො පාපස්සාත්‍යාදෙ කම්මෙ සම්බන්ධවච නිච්ඡායං ඡඨී-කම්මවචනිච්ඡායන්තු සරති රජ්ජන්ත්‍යාදි-1.

කිතකප්පයොගෙ කත්තුකම්මෙසු බහුලං සම්බන්ධවචනිච්ඡායං ඡඨී. ධම්මස්ස ගුත්තො-භගවතො දස්සනාය-2.

කත්තුකම්ම වචනිච්ඡායන්තු ධම්මෙන ගුත්තො-භගවන්තං දස්සනාය-3

---

1. සරති රජ්ජස්ස පූරෙති බාලො පාපස්සාති, "සරති රජ්ජස්ස පූරෙති බාලො පාපස්ස" යන; ආදෙ, මේ ආදියෙහි; කම්මෙ, කර්මවිෂයෙහි; සම්බන්ධ වචනිච්ඡායං, සම්බන්ධ විවක්‍ෂාවක් ඇතිකල්හි; ඡඨී, ෂෂ්ඨී විභක්ති වේ. රජ්ජස්ස, රාජ්‍යය සම්බන්ධව; සරති, සිහි කෙරේ; බාලො, අඥාන තෙම; පාපස්ස, පාපය සම්බන්ධව; පූරෙති, පුරා.

කම්මවචනිච්ඡායන්තු, කර්ම විවක්‍ෂාවක් ඇතිකල්හි වනාහි; සරති රජ්ජන්ත්‍යාදි, "සරති රජ්ජං" යනාදිය වේ; රජ්ජං, රාජ්‍යය; සරති, සිහි කෙරේ.

2. කිතකප්පයොගෙ, තබ්බාදි ප්‍රත්‍යයන්ගේ ප්‍රයොගයක් ඇතිකල්හි; කත්තුකම්මෙසු, කර්තෘ කර්මයන් විෂයෙහි; බහුලං, ඉෂ්ට පරිද්දෙන් (හෙවත් ප්‍රයොග දුටුදුටු සේ;) සම්බන්ධ වචනිච්ඡායං, සම්බන්ධ විවක්‍ෂාවක් ඇති කල්හි; ඡඨී, ෂෂ්ඨී වේ; * ධම්මස්ස, ධර්මය සම්බන්ධව; (ධර්මය විසින්) ගුත්තො, රක්නාලදී; † (මෙහි තබ්බාද්‍යන්තයා කර්මයෙහි සිද්ධ හෙයින් අනුක්ත කර්තෘයෙහි තෘතීයා වුවමනා තැන සම්බන්ධ විවක්‍ෂායෙන් ෂෂ්ඨී වේ. ‡) භගවතො, භාග්‍යවත්හු සම්බන්ධව (හෙවත්) භගවත්හු; දස්සනාය, දක්ම පිණිස; (මෙහි දර්ශනක්‍රියාවට කර්ම හෙයින් විතියා වුවමනා තැන සම්බන්ධ විවක්‍ෂාවෙන් ෂෂ්ඨී වේ).

3. කත්තුකම්ම වචනිච්ඡායන්තු, කර්තෘ කර්ම විවක්‍ෂාවක් ඇතිකල්හි වනාහි; ධම්මෙන, ධර්මය විසින්; ගුත්තො, රක්‍ෂිතයි; භගවන්තං, භාග්‍යවත්හු; දස්සනාය, දක්මපිණිස.

---

* කිතක යයි තබ්බාදීන්ට පූර්වාචාර්‍ය්‍ය සංඥයි.

† ගුප්තයි.

‡ කෘත්‍යප්‍රත්‍යයා කර්මයෙහි විහිත හෙයින් අනුක්ත කර්තෘයෙහි තෘතීයා වුවමනාතැන සම්බන්ධ විවක්‍ෂාවෙන් ෂෂ්ඨීවේ—ඇතම් පොත්.

ඔදනස්ස සාධු පාචකොවචාදෙ තු කමෙම ක්‍රියාවිසෙසනෙ ගම්‍යමාන කරොති ක්‍රියාය කම්මත්තා න ජහි තථාහි ඔදනස්ස සාධු පාචකොතෙත්ථ ඔදනස්ස සාධු පචනං කරොති ත්‍යත්‍ථො– තස්මා පචනන්තිච කරොති ක්‍රියාය කම්මං තම භාවානන්තානං නපුංසකත්තා නපුංසකමෙකවචනන්තං පචනමත්තස්සා'නෙකත්තා'යොගා සාධූති ච තබ්බිසෙසනං තස්මා. 1

ක්‍රියාවිසෙසනං යන්තු තං සබ්බම්පි නපුංසකෙ
දුතියායෙකවචනං ගති තස්ස හි තාදිසී. 2

---

1. ඔදනස්ස සාධු පාචකොති, "ඔදනස්ස සාධු පාචකො" යන; අදෙ තු, මේ ආදියෙහි වනාහි; ක්‍රියා විසෙසනෙ, ක්‍රියා විශෙෂණවූ; කමෙම, කර්මයෙහි; ගම්‍යමාන, ප්‍රතීයමානවූ; කරොති ක්‍රියාය, කරකරණෙ" යන ධාතුහුගේ ක්‍රියාවට; කම්මත්තා, කර්ම බැවින්; න ජහි, ජහි නොවන්නීයි; තථාහි, එසේමැයි; ඔදනස්ස සාධු පාචකොති, "ඔදනස්ස සාධු පාචකො" යන; එත්ථ, මෙහි; ඔදනස්ස, ඔදනයාගේ; සාධු පචනං කරොතිති අත්‍ථො, මනාවූ පචනය කෙරෙයි යන අර්ථයි. තස්මා, එහෙයින්; පචනන්තිච, "පචනං" යනුද; කරොති ක්‍රියාය, "කරකරණෙ" යන ධාතුහුගේ ක්‍රියාවට; කම්මං, කර්මයි; තම, ඒ "පචනං" යන කර්මපදයද; භාවානන්තානං, භාවයෙහි විහිත අන ප්‍රත්‍යයාන්තයන්ගේ; නපුංසකත්තා, නපුංසක ලිඞ්ගබව හෙයින්; නපුංසකං, නපුංසක ලිඞ්ගද වෙයි; පචනමත්තස්ස, පචන මාත්‍රයාගේ; අනෙකත්තායොගා, අනෙකත්වයෙහි යෙදීමක් නැති හෙයින්; එකවචනන්තං, එකවචනාන්තද වේ. සාධූතිච, "සාධු" යනුද; තං විසෙසනං, ඒ "පචනං" යන්නට විශෙෂණ වේ; තස්මා, එහෙයින්; (හෙවත් නපුංසක ලිඞ්ග විතීයෙක වචනාන්තයහට විශෙෂණ වන හෙයින්.)

2. යන්තු, යම් පදයෙක් වනාහි; ක්‍රියා විසෙසනං, ක්‍රියාවට විශෙෂණ වේද; තං සබ්බම්පි, ඒ සියලු ක්‍රියා විශෙෂණයම; නපුංසකෙ, නපුංසක ලිඞ්ගයෙහි; දුතියායෙකවචනං, විතියෙකවචනයම වේ; තස්ස, ඒ ක්‍රියා විශෙෂණයාගේ; ගති, ප්‍රවෘත්ති තොමෝ (නොහොත්) නිෂ්පත්තිය; තාදිසී, එබඳුමැයි.*

---

* මේ ක්‍රියා විශෙෂණය තෙම අට්ඨකථාවෙහි භාවනපුංසකයයි ව්‍යවහාරකරණු ලැබේ. ක්‍රියාවිශෙෂණය භාවනපුංසකය යනු සමානාර්ථයි. ක්‍රියා විශෙෂණ යනු වෛයාකරණ ව්‍යවහාරය භාව නපුංසක යනු අට්ඨකථා ව්‍යවහාරයි. "භාවො පදත්ථො සත්තාය මතිප්පාය ක්‍රියාසු ච සභාවො භාවලක්ඛණං" යනාදියෙහි මෙතැන්හි භාවයයි ක්‍රියාව අභිමතය එහෙයින් ක්‍රියාසඞ්ඛ්‍යාත භාවයට විශෙෂ

තුල්‍යො පිතු. තුල්‍යො පිතරාති "තුල්‍යත්ථෙන වා තතියා" ති-1
උදරස්ස හෙතුති "ඡට්ඨී හෙත්වත්ථෙහි" ති. 2

කො හෙතු කං හෙතු කෙන හෙතුනා කස්ස හෙතුස්ස කස්මා හෙතුස්මා කස්ස හෙතුස්ස කස්මිං හෙතුස්මින්ති "සබ්බාදිතො සබ්බා"ති-3

එවං තාදීහි අවුත්තෙසු කම්මාදීසු විභත්තියො යථාලාභං දස්සෙත්වා සම්පති යො පච්චයො වා සමාසො වා යත්ථ'ත්ථෙ විහිතො සො'ත්ථ නා සමුප්පන්නම'ත්ථං තස්සෙව ලිඞ්ගත්ථ සඞ්ඛ්‍යාය ච තියො යුජ්ජමානො වදති වුත්තෙව තස්මිං "පඨමාත්ථමත්තෙන" ති වුත්තන්ති ඉදමෙත්ථ යථායොගං දස්සයිස්සාම-4

---

1. තුල්‍යො පිතු තුල්‍යො පිතරාති, "තුල්‍යො පිතු තුල්‍යො පිතරා" යන මෙහි; "තුල්‍යත්ථෙන වා තතියා" ති, "තුල්‍යත්ථෙන වා තතියා" යන සූත්‍රයෙන් (තුල්‍යාර්ථ යොගයෙහි තෘතියා ෂෂ්ඨි විභක්තිහු වෙත්) පිතු, පියා හා; තුල්‍යො, සදෘශයි; පිතරා, පියාහා; තුල්‍යො, සදෘශයි.

2. උදරස්ස හෙතුති, "උදරස්ස හෙතු" යන්නෙහි; "ඡට්ඨී හෙත්වත්ථෙහි" ති, "ඡට්ඨී හෙත්වත්ථෙහි" යන සූත්‍රයෙන් (හෙත්වර්ථ වාචීන් හා යොගයක් ඇතිකල්හි හෙතුයෙහි ෂෂ්ඨි වේ) උදරස්ස හෙතු, බඩ පිණිස-

3. කො හෙතු—පෙ—කස්මිං හෙතුස්මින්ති, "කො හෙතු—පෙ—කස්මිං හෙතුස්මිං" යන මෙහි; "සබ්බාදිතො සබ්බා" ති, "සබ්බාදිතො සබ්බා" යන සූත්‍රයෙන් (හෙත්වර්ථවාචීන් හා යොගයක් ඇති කල්හි හෙතුයෙහි සබ්බාදීන් කෙරෙන් පරව සියලු විභක්තිහු වෙත්) කොහෙතු, කවර හෙතුවෙක්ද; කං හෙතු, කවර හෙතුවක්; කෙන හෙතුනා, කවර හෙතුවකින්; කස්ස හෙතුස්ස, කවර හෙතුවකට; කස්මා හෙතුස්මා, කුමක් හෙතුකොටගෙණ; කස්ස හෙතුස්ස, කවර හෙතුවක්හුගේ; කස්මිං හෙතුස්මිං; කවර හෙතුවෙක්හි.

මෙසේ අනුක්තය හා අනුක්තයෙහි විභක්තීන් දක්වා දැන් උක්තය හා උක්තයෙහි විභක්තීන් දක්වනු. පිණිස "එවං" යනාදිය කියනලදී.

4. එවං, මෙසේ; තාදීහි, තාදීන් විසින්; අවුත්තෙසු, අනුක්තවූ; කම්මාදීසු, කර්මාදියෙහි; විභත්තියො, ද්විතීයාදි විභක්තීන්; යථාලාභං, ලැබෙන ලැබෙන පරිද්දෙන්; දස්සෙත්වා, දක්වා; සම්පති, දැන්; යො පච්චයො වා, යම් ප්‍රත්‍යයෙක් හෝ; යො සමාසො වා, යම්

---

ණවූ නපුංසක ලිඟුවූ පදය භාව නපුංසක නම් වේ. නපුංසක ලිඟු විභක්තියෙක වචනවූ යම් නාමපදයෙක් "විසමං චන්දිම සුරියා පරිවත්තන්ති" යනාදියෙහි මෙන් ගමනාදි එක්තරා ක්‍රියාවකට විශෙෂණවූද ඒ පදය භාවනපුංසක යයිද ක්‍රියාවිශෙෂණ යයිද කියනු ලැබේ.

තත්‍ථ ත්‍යාදීහි වුත්තං කම්මං කත්තා ච යථා.

පච්චතෙ ඔදනො පච්චන්තෙ ඔදනා ත්‍වං පච්චසෙ තුම්හෙ පච්චව්හෙ අහං පච්චෙ මයං පච්චාමහෙ ඉච්චාදි–1.

පචති දෙවදත්තො පචන්ති දෙවදත්තා පචති ඉත්‍ථී පචන්ති ඉත්‍ථියො පචති කුලං පචන්ති කුලානි ත්‍වං පචසි තුම්හෙ පචථ අහං පචාමි මයං පචාම ඉච්චාදි–2.

---

සමාසයෙක් හෝ; යත්‍ථත්‍ථෙ, කර්මාදි යම් අර්ථයෙක්හි; විහිතො, කරණලද්ද; සො, ඒ ප්‍රත්‍යයද සමාසයද; අත්තනා සමුප්පන්නං, තමා උපන්නාවූ; අත්‍ථං, කර්මාද්‍යර්ථය; තස්සෙව, එම අර්ථයාගේ; ලිඞ්ගත්ත, ලිඞ්ගභාද; සඞ්ඛ්‍යායච, සඞ්ඛ්‍යාවහාද; බහියො, බොහෝසේ; යුජ්ජමානො, යෙදෙන්නේ; වදති, කියන්නේය (නොහොත්) කියාද; වුත්තෙ ච තස්මිං, ඒ කර්මාද්‍යර්ථය උක්තවූ කල්හිත්; පඨමාත්‍ථමත්තෙති, "පඨමාත්‍ථමත්තෙ" යි; වුත්තත්තා, කියනලද්දනුයි; ඉදං, මේ උක්තය; එත්‍ථ, මේ ප්‍රස්තාවෙහි; යථායොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; දස්සයිස්සාම, දක්වමු.

1. තත්‍ථ, ඒ ප්‍රත්‍යය සමාසයන් අතුරෙන්; ත්‍යාදීහි, ත්‍යාදීන් විසින්; වුත්තං, උක්තවූ; කම්මං, කර්මයද; කත්තා ච, කර්තෘද; යථා, මෙසේයි.

පච්චතෙ ඔදනො–පෙ–මයං පච්චාමහෙ ඉති, "පච්චතෙ ඔදනො –පෙ–මයං පච්චාමහෙ" යන; ආදි, මේ ආදියයි–ඔදනො, ඔදනය තෙම; පච්චතෙ, පිසනුලැබේ; ඔදනා, ඔදනයෝ; පච්චන්තෙ, පිසනු ලැබෙත්; ත්‍වං, තෝ; පච්චසෙ, පිසනුලබන්නෙහි; තුම්හෙ, තෙපි; (බොහෝ දෙන) පච්චව්හෙ, පිසනු ලබන්නහු; අහං, මම; පච්චෙ, පිසනු ලැබෙමි; මයං, අපි; (බොහෝ දෙන) පච්චාමහෙ, පිසනු ලබමු. ("පච්චතෙ' යනාදියෙහි තෙ ආදී ප්‍රත්‍යයෝ කර්මයෙහි වූ නුයි කර්මය ඔවුන් විසින් උක්තනම් වෙයි උක්තයෙහි ප්‍රථමා වේ නුයි උක්තවූ ඔදනාදීන් කෙරෙන් ප්‍රථමා වේ.) *

2. පචති දෙවදත්තො–පෙ–මයං පචාම ඉති, "පචති දෙවදත්තො–පෙ–මයං පචාම" යන; ආදි, මේ ආදියයි–දෙවදත්තො, දෙවදත්ත තෙම; පචති, පිසේ; දෙවදත්තා, දෙවදත්තයෝ; පචන්ති, පිසෙත්; ඉත්‍ථී, ස්ත්‍රීතොමෝ; පචති, පිසේ; ඉත්‍ථියො, ස්ත්‍රීයෝ තුමූ; පචන්ති, පිසෙත්; කුලං, කුලය තෙම; පචති, පිසේ; කුලානි, කුලයෝ; පචන්ති,

---

* තෙ ප්‍රත්‍යයාදීන් කර්මයෙහි නිෂ්පන්නහෙයින් ඔවුන් විසින් කර්මය උක්තනම්. "උත්තෙ කම්මණි ප්‍රථමා"යි උක්තකර්ම ඔදනාදීන් කෙරෙන් ප්‍රථමා වේ කර්තෘ අනුක්ත වේ. "අනුත්තෙ කත්තරි තෘතියා"යි කර්තෘ අනුක්ත කල්හි දෙවදත්තාදීන් කෙරෙන් තෘතියා වේ.

එත්ථ වුත්තෙන සබ්බත්ථ'ත්ථමනෙන පඨමා–එවං සබ්බකාලෙසු පයොගා යථාරහං වෙදිතබ්බා–1.

කාලො ච නාම–

ක්‍රියාසන්තාන විච්ඡෙදෙ කාලො'තීතො පතීයතෙ
අනාගතො'ච'නාරම්භෙ පවත්තා 'නිට්ඨිතො පන
වත්තමානොති විඤ්ඤෙය්‍යො තං සමීපො'පි තාදිසො–2.

පිසත්; ත්වං, තෝ, පචසි, පිසන්නෙහි; තුම්හෙ, තෙපි (බොහෝ දෙන) පචථ, පිසන්නහු; අහං, මම; පචාමි, පිසෙමි; මයං, අපි (බොහෝ දෙන;) පචාම, පිසමු. ("පචති" යනාදියෙහි ති ආදීන් කර්තෘයෙහි වූ හෙයින් කර්තෘ උන් විසින් උක්තනම් වේ.)*

1. එත්ථ, මේ උක්ත කර්ම කර්තෘ උදාහරණයෙහි; වුත්තෙන සබ්බත්ථ, උක්තවූ හැම තන්හි; අත්ථමත්තෙ, අර්ථ මාත්‍රයෙහි; පඨමා, ප්‍රථමා වේ.

එවං, මෙසේම; සබ්බකාලෙසු, අනාගතාදි හැම කල්හි; පයොගා, ප්‍රයෝ[illegible]ෂෝ; යථාරහං, සුදුසු සුදුසු පරිද්දෙන්; වෙදිතබ්බා, දතයුතුනා ගුයි.

කාලො ච නාම, කාල නම්ද.

2. ක්‍රියාසන්තාන, (පවත්ගන්නාලද) ක්‍රියා ප්‍රබන්ධයාගේ; විච්ඡෙදෙ, නිමාපත් කල්හි; කාලො, කාලයතෙම; අතීතො, අතීතයයි; පතීයතෙ, දන්නාලැබේ; අනාරම්භෙ තු, ක්‍රියාවගේ ආරම්භයක් නැති කල්හි වනාහි; අනාගතො, කාලය අනාගතයයි (දන්නාලැබේ;) පවත්තා, පැවැත්තාවූ; අනිට්ඨිතො පන, නොනිමියාවූ භාවය (හෙවත්) නොනිමි ක්‍රියාව ඇති කාලය වනාහි; වත්තමානොති, වර්තමාන යයි; විඤ්ඤෙය්‍යො, දතයු[illegible]; තං සමීපොපි, ඒ වර්තමානයට සමීපවූ භූතභවිෂ්‍යත් කාලයද; තාදිසො, ඔහුම බඳුයි. (හෙවත් ඒ වර්තමාන කාලයමෙන් දතයුතුයි. උපචාරයෙන් වර්තමාන කාල නම් වේ.) †

* මෙහි ති ප්‍රත්‍යයාදීන් කර්තෘයෙහි විහිතහෙයින් කර්තෘ උක්ත වේ. "උක්තෙ කර්තරි ප්‍රථමා" යි උක්ත කර්තෘවූ දෙවදත්තාදීන් කෙරෙන් ප්‍රථමා වේ.

† "සො අපචි" යි කී කල පචනක්‍රියාව පරිසමාප්ත හෙයින් කාලය අතීත නම් වෙයි, "පචිස්සති" යි කී කල පචනක්‍රියාව අනාරම්භ හෙයින් කාලය අනාගත නම්–"පචති" යි කී කල පචනක්‍රියාව අනිෂ්ඨිත හෙයින් වර්තමාන නම්. "ක්‍රදාගතොසි–ගච්ඡාමි, පුරා මරාමි" යනාදියෙහි වර්තමානයට සමීපවූ භූතභවිෂ්‍යත් කාලයෝද උපචාරයෙන් වර්තමාන නම්–මෙම කිහ.

"ප්‍රාරබ්ධො'නිෂ්ඨිතො භාවො වර්තමානව්‍යපදිශ්‍යතෙ
වර්තමාන සමීපෙ ච වර්තමානං ප්‍රචක්ෂ්‍යතෙ".

එත්ථ පන තාදයො න ලිඞ්ගං ගණ්හිතුම'රහන්තීති සඞ්ඛ්‍යාමත්ත මෙව'බ්භූපගච්ඡන්ති–1.

---

1. එත්ථ පන, මේ යථොක්තවූ උදාහරණයෙහි වනාහි; තාදයො, තාදීහු; ලිඞ්ගං ගණ්හිතුං, ලිඟු ගන්නට; න අරහන්තීති, නුසුදුසු වෙත් නුයි; සඞ්ඛ්‍යාමත්තමෙව; (තමන් විසින් වාච්‍යවූ අර්ථයාගේ) සඞ්ඛ්‍යාමාත්‍රයක්ම; අබ්භූපගච්ඡන්ති, ගිවිස්නාහුයි; (භජනය කරන්නාහයි සේයි.)

---

පැවැත්තාවූ නොනිමියාවූ ක්‍රියාවෙහි වර්තමාන ව්‍යවස්ථාව නිශ්චය වර්තමානයට සමීපවූ භූතභවිෂ්‍යත් කාලයද වර්තමානයයි කියත්.

කුමක්මෙන්ද යත්,

“ගඞ්ගාව තත්සමීපඤ්ච යද්වද් ගඞ්ගා ප්‍රතීයතෙ
ගඞ්ගායාං ස්නාතුමාගච්ඡ ගඞ්ගායාං ඝොෂ ඉත්‍යපි”

ගඞ්ගායෙහි නහන්ට එයි යන ප්‍රයොගයෙහි ගඞ්ගාප්‍රවාහයද ගඞ්ගා සමීපයෙහි ගො කුලයයි යන මෙහිදු ඒ ගඞ්ගා සමීපයද යම්සේ දැන්නා ලැබේද.

“මුඛ්‍යගෞණාර්ථභෙදෙන වර්තමානම'තොවිධා
මුඛ්‍යං නිරූඪිමා'පන්නං තදරොපෙණ ගෞණතා”.

අතඃ, එහෙයින්; මුඛ්‍යගෞණාර්ථ භෙදෙන, මුඛ්‍යගෞණාර්ථභෙදයෙන්; වර්තමානං, වර්තමාන කාලය; විධා, දෙපරිද්දෙකින් වෙයි; නිරූඪිං, අනාදිසංකෙතප්‍රසිද්ධියට; ආපන්නං, පැමිණියේ; මුඛ්‍යං, මුඛ්‍ය නම්; තදරොපෙණ, මුඛ්‍යවස්තුහුගේ ගෙමයයි කියා අභෙදධ්‍යාරොපණයෙන්; ගෞණතා, අමුඛ්‍යබව වේ.

යම්සේ ගඞ්ගාවද ගඞ්ගා සමීපයද මුඛ්‍යාර්ථ ගෞණාර්ථ භෙදයෙන් ගඞ්ගා නම් වේද එසේම වර්තමාන කාලයද තත් සමීපවූ භූතභවිෂ්‍යත් කාලයද මුඛ්‍යගෞණාර්ථ භෙදයෙන් ද්විප්‍රකාර වේ නුයි. “අග්නිර්දහති” යනාදියෙහි ප්‍රජ්වලභාෂ්වරාකාරවූ අර්ථය යම්සේ අනාදිසංකෙතප්‍රසිද්ධිප්‍රාප්තවූ මුඛ්‍යනම් වේද එසේම අනාදිසංකෙත ප්‍රසිද්ධවූ වස්තුව මුඛ්‍ය නම් වෙයි. යම්සේ “අග්නිර්මාණවකඃ” යනාදියෙහි තෛක්ෂ්ණ්‍යාදි සාධර්ම්‍යයෙන් අග්නියයි යන අධ්‍යාරොපණයෙන් අග්නියයි කියනලද මානවකාර්ථය අනාදි කාලයෙහි අග්නියයි ප්‍රසිද්ධියක් නැති හෙයින්ද ඒ ගෞණ නම් වේද එසේම යම් වස්තුවෙක් මුඛ්‍ය වස්තුව හා අභෙදාධ්‍යාරොපණයෙන් තද් ව්‍යවහාර ලැබේද හේ ගෞණයි.

යදා භාවෙ පච්චයො තදා න කිඤ්චි වුත්තං හොති–තත්‍රා'කම්මකෙහි ධාතූහි භාවෙපි පච්චයො–යථා භූයතෙ දෙවදත්තෙන–1.

කම්මස්සා'වචනිච්ඡායං ධාතුතොපි සකම්මකා
භාවෙපි පච්චයොහොති යථා සූදෙන පච්චතෙ. 2.

---

1. යදා, යම් කාලෙක්හි; භාවෙ, භාවයෙහි; පච්චයො, ප්‍රත්‍යය වේද; තදා, එකල්හි; කිඤ්චි, කර්මාදි කිසිවෙක්; වුත්තං න හොති, උක්ත නම් නොවේ. අකම්මකෙහි ධාතූහි, අකර්මක ධාතූන් කෙරෙන්; තත්‍ර භාවෙ, ඒ භාවයෙහි; පච්චයො, ප්‍රත්‍යය වේ. යථා, මෙසේයි–"දෙවදත්තෙන භූයතෙ" යන මෙහි. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; භූයතෙ, (දූන්) වීමයි.

2. කම්මස්ස, විද්‍යමානවූ කර්මයාගේ; අවචනිච්ඡායං, අභිධානෙච්ඡාවක් නැති කල්හි; සකම්මකා ධාතුතොපි, සකර්මක ධාතූන් කෙරෙන්ද; භාවෙපි, භාවයෙහිද; පච්චයො හොති, ප්‍රත්‍යය වේ; සූදෙන පච්චතෙ යථා, "සූදෙන පච්චතෙ" යනුමෙනි–සූදෙන, සූදයා විසින්; පච්චතෙ, පිසීමයි. *

---

* මෙහි "පච පාකෙ" යන ධාතු සකර්මක ධාතුවුවද විද්‍යමානවූ කර්මය අවිවක්ෂිත හෙයින් කර්මයෙහි ප්‍රත්‍යය නොව භාවයෙහිම වී– විද්‍යමානයාගෙ අවිවක්ෂාව කෙසේ වේද?

"සතොපි න විවක්ඛා ස්‍යාද'සතොපිච සා භවෙත්
තද්‍යථා· නුදරා කන්‍යා විඤ්ඣ්‍යා වර්ධිතකො යථා"

සතොපි, විද්‍යමානවූද අර්ථයාගේ; විවක්ෂා, අභිධානාභිප්‍රාය; න ස්‍යාත්, නොවන්නේය; අසතොපිච, අවිද්‍යමානවූද අර්ථයාගේ; සා, ඒ විවක්ෂා තොමෝ; භවෙත්, වන්නීය; තද්‍යථා, ගේ මෙසේයි; අනුදරා කන්‍යා, උදර නැති යුවතිය; වර්ධිතකඃ, පරිවෙෂිත භක්තරාශිය තෙම; විඤ්ඣ්‍යා යථා, වින්ධ්‍යපර්වතය යනු මෙනි.

"අනුදරා කන්‍යා" යන්නෙහි විද්‍යමාන උදරයාගේ සෞන්දර්‍යාතිශය ප්‍රකාශනපරවූ අවිවක්ෂා වේද "විඤ්ඣ්‍යා වර්ධිතකඃ" යන්නෙහි වින්ධ්‍යත්වයෙන් අවිද්‍යමානවූද පරිවෙෂිත භක්තරාශිහුගේ මහත්ත්ව ප්‍රකාශනපරවූ විවක්ෂා වේද එසේම විද්‍යමානවූ ව්‍යාප්‍යයාගේ අවිවක්ෂාව වේ.

"විවක්ඛා ලෞකිකා සෛෂා න ශක්‍යම'ති වර්තිතුම්
කථමෙෂවිපර්‍යාසො ලොක එවානුයුජ්‍යතාම්".

ලෞකිකා, ලොකප්‍රසිද්ධවූ; සෛෂා විවක්ෂා, සද්වස්තු ප්‍රතිෂෙධපරවූද අසද්වස්තු ප්‍රකාශන පරවූද ගේ මේ විවක්ෂා තොම; අතිවර්තිතුං, ඉක්ම පවත්නට; නශක්‍යං, නොපිළිවන (එසේ කල්හි); එෂවිපර්‍යාසඃ,

ධාතු පාදිවසා කොචා 'කම්මකොපි සකම්මකො
යථානුභූයතෙ කම්මඵලං ජාතෙන ජන්තුනා. 1.

භාවො සන්තා සාවා'සඞ්ඛ්‍යතෙකවචනං පඨම පුරිසස්සෙව හොති–2.

---

1. අකම්මකොපි, අකර්මකවූද; කොචි ධාතු, කිසි ධාතු කෙනෙක්; පාදිවසා, (ධාත්වර්ථය අනුව පවත්නා) ප්‍රාදීන්ගේ වශයෙන්; සකම්මකො, සකර්මක වේ; අනුභූයතෙ කම්මඵලං ජාතෙන ජන්තුනා යථා, "අනුභූයතෙ කම්මඵලං ජාතෙන ජන්තුනා" යනු මෙනි. ජාතෙන ජන්තුනා, උපන්නාවූ සත්ත්වයා විසින්; කම්මඵලං, (කුශලාකුශල චෙතනා ලක්ෂණවූ) කර්මයාගේ විපාකය; අනුභූයතෙ, අනුභව කරණු ලැබේ.

අකර්මක ධාතුහු තමා කර්ම රහිත හෙයින් ඔහු කෙරෙන් කර්මයෙහි ප්‍රත්‍යයෝ නොවෙත්නුයි කර්තෘ භාව දෙක්හිද කර්ම විවක්ෂාවක් නැතිකල්හි භාවයෙහිද වෙත්–යම්සේ සකර්මක ධාතුහු කෙරෙන් පරව භාවයෙහිද ප්‍රත්‍යයෝ විද්‍යමානවූද කර්මයාගේ අවිවක්ෂාවක් හෙතු කොටගෙණ වෙද්ද එසේම අකර්මක ධාතුහු කෙරෙනුදු අයත්වූද කර්මයාගේ විවක්ෂාව හෙතු කොටගෙණ කර්මයෙහි ප්‍රත්‍යයෝ කුමක් හෙයින් නොවෙද්දයත් ශබ්දප්‍රයොගය අභිප්‍රනිත්‍ය පිණිසනුයි ඉදින් අකර්මක ධාතුන් කෙරෙන් කාරණලද ප්‍රත්‍යයන් විසින් කර්මප්‍රතීතිය වේ නම් කර්මයෙහිදු ප්‍රත්‍යයෝ වන්නෝය එසේ කර්මප්‍රතීතිය නැත්නුයි කර්මයෙහි ප්‍රත්‍යයෝ නොවන්නෝය යම් කලෙක්හි වනාහි ප්‍රාදිවිශෙෂ සන්නිධානයෙන් කර්මප්‍රතීතිය වේද එකල්හි "අනුභූයතෙ කම්මඵලං ජාතෙන ජන්තුනා" යන මෙහි අකර්මක ධාතුහු කෙරෙනුදු කර්මයෙහි ප්‍රත්‍යයෝ වෙති යනුභාවයි.

ප්‍රකෘතවූ භාවස්වරූපය දක්වනු පිණිස "භාවො සන්තා" යනාදී කියනලදි.

2. භාවො, භාවය නම්; සන්තා, සත්තාවය (හෙවත්) ක්‍රියාවය; සා ච, ඒ සත්තාවද; අසඞ්ඛ්‍යා ඉති, (තමා අද්‍රව්‍ය හෙයින් ද්‍රව්‍ය

---

මේ විපර්‍ය්‍යාසය (හෙවත් අසම්‍යක්ත්‍වය නැත යන මේ විපර්‍ය්‍යාසය;) කථං, කෙසේ වේද?; ලොක එව, ලෝවැසිම; අනුයුජ්‍යතාම්, විචාරණු ලැබේවා.

යම් ලොකයෙක් තෙම මේ විවක්ෂාව කෙරේද ඒ ලෝවැසිතෙම තොප විසින් පිළිවිස්සයුත්තේය ඒ ලොක ව්‍යවහාරයෙන් පවත්නාවූ අපි නොපිළිවිස්සයුත්තාමහ එහෙයින් විද්‍යමානවූද ව්‍යාප්‍යයාගේ අවිවක්ෂාව හෙතු ‍ෙ වේ කර්තෘ සව්‍යාප්‍ය ධාතුහු කෙරෙනුදු භාවයෙහි ප්‍රත්‍යය ‍ෙ ‍නො අනුඥාත කල්හි ...

ෂයකි පවත්නා එකත්ව ලක්ෂණවූ) සඞ්ඛ්‍යාවක් නැත්නුයි; පඨම පුරිස
සෙසච, (භාවයාගේ තුම්හාම්හශබ්දවාච්‍යත්වයක් නැති හෙයින්) ප්‍රථම
පුරුෂයා සම්බන්ධි වූම; එකවචනං හොති, (ක්‍රියාවගේ විද්‍යමානත්ව
යෙන් අභෙදෛකත්ව සඞ්ඛ්‍යාව ඇත්නුයි තත් ප්‍රකාශනය පිණිස) එක
වචන වේ

යමක්හට එකත්වාදියද අනෙකත්වාදියද නැත්තේවී නම් හෙ තෙමේ
ශශවිෂාණයක්මෙන් අවිද්‍යමානද වේ නුයි විද්‍යමාන ස්වභාවවූ වස්තු
හුගේ අනෙකත්වයක් නැති කල්හි අවශ්‍යයෙන් එකත්වය වුව මැන
වැයි ස්වභාවයෙන් විද්‍යමානවූ භාවයාගේ අභෙද විෂයෙහි වන්නාවූ
එකත්වසඞ්ඛ්‍යාව ඇතද ද්‍රව්‍යධර්මවූ බහුත්වයක් නැත එහෙයින් ඒ එක
ත්වය ප්‍රකාශකොට එක වචනය වන්නේද භාවයාගේ තුම්හාම්හ
ශබ්ද වචනත්වයක් නැතිහෙයින් ප්‍රථම පුරුෂයෙහිම වේ යනු භාවයි.*

ක්‍රියාය භාවය යන මොහු සමානාර්ථයහ ඔවුන් විසින් සියලු ගමන
පචනාදි ක්‍රියා භෙදයෝ වාච්‍යයෝයි. "කරණං ක්‍රියා" යි නිෂ්පන්න
හෙයින් "කර කරණෙ" යන ධාතුහුගේ අර්ථය ක්‍රියායයිද "භවනං
භාවො" යි නිෂ්පන්න හෙයින් "භූ සත්තායං" යන්නහුගේ අර්ථය භාව
යයිද සියලු ධාත්වර්ථය ක්‍රියා භාව නම් නොවන්නේය. එහෙයින් ක්‍රියා
ශබ්දයෙන් හා භාවශබ්දයෙන් සියලු ගමන පචනාදි ප්‍රභෙදයෝ වාච්‍ය
නොවන්නෝ වේද. කුමක්හෙයින්ද යම්සේ පාකගමනාදී ක්‍රියා
විශෙෂණ ශබ්දයෙන් ක්‍රියා භාවාදීන්ගේ අභිධානය යුක්ත නොවේද
එසේම ක්‍රියා භාවාදී ශබ්දයෙන් පාකගමනාදීන්ගේ අභිධානයද
යුක්ත නොවන්නේය. එහෙයින් පාකාදී ක්‍රියා භෙදයෝ කෙසේ
ක්‍රියා භාව ශබ්දයෙන් වාච්‍යයෝද යත් "ගච්ඡති" කී කල්හි "ගමනං
කරොති" කියාද "පචති" කී කල්හි "පචනං කරොති" කියාද
ප්‍රතීතිය හෙතු කොටගෙණ සියලු ධාත්වර්ථයෝ කාත්තව්‍ය ස්වරූපයෝ
නුයි සියලු ගමනපචනාදිවූ ධාත්වර්ථයෙහි කරණාඛ්‍ය ක්‍රියාවද අනුග
තය "පචති" කී කල්හි "පචනං භවති" කියාද "ගච්ඡති" කී කල
"ගමනං භවති" කියාද ප්‍රතීතිය හෙතු කොටගෙණ සියලු ධාත්වර්ථ
යෝ සත්තායෙන් යුක්තයෝ නුයි ඔවුන් හැමදෙනා කෙරෙහි භාවයද
සාමාන්‍යය † එහෙයින් වෘක්ෂ සාමාන්‍යවාචිවූ වෘක්ෂ ශබ්දයෙන් ධවඛදි
රාදිවූ වෘක්ෂ විශෙෂයන්ගේ කථනයමෙන් ක්‍රියා සාමාන්‍යවාචිවූ ක්‍රියා
භාවාදි ශබ්දයන්ගේ සාමාන්‍ය බව හෙතු කොටගෙණ භවනක්‍රියා
ශබ්දයෙන් සියලු ගමනපචනාදි ධාත්වර්ථයන්ගේ කථනය යුක්තය

* භාවයාගේද තුම්හාම්හ ශබ්ද වචනීයත්වයක් නැති හෙයින් ප්‍රයො
ගයෙහිම වෙයි † භාවය අනුගතය–ඇතම්.

තබ්බාද්‍යභිහිතො භාවො දබ්බභූතො තු ඤායතෙ
තස්මා යො ආදයොපෙත්ථ පාකා ඉච්චෙවමාදිසු–

**තථා භාවෙ විහිත තබ්බාදීනං පයොගෙ කම්මකාරකම්පි ඉච්ඡිතබ්බං ඔදනං භුත්වා ගච්ඡතීති–1.**

---

පලාසාදි වෘක්ෂ විශෙෂවාචී ශබ්දයන්ගේ සියලු ධවඛදිරාදී වෘක්ෂයන් ප්‍රකාශකිරීම මෙන් ගමනපචනාදි ක්‍රියා විශෙෂවාචී ශබ්දයන්ගේ සියලු ධාත්වර්ථයන් ප්‍රකාශකිරීමෙක් නැත එහෙයින් ගමනපාකාදී ශබ්දයන් විසින් ගමනපාකාදී ක්‍රියා විශෙෂයම වාච්‍යවෙයි ක්‍රියා භාව ශබ්දයන් විසින් සියලු ධාත්වර්ථයම වාච්‍ය වේ. ඉදින් ක්‍රියාව අද්‍රව්‍ය හෙයින් කර්මාදී කාරකභෙදයද ස්ත්‍රීත්වාදී ලිඞ්ග භෙදයද එකත්වාදී සඞ්ඛ්‍යාභෙදයද නැද්දයත්? "පාකා කරීයන්‍තෙ පාකා වත්තන්‍තෙ" යනාදියෙහි කර්මාදී කාරක භෙදයද "පාකො පචනං පචති" යනාදියෙහි පුංස්ත්ව නපුංසකත්ව ස්ත්‍රීත්වයද "පාකො පාකා" යනාදියෙහි බහුත්වාදියද නොයෙදෙන්නේ වේද යනු ආශංකා කොට තබ්බාදීන් විසින් අභිහිතවූ භාවය "කතො කුම්භො" යනාදියෙහි මෙන් සිද්ධාවස්ථාවූයේ ද්‍රව්‍ය යයි ප්‍රතීත වේ නුයි හෝ නොහොත් "කරීයතෙ කුම්භො" යනාදියෙහි මෙන් සාධ්‍යාවස්ථාවූයේ * තබ්බාද්‍යභිහිතවූ මේ භාවය තබ්බාදීන්ගේ අර්ථප්‍රතිපාදන සාමර්ථ්‍යය හෙතු කොටගෙණ ද්‍රව්‍යය මෙන් ප්‍රතීත වේ නුයි හෝ තබ්බාද්‍යභිහිත භාවයෙහි ලිඞ්ග සඞ්ඛ්‍යා කර්මාදිභෙද සම්භවයෙන් "යො" ආදීහුද වෙතියි දක්වනු පිණිස "තබ්බාද්‍යභිහිතො" යනාදිය කියනලදී.

1. තබ්බාද්‍යභිහිතො, තබ්බාදි ප්‍රත්‍යයන් විසින් උක්තවූ; භාවො තු, භාවය වනාහි; දබ්බභූතො, ද්‍රව්‍ය වූයේ(නොහොත් ද්‍රව්‍යය වැනිවූයේ;) ඤායතෙ, දන්නා ලැබෙයි; තස්මා, එහෙයින්; එත්ථ, මේ භාවයෙහිවූ; පාකා ඉති, "පාකා" යන; එවමාදිසු, මේ ආදී ප්‍රයොගයෙහි; යො ආදයොපි, (බහුවචනාන්තවූ) යො ආදිහුද වෙත්.

තථා, (යම්සේ තබ්බාද්‍යභිහිතවූ භාවය ද්‍රව්‍යයමෙන් ඊප්සිතද) එසේම; භාවෙ විහිත, භාවයෙහි කරණලද; තබ්බාදීනං පයොගෙ, තබ්බාදී ප්‍රත්‍යයන්ගේ ප්‍රයොගයෙහි; කම්මකාරකම්පි, කර්මකාරකයද; ඉච්ඡිතබ්බං, කැමතිවිය යුතුයි. "ඔදනං භුත්වා ගච්ඡතීති" යනාදියයි † ඔදනං භුත්වා, ඔදනය අනුභවකොට; ගච්ඡති, යේ–("භුත්වා" යන්නෙහි තබ්බාදි ප්‍රත්‍යයා භාවයෙහිවූ හෙයින් "ඔදනං" යනු අනුක්ත කර්මයි.)

---

* සාධ්‍යස්වරූපවූද–සම්භර. † මෙහි ඉති ශබ්දය ආද්‍යර්ථයි.

පධානානුයායිත්තා ජනවොහාරස්ස පධානසත්තියා'භිධානෙ ගුණසත්‍ය'භිහිතෙව පකාසතීති ඔදනො පචිත්වා භුඤ්ජතෙ ඉච්චත්‍ර ඔදනෙ පඨමෙව න දුතියා–1.

සාධියමානත්තා'ත්‍ර ත්‍යාද්‍යන්තක්‍රියාය පධානත්තං තබ්බිසෙසන භාවෙන තබ්බාද්‍යන්ත ක්‍රියාය ගුණ භාවොති–2

---

1. ජනවොහාරස්ස, ලොක ව්‍යවහාරයාගේ; පධානානුයායිත්තා, ප්‍රධානානුයායි බව හෙයින් (හෙවත් මුඛ්‍යයා අනුව පවත්නාබව හෙතු කොටගෙණ;) පධානසත්තියා, ප්‍රධානවූ කාරක ශක්තියගේ; අභිධානෙ, කථනයක් ඇති කල්හි; ගුණසත්ති, අප්‍රධානවූ කාරක ශක්ති තොමෝ; අභිහිතා ඉව, උක්තයාමෙන්; * පකාසතීති, ප්‍රකාශ කෙරේ නුයි; ඔදනො පචිත්වා භුඤ්ජතෙ ඉති, "ඔදනො පචිත්වා භුඤ්ජතෙ" යන; අත්‍ර, මෙහි; ඔදනෙ, ඔදන ශබ්දයා කෙරෙහි; පඨමා එව, (ප්‍රධාන කාරක ශක්තිය ත්‍යාද්‍යන්තයා විසින් උක්ත හෙයින්ද අප්‍රධාන කාරකශක්තිය උක්තයාමෙන් ප්‍රකාශවන හෙයින්ද උක්තයෙහි) ප්‍රථමාම වෙයි; නදුතියා, (ත්වාන්ත ක්‍රියා සම්බන්ධයෙන් අනුක්තයෙහි) ද්විතීයා නොවේ–ඔදනො, ඔදනය තෙම; පචිත්වා, පිස; භුඤ්ජතෙ, අනුභවකරණුලැබේ–("ඔදනො පචිත්වා භුඤ්ජතෙ" යන මෙහි ප්‍රධානවූ එක් කර්ම ශක්තියෙක අප්‍රධානවූ එක් කර්මශක්තියෙකැයි කර්ම ශක්තිහු දෙදෙනෙක් වෙති එයින් පචනක්‍රියා සාධනවූ කර්ම ශක්තිය අප්‍රධානය භුජ්ක්‍රියා සාධනවූ කර්මශක්තිය ප්‍රධානය ලොක ව්‍යවහාරයද ප්‍රධානානුයායි හෙයින් ප්‍රධානවූ භුජ්ක්‍රියා සාධනවූ කර්මශක්තියගේ කථනයක් ඇති කල්හි අප්‍රධානවූ පචනක්‍රියා සාධනවූ කර්මශක්තිය තදන්තර්ගතවම † උක්තයාමෙන් ප්‍රකාශ වේ නුයි ඔදන ශබ්දයා කෙරෙන් උක්තයෙහි ප්‍රථමා වෙයි ත්වාන්තක්‍රියා සම්බන්ධයෙන් ද්විතීයා නොවෙයි යනු අභිප්‍රායයි.)

ක්‍රියා සාධනවූ කාරක ශක්තියගේ ප්‍රධානාප්‍රධානත්වය ක්‍රියාවගේ ප්‍රධානාප්‍රධානත්වයෙනැයි විභාවනය කොට ප්‍රධානාප්‍රධාන ක්‍රියාද ඒ ක්‍රියාවගේ ප්‍රධානාප්‍රධානත්වයට කාරණාද දක්වනු පිණිස "සාධියමානත්තා" යනාදිය කියනලදී.

2. අත්‍ර, මේ උදාහරණයෙහි(නොහොත් මේ ක්‍රියාවන් දෙදෙනා අතුරෙන්;) සාධියමානත්තා, (දෙවදත්තාදි කර්තෘහු විසින්) සිද්ධකරණු ලබන බව හෙතු කොට ගෙණ; ත්‍යාද්‍යන්ත ක්‍රියාය, ("භුඤ්ජතෙ" යන) ත්‍යාද්‍යන්ත ක්‍රියාවගේ; පධානත්තං, ප්‍රධාන බවය; තබ්බිසෙසන

---

* කියනලද්දියකමෙන්–† තදන්තොගධවම–සමහර.

තබ්බාදීහි වුත්තකම්මං යථා–අනුභූතො ඔදනො අනුභූතා ඔදනා අනුභූතා වෙදනා අනුභූතායො වෙදනායො අනුභූතං කම්මඵලං අනුභූතානි කම්මඵලානි–1

ණාදීහි යථා–සතිකො දසො සතිකා දසා සතිකා දසී සතිකායො දසියො සතිකං දසකුලං සතිකානි දසකුලානි–2

---

භාවෙන, ඒ ත්‍යාද්‍යන්තක්‍රියාවට විශෙෂණභාවයෙන්; තබ්බාද්‍යන්ත ක්‍රියාය, ("පචිත්වා" යන) තබ්බාද්‍යන්ත ක්‍රියාවගේ; ගුණභාවොති, අප්‍රධානත්වය වේ නුයි කියයි.

මෙහි පාකක්‍රියාව භුජික්‍රියාව පිණිස නුයි පචනක්‍රියාවෙන් භුජික්‍රියාව සිද්ධ කටයුතු හෙයින් ත්‍යාද්‍යන්තවූ භුජික්‍රියාව ප්‍රධානය තිෂ්ඨණක්‍රියාදියෙන් යම් කිසි පරිද්දෙකින් භුජික්‍රියාව කටහැකිනුයි තිෂ්ඨාදි ක්‍රියාවන්ට සාධාරණවූ භුජික්‍රියාව තිෂ්ඨාදි ක්‍රියාවන් කෙරෙන් වෙසෙසානුයි තබ්බාද්‍යන්තවූ පචනක්‍රියාව භුජික්‍රියාවට විශෙෂණය එහෙයින් ත්වාන්තයාගේ අප්‍රධානත්වයයි. එසේවී නම් පිස අන්නට දීම හෝ අන් කිසිවක් හෝ කටහැකි නුයි දානාදීන්ට සාධාරණවූ පචනක්‍රියා තොමෝ භුජික්‍රියාව විසින් වෙසෙසියයුතු නුයි විශෙෂණත්වයෙන් අප්‍රධානය වේද යත්? ඒ එසේමය එතකුදුවී නමුත් ත්වාන්තක්‍රියා තොම ත්‍යාද්‍යන්තවූ කිසි ක්‍රියාවක් අපෙක්ෂා කෙරේ නුයි විශෙෂ්‍යත්වයෙන් ප්‍රධාන නොවෙයි ත්‍යාද්‍යන්ත ක්‍රියාවට විශෙෂණ හෙයින් අප්‍රධානය යනු අභිප්‍රායයි.

1. තබ්බාදීහි, තබ්බාදිප්‍රත්‍යයන් විසින්; වුත්තකම්මං, උක්තවූ කර්මය; යථා, මෙසේයි-අනුභූතො-පෙ-කම්මඵලානි, "අනුභූතො–පෙ–කම්මඵලානි" යන මේයි–ඔදනො, ඔදනය තෙම; අනුභූතො, අනුභව කරණලදී; ඔදනා, ඔදනයෝ; අනුභූතා, අනුභව කරණලදහු; වෙදනා, වෙදනා තොම; අනුභූතා, අනුභව කරණලදු; වෙදනායො, වෙදනාවෝ; අනුභූතායො, අනුභව කරණලදහු; කම්මඵලං, කර්මවිපාකය; අනුභූතං, අනුභව කරණලදී; කම්මඵලානි, කර්මවිපාකයෝ; අනුභූතානි, අනුභව කරණලදහු.

"අනුභූතො" යනාදියෙහි ක්තප්‍රත්‍යය කර්මයෙහිවූ හෙයින් ඔදනාදි කර්මගත ලිඞ්ගසඞ්ඛ්‍යාවෙන් යුක්තව ඔදනාදී කර්මය කියා නුයි තුන් ලිඟුයෙහිදු එකත්ව බහුත්වයෙහිදු උදහරණ දක්වනලදී.

2. ණාදීහි, ණාදීන් විසින් (උක්තකර්මය;)යථා, මෙසේයි–සතිකො–පෙ–දසකුලානි, "සතිකො–පෙ–දසකුලානි" යන මේයි–සතිකො, සිය යකින් විකිණී ගන්නාලද; දසො, දසයායි; සතිකා, සියයෙකින්

සමාසෙන යථා–ආරූළ්හවානරො–රුක්ඛො. ආරූළ්හවානරා–රුක්ඛා. ආරූළ්හවානරා–ලතා. ආරූළ්හවානරායො–ලතායො. ආරූළ්හවානරං–ගෙහං. ආරූළ්හවානරානි–ගෙහානි. 1

එවමුපරි සඞ්ඛ්‍යාභෙදෙ ඌහිතබ්බො—අඤ්ඤපදත්ථසමාසෙයෙව කම්මාද්‍ය'ත්ථානං වුත්තත්ත සම්භවතො'යමෙව දස්සිතො–2

---

විකිණී ගන්නාලද; දැසා, දැසයෝයි; සතිකා, ශතයෙකින් ක්‍රීතවූ; දැසී, දැසු; සතිකා, ශතයෙකින් ක්‍රීතවූ; දැසියො, දැස්හුයි; සතිකං, ශතයෙකින් ක්‍රීතවූ; දැසකුලං, දැසකුලයයි; සතිකානි, ශතයෙකින් ක්‍රීතවූ; දැසකුලානි, දැසකුලයෝයි.

කර්මයෙහි සිඬවූ ක්‍රීත ශබ්දයාගේ අර්ථයෙහි ඉක ප්‍රත්‍යය වූ හෙයින් ණාදීහු විසින් කර්මය උක්ත නම් වේ.

1. සමාසෙන, සමාසය විසින්(උක්තවූ කර්මය;)යථා, මෙසේයි–ආරූළ්හ–පෙ–ගෙහානි, "ආරූළ්හ–පෙ–ගෙහානි" යන මේයි. ආරූළ්හවානරො, ආරූඪවූ වානරයන් ඇති; රුක්ඛො, රුකයි; ආරූළ්හවානරා, ආරූඪවූ වානරයන් ඇති; රුක්ඛා, වෘක්ෂයෝයි; ආරූළ්හවානරා; ආරූඪවූ වානරයන් ඇති; ලතා, ලතායි; ආරූළ්හවානරායො, ආරූඪවූ වානරයන් ඇති; ලතායො, ලතාවෝයි; ආරූළ්හවානරං, නැංගාවූ වඳුරන් ඇති; ගෙහං, ගෙයයි; ආරූළ්හවානරානි, නැංගාවූ වඳුරන් ඇති; ගෙහානි, ගෘහයෝයි—("ආරූළ්හො වානරො යං" යන වාක්‍යයෙහි "යං" යනාදි අන්‍ය පදයන්ගේ අර්ථයෙහි "ආරූළ්හවානරො"යනාදි සමාසවූ හෙයින් සමාසයෙන් කර්මාර්ථය උක්ත නුයි යත් ශබ්දයෙන් පරාමෘෂ්ටවූ වෘක්ෂාදීහු ආරූළ්හවානර ශබ්දයෙන් වාච්‍ය වන්නාහුයි.

2. උපරි, මත්තෙහිද; සඞ්ඛ්‍යාභෙදෙ, සඞ්ඛ්‍යාවිශෙෂය; එවං, මෙසේ; ඌහිතබ්බො, කල්පනා කටයුත්තේයි; (එහෙයින් නොදක්වම්හයි සේයි) අඤ්ඤපදත්ථසමාසෙයෙව, අන්‍යපදාර්ථසමාසයෙහිම; කම්මාද්‍යත්ථානං, කර්මාද්‍යර්ථයන්ගේ; වුත්තත්තසම්භවතො, උක්තත්වය සම්භවන හෙයින්; අයමෙව, මේ අන්‍යාර්ථසමාසයම; දස්සිතො, දක්වනලදී.

කර්මාද්‍යර්ථවර්තීවූ විතීයාන්තාදි පදයන්ගේ අර්ථය ප්‍රධාන නොවන හෙයින්ද අර්ථමාත්‍රවර්තීවූ පදයන්ගේ අර්ථය ප්‍රධාන හෙයින්ද පූර්ව පදාර්ථ උත්තර පදාර්ථ උභය පදාර්ථ ප්‍රධානසමාස හෙයින් කර්මාද්‍යර්ථය උක්ත නොවන්නේය විතීයාන්තාදි අන්‍යපදයන්ගේ අර්ථයෙහි අන්‍යාර්ථ සමාසය වනහෙයින් එහිම කර්මාද්‍යර්ථයන්ගේ උක්තතාව සම්භ වේනුයි අන්‍යාර්ථසමාසයම උක්තකර්මාදහරණයට දක්වන ලද යනුභාවයි-

තග්ගුණො 'තග්ගුණොචෙති සො සමාසො ද්විධා මතො
තං යථා'නීයතං ලම්බකණ්ණො'යං දින්නසාගරො.1

එත්ථ ලම්බකණ්ණො ආනීයතන්ති තග්ගුණසංවිඤ්ඤාණො'යම'ඤ්ඤපදත්ථො ලම්බානං කණ්ණානං ගුණභූතානං තදවිනාභාවිත්තෙනානයන සම්බන්ධතො–2

දින්නසාගරො'යමා'නීයතන්ති අතග්ගුණසංවිඤ්ඤාණො ගුණභූතස්ස සාගරස්සා'නයනා'සම්භවා පුරිසොයෙව තාදිසො ආනීයතීති–3

---

ඒ සමාසය කතිවිධ වේද යත්.?

1. සො සමාසො, ඒ අන්‍යාර්ථසමාසයතෙම; තග්ගුණො, තද්ගුණද වෙයි; අතග්ගුණොචෙති, අතද්ගුණද වෙයි කියා; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දන්නාලද; තං යථා, ඒ මෙසේයි; ලම්බකණ්ණො, ලම්බවූ කර්ණයන් ඇති පුරුෂතෙම; ආනීයතං, ගෙණෙනුලැබේවයි; දින්නසාගරො, දෘෂ්ටවූ සාගරය ඇති; අයං, මේ පුරුෂතෙම; ආනීයතං, ගෙණෙනු ලැබේවයි; යනමේයි.

2· එත්ථ, මේ ගාථාවෙහි(නොහොත් මේ උදාහරණයන් දෙදෙනා අතුරෙන්;)ලම්බකණ්ණො ආනීයතන්ති,“ලම්බකණ්ණො ආනීයතං”යන; අයං අඤ්ඤපදත්ථො, මේ අන්‍යපදාර්ථසමාසය තෙම; ගුණභූතානං, අප්‍රධානවූ;* ලම්බානං කණ්ණානං, ලම්බවූ කර්ණයන්ගේ; තදවිනාභාවිත්තෙන, ඒ ලම්බකර්ණපුරුෂයා හා අවිනා භාවිත්වයෙන්; ආනයන සම්බන්ධතො, ආනයන ක්‍රියාවහා සම්බන්ධය හෙතු කොටගෙණ; තග්ගුණසංවිඤ්ඤාණො, තද්ගුණ සංවිඥාන නම් වෙයි.

3. දින්නසාගරොයමානීයතන්ති, “දින්නසාගරොයමානීයතං” යන අන්‍යපදාර්ථසමාසය තෙම; ගුණභූතස්ස සාගරස්ස, ගුණවූ සාගරයට; †ආනයනාසම්භවා, ආනයනක්‍රියාවගේ සම්භවීමක් නැතිහෙයින්; තාදිසො, එබඳුවූ; (දක්නාලද සාගර ඇති) පුරිසොයෙව, පුරුෂම; ආනීයතීති, ගෙණෙනු ලැබේනුයි; අතග්ගුණසංවිඤ්ඤාණො, අතද්ගුණ සංවිඥාන නම් වේ; (මේ තද්ගුණසංවිඥානයෙහි අන්‍යපදාර්ථය තෙම විශෙෂණයා හා එක්කොට ගන්නාලැබෙයි අතද්ගුණසංවිඥානයෙහි වනාහි විශෙෂණයා හැර හුදෙක් අන්‍යපදාර්ථය ගන්නා ලැබේ.)

“තස්ස අඤ්ඤපදත්ථස්ස ගුණෙන අවයවභූතෙන ධම්මභූතෙන වා තදභින්නවිසෙසනෙන වා සද්ධිං ක්‍රියා විඤ්ඤාපකො තග්ගුණසංවිඤ්ඤා

---

* පුරුෂයාහට විශෙෂණ හෙයින් සමාසයෙහි අප්‍රධානවූ.

† පුරුෂයාහට විශෙෂණහෙයින් සමාසයෙහි අප්‍රධානවූ පුරුෂ සාගරයහට. සමහර.

තබ්බාදීහි වුත්තකත්තා යථා–කාරකො දෙවදත්තො කාරිකා ඉත්ථි කාරකං කුලම්ච්චාදි–1

ණාදීහි යථා–අධම්මිකො පුරිසො අධම්මිකා ඉත්ථි අධම්මිකං කුලං–2

න ධම්මො අධම්මො ධම්මමත්තං නිවත්තෙත්වා අපරො පාණාතිපාතාදිකො විධීයතෙ තතො'ත්‍ර නකාරො පරියුදාසෙ පරිතුලිතමුග්ගය්හ නිසෙධෙතබ්බස්ස අසනං ඛෙපො වජ්ජනං පරියුදාසොති–

---

ණො–භින්න විසෙසනත්තා නානගුණසංවිඤ්ඤාණො අතග්ගුණ සංවිඤ්ඤාණො ”

1. තබ්බාදීහි, තබ්බාදීන් විසින්; වුත්තකත්තා, උක්තකර්තෘ තෙම; යථා, මෙසේයි–කාරකො–පෙ–කුලං, ඉති “කාරකො–පෙ–කුලං” යන; ආදි, මේ ආදියයි–කාරකො, කරන්නාවූ; දෙවදත්තො, දෙවදත්තයි; කාරිකා, කරන්නාවූ; ඉත්ථි, ස්ත්‍රීයි; කාරකං, කරන්නාවූ; කුලං, කුල යයි. (මෙහි “කර කරණෙ” යන ධාතුහු කෙරෙන් පරව කර්තෘකාරක යෙහි ණක ප්‍රත්‍යය වූ හෙයින් තබ්බාදීන් විසින් කර්තෘ උක්තයි.)

2. ණාදීහි, ණාදීන් විසින් (උක්තකර්තෘ තෙම;) යථා, මෙසේයි–අධම්මිකො—පෙ—කුලං, “අධම්මිකො—පෙ—කුලං” යන මේයි–අධම්මිකො, අධර්මය කරන්නාවූ (නොහොත්) අධර්මයෙහි හැසිරෙන්නාවූ; පුරිසො, පුරුෂයි; අධම්මිකා, අධර්මයෙහි හැසිරෙන්නාවූ; ඉත්ථි, ස්ත්‍රීයි; අධම්මිකං, අධර්මයෙහි හැසිරෙන්නාවූ; කුලං, කුලයයි;

එක් අර්ථයක්හුගේ විභාවනය පිණිස දැක්වූ යම් උදාහරණයකින් අර්ථාන්තරයක්හුගේ ප්‍රකාශයද කරණු කැමතහොත් එසේවූ උදාහරණය පෑ ඒ අර්ථාන්තරයාගේද ප්‍රකාශකිරීම මෙහි ශාස්ත්‍රකාර ගති යෙක් නුයි. ණාදීන් විසින් උක්තකර්තෘ විභාවන මුඛයෙන් නඤ් සහිතකොට දැක්වූ “අධම්මිකො” යන්නෙහි නිෂ්පත්ති විවරණමුඛයෙන් නඤර්ථ විභාගයද කරණු කැමතිව “න ධම්මො” යනාදිය කියනලදී.

1. න ධම්මො, ධර්මනොවූ යේ (නොහොත්) ධර්මයට ප්‍රතිපක්ෂවූ යේ; අධම්මො, අධර්මයයි; ධම්මමත්තං, ධර්මමාත්‍රය(හුදෙක් ධර්මයම;) නිවත්තෙත්වා, වළකා; අපරො, (එයින්) අන්‍යවූ; පාණාතිපාතාදිකො, ප්‍රාණ වධාදි කිසිවෙක්; විධීයතෙ, විධානකරණු ලැබෙයි; (අධර්ම ශබ්දයෙන් කියනු ලැබෙයි.) තතො, එහෙයින්; (හෙවත් ක්‍රියාන්තර නිෂෙධයක් නැතිව කාරකාන්තර විධානය හෙතු කොට ගෙණ;) අත්‍ර, මේ (“අධම්මිකො” යන) උදාහරණයෙහි; නකාරො, නශබ්දය තෙම; පරියුදාසෙ, පර්‍ය්‍යුදාසයෙහි වැටෙයි; (පරියුදාස නම් කිමෙක්ද යත්?) පරිතුලිතං, නිෂෙධ්‍යා හා තුල්‍යවැ්‍යනු; උග්ගය්හ, ගෙණ; නිසෙධෙ

අඤ්ඤන්තරම'නපෙක්ඛිත්වා සබ්බථා'ඤ්ඤස්ස නිවත්තනං පන පසජ්ජප්පටිසෙධො පටිසෙධෙතබ්බමෙව පසජ්ජ පත්වා තං සදිසම'නපෙක්ඛිත්වා නිසෙධො පසජ්ජප්පටිසෙධොති. 1

පසජ්ජප්පටිසෙධො සො සබ්බථා'ඤ්ඤනිවත්තනං
ඤෙය්‍යො පරියුදසො තු වත්ථුතො'ඤ්ඤප්පවුත්තියා–2.

අධම්මං චරතීති අධම්මිකො-3-

සමාසෙන යථා–ජිතින්ද්‍රියො භික්ඛු ජිතින්ද්‍රියා භික්ඛුණී ජිතින්ද්‍රියං සාධු කුලමිච්චාදි–4.

---

තබ්බස්ස, ප්‍රතිෂෙධකටයුතු වස්තුහුගේ; අසනං, අසනයයි සේය; ඛෙපො, ඛෙපයයි සේය; වජ්ජනං, දුරුකිරීම; පරියුදසොති, පර්යුදස නම් වෙයි යනමෙයි; (මේ පර්යුදස සවරූප නමැයි සේයි.)

1. අඤ්ඤන්තරං, (ප්‍රතිෂෙධ්‍ය වස්තුහු කෙරෙන්) අන්‍යවස්තුවක්; අනපෙක්ඛිත්වා, (පර්යුදසයෙහි මෙන්) අපෙක්ෂා නොකොට; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; අඤ්ඤස්ස, (නිෂෙධ්‍ය) වස්තුහුගේ; නිවත්තනං පන, වැළැක්ම වනාහි; පසජ්ජප්පටිසෙධො, ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධ නම් වේ; (කුමක් හෙයින්ද යත්?) පටිසෙධෙතබ්බමෙව, ප්‍රතිෂෙධ්‍ය වස්තුවටම; (හෙවත් ප්‍රතිෂෙධකටයුතු වස්තුහු කරාම;) පසජ්ජ, පසජ්ජයයි සේයි; පත්වා, පැමිණ; තං සදිසං, ඒ නිෂෙධ්‍යයහා සදෘශ වස්තුවක්; අනපෙක්ඛිත්වා, අපෙක්ෂා නොකොට; නිසෙධො, නිෂෙධය; පසජ්ජප්පටිසෙධොති, ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධ නම් වෙයි කියායි.

2. සො පසජ්ජප්පටිසෙධො, ඒ ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධය තෙම්; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; අඤ්ඤනිවත්තනං, (නිෂෙධ්‍ය) වස්තුහුගේ වැළැක්මය; පරියුදසො තු, පර්යුදසය වනාහි; වත්ථුතො, (ප්‍රතිෂෙධ්‍ය) වස්තුහු කෙරෙන්; අඤ්ඤප්පවුත්තියා, අන්‍යවස්තුවෙක්හි (නඤ් හුගේ විධායකත්වයෙන්) ප්‍රවෘත්තිය හෙතු කොට ගෙණ; ඤෙය්‍යො, දතයුතුයි.

3. අධම්මං චරතීති, අධර්මය කෙරේනුයි (නොහොත්) අධර්මයෙහි හැසිරේනුයි; අධම්මිකො, අධාර්මික නම් වේ. (මෙහි කර්තෲයෙහි සිද්ධවූ "චරති" යන්නහුගේ අර්ථයෙහි ඉක ප්‍රත්‍යය වූ හෙයින් ණාදීහු විසින් කර්තෲ උක්ත නම් වේ.

4. සමාසෙන, සමාසයා විසින් (උක්තවූකර්තෲ තෙම;) යථා, මෙසේයි– ජිතින්ද්‍රියො—පෙ—කුලමිති, "ජිතින්ද්‍රියො—පෙ—කුලං" යන; ආදි, මේ ආදියයි; ජිතින්ද්‍රියො, දිනනලද ඉඳුරන් ඇති; භික්ඛු, භික්ෂුයි; ජිතින්ද්‍රියා, දිනනලද ඉඳුරන් ඇති; භික්ඛුණී, භික්ෂුණියි; ජිතින්ද්‍රියං,

යදා කම්මං'වනායාසකත්තබ්බත්තවසෙන තු
කත්තුතායිච්ඡතෙ වත්තුං කම්මකත්තා'යං මතො. 1

යථා– ඡිජ්ජතෙ කුසූලො සයමෙවෙච්චාදී–එත්ථ වාක්‍යතො උද්ධරිත්වා පදං නිප්ඵාදීයතීති ඡිජ්ජතෙ ඉච්චත්‍ර තෙප්පච්චයො කම්මෙයෙව-නිප්ඵාදෙත්වා පරිච්චත්තානං පදානං පදන්තරසම්බන්ධස්සා'නියතත්තා සයං සද්ද සම්බන්ධෙන'ස්සෙව කම්මස්ස කත්තුතා පතීයතෙ–2

---

දනනලද ඉදුරන් ඇති; සාධු කුලං, සාධුකුලයයි; (මෙහි ජීත ඉන්ද්‍රිය ශබ්දයෝ දෙදෙන "යෙන" යන තෘතියාර්ථයෙහි සමසනවූ නුයි ජීතින්ද්‍රිය ශබ්දයෙන් කර්තෘ උක්තයි.)

1. යදා තු, යම් කලෙක්හි වනාහි; කම්මං එව, කර්මයම; අනායාස, නිරායාසයෙන්, කත්තබ්බත්තවසෙන, කර්තව්‍යතාවශයෙන්; කත්තුතාය කර්තෘත්වයෙන්; වත්තුං, කියන පිණිස; ඉච්ඡතෙ, (වක්තෘතෙම) කැමනිවේද; (තදා, එකල්හි;) අයං, මේ තෙම; කම්මකත්තාති, කර්මකර්තෘ යයි; මතො, දන්නාලදී.

2. යථා, මෙසේයි; ඡිජ්ජතෙ කුසූලො සයමෙවෙති, "ඡිජ්ජතෙ කුසූලො සයමෙව" යන; ආදි, මේ ආදියයි; කුසූලො, කුසූලය තෙම; *සයමෙව, තමාවිසින්ම; ඡිජ්ජතෙ, බිඳෙනුලැබේ; එත්ථ, මේ උදාහරණයෙහි; වාක්‍යතො, පදසමූහයෙන්; උද්ධරිත්වා, උදුරා; (වෙන්කොට) පදං, පදය තෙම; නිප්ඵාදීයතීති, නිපදවනු ලැබේනුයි; ඡිජ්ජතෙ ඉති, "ඡිජ්ජතෙ" යන; අත්‍ර, මේ පදයෙහි; තෙප්පච්චයො, තෙ ප්‍රත්‍යය තෙම; කම්මෙයෙව, කර්මයෙහිම වෙයි; නිප්ඵාදෙත්වා, නිපදවා; පරිච්චත්තානං, පරිත්‍යක්තවූ; පදානං, පදයන්ගේ; † පදන්තර, අන්‍ය පදයන්ගේ; සම්බන්ධස්ස, සම්බන්ධයාගේ; අනියතත්තා, අනියතබව හෙතු කොට ගෙණ; (හෙවත් නියමයක් නැති බැවින්) සයංසද්දසම්බන්ධෙන, සයං ශබ්දයා හා යොගයෙන්; අස්සෙව කම්මස්ස, (කුසූලසංඛ්‍යාතවූ) මෙම කර්මයාගේ; කත්තුතා, කර්තෘත්වය; පතීයතෙ, දන්නා ලැබේ.

"ඡිජ්ජතෙ කුසූලො සයමෙව" යනාදියෙහි; "ඡිජ්ජතෙ" යන පදය සුඛවූ කර්මත්වයම ආශ්‍රයකොට ආදි සිද්ධකරණු ලැබෙයි පසුව "කෙන ඡිජ්ජතෙ" යන අපෙක්ෂාවෙහි "සයමත්තනා ඡිජ්ජතෙ න දෙවදත්තාදිනා" යි කියා සයං ශබ්දසම්බන්ධය හෙතු කොට ගෙණ කුසූලයාගේ කර්තෘත්වය තෙමේ බන්ධුකපුෂ්පාදි සන්නිධානයෙහි ස්ඵටිකයාගේ රක්තත්වය මෙන් ගම්‍යමානවූයේ බාහ්‍යාශ්‍රයත්වය බහිරඞ්ගනුයි අන්‍ය

---

* කොටු ගෙය තෙම;—† පරිච්චත්තානං පදානං, හරණලද පදයන්ගේ; සමහර.

තස්මා වුත්තො කම්මකත්තා කුසූලො—කත්තුත්තවචනිච්ඡායන්තු කත්තරි පච්චයෙ භිඥති කුසූලො සයමෙවෙති භවති–1.

කම්මාවචනිච්ඡායන්තු භාවෙ පච්චයෙ භිජ්ජතෙ කුසූලෙන සයමෙ වෙවචාදි භවති–එවං තබ්බාදිසුපි කම්මකත්තා යථායොගං පටිපජ්ජි තබ්බො-2.

වුත්තකරණං යථා. සිනානියො ආපො සිනානියා මත්තිකා සිනා නියං චුණ්ණං-3.

---

රූඪවූ කර්මත්වය බාධානොකොට හෙයි එහෙයින් පදසංස්කාර කාල යෙහි සන්නිහිත කර්මත්වය අපෙක්ෂාකොට "භිජ්ජතෙ" යන සාමාන්‍ය වචනයෙන්ම ප්‍රයොගයද අර්ථයද සිද්ධනුයි මේ ව්‍යාකරණයෙහි පාණිනියාදියෙහි මෙන් විශෙෂ වචනයෙකින් නොකරණලද යනු අභිප්‍රායි. *

1. තස්මා, එහෙයින්; කුසූලො, කුසුලය තෙම; වුත්තො කම්මකත්තා, උක්තවූ කර්මකර්තෘයි. කත්තුත්තවචනිච්ඡායන්තු, කර්තෘත්වයාගේ කථනාභිප්‍රායක් ඇතිකල්හි වනාහි; කත්තරි පච්චයෙ, කර්තෘයෙහි ප්‍රත්‍යය කළකල්හි; භිඥති කුසූලො සයමෙවෙති, "භිඥති කුසූලො සයමෙව" යි කියා; භවති, (ප්‍රයොගය) වේ; කුසූලො, කුසුලයතෙම; සයමෙව, තමාම; භිඥති, බිඳී; (තමාම යනු ගම්‍යයි)

2. කම්මාවචනිච්ඡායන්තු, විද්‍යමානවූ කර්මය නොකියටිකල්හි වනාහි; † භාවෙ පච්චයෙ, භාවයෙහි ප්‍රත්‍යය කළකල්හි; භිජ්ජතෙ කුසූලෙන සයමෙවෙති, "භිජ්ජතෙ කුසූලෙන සයමෙව" යන; ආදී, මේ ආදිය භවති, වේ; කුසූලෙන සයමෙව, කුසුලයා තමා විසින්ම; භිජ්ජතෙ, බිඳීමයි; තබ්බාදිසුපි, තබ්බාදීන්ගේ ප්‍රයොග විෂයෙහිදු; කම්මකත්තා, කර්ම කර්තෘ තෙම; යථායොගං, යෙදෙනයෙදෙන පරිද්දෙන්; එවං පටි පජ්ජිතබ්බා, මෙසේම දතයුතුයි.

3. වුත්ත කරණං, (තබ්බාදී සමාසයන් විසින්) උක්තවූ කරණය; යථා මෙසේයි; සිනානීයො—පෙ—නිබාදනං, "සිනානීයො—පෙ—නිබා දනං" යනමේයි–සිනානීයො, ස්නානයට කාරණාවූ; ආපො, ජල යයි; සිනානියා, ස්නානයට වහල්වූ; මත්තිකා, මෘත්තිකාවයි; සිනා නියං, ස්නානයට වහල්වූ; චුණ්ණං, චූර්ණයයි; "සිනායත්‍යනෙන" යන වාක්‍යයෙහි කරණයෙහි අනීය ප්‍රත්‍යය වූ හෙයින් තබ්බාදීන් විසින් ආපාදිය උක්තකරණ නම් වේ.

---

* මේ මෞද්ගල්‍යායනයෙහි පාණිනියයෙහි මෙන් "කර්මවත් කර්මණා තුල්‍ය ක්‍රියඃ" යන සූත්‍රයෙන් විශෙෂ වචනයෙහි නොකරණලද යනුයි.

† විද්‍යමාන කර්මයාගේ කථනෙච්ඡාක් නැති කල්හි; සමහර.

ඡින්නරුක්ඛො ඵරසු ඡින්නරුක්ඛා වාසි ඡින්නරුක්ඛං නිඛාදනං 1.

වුත්තසම්පදානං යථා–දනීයො භික්ඛු දනීයා භික්ඛුණී දනීයං කුලං– දින්නභොජනො භික්ඛු දින්නභොජනා භික්ඛුණී දින්නභොජනං කුලං-2

වුත්තාවධි යථා–භීමො යක්ඛො භීමා යක්ඛිණී භීමං යක්ඛකුලං— අපගතකාළකො පටො අපගතකාළකා භිත්ති අපගතකාළකං වත්ථං–3

වුත්තාධාරො යථා–යාතො ගාමො යාතා නදී යාතං ඨානං–රුක්ඛවා දෙසො රුක්ඛවතී භූමි රුක්ඛවන්තං ඨානං–4.

බහුමාතඞ්ගො ගාමො බහු මාතඞ්ගා වනරාජි බහු මාතඞ්ගං වනං–

---

1. ඡින්නරුක්ඛො, ඡින්නවූ වෘක්ෂයන්ට කාරණවූ; ඵරසු, පොරොවයි; ඡින්නරුක්ඛා, කපනලද වෘක්ෂයන් ඇති; වාසි, වෑයයි; ඡින්නරුක්ඛං, කපනලද වෘක්ෂයන් ඇති; නිඛාදනං, නියනයි; "ඡින්නා රුක්ඛා යෙන" යන වාක්‍යයෙහි "යෙන" යන කරණාර්ථයෙහි සමාසවූ හෙයින් ඵරසු ආදී කරණය සමාසයෙන් උක්තයි.

2. වුත්තසම්පදානං, (තබ්බාදි සමාසයන් විසින්) උක්ත සම්ප්‍රදානය; යථා මෙසේයි–දනීයො–පෙ–කුලං, "දනීයො–පෙ–කුලං" යන මේයි. දනීයො, දනප්‍රතිග්‍රාහකවූ; භික්ඛු, භික්ෂුයි; දනීයා, දනප්‍රතිග්‍රාහකවූ; භික්ඛුණී, භික්ෂුණීයි; දනීයං, දනප්‍රතිග්‍රාහකවූ; කුලං, කුලයයි. "දියතෙ යස්ස" යන වාක්‍යයෙහි සම්ප්‍රදානයෙහි අනීයප්‍රත්‍යය වූ හෙයින් තබ්බාදීන් විසින් භික්ෂු ආදී සම්ප්‍රදානය උක්තයි.) දින්නභොජනො, දෙනලද භොජනය පිළිගන්නාවූ; භික්ඛු, භික්ෂුයි; දින්නභොජනා, දෙනලද භොජන ඇති; භික්ඛුණී, භික්ෂුණීයි; දින්නභොජනං, දෙනලද භොජන ඇති; කුලං, කුලයයි; ("දින්නානි භොජනානි යස්ස" යන වාක්‍යයෙහි "යස්ස" යන අන්‍ය පදයාගේ අර්ථයෙහි සමාසවූ හෙයින් සමාසයෙන් සම්ප්‍රදානය උක්ත නම් වේ.)

3. වුත්තාවධි, (තබ්බාදි සමාසයන් විසින්) උක්තවූ අවධි තෙම; යථා, මෙසේයි; භීමො—පෙ—වත්ථං, "භීමො—පෙ—වත්ථං" යන මේයි. භීමො, භයජනකවූ; යක්ඛො, යක්ෂයි; භීමා, භයජනකවූ; යක්ඛිණී, යක්ෂිණීයි; භීමං, භයට කාරණවූ; යක්ඛකුලං, යක්ෂකුලයයි. ("භායන්ති යස්මා" යන වාක්‍යයෙහි අවධියෙහි 'ම' ප්‍රත්‍යය වූ හෙයින් තබ්බාදීන් විසින් යක්ෂාදිඅවධිය උක්තයි.) අපගතකාළකො, පහවූ කෘෂ්ණවර්ණාවධිවූ; පටො, වස්ත්‍රයයි; අපගතකාළකා, පහවූ කළුපැ ඇති; භිත්ති, භිත්තියයි; අපගතකාළකං, පහවූ කළුපැ ඇති; වත්ථං, වස්ත්‍රයයි; ("අපගතං කාළකං යස්මා" යන වාක්‍යයෙහි "යස්මා" යන අන්‍ය පදයාගේ අවධි අර්ථයෙහි සමාසවූ හෙයින් පටාදිඅවධිය සමාසයෙන් උක්තයි.)

4. වුත්තාධාරො, (තබ්බාදි ණාදි සමාසයෙන්) උක්තවූ ආධාරය තෙම; යථා, මෙසේයි. යාතො ගාමො–පෙ–වනං, "යාතො ගාමො–පෙ–වනං"

**වුත්ත සම්බන්ධො යථා–ගොමා දෙවදත්තො ගොමතී වනිතා ගොමන්තං කුලං–උපදසො පුරිසො උපදසා ඉත්ථී උපදසං කුලං–1.**

---

යන මේයි. යාතො, යාමට ස්ථානවූ; ගාමො, ගමයි; යාතා, යාමට ස්ථානවූ; නදී, නදියයි; යාතං, ගියාවූ; ඨානං, ස්ථානයයි; ("යාතවන්තො සමිං" යන වාක්‍යයෙහි "යා පාපුණනෙ" යන ධාතුහු කෙරෙන් ආධාරයෙහි තප්‍රත්‍යය වූ හෙයින් තබ්බාදීන් විසින් ගාමාදි ආධාරය උක්ත නම් වේ.) රුක්ඛවා, බොහෝ වෘක්ෂයන් ඇත්තාවූ; දෙසො, දෙශයයි; රුක්ඛවතී, බොහෝ වෘක්ෂයන් ඇත්තාවූ; භූමි, භූමියයි; රුක්ඛවන්තං, බොහෝ වෘක්ෂයන් ඇත්තාවූ; ඨානං, ස්ථානයයි; ("පහූතා රුක්ඛා අස්මින්ති" යන වාක්‍යයෙහි "අස්මිං" යන ආධාරාර්ථයෙහි වන්තු ප්‍රත්‍යය වූ හෙයින් ණාදීන් විසින් දෙශාදි ආධාරය උක්ත නම් වේ) බහුමාතඞ්ගො, බොහෝ හස්තීන්ට ස්ථානවූ (හෙවත්) බොහෝ ඇතුන් ඇති; ගාමො, ග්‍රාමයයි; බහුමාතඞ්ගා, බොහෝ හස්තීන්ට ස්ථානවූ; වනරාජී, වනරේඛාවයි; බහුමාතඞ්ගං, බොහෝ හස්තීන් ඇති; වනං, වනයයි ("බහවො මාතඞ්ගා යස්මිං" යන වාක්‍යයෙහි "යස්මිං" යන අන්‍ය පදයාගේ ආධාරාර්ථයෙහි සමාස වූ හෙයින් සමාසයෙන් ආධාරය උක්තයි).

1. වුත්තසම්බන්ධො, (ණාදි සමාසයෙන්) උක්ත සම්බන්ධය; යථා, මෙසේයි. ගොමා–පෙ–කුලං, "ගොමා––පෙ––කුලං" යන මේයි. ගොමා, බොහෝ පශූන් ඇති; දෙවදත්තො, දෙවදත්තයි; ගොමතී, බොහෝ ගෙරින් ඇති; වනිතා, අඟනයි; ගොමන්තං, බොහෝ ගෙරින් ඇති; කුලං, කුලයයි;("පහූතා ගාවො අස්ස සන්ති" යන වාක්‍යයෙහි "අස්ස" යන ෂෂ්ඨ්‍යර්ථයෙහි මන්තු ප්‍රත්‍යය වූ හෙයින් ණාදීන් විසින් දෙවදත්තාදි සම්බන්ධය උක්ත නම් වේ) උපදසො, සමීපගතවූ දශයක් ඇති; පුරිසො, (නවවැනිවූ හෝ එකොළොස් වැනිවූ හෝ) පුරුෂයි; උපදසා, සමීප දශයක් ඇති; ඉත්ථී, (නවවැනිවූ හෝ එකොළොස් වැනිවූ හෝ) ස්ත්‍රීයි; උපදසං, සමීපවූ දශයක් ඇති; කුලං, (නවවැනිවූ හෝ එකොළොස් වැනිවූ හෝ) කුලයයි; (දශයක් සමීපවීම නවයකට හෝ එකොළොසකට මුත් නැත්තුයි නවවැනිවූ හෝ එකොළොස් වැනිවූ හෝ යි කියනලදී.) "උපගතා සමීපගතා දස එතස්ස නවමස්ස එකාදසමස්ස වා" යන වාක්‍යයෙහි "එතස්ස" යන අන්‍ය පදයාගේ ෂෂ්ඨ්‍යර්ථයෙහි "උපදසො" යි සමාස වූ හෙයින් සමාසයෙන් පුරුෂසඞ්ඛ්‍යාත සම්බන්ධය උක්ත නම් වේ.

"විසු කාරක භාවෙසු" යනාදීන් තබ්බාදීන්ගේද "වත්තමානාදිකාලෙසු" යනාදීන් ත්‍යාදීන්ගේද විෂයවූ අර්ථය නියම්කළ හෙයින් ණාදි

කාරණා'වධිතො'ඤ්ඤත්ථ භීයො දිස්සන්ති ණාදයො
සමාසො පන සබ්බත්ථ හොති සම්බන්ධකාරකෙ–1.

මුඛ්‍යං වදන්ති කත්තාරං පච්චයො'නෙකකත්තුකෙ
මුඛ්‍යො පයොජකො ඤෙය්‍යො පයුත්තො නා'පරෙහිච.

යථා–පාචයතොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො–2.

---

සමාසයන්ගේද විෂයවූ අර්ථය නියම කරණු පිණිස "කාරණාවධිතො" යනාදී කියනලදී.

1. ණාදයො, ණාදී ප්‍රත්‍යයෝ; කාරණාවධිතො, කරණ අවධි දෙකින්; අඤ්ඤත්ථ, අන්‍යවූ කාරකයෙහිද සම්බන්ධයෙහිද; භීයො, බොහෝසේ; දිස්සන්ති, දක්නාලැබෙති; සමාසො පන, සමාසය වනාහි; සබ්බත්ථ සම්බන්ධකාරකෙ, සියලු සම්බන්ධකාරකයෙහි; හොති, වේ.

ණාදිනු කරණාවධි දෙකින් පිටත් සම්බන්ධ කාරකයෙහි බොහෝ සේ දක්නාලැබෙති සමාසය සියලු සම්බන්ධ කාරකයෙහි වෙයි එහෙයින් උක්ත කරණාවධියට උදාහරණ දක්වන තෙන ණාදීන් හැර සෙස්සෙහි දක්වනලද සියලු කාරක සම්බන්ධයෙහිම සමාසොදාහරණ දක්වනලදී. මෙසේ ෂට්කාරක සම්බන්ධයන්ගේ උක්තත්වය දක්වා දැන් කර්තෘ කර්ම දෙදෙනාගේම අනෙක කර්තෘකර්මවිෂයෙහි උක්තානුක්ත විභාග දක්වන පිණිස "මුඛ්‍යං" යනාදී කියනලදී. *

2. අනෙකකත්තුකෙ, නොයෙක් කර්තෘන් ඇති ධාතුයෙහි කරණලද; පච්චයො, (ත්‍යාදිතවයාදි) ප්‍රත්‍යය තෙමේ; මුඛ්‍යං කත්තාරං, ප්‍රධාන කර්තෘහු; වදන්ති, කියන්නේය; (නොහොත්) පච්චයො, (කර්තෘයෙහි කරණලද ත්‍යාදි තබ්බාදි) ප්‍රත්‍යය තෙම; අනෙක කත්තුකෙ, නොයෙක් කර්තෘන් ඇති ධාතු විෂයෙහි (නොහොත්) නොයෙක් කර්තෘන් අතුරෙන්; මුඛ්‍යං කත්තාරං වදන්ති, මුඛ්‍ය කර්තෘහු කියන්නේය; (මුඛ්‍ය නම් කවරේද යත්?) පයොජකො, ප්‍රයොජක කර්තෘතෙම; අපරෙහි, අන්‍යවූ ප්‍රයොජකයන් විසින්; නපයුත්තො, නොමෙහෙය නලද්දේවිනම්; මුඛ්‍යො ඤෙය්‍යො, මුඛ්‍ය කර්තෘයයි දතයුතු. යථා, මෙසේයි. පාචයතොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො, "පාචය තොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො" යන මේයි. යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; ඔදනං, තඹුලය; පාචයති, පිසවා; (මෙහි යඤ්ඤදත්තය දෙවදත්තය යන කර්තෘවයක් ඇත්තාවූ පච්ධාතුහු කෙරෙන් ණි ප්‍රත්‍යය වන්නේ මුඛ්‍ය කර්තෘයෙහි වේ නුයි "යඤ්ඤදත්තො" යනු උක්තවූ ප්‍රයොජක කර්තෘය එහෙයින් අර්ථමාත්‍රයෙහි ප්‍රථමාවෙයි. "දෙවදත්තෙන" යනු අනුක්ත ප්‍රයොජ්‍ය කර්තෘය එහෙයින් කර්තෘයෙහි තෘතීයා වේ.)

---

* ණාදිහු කරණාවධි දෙකින් පිටත් කාරකයෙහිද සම්බන්ධයෙහිද බොහෝසේ දක්නා ලැබෙති සමාසය ෂට්කාරක සම්බන්ධයෙහි වේ–ෂට්කාරක සම්බන්ධයන්ගේ උක්තානුක්තය දක්වා දැන් කර්තෘ කර්ම දෙදෙනාගේම අනෙක කර්තෘකර්මවිෂයෙහි උක්තානුක්ත විභාග දක්වත්–සමහර.

යදතු පයොජකොප්‍ය'ඤ්ඤෙන පයුජ්ජියති තදා ණායන්තාපි ණිප්පච්චයො-යථා–පාචයතොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තෙන විඤ්ඤාපිතො–1.

වදෙ කම්මං දුහාදීනම'මුඛ්‍යං නයාදිකෙතරං
කම්මජෙ'නෙකකම්මෙසු පයොජ්ජං ණිම්හි වෙතරං–2.

---

1. යදතු, යම් කලෙක්හි වනාහි; පයොජකොපි, ප්‍රයොජක කර්තෘද; අඤ්ඤෙන, අනික් ප්‍රයොජකයකු විසින්; පයුජ්ජියති, මෙහෙයනු ලැබේද; තදා, එකල්හි; ණායන්තාපි, ණායන්තයා කෙරෙන්ද; ණිප්පච්චයො, ණිප්‍රත්‍යය වේ; යථා, මෙසේයි; පාචයතොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තෙන විඤ්ඤාපිතො, "පාචයතොදනං දෙවදත්තෙන යඤ්ඤදත්තෙන විඤ්ඤාපිතො" යන මේයි. විඤ්ඤාපිතො, විඥාපිත තෙම; යඤ්ඤදත්තෙන, යඤ්ඤදත්තයා ලවා; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; ඔදනං, තඬුලය; පාචයති, පිසවා.

* 2. අනෙක කම්මෙසු, නොයෙක් කර්ම ඇති ධාතූන් විෂයෙහි (ද්වේ හෝ නොහොත්) අතුරෙන්; කම්මජෙ පච්චයො, කර්මයෙහිවූ නයාදි ප්‍රත්‍යයතෙම; දුහාදිනං, දුහාදි ධාතූන්ගේ; අමුඛ්‍යං කම්මං, (ධෙනුවාදි) අප්‍රධාන කර්මයද; නයාදිකෙ, නයාදියෙහි; ඉතරං, අන්‍යවූ (භාරාදි) ප්‍රධාන කර්මයද; වදෙ, කියන්නේය; ණිම්හි, (ප්‍රයොජකව්‍යාපාරයෙහි) ණි කළ කල්හි; පයොජ්ජං වා, ප්‍රයොජ්‍යවූ මානවකාදි කර්මය හෝ; ඉතරං, අන්‍යවූ ග්‍රාමාදිකර්මය හෝ; වා, විකල්පයෙන්; වදෙ, කියන්නේය†.

මෙහි ප්‍රයොජක විෂයෙහි කරණලද පාචි යන ණායන්තයා කෙරෙන් දෙවන ප්‍රයොජක ක්‍රියායෙහි 'ණි' කළ කල්හි පූර්ව'ණි'හට "ණිණාපීනං තෙසු" යන සූත්‍රයෙන් ලොප්කොට තබාගත් පාචි යන ධාතුහු කෙරෙන් මිතිය ප්‍රයොජකයෙහි ති ප්‍රත්‍යය වෙයි. එහෙයින් "විඤ්ඤාපිතො" යි උක්ත ප්‍රයොජක කර්තෘයෙහි ප්‍රථමා වෙයි. "යඤ්ඤදත්තෙන දෙවදත්තෙන" යි අනුක්ත ප්‍රයොජ්‍ය කර්තෘ හෙයින් කර්තෘයෙහි තෘතියා වේ.

---

* අනෙක කම්මෙසු, නොයෙක් කර්ම ඇති ධාතූන් විෂයෙහි (ද්වේ හෝ නොහොත්) නොයෙක් කර්මයන් අතුරෙන්; දුහාදීනං, දුහාදී ධාතූන්ගේ; අමුඛ්‍යං කම්මං, අප්‍රධාන කර්මයද; නයාදිකෙතරං කම්මං, නයාදි ධාතූන්ගේ ප්‍රධාන කර්මයද; ණිම්හි, (ප්‍රයොජක ක්‍රියායෙහි) ණි ප්‍රත්‍යය කළකල්හි; පයොජ්ජං වා, ප්‍රයොජ්‍ය කර්තෘද හෝ; ඉතරං වා, එයින් අන්‍යවූ කර්මයද හෝ; කම්මජෙ, කර්මයෙහිවූ ප්‍රත්‍යයතෙමේ; වදෙ, කියන්නේයි. සමහර පොත්.

† "පයොජ්ජං" යනු ශ්‍රැතහෙයින් "ශ්‍රැතානුමිතයොඃ ශ්‍රැතසම්බන්ධ එව බලීයාන්" යනු හෙයින් ප්‍රයොජක ව්‍යාපාරයෙහි ණිප්‍රත්‍යයම ගන්නා

පයොජ්ජෙ නියමො'යඤ්ච ගත්‍යත්ථාදිසු නීයතං
පයොජ්ජෙ කම්මතාපත්ති ඤෙය්‍යා සාමත්ථියෙන තු–1.

---

ණි ප්‍රත්‍යය කළාවූ හැම ප්‍රයොජ්‍යයම කියාද යන ආශංකායෙහි එක් විෂයෙක්හියයි නියමකරණු පිණිස “පයොජ්ජෙ” යනාදි කියනලදි.

1. පයොජ්ජෙ, ප්‍රයොජ්‍ය විෂයෙහි; අයං නියමො ච, (කර්මජ ප්‍රත්‍යයා ප්‍රයොජ්‍යය විකල්පයෙන් කියයි යන) මේ නියමයද; * ගත්‍යත්ථාදිසු, ගමනාර්ථාදි ධාතූන් විෂයෙහි; නීයතං, පමුණුවනු ලැබේවා (නොහොත්) දන්නා ලැබේවා; (ප්‍රයොජ්‍යයෙහි යම් කර්මත්වයක් නිසා කර්මජ ප්‍රත්‍යය වේද? ඒ කර්මත්වය හඟවනු පිණිස “පයොජ්ජෙ කම්මතා” යනාදි කියනලදි) පයොජ්ජෙ, ප්‍රයොජ්‍යයෙහි; කම්මතාපත්ති තු, කර්මත්වයාගේ ප්‍රාප්තිය වනාහි; සාමත්ථියෙන, අර්ථබලයෙන් (හෙවත් ප්‍රයොජ්‍යත්වලක්ෂණවූ) අර්ථයාගේ ක්‍රියාවෙන්; (කර්මනුවූයේ වීනම් අන් කුමක් වේද? යන අන්‍යථානුපපත්ති ලක්ෂණ සාමර්ථ්‍යයෙන්); ඤෙය්‍යා, දත යුත්තීයි.

ප්‍රයොජ්‍යයා ගමනාදිය පිණිස මෙහෙයනුලබන්නේ ප්‍රයොජක ක්‍රියාවට කර්ම නොවේනම් මෙහෙයීමෙන්වූ ප්‍රයොජ්‍යත්වයාගේ අසම්භවය නුයි ව්‍යාපාරිත්වයෙන් සාක්ෂාත් ප්‍රතීයමානවූ ප්‍රයොජ්‍යත්ව ලක්ෂණවූ අර්ථයාගේ අන්‍යප්‍රකාරයකින් අනිෂ්පත්ති ලක්ෂණවූ සාමර්ථ්‍යයෙන් කර්මත්වය දතයුතුයි යනුභාවයි.

මෙසේ සාමර්ථ්‍යයෙන් ලභ්‍යමානවූ කර්මත්වය හැම ප්‍රයොජ්‍යයෙහිම ඇත්නුයි “කම්මෙ දුතියා” යන සූත්‍රයෙන් විතියාව සිඬවුවද “සිඬෙ සත්‍යාරම්භො නියමාය විකල්පාය වා” යනුහෙයින් “ගති බොධාහාර

---

ලැබෙයි අනුමිතවූ ස්වාර්ථයෙහි ණිප්‍රත්‍යය නොමගන්නා ලැබේ. මෙහි සමුච්චය ගම්‍යමාන නුයි “ගම්‍යමානාර්ථස්වාස්‍ය ශබ්දස්‍ය ප්‍රයොගම්ප්‍රති කාමාචාරාත්” යනු හෙයින් චශබ්දප්‍රයොග නොකළද සමුච්චය කොට අර්ථ කියනලදී. සමුච්චයාදිය සමුච්චයාදි යුක්තාර්ථවාචී ශබ්දයාගේ වත් මිස චශබ්දයාගේ කෙසේ වේද යත්? චශබ්දයාගේ වාචකත්වයක් නැතද ඔහුගේ සාන්නිධ්‍යයෙහි ව්‍යක්ත වේ නුයි කර්ත්‍රාදිගට තෘතීයාර්ථාදී ව්‍යවහාරයමෙන් ද්‍යොතකත්වයෙන් චශබ්දයාගේ අර්ථනම් වේ. එහෙයින් කිහ.

“ඉතරෙතරයොගාදිශබ්දානාමෙව තාදෘශාම්
අර්ථස්වකාරසාන්නිධ්‍යාව්‍යක්තනෙත්‍යස්‍ය කථ්‍යතෙ” යි.

* අයඤ්චනියමො, මේ නියමයද (හෙවත් ණි කළ කල්හි කර්මයෙහි ප්‍රත්‍යය ප්‍රයොජ්‍ය කර්මයෙහි විකල්පයෙන් කියයි යන නියමයද;) ඇතම්.

තත්‍ථ දුහාදීනමප්පධානං වුත්තකම්මං යථා–දුය්හතෙ පයො ගො ගොපාලෙන-යාචීයතෙ ගොමා ගාවිං විජෙන–අවරුන්ධතෙ වජං ගො ගොපාලකෙන–පුච්ඡීයතෙ මානවකො මග්ගං පථිකෙන–1.

---

සද්දත්‍ථා කම්මකාභජ්ජාදීනං පයොජ්ජේ" යන සූත්‍රයෙන් ගත්‍යර්ථාදි ධාතූන්ගේ ප්‍රයොජ්‍යයෙහිම ද්විතීයාව නියමකළ හෙයින් එයින් අන්‍යවූ ප්‍රයොජ්‍යයෙහි ද්විතීයානිවෘත්තිය වෙයි එහෙයින් විභක්තිය විනා අර්ථය දක්වන්ට නොපිළිවන් බැවින් ප්‍රයොජ්‍යයාගේ සාක්ෂාත් කර්තෘත්වය අපෙක්ෂා කොට කර්තෘයෙහි තෘතියා වේ. ප්‍රයොජ්‍යකර්මයෙහි වන්නාවූ ප්‍රත්‍යය වනාහි යම් ප්‍රයොජ්‍යයෙක්හි කර්මද්‍යොතකවූ විභක්තිය නොවේද එහි වාචකවූ ශබ්දයාත් කැලම නොවේනුයි තෘතීයා වන විෂය හැර ද්විතීයාවන විෂයෙහිම වේ. එහෙයින් මත්තෙහි කියනු ලැබේ.

"පයොජ්ජෙ යත්‍ථ යත්‍ථෙව දුතියා විහිතා සියා
පයොජ්ජං තං තදෙවෙත්‍ථ කම්මජො පච්චයො වදෙ" යි.

1. තත්‍ථ, ඒ අනෙක කර්මයන් අතුරෙන්; දුහාදීනං, දුහාදී ධාතූන්ගේ; අප්පධානං, අප්‍රධානවූ; වුත්තකම්මං, උක්තවූ කර්මය; යථා, මෙසේයි; දුය්හතෙ පයො ගො ගොපාලෙන—පෙ—සිස්සො ධම්මමනුසාසියති ගුරුණා, "දුය්හතෙ පයො ගො ගොපාලෙන—පෙ—සිස්සො ධම්ම මනුසාසියති ගුරුණා" යනමේයි–ගොපාලෙන, ගොපල්ලා විසින්; ගො, දෙන් තොම; පයො, ක්ෂීරය; දුය්හතෙ, දෝනාලැබේ. (මෙහි දොහන ක්‍රියාව හා සම්බද්ධ්‍යමාණවූ ක්ෂීරය ප්‍රයොජනත්වයෙන් අභිමතවී නුයි ක්ෂීරය ප්‍රධාන කර්මය ඒ ක්ෂීරයට නිමිත්තවූ ගො අප්‍රධානය එහෙයින් කර්මයෙහිවූ ඒ ප්‍රත්‍යයා විසින් ගො ස්වරූපවූ අප්‍රධාන කර්මය උක්තයි ක්ෂීරය අනුක්තයි–) විජෙන, බ්‍රාහ්මණයා විසින්; ගොමා, ගොමත් තෙම; ගාවිං, දෙන; යාචීයතෙ, ඉල්වනු ලැබේ; (මෙහි යාචන ක්‍රියාව හා සම්බන්ධකරණු ලබන්නාවූ ගො ස්වරූපය ප්‍රයොජන විඳුනාලබන හෙයින් ප්‍රධාන කර්මය ඉල්වන ලබන ගො රූපයට නිමිත්තවන හෙයින් ගොමත් තෙම අප්‍රධාන කර්මය එහෙයින් අප්‍රධාන ගොමත් තෙම උක්තකර්මය "ගාවිං" යනු අනුක්තකර්මයි) ගොපාලකෙන, ගොපල්ලා විසින්; ගො, දෙන් තොම; වජං, (අභෙදොපචාරයෙන්) වූජගත ගොපදෘෂ්ඨසමූහයට; අවරුන්ධතෙ, වළකනු ලැබේ; (ප්‍රවෙශකරණු ලැබේ.) (ගොරාසිකරණය ප්‍රයොජනය අවරුන්ධන ක්‍රියාවට කර්ම වූජ සමූහයෙක්නුයි ප්‍රධාන කර්මය තදවයවවූහෙයින්ම සමූහයට නිමිත්ත ගොතොම අප්‍රධානකර්මයි) පථිකෙන, මගීහු විසින්; මානවකො, මානවකතෙම; මග්ගං, මාර්ගය; පුච්ඡීයතෙ, විචාරණු ලැබේ. (පුච්ඡන

භික්ඛියති ගොමා ගාවං විජෙන—රුක්ඛො'වචියතෙ ඵලානි ලොකෙන– බ්‍රූයතෙ සිස්සො ධම්මමුපජ්ඣායෙන–සිස්සො ධම්මමනුසාසියති ගුරුනා. 1.

අත්‍රොපයුජ්ජමානපයාදීනං නිමිත්තභූතගවාදිනම'ප්පධානත්තා වුත්තත්තං. 2.

නයාදීනං පධානං වුත්තකම්මං යථා–නීයතෙ භාරො ගාමං දෙවදත්තෙන–වුය්හතෙ භාරො ගාමං අග්ගිදත්තෙන–හරියතෙ භාරො ගාමං යඤ්ඤදත්තෙන. 3

---

ක්‍රියාව හා සම්බන්ධනීයවූ මාර්ගය ප්‍රයොජන හෙයින් ප්‍රධානකර්මය මානවක තෙම පුච්ඡමානවූ මාර්ගයට කාරණානුයි අප්‍රධාන කර්මයි.)

1. විජෙන, බ්‍රාහ්මණයා විසින්; ගොමා, ගොමත් තෙම; ගාවං, දෙන; භික්ඛියති, යාච්ඤාකරණු ලැබේ. (මෙහි භික්ෂණ ක්‍රියා (වෙන්) ව්‍යාප්‍යවූ ගො තොම ප්‍රයොජනහෙයින් ප්‍රධාන කර්මය භික්ෂිතව්‍යවූ ගොහට කාරණා හෙයින් ගොමත්තෙම අප්‍රධාන කර්මයි) ලොකෙන, ජනයා විසින්; රුක්ඛො, වෘක්ෂය තෙම; ඵලානි, ඵලයන්; අවචියතෙ, අවලුවනු ලැබේ. (අවචිනනක්‍රියාභිසම්බන්ධ්‍යමානවූ ඒ ඵලයෝ ප්‍රයොජනත්වයෙන් ප්‍රධාන කර්මයහ අවචියමාන ඵලයන්ට කාරණාවූ වෘක්ෂය අප්‍රධාන කර්මයි) උපජ්ඣායෙන, උපාධ්‍යායයා විසින්; සිස්සො, ශිෂ්‍යතෙම; ධම්මං, ධර්මය; බ්‍රූයතෙ, කියනුලැබේ; ගුරුනා, ගුරුහුවිසින්; සිස්සො, ශිෂ්‍ය තෙම; ධම්මං, ධර්මය; අනුසාසියතෙ, අනුශාසනා කරණුලැබේ. (මෙහි බ්‍රූතික්‍රියාව්‍යාප්‍යවූද අනුශාසනක්‍රියාව්‍යාප්‍යවූද ධර්මය ප්‍රයොජන වන හෙයින් ප්‍රධාන කර්මය; බ්‍රූයමානවූද අනුශාස්‍යවූද ධර්මයට නිමිත්තාවූ ශිෂ්‍යතෙම අප්‍රධාන කර්මයි.)

2. අත්‍ර, මේ (යථොක්ත) උදාහරණයෙහි; උපයුජ්ජමාන, උපයොග කරණුලබන්නාවූ (හෙවත් ප්‍රයොජන විඳුනා ලබන්නාවූ; )පයාදීනං, ක්ෂීරාදීන්ට; නිමිත්තභූත, කාරණාවූ; ගවාදීනං, ගො ආදින්ගේ; අප්පධානත්තා, අප්‍රධානබව හෙයින්; වුත්තත්තං, උක්තබවයි.

3. නයාදීනං, නයාදී ධාතුන්ගේ; පධානං, ප්‍රධානවූ; වුත්තකම්මං, උක්තකර්මය; යථා, මෙසේයි. නීයතෙ–පෙ–ගාමං යඤ්ඤදත්තෙන, "නීයතෙ–පෙ–ගාමං යඤ්ඤදත්තෙන" යන මේයි. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; භාරො, භාරයතෙම; ගාමං, ගමට; නීයතෙ, පමුණුවනු ලැබේ. අග්ගිදත්තෙන, අග්ගිදත්තයා විසින්; භාරො, භාරයතෙම; ගාමං, ගමට; වුය්හතෙ, පමුණුවනුලැබේ. යඤ්ඤදත්තෙන, යඤ්ඤදත්තයා විසින්; භාරො, භාරයතෙම; ගාමං, ගමට; හරියතෙ, ගෙණ යනුලැබේ.

එත්ථ පන භාරස්ස නියමානස්ස පධානකම්මත්තා වුත්තත්තං–අය මෙත්ථ ද්වින්නං සඞ්ගහො. 1.

දුහි යාචි රුධි පුච්ඡි භික්ඛි චි බ්‍රූච සාසිච
දුහාදයො නයාදයො තු නී වහ හරධාතවො. 2

ගමනත්ථාදි ධාතූසෙව ණිම්හි පයොජ්ජමිතරං වා වුත්තකම්මං යථා. ගමීයතෙ මානවකො ගාමං දෙවදත්තෙන–ගාමො මානවකම්හි වා. බොධීයතෙ මානවකො ධම්මං ගුරුනා–ධම්මො මානවකම්හි වා. ඔදනං භොජීයතෙ මානවකො දෙවදත්තෙන–ඔදනො මානවකම්හි වා–3

---

1. එත්ථ පන, මේ උදාහරණයෙහි වනාහි; නියමානස්ස, ගෙණ යනුලබන්නාවූ; භාරස්ස, භාරයාගේ; පධානකම්මත්තා, ප්‍රධානකර්මබව හෙතු කොට ගෙණ; වුත්තත්තං, උක්තබව වේ. එත්ථ, මේ ප්‍රකරණයෙහි (ඇහෝ නොහොත්) මේ ව්‍යාකරණයෙහි; ද්වින්නං, දුහාදී නයාදී දෙදෙනාගේ; අයං, මේ (මතු කියන්නේ;) සඞ්ගහො, සඞ්ග්‍රහයි.

2. දුහි–පෙ–ධාතවො, "දුහි–පෙ–ධාතවො" යි කියායි–දුහි, දුහපපූරණෙ යන ධාතුවද; යාචි, යාච යාචනෙ යන ධාතුවද; රුධි, රුධි ආවරණෙ යන ධාතුවද; පුච්ඡි, පුච්ඡ පුච්ඡනෙ යන ධාතුවද; භික්ඛි, භික්ඛ යාචනෙ යන ධාතුවද; චි, චි චයෙ යන ධාතුවද; බ්‍රූච, බ්‍රූ වචනෙ යන ධාතුවද; සාසිච, සාස අනුසිට්ඨියං යන ධාතුවද; (යන මොහු) දුහාදයො, දුහාදීහු නම් වෙති; නයාදයො තු, නයාදීහු වනාහි; නී, නී පාපුණනෙ යන ධාතුවය; වහ, වහ පාපුණනෙ යන ධාතුවය; හරධාතවො, හර හරණෙ යන ධාතුවය; (යන මොහුයි.) *

3. ගමනත්ථාදි ධාතූසෙව, ගත්‍යර්ථාදි ධාතූන් විෂයෙහිම; ණිම්හි, ණිප්‍රත්‍යය කළකල්හි; පයොජ්ජං, ප්‍රයොජ්‍යවූ හෝ; ඉතරං වා, තදන්‍යවූ හෝ; වුත්තකම්මං, උක්තවූ කර්මය; යථා, මෙසේයි. ගමීයතෙ–පෙ–අඤ්ඤම්හි වා, "ගමීයතෙ–පෙ–අඤ්ඤම්හි වා" යන මේයි. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; මානවකො, මානවකතෙම; ගාමං, ගමට; ගමීයතෙ, යවනුලැබේ-ගාමො මානවකම්හි වා, "ගමීයතෙ ගාමො මානවකං දෙවදත්තෙන" කියා හෝ වේ. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; ගාමො, ග්‍රාමයතෙම; මානවකං, මානවකයා; ගමීයතෙ, යවනුලැබේ. (මත්තෙහිදු මෙම ක්‍රමයෙන් යොදා අර්ථ කියයුතු.) ගුරුනා, ගුරුහුවිසින්; මානවකො, මානවකතෙම; ධම්මං, ධර්මය; බොධීයතෙ, අවබොධ කරවනුලැබේ. ධම්මො මානවකම්හි වා, "ධම්මො මානවකං" කියා හෝ වේ. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; මානවකො, මානවකතෙම; ඔදනං, බත; භොජීයතෙ, කවනුලැබේ. ඔදනො මානවකම්හි වා, "ඔදනො මානවකං" කියා හෝ වේ.

---

* "දුහඉච්චයං ධාතු එව දුහි" යනාදීන් වාක්‍ය ගතයුතු. "ඉකිත්ති සරූපෙ" යන සූත්‍රයෙන් ධාතු ස්වරූපයෙහි කිප්‍රත්‍යය වේ.

අජ්ඣාපියතෙ මානවකො වෙදං ගුරුනා-වෙදෙ මානවකම්ති වා. ආසියතෙ දෙවදත්තො යඤ්ඤදත්තෙන. අඤ්ඤෙ තණ්ඩුලං භජ්ජාපියතෙ දෙවදත්තෙන-තණ්ඩුලො අඤ්ඤම්ති වා. අඤ්ඤෙ තණ්ඩුලං කොට්ටාපියතෙ දෙවදත්තෙන-තණ්ඩුලො අඤ්ඤම්ති වා. 1

එත්ථ පන පයොජකස්ස දෙවදත්තාදි කත්තුනො ව්‍යාපාරසඞ්ඛ්‍යාතාය ක්‍රියාය සම්බන්ධියමානත්තා යදිපි ගමනාද්‍යත්ථානං ධාතූනං පයොජ්‍යො මානවකාදිකො යො කත්තා සො ගමනාද්‍යත්ථං ව්‍යාපාරියමානො යදි කම්මං නහොති අඤ්ඤථා කිං හොතීති අඤ්ඤථානුපපත්තිලක්ඛණෙන සාමත්ථියෙන මානවකාදිකො කම්මං හොති තතොයෙවෙත්ථ අවුත්තපක්ඛෙ "ගතිබොධාහාරසද්දත්ථාකම්මකභජ්ජාදීනං පයොජ්‍යෙ" ති දුතියා. එවමුපරිපි. 2

---

1. ගුරුනා, ගුරුහුවිසින්; මානවකො, මානවකතෙම; වෙදං, වෙදය; අජ්ඣාපියතෙ, හදරවනුලැබේ. වෙදෙ මානවකම්ති වා, "වෙදෙ මානවකං" කියා හෝ වේ. යඤ්ඤදත්තෙන, යඤ්ඤදත්තයා විසින්; දෙවදත්තො, දෙවදත්තතෙම; ආසියතෙ, හිඳුවනුලැබේ. * දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; අඤ්ඤෙ, (දෙවදත්තයා කෙරෙන්) අනිකෙක්; තණ්ඩුලං, තණ්ඩුලය; භජ්ජාපියතෙ, බද්දවනුලැබේ. තණ්ඩුලො අඤ්ඤම්ති වා, "තණ්ඩුලො අඤ්ඤං" කියා හෝ වේ. දෙවදත්තෙන, දෙවදත්තයා විසින්; අඤ්ඤෙ, අනිකෙක්; තණ්ඩුලං, තණ්ඩුලය; කොට්ටාපියතෙ, කොටවනුලැබේ. තණ්ඩුලො අඤ්ඤම්ති වා "තණ්ඩුලො අඤ්ඤං" කියා හෝ වේ.

2. එත්ථ පන, මේ (ප්‍රයොජ්‍යයාගේ උක්තකර්මත්වයට) උදාහරණයෙහි වනාහි; පයොජකස්ස, ප්‍රයොජකවූ; දෙවදත්තාදි කත්තුනො, දෙවදත්තාදි කර්තෘහුගේ; ව්‍යාපාරසඞ්ඛ්‍යාතාය, ව්‍යාපාරයයි කියනලද්දවූ; ක්‍රියාය, ක්‍රියාවහා; සම්බන්ධියමානත්තා, සම්බන්ධකරණු ලබනබවහෙයින්; ගමනාද්‍යත්ථානං ධාතූනං, ගත්‍යර්ථාදි ධාතූන්ගේ; පයොජ්‍යො, ප්‍රයොජ්‍යවූ; මානවකාදිකො, මානවකාදිවූ; යො, යමෙක් තෙම; යදිපි කත්තා, කිසිසේත් කර්තෘවී නමුත්; සො, ඒ කර්තෘතෙම; ගමනාද්‍යත්ථං, ගමනාදිය ප්‍රයොජනකොට (හෙවත්) ගමනාදිය පිණිස; ව්‍යාපාරියමානො, මෙහෙයනු ලබන්නේ; යදි කම්මං නහොති, ඉදින් කර්මය නොවේ නම්; අඤ්ඤථා, අනික්පරිද්දෙකින්; කිං හො

---

* මෙහි "ආස උපවෙසනෙ" යනධාතු අකර්මකවූවද ණ්‍යන්තහෙයින් සකර්මක විය සකර්මක ධාතුමෙන් විකර්මක නොවී.

එතෙසමෙවාති කිං? පාචෙති ඔදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො. 1
යදා චරහි ගමයති දෙවදත්තං යඤ්ඤදත්තො තම'පරො පයොජෙති
ගමයති දෙවදත්තං යඤ්ඤදත්තෙන විණ්හුමිත්තොති භවිතබ්බං
ගමයතිස්ස ගමනම්පති නියොගත්ථතාය ගමනත්ථතා'සම්භවතො. 2

---

තීති, කුමක් වේදැයි යන; අඤ්ඤත්ථානුප්පත්තිලක්ඛණෙන, අනික් පරිද්දෙකින් නොයෙදීම (නොහොත්) අනිෂ්පත්තිය ස්වභාවකොට ඇත්තාවූ; සාමත්ථියෙන, අර්ථබලයෙන්; මානවකාදිකො, මානවකාදි තෙම; කම්මං හොති, කර්ම වේද; තතොයෙව, එහෙයින්ම; (මානවකාදීහු කර්ම වන හෙයින්මයයි සේයි) එත්ථ, මේ ප්‍රයොජ්‍යයෙහි; අවුත්තපක්ඛෙ, (තාදීහු විසින්) අනුක්තපක්ෂයෙහි; ගතිබොධාහාරසද්දත්ථාකම්මකභජ්ජාදීනං පයොජ්ජෙති, "ගති–පෙ–පයොජ්ජෙ" යන සූත්‍රයෙන්; දුතියා, ද්විතීයා වේ. උපරිපි, මත්තෙහිදු; එවං, මෙසේමැයි (මෙසේම අනුක්තපක්ෂයෙහි ද්විතීයා වෙයි සේයි).

1. එතෙසමෙවාති, මොවුන්ගේම යනු (හෙවත් ගතිබෝධාහාරශබ්දාර්ථාකර්මකභජ්ජාදීන්ගේම ප්‍රයොජ්‍යයෙහි ද්විතීයා වෙයි යනු) කිං, කුමක් පිණිසද?; පාචෙති ඔදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො, "පාචෙති–පෙ–යඤ්ඤදත්තො" යනතන්හි "දෙවදත්තං" යි ද්විතීයා නොවන පිණිසයි. ණිණාප්‍යන්ත නොවන්නාවූ ගමනාද්‍යර්ථයන්ගේම යම් කර්තෘයෙක් ඇද්ද ඔහු ප්‍රයොජ්‍යකල්හි ද්විතීයා ඉෂ්ටය එසේම ණිණාප්‍යන්තවූ ඔවුන්ගේ යම් කර්තෘයෙක් ඇද්ද ඔහු ප්‍රයොජ්‍ය කල්හි විශෙෂග්‍රහණයක් නොකළහොත් ද්විතීයා පැමිණෙන්නීයයි සිතා පෘච්ඡාවකරන්නාහු "යදාචරහි" යනාදී කීහු.

("පයොජෙති" යන්නට අනතුරුකොට "තදා කථං භවිතබ්බං" යන පාඨ ශෙෂයක් යෙදියයුතු.)

2. චරහි, එසේ වීනම්; යදා, යම් කලෙක්හි; යඤ්ඤදත්තො, යඤ්ඤදත්ත තෙමේ; දෙවදත්තං, දෙවදත්තයා; ගමයති, යවාද; තං, ඒ යඤ්ඤදත්තයා; අපරො, අන්‍යවූ (අග්ගිදත්තාදියෙක්); පයොජෙති, මෙහෙයාද; (තදා, එකල්හි; කථං භවිතබ්බං, කෙසේ වියයුතුද?;) ගමයති දෙවදත්තං යඤ්ඤදත්තෙන විණ්හුමිත්තොති, "ගමයති–පෙ–විණ්හුමිත්තො" යි කියා; භවිතබ්බං, වියයුතුයි. (කුමක්හෙයින්ද යත්?) ගමයතිස්ස, ගම් යන ධාතුහුතමා; ගමනම්පති, (දෙවදත්තයාගේ) ගමන නිසා හෙවත් යාම පිණිස; නියොගත්ථතාය, නියොගය අර්ථකොට ඇති බැවින්; ගමනත්ථතා'සම්භවතො, ගමනාර්ථතාවගේ සම්භවයක් නැති හෙයිනි. (ගමධාතු ගමනාර්ථවත් මුත් ණ්‍යන්තවූ ගම්ධාතුහු නියොගාර්ථ හෙයින් ගමනාර්ථ නොවේනුයි "යඤ්ඤදත්තෙන" යි තෘතීයා වත් මුත් "යඤ්ඤදත්තං" යි ද්විතීයා නොවෙයි.)

කම්මෙ තු ගාමං ගමියතෙ දෙවදත්තො යඤ්ඤදත්තෙන විණ්හුමිත්තෙන නෙවවාදි. "හරාදිනංවා"ති හරාදිනං පයොජ්ජෙ කත්තරි වා දුතියා විධානතො හාරියති භාරං දෙවදත්තො යඤ්ඤදත්තෙන-භාරො දෙවදත්තමිති වා. දුතියායාභාවපක්ඛෙ තු හාරියති භාරො දෙවදත්තෙන යඤ්ඤදත්තෙනෙවෙති භවති. 1

එවං කරදිසඅභිවාදිනං පයොජ්ජවිසයෙ පයොගා යථායොගං පටිපජ්ජිතබ්බා. 2

ඛාදදිනං පයොජ්ජෙ කත්තරි "න ඛාදදිනන්ති" පටිසෙධා ඛාදයති දෙවදත්තෙන ආදයති දෙවදත්තෙන අව්හාපයති දෙවදත්තෙන සද්දපයති දෙවදත්තෙන කන්දපයති දෙවදත්තෙන නායයති දෙවදත්තෙන යඤ්ඤ දත්තොති ච. 3

---

1. කම්මෙ තු, කර්මයෙහි වනාහි; විණ්හුමිත්තෙන, විෂ්ණු මිත්‍රයා විසින්; යඤ්ඤදත්තෙන, යඥදත්තයා ලවා; දෙවදත්තො, දෙවදත්ත තෙම; ගාමං, ගමට; ගමියතෙ ඉති, යවනු ලැබෙයි යන; ආදි, මේ ආදිය වේ. හරාදිනං වාති, "හරාදිනං වා" යන මේ සූත්‍රයෙන්; හරාදිනං, හරාදි ධාතූන්ගේ; පයොජ්ජෙ කත්තරි, ප්‍රයොජ්‍ය කර්තෘයෙහි; වා දුතියා විධානතො, විකල්පයෙන් ද්විතියා විධානය හෙතු කොට ගෙණ; හාරියති භාරං දෙවදත්තො යඤ්ඤදත්තෙන, "හාරියති භාරං දෙවදත්තො යඤ්ඤදත්තෙන" යි වේ. භාරො දෙවදත්තමිති වා, "භාරො දෙවදත්තං" කියා හෝ වේ. යඤ්ඤදත්තෙන, යඥදත්තයා විසින්; දෙවදත්තො, දෙවදත්තතෙම; භාරං, භාරය; හාරියති, ගෙණයවනු ලැබේ; භාරො, භාරය තෙම; දෙවදත්තං, දෙවදත්තයා ලවා; "හාරියති" යි යොදනු. දුතියායාභාවපක්ඛෙතු, ද්විතියාවගේ නොවීම් පක්ෂයෙහි වනාහි; හාරියති භාරො දෙවදත්තෙන යඤ්ඤදත්තෙනෙවෙති, "හාරියති පෙ-යඤ්ඤදත්තෙන" හිම කියාද; භවති, වේ. යඤ්ඤදත්තෙන, යඥදත්තයා විසින්; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; භාරො, භාරය තෙම; හාරියති, ගෙණ යවනු ලැබේ.

2. කරදිසඅභිවාදිනං, කර කරණෙය දිස පෙක්ඛණෙය අභිපූර්වවූ වාදි යන නාමධාතූග යනමොවුන්ගේ; * පයොජ්ජවිසයෙ, ප්‍රයොජ්‍ය විෂයෙහි; පයොගා, ප්‍රයොගයෝ; යථායොගං, යෙදෙනයෙදෙන පරිද්දෙන්; එවං පටිපජ්ජිතබ්බා, මෙසේම දතයුත්තාහුයි.

3. ඛාදදිනං, ඛාදදි ධාතූන්ගේ; පයොජ්ජෙකත්තරි, ප්‍රයොජ්‍යකර්තෘයෙහි; න ඛාදදිනන්ති, "න ඛාදදිනං" යන සූත්‍රයෙන්; පටිසෙධා, ප්‍රතිෂෙධ කළහෙයින්; ඛාදයති දෙවදත්තෙන ආදයති දෙවදත්තෙන අව්හාපයති දෙවදත්තෙන සද්දපයති දෙවදත්තෙන කන්දපයති දෙවදත්තෙන නායයති දෙවදත්තෙන යඤ්ඤදත්තොතිච, "ඛාදයති-පෙ-යඤ්ඤදත්තො" යි කියාද.

---

* කරකරණෙ දිස පෙක්ඛණෙ අභිඅවපුබ්බ දි යන ධාතු යන මොවුන්ගේ—සමහර.

“වහස්සානියන්තුකෙ” ති ගණසුත්තෙන වාහයති භාරං දෙවදත්තෙන යඤ්ඤදත්තොති ච. “භක්ඛස්සාහිංසායන්ති” ගණසුත්තෙන භක්ඛයති මොදකෙ දෙවදත්තෙන යඤ්ඤදත්තොති ච භවති. 1

නියන්තුකවිසයෙ තු වාහයති භාරං බලිවද්දෙ සාරථීති භවති. 2

---

1. වහස්සානියන්තුකෙති, “වහස්සානියන්තුකෙ” යන; ගණසුත්තෙන, ගණසූත්‍රයෙන්; (අනියන්තෘක විෂයෙහි වහ යන ධාතුහුගේ ප්‍රයොජ්‍යයෙහි විතීයා ප්‍රතිෂෙධ කළහෙයින්) වාහයති භාරං දෙවදත්තෙන යඤ්ඤදත්තොති ච, “වාහයති භාරං දෙවදත්තෙන යඤ්ඤදත්තො” යි කියාද. භක්ඛස්සාහිංසායන්ති, “භක්ඛස්සාහිංසායං” යන; ගණසුත්තෙන, ගණසූත්‍රයෙන්; (අහිංසාවිෂයෙහි භක්ඛ යන ධාතුහුගේ ප්‍රයොජ්‍යයෙහි විතීයා ප්‍රතිෂෙධ කළහෙයින්) භක්ඛයති මොදකෙ දෙවදත්තෙන යඤ්ඤදත්තොති ච, “භක්ඛයති මොදකෙ දෙවදත්තෙන යඤ්ඤදත්තො” යි කියාද; භවති, වේ. යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; ඛාදයති, කවා—යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; ආදයති, කවා—යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; අව්හාපයති, කැඳවා–යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයාලවා; සද්දපයති, හඬගාවා–යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයාලවා; කන්දපයති, කැඳවවා–යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; නායයති, පමුණුවවා—යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයා ලවා; භාරං, භාරය; වාහයති, උසුල්වවා—යඤ්ඤදත්තො, යඤ්ඤදත්තතෙම; දෙවදත්තෙන, දෙවදත්තයාලවා; මොදකෙ, මොදකයන්; (හෙවත් ගත්) භක්ඛයති, කවවා.

2. නියන්තුකවිසයෙ තු, නියන්තෘකවිෂයෙහි වනාහි; වාහයති භාරං බලිවද්දෙ සාරථීති, (ගමනාර්ථධාතුහෙයින් ගතිබොධාදී සූත්‍රයෙන් විතීයා වේනුයි) “වාහයති භාරං බලිවද්දෙ සාරථී” යි කියා, භවති, වේ. සාරථී, රථාචාරීතෙම; බලිවද්දෙ, බලීවද්දයන් ලවා; භාරං, භාරය; වාහයති, අද්දවා. (මෙහි නියන්තෘක නම් ක්‍රියාසිද්ධියෙහි ගවාශ්වාදීන් යොදන නියාමකයි යමෙක් ක්‍රියාව කරන්නහුලවා නියාමකව ක්‍රියාව කරවාද ඒ රථාචාරි නියන්තෘක නම්. නියන්තෘක රහිතවූයේ අනියන්තෘක නම් වේ. ක්‍රියාසිද්ධියෙහි අනිකක්හු අපෙක්ෂානොකරන්නාවූ අප්‍රයොජ්‍යයයි සේයි.)

හිංසායන්තු· යස්ස තං සස්සං සො තස්ස භක්ඛණෙන පීළිතො හොති භක්ඛයන්ති බලිවද්දෙ සස්සානි භවනි. 1

පයොජ්ජෙ යත්ථ යත්ථෙව දුතියා විහිතා සියා
පයොජ්ජං තං තදෙවෙත්ථ කම්මජො පච්චයො වදෙ. 2

නනුච ඔදනො පච්චතෙච්චාදිසු ත්‍යාදිප්පත්තිහි වුත්තෙ සබ්බත්ථ පඨමාව කස්මා වුත්තා න දුතියාදයොති වුච්චතෙ. 3

ජාතිගුණක්‍රියාලක්ඛණො සභාවො තංනිස්සයභූතං දබ්බං ඉත්ථත්තාදිකං ලිඞ්ගං එකත්තාදිකා සඞ්ඛ්‍යා කාරකානිච ජ කම්මාදිනි පචෙසා නාමත්ථො විභත්තියො පන ඉත්ථිප්පච්චයාච ජොතකා හොන්ති විසෙස වුත්තිතාය. 4

---

1. හිංසායන්තු, හිංසාවිෂයෙහි වනාහි; තං සස්සං, (භක්ෂ්‍යවාණවූ) ඒ ශස්‍යය; යස්ස, යමක්හුගේද; සො, හෙතෙම; තස්ස භක්ඛණෙන, ඒ ශස්‍යයාගේ කෑමෙන්; පිළිතො හොතීති, පෙළෙනලද්දේ වේනුයි; භක්ඛයන්ති බලිවද්දෙ සස්සානි, (ගතිබොධාදී සූත්‍රයෙන් විනියාවිනාගෙ සින්) "භක්ඛයන්ති බලිවද්දෙ සස්සං" කියා; භවනි, වේ. බලිවද්දෙ, බලි වද්දන්ලවා; සස්සං, ශස්‍යය, භක්ඛයනි, කවා.

2. එත්ථ, මේ (යථොක්තවූ) උදාහරණයෙහි; යත්ථ යත්ථ පයොජ්ජෙ එව, යම් යම් ප්‍රයොජ්‍යයෙක්හිම; දුතියා, විනියා තොම; විහිතා සියා, කර ණලද්දි වේද; තං තං පයොජ්ජං එව, ඒ ඒ ප්‍රයොජ්‍යයම; කම්මජො පච්ච යො, කර්මයෙහිවූ ප්‍රත්‍යයතෙම, වදෙ, කියන්නේ යි. (නොහොත්) පයොජ්ජෙ, ප්‍රයොජ්‍ය විෂයෙහි; යත්ථ යත්ථෙව, යම් යම් ප්‍රයොජ්‍යයෙ කම; දුතියා, විතීයාවිභක්තිතොම; විහිතා සියා, කර ණලද්දි වේද; එත්ථ මෙහි (නොහොත් විනියාවූ පක්ෂයෙහි;) කම්මජො පච්චයො, කර්මයෙ හිවූ ප්‍රත්‍යයතෙම, තං තං පයොජ්ජං එව, ඒ ඒ ප්‍රයොජ්‍ය කර්මයම; වදෙ, කියන්නේයි.

3. නනුච, චොදනාවක්කෙරෙමි;* ඔදනො පච්චතෙච්චාදිසු, "ඔදනො පච්චතෙ" යනාදියෙහි; ත්‍යාදිප්පත්තිහි; ත්‍යාද්‍යාදීන්විසින්; වුත්තෙ ස බ්බත්ථ, උක්තවූ කර්මාදි හැමඅර්ථයෙහි; පඨමාව කස්මා වුත්තා, ප්‍රථමා ම කුමක්හෙයින් කියනලද්ද;? දුතියාදයො කස්මා න වුත්තාති, විතී යාදීහු කුමක්හෙයින් නොකියනලදහුද;? වුච්චතෙ, (මෙහි පරිහාර) කියනුලැබේ.

4. ජාතිගුණක්‍රියාලක්ඛණො, ජාතිගුණක්‍රියාස්වභාවවූ; සභාවො, ස්වාර්ථයද; තංනිස්සයභූතං, ඒ ජාත්‍යාදීන්ට ආධාරවූ; දබ්බච, ද්‍රව්‍ය යද; ඉත්ථත්තාදිකං ලිඞ්ගං, ස්ත්‍රීත්වාදිවූ ලිඟුද; එකත්තාදිකා සඞ්ඛ්‍යා,

---

* නනුච, කිමෙක්ද;? සමහර.

තෙනෙව වුච්චති.

සද්දෙ සත්තං වත්‍වාන පදත්තං දබ්බසඤ්ඤිතං
සමවෙතං වදෙ ලිඞ්ගං සඞ්ඛ්‍යා කම්මාදිකම්පිච. 1.

---

එකත්වාදිවූ සඞ්ඛ්‍යාද; කම්මාදිනි ඡ කාරකානිචාති, කර්මාදි ෂට්කාර කයෝද යන; පච්චකො, පස; නාමතෙථා, නාමයාගේ අර්ථ නම් වෙයි; විභත්‍යොයො පන, විභක්තීහුද; ඉත්ථිපච්චයාච, ස්ත්‍රීප්‍රත්‍යයෝද; විසෙස වුත්තිතාය, කර්මත්වාදි එකත්වාදි සඞ්ඛ්‍යාත විශෙෂයෙහි පැවතීම් ඇතිබැවින්; ජෝතකා හොන්ති, (ශබ්දයාමෙන් වාචකනොව ශබ්ද වාච්‍යයට) ද්‍යොතක වන්නාහුයි. *

ද්‍රව්‍යනිශ්‍රිතයා ස්වාර්ථනම් වන හෙයින්ද ජාති ගුණ ක්‍රියාවන් කිසි කලෙකත් ද්‍රව්‍යය විනා නොපවත්නා හෙයින්ද නිෂ්පර්‍ය්‍යාය හෙයින් ජාති ගුණක්‍රියාවෝම ස්වාර්ථනම් වෙතියි හඟවනු පිණිස හෝ භූයොවෘ ත්තින් හෝ "ජාතිගුණක්‍රියාලක්ඛණො සත්‍ථෙථා" යි කිවද ද්‍රව්‍ය යද කිසි කලෙකත් ද්‍රව්‍ය නිශ්‍රිතත්වයෙන් ද්‍රව්‍යාන්තරයක්හට "යඞ්‍යො පවෙසය කුන්තෙ පවෙසය" යනාදියෙහි විශෙෂණවූයේ ස්වාර්ථ වෙයි රුක්ඛාදි ශබ්ද ස්වරූපයද වාච්‍යනිශ්‍රිතත්වයෙන්ම පවත්නා හෙ යින් විශෙෂණ වූයේ ස්වාර්ථනම් වෙයි. යම් තෙනෙක්හි "දණ්ඩී විසාණී" යි ද්‍රව්‍ය සම්බන්ධ නිමිත්තවූ ප්‍රත්‍යය වේද එහි සම්බන්ධයද ද්‍රව්‍ය නිශ්‍රිත හෙයින්ම ස්වාර්ථ නම් වෙයි.

මේ හැම පඤ්චිකායෙහි කියේ මැනෝ.

"යදා පන දබ්බම්පි දබ්බන්තරස්ස විසෙසනභූතමහාවති යඞ්‍යො පවෙසය කුන්තෙ පවෙසයාති එවමාදිසු තත්‍ථ යඞ්ඨි ආදිකං දබ්බං විසෙසන භාවමාපන්නං සත්‍ථෙථා දබ්බන්තරං විසෙස්සභාවමාපන්නං පුරිසාදිද බ්බං–යදා සද්දස්ස සරූපෙන විසිඨා ජාති වුච්චතෙ තදා සද්දස්ස සරූපං විසෙසනං සත්‍ථෙථා භවති ජාති පන විසෙස්සාතා දබ්බං කත්‍ථචි සම්බ න්ධොපි සත්‍ථෙථා භවති යත්‍ථ සම්බන්ධ නිමිත්තො පච්චයො දණ්ඩී විසා ණීති දණ්ඩපුරිස සම්බන්ධො දණ්ඩීති පච්චයො" යි.

ජාත්‍යාදීන්ට නිශ්‍රයවූ ද්‍රව්‍යයම සාක්ෂාත් ද්‍රව්‍යනම් වන හෙයින් "ජාත්‍යාදිනමාධාරො දබ්බං" යි කිවද ජාත්‍යාදිහු විශෙෂ්‍යත්වයෙන් ද්‍රව්‍යයයි කල්පිතයොයි.

එහෙයින් කිහ.

"යදාවිශෙෂ්‍යතෙ කිඤ්චිත් තත්තද් ද්‍රව්‍යං විශෙෂ්‍යතෙ
ජාත්‍යාදෙරප්‍යතස්තාදි ද්‍රව්‍යත්ව මුපකල්ප්‍යතෙ" යි.

1. තෙනෙව, එහෙයින්ම; (හෙවත් ස්වාර්ථාදි පඤ්චයාගේ ශක්තින් ද්‍යොතක හෙයින්ම;†) වුච්චති, කියනුලැබේ.
සද්දෙ, (වෘක්ෂාශ්වාදි නිෂ්පන්න) ශබ්දයතෙම; සත්තං,(ජාතිගුණ ක්‍රියා ලක්ෂණවූ)ස්වාර්ථය; වත්‍වාන, කියා;දබ්බසඤ්ඤිතං, ද්‍රව්‍යයයි සලකනලද;

---

* ජෝතකා හොන්ති, (ශබ්දයාමෙන් වාචකනොව) ශබ්දාර්ථ ජෝත නය කරන්නාහු වෙත්·

† ස්වාර්ථාදියම නාමාර්ථ හෙයින් හා විභක්ති ජෝතකහෙන්යිම; ඇතම්.

තස්මා යත්ථ ත්‍යාදිප්පභුතීහි කම්මාදයො'භිධීයන්තෙ තත්ථොදනාදි සද්දා සද්දත්ථසඞ්ඛාතනාමත්ථපඤ්චකතො අව්‍යතිරිත්තා අත්ථමත්තෙ යෙව වත්තන්තීති පඨමාව තතො යුත්තා න දුතියාදයො කම්මාදීසෙව තස්ස වුත්තියෙව නත්ථීති. 1

---

පදත්ථං, පදාර්ථයද; සමවෙතං, ඒ ජාත්‍යාදීන් හා එක්වූ (නොහොත්) ඒ ද්‍රව්‍යයෙහි පිහිටියාවූ; ලිඞ්ගං, (ස්ත්‍රීත්වාදි) ලිඟුද; සඞ්ඛ්‍යා, (එකත්වාදි) සඞ්ඛ්‍යාද; කම්මාදිකම්පිච, කර්මාදි කාරකද; වදෙ, කියන්නේයි.

“රුක්ඛො අයං” යනාදියෙහි වෘක්ෂත්වාදි ජාත්‍යාදීන් විශිෂ්ටවූ වෘක්ෂත්වාදි පදාර්ථයද තද්ගත පුංලිඞ්ගාදියද* “රුක්ඛො රුක්ඛා” යනාදීන් සඞ්ඛ්‍යාවද “රුක්ඛං ඡින්දති අසාමානයති” යනාදීන් කර්මාදියද රුක්ඛ අශ්වාදී ශබ්දයෙන් ප්‍රකාශවන හෙයින් ස්වාර්ථාදි පඤ්චකය ශබ්දයාගේ අර්ථයයි. විභක්තීන් හා ස්ත්‍රී ප්‍රත්‍යයෝ කර්මාදිය හා ස්ත්‍රීත්වය ප්‍රකාශකරණ හෙයින් ද්‍යොතකය යනු අභිප්‍රායයි.

1. තස්මා, එහෙයින් (හෙවත් ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා මෙසේ වෙන්ව ලභ්‍යමානවූ ස්වාර්ථාදි පඤ්චකය ශබ්දවාච්‍යවයෙන් ශබ්දාර්ථනම් වන හෙයින් හා තද්ද්‍යොතනයෙන් විභක්තීන් ද්‍යොතකනම් වන හෙයින්;) යත්ථ, යම් ප්‍රයොගයෙක්හි; ත්‍යාදිප්පභුතීහි, ත්‍යාද්‍යාදි ප්‍රත්‍යය සමාසයන් විසින්; කම්මාදයො, කර්ම කර්ත්‍රාදීහු; අභිධීයන්තෙ, කියනු ලැබෙද්ද; තත්ථ, ඒ ප්‍රයොගයෙහි; ඔදනාදිසද්දා, ඔදනාදී ශබ්දයතෙම; සද්දත්ථසඞ්ඛාත, ශබ්දාර්ථයයි කියනලද; නාමත්ථපඤ්චකතො, නාමයාගේ ස්වාර්ථාදි අර්ථ පඤ්චකයෙන්; අව්‍යතිරිත්තා, නොවෙන්වූ; අත්ථමත්තෙයෙව, අර්ථමාත්‍රයෙහිම; වත්තන්තීති, පවතිත්නුයි; තතො, ඒ ඔදනාදි ශබ්දයා කෙරෙන්; පඨමා එව, (අර්ථමාත්‍රයෙහි) ප්‍රථමාම; යුත්තා, යුක්තාය; න දුතියාදයො, ද්විතීයාදීහු යුක්ත නොවන්නාහුයි; (කුමක්හෙයින්ද යත්?) කම්මාදිසු, කර්ම කර්ත්‍රාදි අර්ථයෙහි; එතස්ස, මේ ඔදනාදි ශබ්දයාගේ; වුත්තියෙව, පැවැත්මම; නත්ථීති, නැත්නුයි කියායි.

“ඔදනො පච්චතෙ පචති දෙවදත්තො” යනාදි යම් ප්‍රයොගයෙක්හි කර්මාදියෙහි ප්‍රත්‍යයාදීහු වෙද්ද එහි කර්මාදි විශෙෂාවස්ථාතොම ප්‍රත්‍යයාදීහු විසින් උක්ත නුයි ඔදනාදි ශබ්දයා ස්වාර්ථාදි නාමාර්ථ පඤ්චකයෙන් නොවෙන්වූ හෙවත් කර්මාදීන්ට සාධාරණවූ එහෙයින්ම කර්මාදීන් විසින් නොවෙසෙසන ලද්දවූ අර්ථමාත්‍රයෙහිම පවතී නුයි අර්ථමාත්‍රවතීනිවූ ඔදනාදීනු කෙරෙන් අර්ථමාත්‍ර ප්‍රකාශකවූ ප්‍රථමාම

---

* ස්ත්‍රීත්වාදි ලිඞ්ගයද—ඇතම්.

එත්ථ සියා අභිහිතො කම්මාදිකො චරහි අත්ථො සද්දත්ථො න හොති න තං කාරකං සියා'යතො ඔදනාදයො සද්දා කම්මාදිස්වෙව න වත්තන්තීති. 1

---

වත්නට යුක්තය ත්‍යාද්‍යාදීන්ට කර්මාදිය ප්‍රකාශකොට සිටිනා හෙයින් ඔදනාදි ශබ්දයාගේ කර්මාදි වර්තිත්වයෙක්ම නැත්නුයි කර්මාදි ප්‍රකාශක විභක්තියාදීහු යුක්ත නොවන්නාහුයි කුමක්මෙන්ද යත්? විභක්ත්‍යානානාදීන් කෙරෙන් කර්මාදි ප්‍රකාශය පිණිස නැවත විභක්තියාදීන් නොවන්නාමෙනි. මෙයින් කුමක්කිහ යත්? අර්ථමාත්‍රය නම් සියලු ඛණ්ඩමුණ්ඩාදි ව්‍යක්තිය අනුවූ එහෙයින්ම භෙදයට සාධාරණවූ මනුෂ්‍යත්වාදි ජාතියමෙන් ස්වාර්ථාදිය නොහැර පැවැත්තාවූ කර්මාදි විශෙෂය මනුෂ්‍යත්වාදි ජාතිය නොහැර පැවැත්තාවූ බාල තරුණ වෘද්ධ ස්ත්‍රීත්වාදි විශෙෂය මෙනි. එහෙයින් යම් තැනෙක කර්මාදි විශෙෂය ප්‍රත්‍යයාදීහු විසින් ප්‍රකාශිතද එහි මනුෂ්‍යාදි ජාතිය විශෙෂයට සාධාරණව සිටිනාසේ කර්මාදි භෙදයට සාධාරණව සිටිනාවූ එහෙයින්ම නාමාර්ථ පචනයෙන් අව්‍යතිරික්තයයි කියනලද්දවූ අර්ථමාත්‍රයෙහි ඔදනාදි ශබ්දයා වැටේනුයි අර්ථමාත්‍ර ප්‍රකාශකවූ ප්‍රථමාම ඔහු කෙරෙන් වෙයි. යම් තෙනෙක්හි ප්‍රත්‍යයාදීන් විසින් කර්මාදිය අනුක්ත කල්හි වනාහි ස්ත්‍රීත්වාදිය මනුෂ්‍යාදි ජාතිය නොහැර පැවැත්තද ඔහුගේ විශෙෂණත්වයෙන් සිටියාමෙන් අර්ථමාත්‍රෛක දෙශත්වයෙන් සිටියාවූ කර්මාදිය සඞ්ඛ්‍යාදි ලක්‍ෂණවූ අර්ථමාත්‍රය නොහැර පැවැත්තේද තද්විශෙෂණත්වයෙන්ම ඔදනාදි ශබ්දයෙන් ප්‍රකාශිත වේ නුයි ඔහු කෙරෙන් විභක්තියා වෙයි කිවා නම් වේ.

ප්‍රත්‍යයාදීන් විසින් කර්මාද්‍යර්ථ වස්තුාව උක්ත හෙයින් ඒ හැර අවශිෂ්ට නාමාර්ථ මාත්‍රවර්තිත්වය නිසා කළිතවූ "කම්මාදිස්වෙව තස්ස වුත්තියෙව නත්ථි" යන වචනයෙන් හැඟෙන්නාවූ උක්තයාගේ ආකාරත්වාපජ්ජනයක් චොදනා විභාවනය කොට එයින් මත්තෙහි * තන්නිරාකරණය කොට කාරණා දක්වීමෙන් උක්තයාගේ කාරකත්වප්‍රතිපාදනය කරන්නාහු "එත්ථ සියා" යනාදී කීහු.

1. එත්ථ, මේ උක්ත විෂයෙහි; සියා, චොද්‍යයෙක් වන්නේයි; චරහි, එබැවින් (නොහොත්) එසේවීනම්; අභිහිතො, ප්‍රත්‍යයසමාසයන් විසින් උක්තවූ; † කම්මාදිකො අත්ථො, කර්ම කර්ත්‍රාදි අර්ථය; සද්දත්ථො න හොතිති, ඔදනාදි ශබ්දයාගේ අර්ථ නොවේ නුයි; තං, ඒ උක්තවූ

---

* ආකාරත්ව ප්‍රසඞ්ග ශඞ්කාවෙහි.

† අභිහිතො, ත්‍යාදි තව්‍යාදීන් විසින් උක්තවූ; සමඟර.

නෙදමෙවමවගන්තබ්බං යස්මා අභිහිතො කම්මාදිකො අත්ථො පඨමා විසයොයෙව සම්පජ්ජතෙ. 1

තායා'භිධෙය්‍යස්සත්ථමත්තස්ස තත්ථ සාමඤ්ඤෙනා'වට්ඨානතො. 2

---

කම්මාදිස; කාරකං න සියා, කාරක නොවන්නේ වේද; (කුමක්හෙයින්ද යත්?) යතො, යම් හෙයකින්; ඔදනාදයො සද්දා, ඔදනාදි ශබ්දයෝ; කම්මාදිකෙ'ව, කර්ම කර්ත්‍රාද්‍යර්ථයෙහිම; නවත්තන්ති, නොවැටෙද්ද; තතො ඉති, එහෙයිනුයි කියායි.

යම් හෙයකින් උක්ත විෂයෙහි ඔදනාදි ශබ්දයන්ගේ කර්ම කර්ත්‍රාදියෙහි වැටිමෙක් නැතැයි කිවද එහෙයින් උක්තවූ කර්මාදිය ඔදනාදි ශබ්දයන්ගේ අර්ථයෙක් නොවේ නුයි උක්ත කල්හි, කර්මාදිය කාරකනම් නොවන්නි වේද යනු මෙහි චොදනායි. *

1. ඉදං, මේ චොද්‍යය (හෙවත් ත්‍යාදි තව්‍යාදීන් විසින් කර්මය උක්ත කල්හි ප්‍රථමා හෙයින් ඔදනාදි ශබ්දයන්ගේ කර්මාද්‍යර්ථයෙහි වැටිමෙක් නැත යනු; † එවං, මෙසේ; (හෙවත් උක්ත කර්මාද්‍යර්ථය කාරක නොවෙයි කි නියායයි; අවගන්තබ්බං න, දතයුතු වූයේ නොවේ. (කුමක් හෙයින්ද යත්?) අභිහිතො, ප්‍රත්‍යයසමාසයන් විසින් උක්තවූ; කම්මාදිකො අත්ථො, කර්මාද්‍යර්ථය, පඨමා විසයො එව, ප්‍රථමාවට විෂය වූයේම; යස්මා සම්පජ්ජතෙ, යම් හෙයකින් සැපයේද. "යස්මා" යි යත් ශබ්දයෙන් දැක්වූ හෙතුව "තස්මා" යි දැක්වූ පමණින් අප්‍රකාශ හෙයින්ද තත් ශබ්ද සම්බන්ධය නිත්‍ය හෙයින්දැයි "තස්මා" පද ප්‍රයොග නොකොට හෙතුව ම ස්ඵුටකොට දක්වන්නාහු "තාය" යනාදි කිහු.

2. තාය, ඒ ප්‍රථමා විභක්තිය විසින්; අභිධෙය්‍යස්ස, කියයුතුවූ; අත්ථමත්තස්ස, අර්ථමාත්‍රයාගේ; තත්ථ, ඒ ඔදනාදි ශබ්දයා කෙරෙහි; සාමඤ්ඤෙන, අවිශිෂ්ටාවස්ථාවෙන් (හෙවත් කාරකෂට්කසාධාරණ වශයෙන්;) අවට්ඨානතො, පිහිටිම හෙතු කොට ගෙණයි.

උක්තවූ කර්මාද්‍යර්ථය ප්‍රථමාවට විෂයව යම් හෙතුවකින් නිපදිද ඒ හෙතුවෙනැයි සේයි. ඒ හෙතුව නම් ප්‍රථමාව විසින් ප්‍රකාශිතව්‍යවූ නාමාර්ථ සාමාන්‍යයයි කියනලද යම් අර්ථමාත්‍රයෙක් ඇද්ද ඒ අර්ථමාත්‍රයාගේ ඔදනාදි ශබ්දයා කෙරෙහි සාමාන්‍යාවස්ථාවෙන් පිහිටි හෙතු

---

* නොවන නියාවේද යනු මෙහි චොදකාභිප්‍රායි—

† ඉදං, (ප්‍රත්‍යයසමාසයන් විසින් කර්මාදිය උක්ත කල්හි අර්ථමාත්‍ර වතිනි හෙයින් ඔදනාදි ශබ්දයන්ගේ කර්මාද්‍යර්ථයෙහි වැටිමෙක් නැත යන) මේ; සමහර.

තෙනෙව වුත්තං කම්මාදීහි අවිසිට්ඨො අත්ථො අත්ථමත්තන්ති. 1
එත්තකමෙව පන නිස්සාය කම්මාදිසු එතස්ස වුත්තියෙව නත්ථීති වුත්තන්ති එත්තාවතා කාරකත්ථස්ස සභාවපරිච්චාගො වා අත්ථන්තරරූපාපත්ති වා න හොති වචනමත්තෙන වත්ථුසභාවපරාවත්තියා සති අනිට්ඨප්පසඞ්ගො සියාති. අභිහිතම්පි තං කාරකමෙවා'නභිහිතම්පි අඤ්ඤථා කථම'භිහිතා'නභිහිතවොහාරො කම්මාදිකාරකෙසු'වගන්තබ්බං–2.

---

න්ධයෙන් දැක්වූ එම අර්ථය පූර්ව ශාස්ත්‍රයෙන් ප්‍රමාණ පාඨ ගෙණහැර පා ස්ථාපනය කරන්නාහු "තෙනෙව වුත්තං" යනාදී කීහු.

1. තෙනෙව, එහෙයින්ම (හෙවත් අර්ථමාත්‍රය ඔදනාදි ශබ්දයෙහි සාමාන්‍යයෙන් පිහිටි හෙයින්ම;) කම්මාදීහි අවිසිට්ඨො අත්ථො අත්ථමත්තන්ති, "කම්මාදීහි අවිසිට්ඨො අත්ථො අත්ථමත්තං" කියා; වුත්තං, (පූර්ව ශාස්ත්‍රයෙහි) කියනලදී. කම්මාදීහි, කර්මාදීන් විසින්; අවිසිට්ඨො අත්ථො, (කර්මකර්තෘාද්‍යවස්ථා වශයෙන්) නොවෙසෙසනලද අර්ථය; අත්ථමත්තං, අර්ථමාත්‍ර නම් වේ.

යථොක්ත හෙතුව කර්මාදියෙහි ඔදනාදිශබ්දයාගේ වැටීමෙක් නැතැයි කීමට කාරණය උක්තද්ද ඒ කර්මාදීහුගේ අකාරක නොවීම දක්වන්නාහු *"එත්තකමෙව" යනාදී කීහු.

2. එත්තකමෙව පන, මෙපමණක්ම වනාහි; නිස්සාය, නිසා (හෙවත් අර්ථමාත්‍රයාගේ සාමාන්‍යාවස්ථිති පමණක්ම නිසා;) කම්මාදිසු, කර්මාදී අර්ථයෙහි; එතස්ස, මේ ඔදනාදී ශබ්දයාගේ; වුත්තියෙව, පැවැත්මම; නත්ථීති, නැතැයි; වුත්තන්ති, කියනලද නුයි; එත්තාවතා, මෙපමණෙකින්; (හෙවත් මෙසේ කළ පමණකින්ම;) කාරකත්ථස්ස, කාරක සඞ්ඛ්‍යාත අර්ථයාගේ; සභාවපරිච්චාගො වා, කාරකස්වරූපයෙන් හැරීමෙක් හෝ; අත්ථන්තරරූපාපත්ති වා, කර්මාදීහුගේ කර්තෘාදී අන්‍ය අර්ථස්වරූපයකට පැමිණීමෙක් හෝ; න හොති, නොවෙයි; වචනමත්තෙන, වාක්‍යමාත්‍රයෙකින් (හෙවත් "කම්මාදිසු වුත්තියෙව නත්ථි" යි කී පමණකින්;) වත්ථුසභාවපරාවත්තියා සති, වස්තුහුගේ ස්වභාවයෙන් පෙරළීමක් ඇති කල්හි; අනිට්ඨප්පසඞ්ගො සියාති, අනිෂ්ට ප්‍රසඞ්ගයද (හෙවත් අනභිමත අකාරකාර්ථ ප්‍රසඞ්ගයද) වේ නුයි; අභිහිතම්පි, උක්තවූද; අනභිහිතම්පි, අනුක්තවූද; තං, ඒ කර්මාද්‍යර්ථය; කාරකමෙව, කාරක නම්ම වෙයි; අඤ්ඤථා, නොඑසේවී නම්(හෙවත් උක්තවූ කර්මාදිය කාරක නොවේනම්;) කම්මාදිකාරකෙසු, කර්මාදී කාරකයන් කෙරෙහි;] අභිහිතානභිහිතවොහාරො, උක්තානුක්ත ව්‍යවහා

---

* ඒ කර්මාදීහුගේ අනුක්ත නොවී ම දක්වත්. ඇප මී.

අත්ථමත්තසබ්භාවෙපි දුතියන්තාදිහිපි පඨමායා'සම්භවෙ පනා'යං හෙතු–1.

විභූතං කම්මකත්තාදී ජොතෙන්ති දුතියාදයො
වත්තතෙ තත්ථ නෙවා'යම'ත්ථමත්තෙ තිරොහිතෙ. 2

---

රය; කථං හොති, කෙසේ වේදැයි?; අවගන්තබ්බං, උක්තයද කාරකයයි දතයුතුයි.

කර්තෘාද්‍යනුගතවූ අර්ථය අර්ථමාත්‍ර නුයි ද්විතියාදීන් විසින් අභිහිතවූ කර්මාදි කාරකයෙහි අර්ථමාත්‍ර ප්‍රකාශනය පිණිස ප්‍රථමා විභක්තිවුව මනා වේද යනු ආශඞ්කා කොට “අත්ථමත්තසබ්භාවෙපි” යි සූත්‍ර.

1. අත්ථමත්තසබ්භාවෙපි, (ඛදනාදි ශබ්දයා කෙරෙහි) අර්ථමාත්‍රයාගේ විද්‍යමානත්වය ඇති කල්හිදු; දුතියන්තාදිහිපි, ද්විතියාන්තාදීන් කෙරෙනුදු; පඨමාය, ප්‍රථමා විභක්තියගේ; අසම්භවෙ පන. අවිද්‍යමානත්වයෙහි වනාහි; අයං, මේ (මතු කියන්නේ;) හෙතු, කාරණයි.

2. කම්මකත්තාදී, (සාක්ෂාත් ශබ්දාර්ථය අපේක්ෂා නොකරණ හෙයින් කෙවලවූ) කර්ම කර්තෘාදිය; විභූතං, ප්‍රකාශවූවා (හෙවත්) ප්‍රධානවූවා; දුතියාදයො, ද්විතියාදීහු; ජොතෙන්ති, ප්‍රකාශකරන්නාහ; (එහෙයින්) අත්ථමත්තෙ,(විද්‍යමානවූද) අර්ථමාත්‍රය; තිරොහිතෙ, තිරොභූත කල්හි; (හෙවත් අප්‍රකාශ කල්හි;) අයං, (විභූතවූ අර්ථමාත්‍රයෙහි වන්නාවූ) මේ ප්‍රථමා විභක්තිතොම; තත්ථ, ඒ තිරොහිතවූ අර්ථමාත්‍රයෙහි; නෙව වත්තතෙ, නොම පවත්නියි; (නොහොත්) දුතියාදයො, ද්විතියාදීහු; විභූතං, ප්‍රකටය; කම්මකත්තාදී, කර්ම කර්තෘාද්‍යර්ථය; ජොතෙන්ති, ප්‍රකාශකෙරෙති; තත්ථ, ඒ ද්විතීයාදීන් විසින් කර්මාද්‍යර්ථය ප්‍රකාශිත කල්හි; තිරොහිතෙ, මුවාවූ; (අප්‍රකටවූ) අත්ථමත්තෙ, අර්ථමාත්‍රයෙහි; අයං, මේ ප්‍රථමාතොම; නෙව වත්තතෙ, නොම පවත්නියි.

රක්තාදි යොගයක් නැති කල්හි ස්ඵටිකයාගේ ජාති වර්ණය විභූතයාමෙන් කර්මාදීන් අවිශිෂ්ට කල්හි ශබ්දයාගේ ජාත්‍යාඛ්‍යවූ අර්ථමාත්‍රය විභූතවෙයි රක්තාදි යොගයෙහි ස්ඵටිකයාගේ වර්ණය තිරොහිතයාමෙන් කර්මාදීන් විශිෂ්ට කල්හි අර්ථමාත්‍රය තිරොභූත වෙයි එහෙයින් ද්විතීයාදීන් විසින් අර්ථමාත්‍රය ප්‍රකාශනොකොට කෙවලවූ කර්මාදිය ප්‍රකාශකරණ ලබන කල්හි ඒ විද්‍යමානවූ අර්ථමාත්‍රය තිරොභූත නුයි විභූතවූ අර්ථමාත්‍ර ප්‍රකාශනය පිණිස වන්නාවූ ප්‍රථමා විභක්තිතොමෝ ඒ ද්විතියාද්‍යභිහිතවූ කර්මාදි කාරකයෙහි නොවෙයි යනු භාවයි.

තවද ද්විතීයාදිවූ ස්‍යාදීනු කර්මාදි කාරකයන් කියන්නාහු සඞ්ඛ්‍යාදි ලක්ෂණවූ අර්ථමාත්‍රයද කර්මාදියමෙන් ශබ්දශක්තිස්වභාවයෙන්ම

අව්‍යතිරිත්තො අත්ථමත්තොති එත්ථ අරියති අනපෙක්ඛිත විභත්ති විසෙසෙන පකති රූපෙන ඤායතීති අත්ථො—1.
තස්ස සොව මත්තං සාමඤ්ඤං කම්මාදීනන්ති අත්ථමත්තං—2.

තථාහි තං කම්මාදීනො අව්‍යතිරිත්තම්'පුථුභූතම්පි සමානං සකත්ථ දබ්බලිඞ්ගසඞ්ඛ්‍යාසඞ්ඛාතං පච්චයසමාසෙහි කම්මාද්‍යත්ථ'භිහිතෙ අනපෙක්ඛිතවිභත්තිවිසෙසෙන පකතිරූපෙන විඤ්ඤායමානම'වසිස්සතෙ තාව සාමඤ්ඤං කම්මාදීනන්ති අත්ථමත්තන්ති වුච්චති—3.

---

ප්‍රකාශකෙරෙත් නුයි චිතීයාද්‍යභිහිතවූ කර්මාදි කාරකයෙහි ගතාර්ථ හෙයින් ප්‍රථමා නොවෙයි යන මේ න්‍යායද සිත්හි තිබියයුතු. උක්ත කර්මාදි ගැමනන්හි ප්‍රථමාම විමට කාරණා දක්වන තැන ප්‍රයුක්තකර ණලද්දවූ "අව්‍යතිරිත්තො අත්ථමත්තො" යන්නෙහි අර්ථමාත්‍ර ස්වරූපය දක්වියටිව "අව්‍යතිරිත්තො අත්ථමත්තො" යන්න පුළුඞ්ගුකොට ආධාරත්වයෙන් තබා අර්ථනම් කිමෙක්ද, අර්ථමාත්‍රනම් කිමෙක්ද, යන අන්තර්ලීන ප්‍රශ්නයට විසර්ජනාවශයෙන් * අර්ථයද අර්ථමාත්‍රයද විභාගකරන්නාහු "අව්‍යතිරිත්තො" යනාදිය ප්‍රයුක්ත කළෝ.

1. අව්‍යතිරිත්තො අත්ථමත්තොති, "අව්‍යතිරිත්තො අත්ථමත්තො" යන; එත්ථ, මෙහි; අරියති, අරියති යයි සේයි; අනපෙක්ඛිත විභත්ති විසෙසෙන, අපෙක්ෂානොකරණලද විභක්ති විශෙෂ ඇති; පකතිරූපෙන, බුධ සුගත යනාදී ප්‍රකෘති රූපයෙන්; ඤායතීති, දන්නාලැබේ නුයි; අත්ථො, අර්ථනම් වෙයි.

2. සොව, ඒ අර්ථයද; මත්තං, මත්තං යයි සේයි; සාමඤ්ඤං, සාමාන්‍යවූයේ; කම්මාදීනන්ති, කර්මාදීන්ට නුයි; අත්ථමත්තං, අර්ථමාත්‍රනම් වේ (නොහොත්) තස්ස, ඒ නාමාර්ථයාගේ; මත්තං, මත්ත යයි සේයි; කම්මාදීනං, කර්මාදීන්ට; සාමඤ්ඤං, සාමාන්‍යයෙක් නු ය (සාධාරණාවස්ථාවෙක් නුයි;) අත්ථමත්තං, අර්ථමාත්‍රනම් වේ. "අරියතීති අත්ථො අත්ථොයෙව මත්තං අත්ථමත්තං" යු තැනී.

නිර්වචනමුඛයෙන් සංක්ෂිප්තකොට දක්වූ අර්ථයම "අව්‍යතිරිත්තො" යන්න හා එක්කොට විස්තර මුඛයෙන් දක්වන්නාහු "තථාහි" යනාදි කියනලදී.

3. තථාහි, එසේමැයි; තං, ඒ අර්ථමාත්‍රය; කම්මාදීනො, කර්ම කර්ත්‍රාදියෙන්; අව්‍යතිරිත්තං යයි සේයි; අපුථුභූතම්පි සමානං, වෙන් නුවූයේද; සකත්ථදබ්බලිඞ්ගසඞ්ඛ්‍යාසඞ්ඛාතං, ස්වාර්ථද්‍රව්‍යලිඞ්ගසඞ්ඛ්‍යා යයි කියනලද්දේ; පච්චයසමාසෙහි, (ත්‍යාදි තව්‍යාදී ණාදි) ප්‍රත්‍යය

---

* අන්තර්ලීන චොද්‍යයට පරිහාර වශයෙන්. ඇතම්.

සමාසයන් විසින්; කම්මාද්‍යත්‍ථෙ අභිහිතෙ, කර්මාද්‍යර්ථය උක්ත කල්හි; අනපෙක්ඛිතවිභත්තිවිසෙසෙන, අනපෙක්ෂිතවූ විභක්ති විශෙෂ ඇති; පකතිරූපෙන, ඔදන දෙවදත්ත යනාදි ප්‍රකෘති රූපයෙන්; විඤ්ඤායමානං, දන්නාලබන්නේ; අවසිස්සතෙ, අවශෙෂකරණු ලැබෙයි; තව සාමඤ්ඤං, ඒ අර්ථ සාමාන්‍යයද; කම්මාදිනන්ති, කර්මාදීන්ට තුයි; (හෙවත් කර්මාදීන්ට සාධාරණ තුයි;) අත්‍ථමත්තන්ති වුච්චති, අර්ථමාත්‍ර යයි කියනු ලැබේ. මේ මෙහි උල්ලිඛිත කල්‍යාදනුක්‍රමයෙන් තබනලද ග්‍රන්‍ථානු ක්‍රමයෙන් කියනලද අර්ථක්‍රමයි.

"තං අත්‍ථමත්තං පච්චයසමාසෙහි කම්මාද්‍යත්‍ථෙ'භිහිතෙ අනපෙක්ඛිතවිභත්තිවිසෙසෙන පකතිරූපෙන විඤ්ඤායමානං සකත්‍ථදබ්බලිඞ්ගසඞ්ඛ්‍යාසඞ්ඛාතං කම්මාදිතො අවයතිරිත්තම්පුථුභූතතො අවසිස්සතෙ තව සාමඤ්ඤං කම්මාදිනන්ති අත්‍ථමත්තන්ති වුච්චති" යි සම්බන්ධ කරණු.

ප්‍රත්‍යයසමාසයන් විසින් කර්මාද්‍යර්ථය උක්ත කල්හි විභක්ති රහිතවූ ප්‍රකෘති රූපයෙන් දන්නා ලබන හෙයින් ස්වාර්ථද්‍රව්‍යලිඞ්ගසඞ්ඛ්‍යාත්මකවූ චතුෂ්කය අර්ථනම් වෙයි අර්ථය කර්මාදීන්ට සාධාරණ හේතින් අර්ථමාත්‍රනම් වෙයි ඒ කර්මාදි කාරකය සාධාරණත්වයෙන්ම කර්මාදියෙන් නොවෙන්වූයේද කර්මාදි විශෙෂයකට නොපැණි හෙයින් කර්මාදියෙන් අවශිෂ්ට වෙයි විශෙෂාවස්ථාවෙන් සාමාන්‍යාවස්ථාව වන හෙයින් අර්ථමාත්‍රය කර්මාදි විශෙෂයෙන් අතිරෙකැයි සේයි. මෙපමණකින් මේ අර්ථමාත්‍රස්වරූපය අව්‍යුත්පන්නයන්ට නොහැඟෙන්නේය එහෙයින් සොදහරණ සොපමාන ව්‍යාඛ්‍යානයක්ද කරණු ලැබේ. *

"රුක්ඛො තිට්ඨති" යි ආඛ්‍යාත ප්‍රත්‍යයා විසින්ද "රුක්ඛො ඡින්නො" යි තව්‍යාදි ප්‍රත්‍යයන් විසින්ද "පාතබ්බො රුක්ඛො" යනාදි ණ්‍යාදි ප්‍රත්‍යයා විසින්ද "ආරූළ්හවානරො රුක්ඛො" යනාදි සමාසයා විසින්ද කර්මාදිය උක්ත කල්හි "රුක්ඛො" යන්නෙහි විභක්ත්‍යන්ත රහිතවූ "රුක්ඛ" යන මේ ප්‍රකෘතිරූපයෙන් දන්නා ලබන්නාවූ වෘක්ෂජාතීන් විශිෂ්ටවූ පුල්ලිඞ්ගඑකත්වසඞ්ඛ්‍යායෙන් යුක්තවූ වෘක්ෂාර්ථය කර්මාදීන් නොවෙසෙසනලද හෙයින් හෙවත් කර්මාදීන්ට සාධාරණ හෙයින් අර්ථමාත්‍ර නම් වෙයි.

"රුක්ඛං ඡින්දති" යනාදියෙහි වෘක්ෂාර්ථය කර්මයෙන් විශිෂ්ට හෙයින් කර්ම නම් වෙයි "රුක්ඛෙන කතා ජායා" යනාදියෙහි කර්තෘත්වයෙන් විශිෂ්ටවූ වෘක්ෂාර්ථය කර්තෘ නම් වෙයි.

"රුක්ඛෙන ජවති රුක්ඛස්ස ජලං දදාති රුක්ඛස්මා පතිතො රුක්ඛෙ නිසින්නො" යනාදියෙහි කරණාදීන් විශිෂ්ටවූ වෘක්ෂාර්ථය කරණ සම්ප්‍රදානාවධි ආධාරකාරක නම් වෙයි සාමාන්‍යත්වයක් නැති හෙයින් අර්ථමාත්‍ර නම් නොවේ.

---

* එහෙයින් සසාරණ සොපමානකොට දක්වනු ලැබේ—සමගර.

යං පන පරෙහි විසුං පරිකප්පිතං බාරි ආළ්හකො දොණොච්චාදීසු යං පරිමාණං තම්පි අත්ථමත්තමෙව සඞ්ගහෙත්වා ඉදමෙත්ථ වුච්චති. 1

සකත්ථො දබ්බලිඞ්ගඤ්ච සඞ්ඛ්‍යාච පරිමාණකං
අත්ථමත්තන්ති නිද්දිට්ඨං මත්තං සාමඤ්ඤමුච්චතෙති. 2

———000———

---

යම්සේ "රුක්ඛො" යන්නෙහි "රුක්ඛ" යන මේ ප්‍රකෘති රූපය "රුක්ඛං රුක්ඛෙන" යනාදි රූප විශේෂයට සාධාරණද එසේම "රුක්ඛො" යන්නෙහි "රුක්ඛ" ප්‍රකෘති වාච්‍යවූ අර්ථයද "රුක්ඛං රුක්ඛෙන" යනාදි රූප විශේෂයෙන් වාච්‍යවූ අර්ථ විශේෂයන්ට සාධාරණයැයි දතයුතු.

තවද යම්සේ රාමවේෂාදී වේෂ විශේෂයකට නොපැමිණ ස්වස්වරූපස්ථවූ නාටකයාතෙම සියලු නෘත්‍යවිශේෂයට සාධාරණත්වයෙන් නෘත්‍යයයි කියනු ලැබේද? රාම රාවණාදි වේෂ ගත්තේ නෘත්‍ය විශේෂයකට පැමිණි හෙයින් රාම රාවණාදියයි කියනු ලබත් මුත් සාමාන්‍යත්වයෙක් නැත්නුයි නෘත්‍යකයයි කියනු නොලැබේද? එසේම "රුක්ඛ" යනාදි නාමාර්ථයද කර්මාදියෙන් නොවෙසෙසන ලද්දේ කර්මාදීන්ට සාධාරණත්වයෙන් අර්ථමාත්‍ර යයි කියනුලැබේ. කර්මාදියෙන් විශිෂ්ටවූයේ අවස්ථා විශේෂයකට පැමිණි හෙයින් කර්ම කර්තෘාදී යයි කියත් මුත් සාමාන්‍යත්වයෙක් නැත්නුයි අර්ථමාත්‍රයයි කියනුනොලැබේ. මෙසේ සාභිප්‍රාය ස උදාහරණ සොපමාන ව්‍යාඛ්‍යානයෙන් අර්ථමාත්‍රයාගේද කර්මාදීන්ගේද ස්වරූපයද නානාත්වයද දතයුතු. *

1. බාරි ආළ්හකො දොණොච්චාදීසු, "බාරි ආළ්හකො දොණො" යනාදියෙහි; යං පරිමාණං පන; යම් පරිමාණයෙක් වනාහි; පරෙහි, අන්‍යයන් විසින් (හෙවත් පාණිනීන් විසින්;) විසුං, (අර්ථමාත්‍රයෙන්) වෙන් කොට; පරිකප්පිතං, කල්පනාකරණලද්ද; තම්පි, ඒ පරිමාණයද; අත්ථමත්තමෙව සඞ්ගහෙත්වා, (පරිමාණයද පරිමාණවත් ද්‍රව්‍යයද ශබ්දාර්ථම නුයි පරිමාණයාගේ වෙන් වෙන් කොට කල්පනාව ව්‍යර්ථ හෙයින්) අර්ථමාත්‍රයෙහිම සඞ්ග්‍රහකොට; ඉදං, මේ චොද්‍යය; එත්ථ, මේ අර්ථමාත්‍රස්වරූප විභාවනාප්‍රස්තාවෙහි; වුච්චති, කියනු ලැබේ.

2. සකත්ථො—පෙ—සාමඤ්ඤමුච්චතෙති, "සාමඤ්ඤමුච්චතෙ" යි කියායි; සකත්ථො, (විශේෂණත්වයෙන් විවක්ෂිතවූ ජාති ගුණක්‍රියාලක්ෂණවූ) ස්වාර්ථයද; දබ්බං,(ඒ ජාත්‍යාදීන්ට ආධාරවූ)ද්‍රව්‍යයද (නොහොත් විශේෂ්‍යත්වයෙන් විවක්ෂිතවූ ජාත්‍යාදි ද්‍රව්‍යයද;) ලිඞ්ගඤ්ච,(ස්ත්‍රීත්වාදි)ලිඞ්ගයද; සඞ්ඛ්‍යාච,(එකත්වාදි) සඞ්ඛ්‍යාද;පරිමාණකං, (ආළ්හකද්‍රෝණාදි)පරිමාණයද යන මේ; අත්ථමත්තන්ති, අර්ථමාත්‍ර යයි; නිද්දිට්ඨං, දක්වන ලද; මත්තං, මාත්‍රයයි; සාමඤ්ඤං, සාමාන්‍යය; උච්චතෙ, කියනුලැබේ.

———000———

---

* සාභිප්‍රාය සොපමාන ව්‍යාඛ්‍යානයෙන් අර්ථමාත්‍රයාගේද කර්මාදීන්ගේද නානාත්ව දතයුතු. සමහර.

යේ'නන්තතන්තරතනාකරමජ්ඣනෙන
මජ්ඣාවලොල්ලසිතඤාණවරෙන ලද්ධා
සාරාමතා'ති සුඛිතා සුඛයන්ති ච'ඤ්ඤෙ
තෙ මෙ ජයන්ති ගුරවො ගුරවො * ගුණෙහි. 1
ජයතීහ මහාපඤ්ඤො සො මොග්ගල්ලායනො මුනි
යස්ස සාධුගුණුබ්භූතකිත්ති සබ්බත්ථ පත්ථටා. 2

——000——

පරමප්පිච්ඡතානෙක සන්තොසොපසමෙසිනං †
සුචිසල්ලෙඛවුත්තීනං සදාරඤ්ඤනිවාසිනං.
සාසනුජ්ජොතකාරීනමාචෙරත්තමුපාගතං
උදුම්බරගිරිඛ්‍යාතායතීනං යතිපුඞ්ගවං.
මෙධඞ්කරඉතිඛ්‍යාතනාමධෙය්‍යං තපොධනං
ථෙරං පිරදයාමෙධානිධානං සාධු පූජිතං +.
සිස්සං සහායමාගම්ම මිත්තං කල්‍යාණම'ත්තනො ‡
සොධෙතුං සාසනං සත්ථු පරක්කමම'කාසි යො.

---

1 යෙ, යම් කෙනෙක්; මජ්ඣාවල, මජ්ඣපර්වතයසේ; උල්ලසිත, සෙවිනාවූ; ඤාණවරෙන, උත්තමවූ ඥානය කරණකොට ගෙණ; අනන්ත, අපරියන්තවූ; තන්තරතනාකර, ශාස්ත්‍ර සාගරයාගේ; මජ්ඣනෙන, ඇල්ලීමෙන්; සාරාමතං, සාරාත්ථ නැමැති අමෘතය; ලද්ධා, ලදින්; අති සුඛිතා, අතිශයෙන් සඤ්ජාතවූ සුව ඇත්තෝ; අඤ්ඤෙච, අන්‍යවූ ශිෂ්‍ය ශ්‍රොතෘජනය තුදු; සුඛයන්ති, සුවපත් කෙරෙද්ද; ගුණෙහි ගුරවො, ශීලාදී ගුණයෙන් ගුරුවූ; මෙ තෙ ගුරවො, මාගේ ඒ ගුරුනු; ජයන්ති, ජයගන්නාහුයි (හෙවත් යථොක්තවූ ගුණසමායොගයෙන් පරාභිභවනය කරන්නාහුයි.)

2 යස්ස, යමක්හුගේ; සාධුගුණුබ්භූත, සුන්දරවූ ගුණයෙන් උපන්නාවූ (නොහොත්) නැඟගාවූ; කිත්ති, කීර්ත්තිතොම; සබ්බත්ථ, හැමතන්හි;

---

* සංස්කෘත භාෂාවෙහිමුත් පාලි භාෂාවෙහි 'ගුරු' ශබ්දයක් නොයෙදේ, එහිවූ කලී 'ගරු' ශබ්දය වේ යනු ප්‍රකරණාචාර්‍ය්‍යයන්ගේ පවා මතයක් නුමුත් 'ගුරු' ශබ්දයද බොහෝසේ දකින්ට ලැබෙන හෙයින් ඇතැම් තැන එසේද යෙදුමු.

† "විසෙසූපසමෙසිනං"

+ "ථෙරං පිරදයාපන්නං මෙධානිධිසුපූජිතං".

‡ "තස්සෙව පියසිස්සන්තං".

සුසද්දසිද්ධිං යො යොගනිච්ඡයං සබ්භි වණ්ණිතං *
අකා සුබොධාලඞ්කාරං වුත්තොදයම'නාකුලං.
**සඞ්ඝරක්ඛිත** නාමෙන මහාථෙරෙන ධීමතා
නිවාසභූතෙනා'නෙකගුණානප්පිච්ඡතාදිනං.
තෙනා'යං රචිතා සාධු සාසනොදයකාරිනා
බුද්ධසික්ඛාය ටීකාපි තථා සම්බන්ධචින්තනං.
සත්ථසඤ්චිතපුඤ්ඤෙන නිබ්බාණසාධකං හිතං
සාධෙන්තො ලොකනාථස්ස සද්ධම්මො තිට්ඨතං චිරන්ති.

**ඉති සඞ්ඝරක්ඛිතමහාසාමිපාදවිරචිතා**
සම්බන්ධචින්තා සමත්තා.

———o———

පත්ථටා, පතළාද; මහාපඤ්ඤො, පූජ්‍යවූ (ද්‍රේ ගෝ නොහොත්) විපුලවූ ප්‍රඥ ඇති; සො මොග්ගල්ලායනො මුනි, ඒ මෞද්ගල්‍යායන නම් තපස් විතෙම; ඉධ, මේ ලොකයෙහි; ජයති, දනන්නේයි (ගෙවත් විශිෂ්ටවූ ප්‍රඥ ගුණ සමායොගයෙන් පරාභිභවනය කරන්නේයි.)

**සම්බන්ධචින්තා සන්නය**
**නි මි.**

———o———

සො'යං දයාලු ගුරු මෙ ජයතීහ පඤ්ඤො
ආනන්දරඤ්ඤරතනාදි මහායතීමෙ
නිස්සාය සිස්සජනතා අපි යස්ස තෙජො
ගන්ථස්ස අත්ථමසුතස්සපි ජොතයන්ති.
පඤ්ඤාවඩ්ඪනා මය්හං සඤ්ජාතා මනමඤ්ඤිරෙ
තොසයන්ති ජනං සබ්බං වුඩ්ඪිං ගච්ඡතු සබ්බදා.
ඉමිනා පුඤ්ඤකම්මෙන යාව බුද්ධොභවාම'හං
මහොසධොව ඤාණෙන ජොතිසෙට්ඨිව භොගිනං
වෙස්සන්තරොව දානෙන හොතු මය්හං භවාභවෙ.
ඉමිනා පුඤ්ඤකම්මෙන මා මෙ බාලසමාගමො
සතං සමාගමො හොතු යාව සම්බොධිපත්තියා †.
බුද්ධත්තං පත්ථයන්තෙන සබ්බසත්තහිතත්ථිනා
ආරඤ්ඤකෙන යතිනා ලිඛිතං **ගොතමෙනිදං**.

---

* "යොගනිච්ඡං මොග්ගල්ලානං ඵං ගන්ථං සබ්භිවණ්ණිතං".
† "යාව නිබ්බාණපත්තියා"

## ශුඩි පත්‍රය.

—oo—

| පිට. | පෙළ. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| 2 | 20 | පිඹාජීයි | පිඹාජී |
| 4 | 7 | යන | යනාදි |
| 6 | 24 | රැපං | රූපං |
| 13 | 33 | ජනයාදිය | ජන්‍යාදිය |
| 15 | 3 | නිලනති | නිලන්ති |
| 16 | 8 | විශෙෂනත්ව | විශෙෂණත්ව |
| 20 | 1 | ව්‍යතිරකෙන | ව්‍යතිරෙකෙන |
| ” | 2 | ආදීවචං | ආදිවචං |
| ” | 13 | ආදිවචං | ආදිවචං |
| ” | 14 | අපූර්වවූයේ | ආ පූර්වවූයේ |
| 31 | 3 | හුසතතායං | හුසතතායං |
| 35 | 12 | චතුෂෂඨි | චතුෂ්ෂෂ්ඨි |
| 37 | 3 | විසොසන | විසෙසන |
| 39 | 30 | යනාදියෙගි | යනාදියෙහි |
| 45 | 18 | විජෙතතෙ | විජ්ජෝතතෙ |
| 46 | 31 | නිර්වෘතිතන | නිර්වෘත්තන |
| 48 | 18 | විද්‍යුත් | විද්‍යුත් |
| 51 | 17 | වක්තුමිෂටය | වක්තුමිෂ්ටය |
| 55 | 7 | ක්‍රියාවත්ථු | ක්‍රියාවස්ථු |
| ” | 3 | ධානෙනා | ධාවනෙනා |
| ” | 34 | සයානම්හු | සපනම්හු |
| 58 | 9 | අද්දෙ | ආද්දෙ |
| 59 | 15 | ජඝි | ජඝි |
| 63 | 16 | ධතු | ධාතු |
| 71 | 3 | අධම්මිකො | අධම්මිකො |
| 73 | 23 | හ | හා |
| 74 | 35 | කාඵනෙවජාක් | කාඵනෙවජාවක් |
| 76 | 5 | පාපුනනෙ | පාපුණනෙ |
| 80 | 18 | ගුරැණා | ගුරැනා |
| ” | 19 | ගුරැණා | ගුරැනා |
| 84 | 14 | බෙධාහාර | බොධාහාර |
| 87 | 13 | පිළිතො | පිළිතො |
| 88 | 40 | හෙන්ඝිම | හෙඝින්ම |
| 92 | 6 | නහිත | නාභිහිත |
| 93 | 8 | පණිස | පිණිස |
| 95 | 18 | නොපැණි | නොපැමිණි |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු